SEC | SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA



# වර්ධනය දිරිමත් කිරීම

වාර්ෂික වාර්තාව 2022

# පටුන


අප ගැන ..............................................................................2

**විධායක සමාලෝචනය**

සභාපතිතුමාගේ සමාලෝචනය .............................................4
අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය .............................7
කොමිෂන් සභා සාමාජිකයින් ............................................12
අධ්‍යක්ෂකවරුන්, අධ්‍යක්ෂකවරියන්,
සහකාර අධ්‍යක්ෂකවරුන් සහ සහකාර අධ්‍යක්ෂකවරියන් 16
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය...............................................17
කළමනාකරුවන්.................................................................17
කාර්යමණ්ඩලය .................................................................18
වසරේ විශේෂ අවස්ථාවන් සහ ඡායාරූප එකතුවක්..........24

**මෙහෙයුම් සමාලෝචනය**

මෙහෙයුම් සමාලෝචනය ..................................................28
අතිරේක තොරතුරු...........................................................61

**මූල්‍ය වාර්තා**

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

විගණකාධිපති වාර්තාව.....................................................68
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය .....................................................73
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය ..............................74
සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය ..............................75
මුදල් ප්‍රවාහ ප්‍රකාශය .........................................................76
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් ....................................77

**සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

විගණකාධිපති වාර්තාව.....................................................91
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය .....................................................95
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය ..............................96
සෙස් අරමුදලේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය.....................97
මුදල් ප්‍රවාහ ප්‍රකාශය .........................................................98
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් ....................................99

**වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

විගණකාධිපති වාර්තාව.................................................. 105
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය .................................................. 109
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය ........................... 110
වන්දි අරමුදලේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය .................. 111
මුදල් ප්‍රවාහ ප්‍රකාශය ...................................................... 112
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් ................................. 113

**පියවීම් සහතික කිරීමේ වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

විගණකාධිපති වාර්තාව.................................................. 119
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය......................................... 123
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය ........................... 124
ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය ...................... 125
මුදල් ප්‍රවාහ ප්‍රකාශය ...................................................... 126
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් ................................. 127
සාංගමික තොරතුරු .....................පිට කවරයේ ඇතුළු පැත්ත



# වර්ධනය දිරිමත් කිරීම

ආයෝජකයින්ගේ ඉතිරිකිරීම් ඵලදායී ආයෝජන වෙත නිසි ලෙස යොමු කරමින්, ශක්තිමත් සුරැකුම්පත් වෙළෙඳපොළක් ආර්ථික වර්ධනය හා සංවර්ධනය සඳහා මාවතක් විවර කරනු ලබයි. සුරැකුම්පත් වෙළෙඳපොළෙහි අඛණ්ඩතාව සහ සෞභාග්‍යය ශක්තිමත් කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නියාමන රාමුවක් නිර්මාණය කර ඇති අතර, එමගින් අපගේ පාර්ශ්වකරුවන්ගේ අභිලාෂයන් සහ අපේක්ෂාවන් මුදුන්පත් කරගත හැකි ආකාරයෙන් වෘත්තීය ප්‍රමිතීන් සපුරාලීම සහතික කිරීම අපේක්ෂා කෙරේ. අපගේ දූරදර්ශී ඉලක්කය වන්නේ අරමුදල් රැස් කිරීම සඳහා දිගුකාලීනව වඩාත් කැමති තේරීමක් බවට ප්‍රාග්ධන වෙළෙඳපොළ පරිවර්තනය කිරීමයි. සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාව වශයෙන් අප වර්ධනය සඳහා කැපවී සිටින්නෙමු.

SEC SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

# අප ගැන

## අපේ දැක්ම

එලදායී, කාර්යක්ෂම හා ක්‍රියාකාරී ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනයේ දකුණු ආසියාවේ ප්‍රමුඛ පෙළේ නියාමකයා බවට පත්වීම.

## අපේ මෙහෙවර

සාධාරණ, කාර්යක්ෂම, ක්‍රමානුකූල හා විනිවිදභාවයෙන් යුත් ප්‍රාග්ධන වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.

### අප ගැන

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (SEC), 1987 අංක 36 දරන පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කරන ලද අතර, එය දැන් අවලංගු කර 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මගින් ප්‍රතිස්ථාපනය කර ඇත. ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය කිරීමට හා සංවර්ධනය සඳහා පහසුකම් සැලසීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ව්‍යවස්ථාපිතව බලය පැවරී ඇති අතර, එය මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි.



## විනිවිදභාවය



# දිරිමත් කිරීම

## විධායක සමාලෝචනය

සභාපතිතුමාගේ සමාලෝචනය 4 | අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය 7 | කොමිෂන් සභා සාමාජිකයින් 12
අධ්‍යක්ෂකවරුන්, අධ්‍යක්ෂකවරියන්, සහකාර අධ්‍යක්ෂකවරුන් සහ සහකාර අධ්‍යක්ෂකවරියන් 16 | ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය 17
කළමනාකරුවන් 17 | කාර්යමණ්ඩලය 18 | වසරේ විශේෂ අවස්ථාවන් සහ ඡායාරූප එකතුවක් 24

# සභාපතිතුමාගේ සමාලෝචනය



**“නිවැරදි, කාලෝචිත සහ විශ්වාසදායක හෙළිදරව් කිරීම් ආයෝජකයින්ගේ විශ්වාසය ගොඩනඟන අතර ශක්තිමත් සහ කාර්යක්ෂම ප්‍රාග්ධන වෙළෙඳපොළක පදනම වේ. අපගේ අඛණ්ඩ හෙළිදරව් කිරීමේ සමාලෝචන වැඩසටහන හරහා, ලැයිස්තුගත සමාගම් මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට සහ හෙළිදරව් කිරීමේ රෙගුලාසිවලට අනුකූල බව සහතික කිරීමට අපි කැපවී සිටිමු.”**

## සමාලෝචිත වසර

2023 පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස මා පත්වීමෙන් පසුව, 2022 අවසන් වසර සඳහා මෙම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙමි. 2022 වර්ෂයේදී බොහෝ රටවල් COVID-19 වසංගතයෙන් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වෙමින් පැවතියත්, ශ්‍රී ලංකාව එහි දරුණුතම ආර්ථික අර්බුදය සමඟ පොරබදමින්, විවිධ සාධකවල හේතුවෙන්, විශේෂයෙන්ම නිෂ්පාදනය හැකිලීම, උද්ධමනය ඉහළ යාම සහ විදේශ විනිමය හිඟය නිසා එහි ප්‍රතිඵලයක් ලෙස අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟය, ඉහළ පොලී අනුපාත , විදේශ ණය ගෙවීමේ දුෂ්කරතා ඇති කිරීමට හේතු විය. 2022 දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සිය නියාමන සහ සංවර්ධන කාර්යයේදී මුහුණදුන් අභියෝග කිහිපයක් විය. මෙම අභියෝග මධ්‍යයේ වුවද, නියාමන බර අඩු කරමින්, අනුකූලතාව සහතික කරමින්, බලාත්මක කිරීම් සහ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නංවමින් ප්‍රාග්ධන සම්පාදනයට පහසුකම් සැලසීමට සහ ආයෝජකයින් ආරක්ෂා කිරීමට අපි කැපවුණු අතර එම ක්‍රියාකාරකම් මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇති ප්‍රධාන විශේෂතා අතර ප්‍රමුඛ තැනක් ගනී.

## ලැයිස්තුගත සමාගම්වල ආචාරධර්ම භාවිතය ඉහළ නැංවීම

නිවැරදි, කාලෝචිත සහ විශ්වාසදායක හෙළිදරව් කිරීම් ආයෝජකයින්ගේ විශ්වාසය ගොඩනඟන අතර ශක්තිමත් සහ කාර්යක්ෂම ප්‍රාග්ධන වෙළෙඳපොළක පදනම වේ. අපගේ අඛණ්ඩ හෙළිදරව් කිරීමේ සමාලෝචන වැඩසටහන හරහා, ලැයිස්තුගත සමාගම් මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට සහ හෙළිදරව් කිරීමේ රෙගුලාසිවලට අනුකූල බව සහතික කිරීමට අපි කැපවී සිටිමු. ලැයිස්තුගත සමාගම් සහ හෙළිදරව් කිරීම් වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා සැලකිය යුතු අඩුපාඩු සහ නොමඟ යවන සුළු හෙළිදරව් කිරීම් සමාගම් වෙත නිවේදනය කරන ලදී. එමෙන්ම, අනුකූල නොවන සමහර අවස්ථාවලදී අපි දැඩි ලෙස බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගත්තෙමු. විශේෂයෙන්ම මුදල් ප්‍රවාහයන්, මෙහෙයුම්, මූල්‍ය කාර්ය සාධනය සහ ව්‍යාපාරික අපේක්ෂාවන් කෙරෙහි බලපෑ අවිනිශ්චිත සහ අස්ථාවර තත්ත්වයන් තුළ ආයෝජකයින්ට නිවැරදි, විනිවිද පෙනෙන සහ කාලෝචිත තොරතුරු ලැබෙන බව සහතික කිරීම සඳහා අපි සමාගම් සහ බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධ වී කටයුතු කළෙමු. තිරසාර මූල්‍ය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමත් සමඟ, ලයිස්තුගත සමාගම් මගින් තිරසාරභාවය හෙළිදරව් කිරීම් ක්‍රියාවට නැංවීම සඳහා දැනුවත් කිරීම සහ පහසුකම් සැලසීම සඳහා අපි අපගේ පාර්ශවකරුවන් සමඟ ඒකාබද්ධ උත්සාහයන් දරන්නෙමු.

## නියාමනයට ලක් කරන ලද ආයතන සම්බන්ධයෙන් කැපී පෙනෙන අධීක්ෂණයක්

2021 නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත බලාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, අපගේ වෙළෙඳපොළ තුළ විශ්වාසය සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සඳහා යහපත් හැසිරීම් දිරිමත් කරමින්, වගකිවයුතු ව්‍යාපාර ප්‍රවර්ධනය කරමින්, පාලන ප්‍රමිතීන් වැඩිදියුණු කරමින් සහ ස්වයං-නියාමනය සහ අනුකූලතා සංස්කෘතියක් වර්ධනය කරමින් වෙළෙඳපොළ ආයතන, වෙළෙඳපොළ අතරමැදියන් සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සඳහා නව නීති අප හඳුන්වා දුන්නෙමු.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නීති සකස් කිරීම සහ නියාමනයට ලක් වන ආයතනවලින් ලැබෙන ප්‍රතිචාර ක්‍රියාවට නැංවීම, නියාමන බර අවම කිරීම සහ ආයෝජකයින් ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් ක්‍රියාවලියක් අනුගමනය කරන ලදී. නියාමනයට ලක්වන ආයතන සම්බන්ධයෙන් සිදුකරන ඵලදායී අධීක්ෂණය සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමන භූමිකාවේ කේන්ද්‍රීය ලක්ෂණයකි. අප විසින් නියාමනය කරන ආයතනවලින් ප්‍රාග්ධන වෙළෙඳපොළට පැන නගින ඕනෑම පද්ධතිමය අවදානමක් අවම කිරීම සඳහා, අප එතැන් සහ විතැන් අධීක්ෂණය සඳහා ඵලදායී අවදානම් මත පදනම් වූ අධීක්ෂණ රාමුවක් හරහා නියාමනයට ලක් කරන ලද ආයතනවල අධීක්ෂණය ශක්තිමත් කළෙමු. සමාලෝචිත වර්ෂය තුළ, නියාමනය කරන ලද ආයතනවලට

**"අපගේ වෙළෙඳපොළ තුළ විශ්වාසය සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සඳහා යහපත් හැසිරීම් දිරිමත් කරමින්, වගකිවයුතු ව්‍යාපාර ප්‍රවර්ධනය කරමින්, පාලන ප්‍රමිතීන් වැඩිදියුණු කරමින් සහ ස්වයං-නියාමනය සහ අනුකූලතා සංස්කෘතියක් වර්ධනය කරමින් වෙළෙඳපොළ ආයතන, වෙළෙඳපොළ අතරමැදියන් සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සඳහා නව නීති අප හඳුන්වා දුන්නෙමු."**

සැලකිය යුතු බාධා කිරීම් මධ්‍යයේ වුවද ක්‍රියාකාරීව ඔරොත්තු දීමේ හැකියාව ඇති කළ ප්‍රධාන පියවරයන් අතරට ශක්තිමත් පද්ධති, ඵලදායී පාලන විධිවිධාන, තොරතුරු සුරක්ෂිතභාවය සහ ඵලදායී ව්‍යාපාර අඛණ්ඩ සැලසුම් ඇතුළත් විය.

## ඩිජිටල්කරණය සහ සුළු පරිමාණ වෙළෙඳපොළ හැසිරීම

කොටස් වෙළෙඳපොළ ඩිජිටල්කරණ ක්‍රියාවලිය, කොළඹ කොටස් හුවමාරුව වෙත සුළු පරිමාණ ආයෝජකයින්ගේ පැමිණීම ඉහළයාමත් සමඟ අවසන් විය. 2022 දී, සුළු පරිමාණ ආයෝජකයින්ගේ සංඛ්‍යාවෙහි සැලකිය යුතු වර්ධනයක් නිරීක්ෂණය වූ අතර විශේෂයෙන්ම වයස අවුරුදු 40 ට අඩු ආයෝජකයින් ආයෝජනය ගැන ඉගෙන ගැනීමට සහ ආයෝජන මාර්ගෝපදේශ ලබා ගැනීමට සමාජ මාධ්‍ය වේදිකා වෙත යොමුවීමේ ඉහළයාමක් දැකගත හැකි විය. මෙම නව සමාජ මාධ්‍ය නාලිකා මතු වීමත් සමඟ තොරතුරු වල විශ්වසනීයත්වය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇත. වසර තුළ සමාජ මාධ්‍ය පළ කිරීම් හරහා සිදු කළ හැකි වෙළෙඳපොළ විෂමාචාර හඳුනාගෙන ඒවාට එරෙහිව බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අපි පියවර ගත්තෙමු. ආයෝජකයින්ට මූල්‍ය අධ්‍යාපනයට නිසි ප්‍රවේශයක් ඇති කිරීමටත් විවිධ නාලිකා මගින් පලකරනු ලබන තොරතුරුවල සත්‍යාසත්‍යතාවය තහවුරු කිරීමට සහ අවබෝධ කර ගැනීමටත් දැනුවත් ආයෝජන තීරණ ගැනීමටත් හැකි වන පරිදි අපගේ ආයෝජක අධ්‍යාපන වැඩසටහන් අඛණ්ඩව ලබා දෙන්නෙමු.

## වෙළෙඳපොළ ආවේක්ෂණ කටයුතු සඳහා තාක්ෂණයේ කාර්යභාරය

වෙළෙඳපොළ අස්ථාවරත්වය මධ්‍යයේ, ආයෝජකයින්ගේ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සහ ආයෝජකයින්ගේ විශ්වාසය ගොඩනැගීම සඳහා ගනුදෙනු අක්‍රමිකතා කාලෝචිත ලෙස හඳුනා ගැනීම සහතික කිරීම සඳහා අප වෙළෙඳපොළ ක්‍රියාකාරකම් අධීක්ෂණය ඉහළ නැංවුවෙමු. වසර ගණනාවක් පුරා, අන්තර්ජාලය සහ ඩිජිටල් මාධ්‍ය පුළුල් ලෙස භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, ප්‍රසිද්ධ නොකළ තොරතුරු සම්ප්‍රේෂණය කිරීමේ සහ අනිසි ලෙස භාවිතා කිරීමේ වේගය සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමාජ මාධ්‍ය හරහා පල කරන ලද එවැනි වංචනික කොටස් ඉඟි පරීක්ෂා කර කාලෝචිත හා සමානුපාතික ලෙස බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට උත්සාහ කළේය. ශීඝ්‍රයෙන් වෙනස් වන තාක්ෂණය නව අභියෝග මතු කරන අතර දත්ත ආවේක්ෂණ ක්‍රියාවලියේ කොඳු නාරටිය බවට පත්ව ඇත. සංකීර්ණ වෙළෙඳපොළ විෂමාචාර අනාවරණය කර ගැනීමට අපගේ උත්සාහයන් අඛණ්ඩව අප විසින් සිදුකරගෙන යාමේදී, අප විශ්ලේෂණය සඳහා ශක්තිමත් මෙවලම් සහිත වෙබ් පාදක වේදිකාවක් භාවිතා කරමින් රටාවන් හඳුනාගැනීම සහ දත්ත විශ්ලේෂණ වැනි විවිධ නව ශිල්පීය ක්‍රම අනුගමනය කළෙමු. උල්ලංඝනයන් හඳුනා ගත් විට, ඒ සඳහා ක්‍රියාත්මකවීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එහි පරිපාලන, සිවිල් සහ අපරාධ බලතල යටතේ බලාත්මක කිරීමේ මෙවලම් මාලාවක්

# සභාපතිතුමාගේ සමාලෝචනය

යොදවා ඇත. වඩාත් සංකීර්ණ සහ ව්‍යාජ වෙළෙඳාම් කිරීමේ සහ වෙළෙඳපොළ මිල ගණන් කෘතිම ලෙස උස් පහත් කිරීමේ ගනුදෙනු ක්‍රම හඳුනා ගැනීමට සහ මැඩපැවැත්වීමට අනාගත ආවේක්ෂණ තාක්ෂණය තවදුරටත් යෙදවීමට සිදුවනු ඇත.

## නව ප්‍රාග්ධනය රැස්කිරීමේ විකල්ප සඳහා පහසුකම් සැලසීම

සංවර්ධනය පැත්තෙන් සළකා බලන විට, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අපගේ වෙළෙඳපොළට ගැඹුරක් එක් කිරීමට සහ විවිධ ගනුදෙනු උපාය මාර්ග, අවදානම් දැරීමට ඇති කැමැත්ත සහ ආයෝජන ක්‍රම සහිත පුළුල් පරාසයක ආයෝජකයින්ට විකල්ප ලබා දීම සඳහා නව නිෂ්පාදන සහ වේදිකා හඳුන්වා දීම සඳහා පහසුකම් සපයයි. හරිත හා තිරසාර මූල්‍ය සංවර්ධනයට සහාය වීම කෙරෙහි සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රධාන අවධානය යොමු කර ඇත. මෙම ප්‍රයත්නයේ කොටසක් ලෙස, කොළඹ කොටස් හුවමාරුව සමඟ සහයෝගයෙන් අප ආර්ථිකයට, ප්‍රජාවට සහ පරිසරයට ධනාත්මක බලපෑමක් ඇති කිරීම සඳහා පාරිසරික, සමාජීය හා පාලන (ESG) පදනම් කරගත් නිෂ්පාදන සහ ESG දර්ශකයක් හඳුන්වා දීමට මූලිකත්වය ගෙන සිටිමු. නුදුරු අනාගතයේ දී හඳුන්වා දීමට නියමිත අනෙකුත් නව ආයෝජන උපකරණ අතර කොටස් ණයට ගැනීම සහ ණයට දීම, නියාමනය කරන ලද හිඟ විකුණුම්, ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ උපකරණ, රත්‍රන් විනිමය හුවමාරු අරමුදල් (Gold ETFs), යටිතල පහසුකම් බැඳුම්කර, REPO ගනුදෙනු සිදු කිරීමට වෙළෙඳපොළින් බැහැර වේදිකාව (OTC) යනාදිය ඇතුළත් වේ.

## ආයෝජක අධ්‍යාපනය වැඩිදියුණු කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 වසරේ පවත්වන ලද මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණයෙන් හෙළි වූයේ ශ්‍රී ලංකාවේ වැඩිහිටියන්ගෙන් 57.9% ක් මූල්‍ය සාක්ෂරතාව ඇති බවයි. එසේ තිබියදීත්, ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය දැනුම වැඩිදියුණු කිරීමට තවමත් පුළුල් අවකාශයක් පවතී. මූල්‍ය සාක්ෂරතාවය ජීවන කුසලතාවක් වන අතර කුඩා කල සිටම මූල්‍ය දැනුම ලබාදීම ඉතා වැදගත් වේ. 2023 වර්ෂයේදී හඳුන්වාදීමට අපේක්ෂිත පාසල් විෂයමාලා සංශෝධනය තුළින් හය වැනි ශ්‍රේණියේ සිට "මූල්‍ය සාක්ෂරතාවය සහ ව්‍යවසායකත්වය" යන නව විෂයයට ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳව කරුණු අන්තර්ගත කිරීමට කටයුතු කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ ස්මාර්ට් ජංගම දුරකථන හරහා ගනුදෙනු කිරීමට කැමති තරුණ ආයෝජක පරම්පරාවක් වෙත ළඟාවීමට අපට හැකියාව ලැබී ඇති අතර ඔවුන් ස්වයංක්‍රීය උපාංග, සහ අන්තර්ජාල මූලාශ්‍රවලින් ආයෝජන තීරණ සඳහා අවශ්‍ය සහාය ලබා ගැනීමට පෙළඹී තිබේ. මේ හේතුව නිසා, අපගේ ප්‍රයත්නයන්ට ෆෙස්බුක්, යූටියුබ් සහ ට්විටර් හි සමාජ මාධ්‍ය පළකිරීම් මගින් විනෝදාත්මක සහ අන්තර්ක්‍රියාකාරී ආකාරයකින් නිතිපතා ආයෝජන දැනුම ලබා දීම ඇතුළත් විය. විවිධ වංචාවන්ට ගොදුරු වීමෙන් වළකින ලෙස අප ආයෝජකයින්ට අවවාද කළ අතර ආයෝජන තීරණ ගැනීමේදී උපරිම ලෙස ප්‍රවේශම් වන ලෙසත් ඔවුන්ට උපදෙස් දුන්නෙමු. අපගේ මාර්ගගත ප්‍රයත්නයන් තුළින් අවම පිරිවැයකින් සැලකිය යුතු පුද්ගලයන් සංඛ්‍යාවක් වෙළෙඳපොළ වෙත ආකර්ෂනය කර ගැනීමට අපට හැකියාව ලැබුණු අතර, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් එවැනි පිරිස් සඳහා පවත්වන වැඩ සටහන් වල වටිනාකම හඳුනාගනිමින් සහ කොළඹ කොටස් හුවමාරුව සමඟ ඒකාබද්ධව රටපුරා විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.

## පාර්ශවකරුවන්ගේ ඉහළ දායකත්වය

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ද්වි-මාර්ග සන්නිවේදනය වැඩි කිරීම සඳහා කථන කටයුතු, උපදේශන, කර්මාන්තය පිළිබඳ සාකච්ඡා, චක්‍රලේඛ, ප්‍රකාශන, මාධ්‍ය නිවේදන සහ වාර්ෂික වාර්තා ඇතුළු බහු නාලිකා භාවිතා කරමින් පුළුල් පරාසයක පාර්ශවකරුවන් සමඟ නිතිපතා, කාලෝචිත සහ ක්‍රියාකාරී මැදිහත්වීම් අඛණ්ඩව සිදු කරගෙන ගියේය. අපගේ නියාමන අපේක්ෂාවන් සහ සංවර්ධන කාර්යයන් පිළිබඳ යාවත්කාලීන කිරීම් සහ ප්‍රතිපත්ති සහ රෙගුලාසි සම්බන්ධයෙන් ඔවුන්ගේ උත්සාහයන් සහ අදහස් ප්‍රකාශ කිරීමට පාර්ශ්වකරුවන්ට අවස්ථා ලබා දීම සඳහා මෙම කටයුතු සිදු කරන ලදී. වෙළෙඳපොළ සහභාගිවන්නන් සමඟ අඛණ්ඩ සංවාදයන් පැවැත්වීම හරහා සුරැකුම්පත් වෙළෙඳපොළේ නව ප්‍රතිපත්ති සහ නියාමන සංවර්ධනයට අදාළව වෙළෙඳපොළෙහි ස්පන්දනය මැන බැලීමට සහ සමීපව සිටීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට හැකියාව ලැබේ.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයෙහි (IOSCO) සාමාජිකයෙකු ලෙස එහි ප්‍රතිපත්ති කමිටු දෙකක, එනම් බලාත්මක කිරීම සහ තොරතුරු හුවමාරු කිරීමේ කමිටුව (කමිටු 4) සහ සුළු පරිමාණ ආයෝජකයින් පිළිබඳ කමිටුව (කමිටු 8) නියෝජනය කරමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ජාත්‍යන්තර ප්‍රමිති සැකසීමේ කාර්යයන් සහ නායකත්ව කාර්යයන් සඳහා අඛණ්ඩව දායක වේ. COVID-19 වසංගතය සහ IOSCO විසින් මාර්ග ගත ක්‍රමය ඔස්සේ නිරන්තර රැස්වීම් පැවැත්වීමට ගත් තීරණය හමුවේ, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව IOSCO හි කාර්යයන් කිහිපයකට සහභාගී වූ අතර විවිධ ජාත්‍යන්තර සුරැකුම්පත් නියාමන ආයතනවල අත්දැකීම් සහ ආචාරධර්ම භාවිතයන් බෙදාහදා ගැනීමට සහ අධ්‍යයනය කිරීමට හැකි විය.

## ඉදිරියට ගමන් කිරීම

පවතින ආර්ථික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් ප්‍රාග්ධන වෙළෙඳපොළේ ක්‍රියාකාරීත්වය දැඩි ලෙස සීමා වී ඇත. කෙසේ වෙතත්, ආර්ථික තත්ත්වය පහසු වී යහපත් අතට හැරෙන විට එහි ප්‍රකෘතිය සහ වර්ධනය පිළිබඳව අපි ධනාත්මකව සහ බලාපොරොත්තු සහගතව සිටින්නෙමු. අදාළ සහ ඵලදායී නියාමනය, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ නව සහ ආකර්ශනීය වෙළෙඳපොළ උපකරණ හඳුන්වාදීම තුළින් ආයෝජකයින්ගේ විශ්වාසය නැවත ගොඩනඟා ගැනීමට දැන් කාලය එළඹ තිබේ.

බාහිර ආර්ථික අර්බුදය මධ්‍යයේ 2023 දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ඇති ප්‍රධාන අභියෝගයක් වනුයේ, නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ එහි නියාමන භූමිකාවේ සහ වගකීම්වල ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර හැකියාවන් ගොඩනැගීමයි. මෙම සන්දර්භය තුළ, අපගේ මෙහෙයුම්වල මානව සම්පත් සහ තාක්ෂණ අවකාශයන් තුළ කඩිනමින් අවධානය යොමු කළ යුතු තීරණාත්මක ගැටලු පවතින අතර ඉහළ දක්ෂතා අත්පත් කර ගැනීම සහ රඳවා තබා ගැනීම සහ ප්‍රාග්ධන ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි විශේෂඥ ප්‍රමිති සැකසීම සහ නියාමන ආයතනයකට අදාළ සුදුසු තාක්ෂණික ආධාරක පද්ධති ආරම්භ කිරීම විශේෂයෙන් සඳහන් කළ හැකිය. නව පනත මගින් ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රසාරණය සහ ඵලදායී නියාමනය සඳහා පුළුල් ආවරණයක් සපයයි. පනත යටතේ පුළුල් කාර්ය සාධනයක් ලබා දීම සඳහා, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට අදාළ විශේෂඥ කුසලතා ඇති පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීමට සහ ආයෝජනය කිරීමට අවශ්‍ය වේ. මෙය කොමිසමේ ප්‍රධාන අවධානයට ලක්වන ක්ෂේත්‍රයක් වනු ඇත.

අවසාන වශයෙන්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් ලබාදුන් ඔවුන්ගේ තීක්ෂණ දායකත්වය, සහයෝගය සහ මගපෙන්වීම සඳහාත්, අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු ලේකම් කාර්යාලයේ කාර්යමණ්ඩලයේ කැපවීම සහ වෙහෙස නොබලා වැඩ කිරීම වෙනුවෙනුත් මා බෙහෙවින් ස්තුති කරන්නෙමු. එමෙන්ම මා සහ නව කොමිෂන් සභාව පිළිබඳව විශ්වාසය තබමින් කටයුතු කළ අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාට සහ මුදල් අමාත්‍යාංශයේ නිළධාරීන්ටත් ස්තුති කිරීමට මා මෙට අවස්ථාවක් කර ගනිමි.

**ෆයිසාල් සාලි**
සභාපති

2023 මාර්තු 15

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය



**“ශ්‍රී ලංකාවේ ආර්ථිකය යලි ගොඩනැංවීමට සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කිරීමට ඩොලර් ආදායම් උපයන ලැයිස්තුගත සමාගම් වලට හැකියාව ඇති අතර එසේ කිරීමට විභවය, අවශ්‍යතාවය සහ කැපවීම ඇති සමාගම් හඳුනා ගැනීමට කාලය එළඹ ඇත. එමෙන්ම එසේ හඳුනාගත් සමාගම් දිරිගැන්වීම සහ ආරක්ෂා කිරීම සිදු කල යුතු අතරම ආර්ථික සංවර්ධනයේ ප්‍රගතියක් ලබාගැනීම සඳහා එවැනි සමාගම් සඳහා ගෝලීය දැවැන්තයින් සමඟ තරඟ කිරීමට ඉඩ හසර ලබාදිය යුතු වේ. මෙමඟින් රටේ සමස්ත සැකැස්ම වෙනස් කරමින් අපව ගතික ව්‍යවසායක රාජ්‍යක් බවට පත් කරනු ඇති අතර එමඟින් රටේ සැබෑ විභවය හඳුනාගැනීමට හැකිවනු ඇත.”**

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

2022 වර්ෂය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිම කරන ලද කාර්යයන් පිලිබඳ සමාලෝචනය කරන්නේ මා ඉතාමත් තෘප්තිමත් බවකින් යුක්තවයි.

දැඩි ආර්ථික බාධක හමුවේ 2022 වසර ශ්‍රී ලංකාවට අසාමාන්‍ය අභියෝගයක් වූ වසරක් බව කිව හැකිය. මෙම අභියෝගයන්ට මුහුණ දීමට සහ ආර්ථික හා මූල්‍යමය දුෂ්කරතාවන් ජයගැනීමට නම් මෙම තත්වයන් තවදුරටත් දුර්වල වීම වැළැක්වීම සඳහා කළ යුතු දේ සහ එය කළ හැකි ආකාරය අවබෝධ කරගැනීම ඉතාමත් වැදගත් වේ.

ආපසු හැරී බලන විට, මූල්‍ය ප්‍රතිපත්තියේ නිසි කළමනාකරණයක් නොතිබීම, ප්‍රමාණවත් විදේශ සංචිත නොමැතිවීම සමඟ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළට ප්‍රවේශය අහිමි වීම සහ මනා විශ්ලේෂණයකින් තොරව ණය ගෙවීම් පැහැරහැරීමට ගත් තීරණය ආර්ථික අවපාතයට තුඩුදුන් සාධක අතරින් කිහිපයක් වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස රට මින් පෙර මුහුණ නොදුන් ආහාර, ඉන්ධන සහ ඖෂධ හිඟයකට මුහුණ පෑමට සිදුවිය. උද්ධමනය ඉතා සීඝ්‍රයෙන් ඉහළ ගිය අතර වසරේ අවසාන භාගයේදී එය 60% ඉක්මවා යන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාත දැඩි කරන ලදි.

කෙසේ වුවත්, ප්‍රතිපත්ති පොලී අනුපාතයන්හි වැඩිවීම තුලින් බැංකු පොලී අනුපාත වල ඉහළ යාමක් සිදුවූ අතර ඒ හේතුවෙන් සමාගම් තම ව්‍යාපාර කටයුතු තාවකාලිකව නතර කල අතරම ආයෝජකයින් තම ආයෝජන කොටස් වෙළෙඳපොළින් ස්ථාවර ආදායම් ලැබෙන ආයෝජන වෙත යොමු කිරීමට පෙළඹීමක් ඇති විය. මේ හේතුවෙන් සියලු කොටස් මිළ දර්ශකය 30.5% කින් පහත වැටෙමින් වසර අවසන් වන විට එහි අගය 8489.66 ක් විය. තවද, S &P ශ්‍රී ලංකා 20 මිළ දර්ශකයද මේ අනුව යමින් 38% ක අඩුවීමක් පෙන්නුම් කල අතර වසර අවසානයේ එහි අගය 2635.63 විය.

2022 වර්ෂය තුල දෛනික සාමාන්‍ය පිරිවැටුම රුපියල් බිලියන 2.97 ලෙස සතුටුදායක මට්ටමක පැවතිණි. 2021 වර්ෂය හා සසඳන විට 2022 වර්ෂය තුල මුළු පිරිවැටුමට විදේශීය ආයෝජකයින්ගේ දායකත්වය 5.2% සිට 7.6% දක්වා ඉහළ ගොස් ඇත.

වෙළෙඳපොළ තුල රුපියල් බිලියන 30.6 ක ශුද්ධ විදේශ ආයෝජන ගලාඒමක් වාර්තා කිරීමට විදේශ ආයෝජකයින්තුල යළි ඇතිවූ උනන්දුව උපකාර වූ අතර එය අඛණ්ඩව වසර 4ක් ශුද්ධ විදේශ ආයෝජන ගලායාම් වාර්තා කිරීමෙන් අනතුරුව ශුද්ධ විදේශ ආයෝජන ගලාඒමක් වාර්තා වූ ප්‍රථම අවස්ථාවයි. දේශීය ආයෝජකයින් 2021 වසර හා සමානව වෙළෙඳපොළ තුල ක්‍රියාකාරීව සිටිය අතර 2022 වසර තුළ දේශීය ආයෝජකයින්ගේ දායකත්වය 92.4% ක් ලෙස වාර්තා විය. සමස්තයක් ලෙස ගත්කල සලකා බලන වර්ෂය තුල වෙළෙඳපොළ තුලින් රැස්කරගෙන ඇති මුළු ප්‍රාග්ධනය රුපියල් බිලියන 44.73 ක් වේ. වෙළෙඳපොළ මිළ ඉපැයුම් අනුපාතය 4.95 ලෙස මධ්‍යස්ත මට්ටමක පැවතින. තවද, වෙළෙඳපොළ තුල ලාභාංශ ඵලදාව 2021 වසර තුළ වාර්තා කල 2.2% සිට සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරමින් 4.1% දක්වා වර්ධනය විය.

ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී මධ්‍යම වෙළෙඳපොළක් ලෙස රට ගොඩනැගීමට අරමුණු කරගනිමින් ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙම වසර තුල ආරම්භ කරන ලදි. වඩා සංවර්ධිත සහ ද්‍රවශීල ප්‍රාග්ධන වෙළෙඳපලක් ඇති කිරීම රජයේ ප්‍රමුඛතාවයක් විය යුතු අතර වත්මන් රජය එය ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන ඇත. පසුගිය වර්ෂයන් තුල වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය සහ වෙළෙඳපොළ පිරිවැටුම දළ දේශීය නිෂ්පාදිතයෙන් 15% සහ 20% අතර උච්චාවචනය වූ අතර එය කලාපයේ අනෙකුත් රටවල් වලට වඩා සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පවතී.

එමනිසා, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අපි රට තුළ ප්‍රාග්ධන වෙළෙඳපොළ සහභාගීත්වය පුළුල් කිරීමේ අරමුණින්

**"ආයෝජකයින් සඳහා ආයෝජන මාර්ග නිර්මාණය කරන අතරම ව්‍යාපාර වල ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා මූල්‍ය ප්‍රභවයක් ලෙස ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි."**

ශක්තිමත් නියාමනය සහ වෙළෙඳපොළ සංවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් වල නිරන්තරයෙන් නිරත වන්නෙමු. වඩා සංවර්ධිත සහ ද්‍රවශීල ප්‍රාග්ධන වෙළෙඳපලක් ඇති කිරීමේ මූලික පියවර වනුයේ වෙළෙඳපොළ කෙරෙහි ආයෝජකයින්ගේ විශ්වාසය ගොඩනැංවීමයි. ආයෝජකයින් සඳහා ආයෝජන මාර්ග නිර්මාණය කරන අතරම ව්‍යාපාර වල ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා මූල්‍ය ප්‍රභවයක් ලෙස ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය යලි ගොඩනැංවීමට සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කිරීමට ඩොලර් ආදායම් උපයන ලැයිස්තුගත සමාගම් වලට හැකියාව ඇති අතර එසේ කිරීමට විභවය, අවශ්‍යතාවය සහ කැපවීම ඇති සමාගම් හඳුනා ගැනීමට කාලය එළඹ ඇත. එමෙන්ම එසේ හඳුනාගත් සමාගම් දිරිගැන්වීම සහ ආරක්ෂා කිරීම සිදු කල යුතු අතරම ආර්ථික සංවර්ධනයේ ප්‍රගතියක් ලබාගැනීම සඳහා එවැනි සමාගම් සඳහා ගෝලීය දැවැන්තයින් සමඟ තරඟ කිරීමට ඉඩ හසර ලබාදිය යුතු වේ. මෙමඟින් රටේ සමස්ත සැකැස්ම වෙනස් කරමින් අපව ගතික ව්‍යවසායක රාජ්‍යක් බවට පත් කරනු ඇති අතර එමඟින් රටේ සැබෑ විභවය හඳුනාගැනීමට හැකිවනු ඇත.

නැගී එන වෙළෙඳපොළ තුළ විශ්වාසය සහ කාර්යක්ෂමතාවය ඇගයීමේ පරාමිති මාලාවක් පදනම් කරගනිමින් ලෝක ආර්ථික සංසදයේ ගෝලීය තරඟකාරීත්ව වාර්තාව මඟින් ශ්‍රී ලංකාව 51 වන ස්ථානයෙහි ශ්‍රේණිගත කර ඇති අතර මැලේසියාව එහි 9 වන ස්ථානයේත්, තායිලන්තය 31 වන ස්ථානයේත් ශ්‍රේණිගත කර ඇත. වර්තමානය තුල වෙළෙඳපොළ කෙරෙහි පවත්නා වූ විශ්වසනීයත්වයෙහි අඩුවක් දක්නට ලැබේ. ලෝක මූල්‍ය අරමුදලේ ඇතැම් නිර්දේශයන් පද්ධතිය කෙරෙහි වූ විශ්වාසවන්තභාවය සම්බන්ධයෙන් වන අතර එම නිර්දේශයන් හා සබැඳි ව්‍යවස්ථාදායක රාමුව පිළිබඳව එහි දීර්ඝ වශයෙන් සඳහන් වේ. පද්ධතිය තුල වූ සියලුම අඩුපාඩු ඔවුන් ඉස්මතු කර ඇත. අපගේ ව්‍යවස්ථාදායක සහ නියාමන රාමුව යල් පැන ගොස් ඇති බව අපි නිරන්තරයෙන් අසා ඇත්තෙමු. අප විසින් නියාමනය කරන්නාවූ පිරිසට පැහැදිලි සහ නිශ්චිත මඟපෙන්වීමකින් තොරව අපට ඉදිරියට ගමන් කල නොහැකි වේ.

මේ අනුව නව නියාමන රාමුව හඳුන්වාදීමත් සමඟ අපි මේ සියලුම දේට පිළිතුරු ලබාදී ඇති අතරම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2022 වර්ෂය තුල ප්‍රමුඛතාවයක් ලෙස නියාමන කාර්යයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදි.

## ක්‍රියාකාරී පියවරයන්

ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අවශ්‍යතාවය වූයේ වෙළෙඳපොළ විෂමාචාර සම්බන්ධයෙන් කඩිනමින් සහ තීරණාත්මක ලෙස කටයුතු කරමින් වෙළෙඳපොළ සංශෝධනය කිරීමට සහ වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වයට වඩා පැහැදිලි බවක්, ස්ථාවරත්වයක් සහ පුරෝකථනය කිරීමේ හැකියාවක් ලබා දීමයි.

කෙසේ වෙතත්, නියාමකයෙකුගේ සාර්ථකත්වය මැනීම සඳහා යෝග්‍ය පදනමක් ලෙස බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග සංඛ්‍යාව මම නොසලනකන නමුත්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් මෙතෙක් සිදුකළ වැඩිම බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග සංඛ්‍යාව වාර්තා වන්නේ

පසුගිය වර්ෂයෙන් වන අතර මේ අතරට නඩු පැවරීම්, වැරදි සමථයට පත් කිරීම් සහ අනෙකුත් බලාත්මක කිරීම් ඇතුලත් වේ. තවද, පසුගිය වර්ෂය තුල ආවේක්ෂණ, විමර්ශන සහ සුපරීක්ෂණ අංශයන් ශක්තිමත් කරමින් ක්‍රියාකාරී, වැළක්වීමේ සහ විචක්ෂණශීලී ප්‍රවේශයක් තුලින් බලාත්මක කිරීම් සිදු කරන ලදි. උදාහරණයක් ලෙස, ආවේක්ෂණ සහ විමර්ශන අංශයන් විසින් පසුගිය වසර තුල දෛනික ගනුදෙනු හා සම්බන්ධව ආසන්න වශයෙන් අවස්ථා 100 ක් පමණ වාර්තා කල අතර ඒ සම්බන්ධයෙන් අවවාද ලබාදීම්, අනුකූලතා නිළධාරී දැනුවත් කිරීම, මාර්ගගත ගනුදෙනු කිරීමේ පහසුකම අත්හිටුවීම්, හේතු දැක්වීමේ නිවේදන නිකුත් කිරීම් සහ අපරාධ නඩු කටයුතු පැවරීම් යනාදී අයුරින් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ලදි. මෙවැනි ක්‍රියාකාරී පියවරයන්ගේ ඵලදායි බව සනාථ කරමින් පසුගිය වසර තුල වෙළෙඳපොළ විෂමචාරයන්ගේ සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණි.

## රීති සැකසීම

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පන බලාත්මක කිරීමත් සමඟ නව පනතේ ඇති විධිවිධාන ඵලදායී ලෙස බලාත්මක කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ රීති, රෙගුලාසි සහ ප්‍රමිතීන් කෙටුම්පත් කිරීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සිදුකල යුතුව තිබුණි.

ඒ අනුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ ආයතන වන විනිමය ස්ථාන, නිෂ්කාශනාගාර, සහ මධ්‍යම තැන්පතුගාර සඳහා සඳහා අදාළ වන රීතීන් සහ වෙළෙඳපොළ අතරමැදියන් වන ආයෝජන කළමනාකරුවන්, ණය ප්‍රාමාණීකරණ නියෝජිතයන්, ආන්තික සපයන්නන්, කළමනාකරණ සමාගම්, සංස්ථාමය මුල්‍ය උපදේශකවරුන්, ප්‍රතිරක්ෂිතයින්, කොටස් තැරැව්කරුවන් සහ කොටස් වෙළෙන්දන් සඳහා ආදාළ වන රීතීන් කෙටුම් පත්කළ අතර එම රීතින් රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමට අපි කටයුතු කළෙමු. මේ මොහොතේ, මෙම ඉතාමත් වැදගත් කාර්යය සඳහා නායකත්වය ලබාදුන් හිටපු සභාපති විරාජ් දයාරත්න මහතාට මම මගේ කෘතඥතාව පළ කර සිටිමි.

තවද, 2011 වසරේ ඒකක භාර සංග්‍රහය නව සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සංග්‍රහය (CIS Code) සමඟ ප්‍රතිස්ථාපනය කර එය රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදි.

සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සඳහා වූ රීතීන් මඟින් ආයෝජයකයින්ට සහ නිකුත්කරන්නන් ට ප්‍රතිලාභ සැලසෙන පුළුල් පරාසයක විහිදුනා වූ ආයෝජන යෝජනා ක්‍රම පිහිටුවීමේ පහසුකම් සලසා ඇත.

අදාළ වන්නාවූ සියලු පාර්ශවකරුවගේ උපදේශන සහ සමාලෝචන ලබාගැනීමෙන් පසුව මෙම රීතීන් ප්‍රකාශයට පත් කිරීම සිදු කරන ලදි. රීති සම්පාදනය කිරීමේදී උපදේශන ප්‍රවේශයක් අනුගමනය කිරීම ප්‍රාග්ධන වෙළෙඳපොළ පාර්ශවකරුවන්ගේ අන්තර්ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීමට උපකාරී වූ බව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ විශ්වාසයයි.

තවද, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ ආයතන, වෙළෙඳපොළ අතරමැදියන්, ලැයිස්තුගත සමාගම් සහ ආයෝජන යෝජනා ක්‍රම සඳහා අතිරේක සේවා සපයන්නන් වන රක්ෂකයන්, සංඛ්‍යාන න්‍යාය පිලිබඳ විශේෂඥයින්, විගණකවරුන්, භාරකරුවන්, සහ තක්සේරුකරුවන් සඳහා මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නා ලදි.

මෙම රීති සහ මාර්ගෝපදේශ හඳුන්වාදීමේ අරමුණ වනුයේ, ව්‍යාපාර සාධාරණ ලෙස පවත්වාගෙන යාම සහතික කිරීම, ආයෝජකයින්ගේ සුබසිද්ධිය ආරක්ෂා කිරීම සහ පද්ධතිමය අවදානම අවම කිරීම සඳහා වන බව මම සඳහන් කල යුතුමයි. මෙම රීති සහ මාර්ගෝපදේශයන් සියලුම වෙළෙඳපොළ සහභාගීවන්නන්ට ඔවුන්ගේ ක්‍රියාකාරකම් වල නිරත වීමට අවශ්‍ය විශ්වාසය සහ අවශ්‍ය පරිසරය සහතික කරනු ඇත.

**“ඩිජිටල්කරණයත් සමඟ වැඩිදියුණු වූ පහසුව සහ කාර්යක්ෂමතාව තුලින් ප්‍රතිලාභ ලබා ගැනීමට වෙළෙඳපොළට අවස්ථාව ලැබී අතර එය කොටස් වෙළඳපොළ නව මානයකට රැගෙන යාමට අවශ්‍ය මාවත සකස් කරයි. මෙම මුලපිරීම සාර්ථක කරගැනීම සඳහා දරන ලද කැපවීම වෙනුවෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හා කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරු ඒකාබද්ධ කමිටු සාමාජිකයින් සියලුම දෙනාට මම ස්තුති කරමි.”**

## සමස්ථ වෙළෙඳපොළ ඩිජිටල්කරණය

Covid-19 වසංගතය හේතුවන් ශ්‍රී ලංකාව තුල පනවා තිබූ දැඩි සීමා සහ රට වසාතැබීම හමුවේ 2020 වර්ෂය තුල කොටස් වෙළෙඳපොළ දින 52 වැනි කාලයක් වසාතැබීමට සිදුවිය. මෙසේ වසා තැබීමට සිදුවූ ප්‍රධාන හේතුව වූයේ කොටස් වෙළෙඳපොළ තුළ මූලික ක්‍රියාකාරකම් ඩිජිටල් ක්‍රමයට සිදුකිරීමට නොහැකි වීමයි. කොටස් වෙළෙඳපොළ ඩිජිටල්කරණයට මූලිකත්වය ගැනීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පෙළඹවීමට මෙය හේතු විය. කොටස් වෙළෙඳපොළ ඩිජිටල්කරණය අදියර තුනක් යටතේ සිදුවිය. පළමු අදියරයන් දෙක 2022 වර්ෂය තුල අවසන් කිරීමට සමත්වූ අතරම මේ වන විට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හා කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරු ඒකාබද්ධ කමිටුව විසින් එහි තුන්වන එනම් අවසන් අදියරත් සම්පූර්ණ කොට ඇත.

මෙම මුලපිරීම තුලින් කොටස් වෙළෙඳපොළ නව මානයකට රැගෙන ගොස් ඇති බව මම පවසන්නේ ඉතාමත් සතුටකිනි. ඩිජිටල්කරණයේ මූලික සන්ධිස්ථානයක් වනුයේ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ජංගම යෙදුම හඳුන්වාදීමයි. මෙමගින් කොටසී වෙළෙඳපොළ ආයෝජකයින්ගේ ඇඟිලි තුඩක දුරට රැගෙන ගොස් ඇත. තොරතුරු වලට ළඟා වීමේ හැකියාව වැඩිවීම සහ තොරතුරු බෙදාහැරීමේ කාර්යක්ෂමතාව වැඩි වීමේ ප්‍රතිඵලයක් ලෙස කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ආයෝජක පදනම පුළුල් වී ඇත.

ඩිජිටල්කරණයේ තුන්වන අදියර තුල ළඟා වූ ප්‍රධාන සන්ධිස්ථාන වනුයේ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ජංගම යෙදුම තුලින්, කොටස් තැරව්කාර හරහා සමාගම් විදේශීය පුද්ගලයින් ඇතුලත් කරගැනීමේ හැකියාව සහ හුවමාරුවේ ජංගම යෙදුම තුලින් බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් ආයෝජන ගිණුම් විවෘත කිරීමට ඉල්ලුම් කිරීමේ හැකියාව, ඉ-අර්පණ/ප්‍රතිමිලදී ගැනුම්, ඉ-ප්‍රාථමික නිකුතු සඳහා වන වෙබ් පහසුකම සහ ආන්තික ගිණුම් විවෘත කිරීමේ හැකියාවයි. මෙම නව අංගයන් ආයෝජකයින්ට විශාල ආයෝජන අවස්ථා රැසක් නිර්මාණය කර ඇති අතරම ඔවුන්ගේ ආයෝජන බාධාවකින් තොරව ඉකමනින් යොමු කිරීමට උපකාරී වේ.

ඩිජිටල්කරණයත් සමඟ වැඩිදියුණු වූ පහසුව සහ කාර්යක්ෂමතාව තුලින් ප්‍රතිලාභ ලබා ගැනීමට වෙළෙඳපොළට අවස්ථාව ලැබී අතර එය කොටස් වෙළඳපොළ නව මානයකට රැගෙන යාමට අවශ්‍ය මාවත සකස් කරයි.

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

මෙම මුලපිරීම සාර්ථක කරගැනීම සඳහා දරන ලද කැපවීම වෙනුවෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හා කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරු ඒකාබද්ධ කමිටු සාමාජිකයින් සියලුම දෙනාට මම ස්තුති කරමි.

## කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව තුළ මධ්‍යම ප්‍රතිපාර්ශවීය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම

දේශීය කොටස් වෙළෙඳපොළ තුල මධ්‍යම ප්‍රතිපාර්ශවීය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහි සැලකිය යුතු ප්‍රගතියක් ලබාගෙන ඇති බව මම සතුටින් ප්‍රකාශ කරමි. මධ්‍යම ප්‍රතිපාර්ශවීය යාන්ත්‍රණය තුලින් මධ්‍යම ප්‍රතිපාර්ශවීය අවදානම අවම කිරීම සහතික කිරීම මෙන්ම ව්‍යුත්පන්නයන් වැනි නව කොටස් වෙළෙඳපොළ උපකරණ හඳුන්වාදීමට හිතකර පරිසරයක් නිර්මාණය කරනු ලබයි.

මධ්‍යම ප්‍රතිපාර්ශවීය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හා කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව එක්ව ඒකාබද්ධ කමිටුවක් පිහිටුවන ලදි. මෙම ඒකාබද්ධ කමිටුව විසින් මධ්‍යම ප්‍රතිපාර්ශවීය යාන්ත්‍රණය හඳුන්වාදීම සඳහා ප්‍රතිපත්තිමය රාමුව සකස් කරන ලද අතර එය අවසන් කිරීමට ප්‍රථමයෙන් වෙළෙඳපොළ පාර්ශවකරුවන්ගේ අදහස් සහ යෝජනා වෙත යොමු කරන ලදි. පසුව, කොමිෂන් සභාව විසින් ඒම ප්‍රතිපත්ති රාමුව අනුමත කල අතර ව්‍යාපාර වස්තු හුවමාරුව විසින් සැපයුම්කරු සමඟ පද්ධතියේ පිරිවිතර අවසන් කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. 2023 වර්ෂයේ අග වන විට මෙය ක්‍රියාවට නැංවිය හැකි වේ යැයි අපි අපේක්ෂා කරමු.

## නව වෙළෙඳපොළ උපකරණ හඳුන්වාදීම

නිකුත්කරන්නන්ට ඔවුන්ගේ ආයෝජන සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය රැස් කරගැනීමට ආයෝජකයින් සඳහා නව ආයෝජන මාර්ග නිර්මාණය කිරීම ඉතාමත් වැදගත් වේ. මෙම කර්තව්‍ය කඩිනම් කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හා කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව එක්ව ඒකාබද්ධ කමිටුවක් පිහිටුවීවන ලදි.

මෙම ඒකාබද්ධ කමිටුව විසින් නව වෙළෙඳපොළ උපකරණ හඳුන්වාදීම අදියර කිහිපයකට වෙන්කොට ඇත. පළමු අදියර යටතේ, නියාමනය කරන ලද හිඟ වෙළෙඳාම ක්‍රියාත්මක කිරීම, හරිත බැඳුම්කර (Green Bonds)/නිල් බැඳුම්කර (Blue Bonds) හඳුන්වාදීම, ESG දර්ශකය හඳුන්වාදීම, ලැයිස්තුගත සාංගමික ණයකර මත ප්‍රතිවිකුණුම් ගනුදෙනු කිරීම සඳහා OTC වේදිකාවක් හඳුන්වාදීම, සදාකාලික බැඳුම්කර (Perpetual Bonds) හඳුන්වාදීම, ලැයිස්තුගත කිරීමේ රාමුව පුළුල් කරමින් රාජ්‍ය ව්‍යවසාය ආයතන මඟින් නිකුත් කරන ණය/කොටස් සුරැකුම්පත් ලැයිස්තුගත කිරීමට පහසුකම් සැලසීම, ශ්‍රී ලංකාව තුල සංස්ථාපිත ආයතන මඟින් විදේශ මුදල් නමින් නිකුත් කරන ණය සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම සහ ගනුදෙනු කිරීම සඳහා පහසුකම් සැලසීම, අධි ඉපැයුම් සාංගමික ණය සුරැකුම්පත් OTC වේදිකාව හරහා ගනුදෙනු කිරීම සහ ඛර්සෘබ මත පදනවූ වාර්තාකරණ වේදිකාවක් ක්‍රියාත්මක කිරීම යනාදී නව වෙළඳපොළ උපකරණ හඳුවාදෙන ලදි.

ආයෝජක ප්‍රජාවගේ වර්තමාන සහ අනාගත වුවමනා වලට සරිලන ලෙස තිරසාර වෙළෙඳපොළක් ගොඩ නැගීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවධානය යොමු කර ඇත. එබැවින්, තිරසාරත්වය ජනනය කරන වෙළෙඳපොළ උපකරණ සමඟ සැපයුම් අංශය සංවර්ධනය කිරීමට පියවර ගැනීම වැදගත් වේ.

අන් කවරදාටත් වඩා වර්තමානයේ පාරිසරික, සමාජයීය සහ පාලනය මත පදනම් වූ ආයෝජන (ESG investing) පිළිබඳ වැදගත්කම දැනෙන්නන්ට පටන්ගෙන ඇත. ආයෝජකයින් වර්තමානයේ පාරිසරික, සමාජයීය සහ

**"ආයෝජක ප්‍රජාවගේ වර්තමාන සහ අනාගත වුවමනා වලට සරිලන ලෙස තිරසාර වෙළෙඳපොළක් ගොඩ නැගීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවධානය යොමු කර ඇත. එබැවින්, තිරසාරත්වය ජනනය කරන වෙළෙඳපොළ උපකරණ සමඟ සැපයුම් අංශය සංවර්ධනය කිරීමට පියවර ගැනීම වැදගත් වේ."**

පාලනය මත පදනම් වූ ආයෝජන (ESG investing) අනුගමනය කරමින් පවතී. ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව හරිත බැඳුම්කර ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රතිපත්ති රාමුව සහ රීති කෙටුම්පත් කිරීම අවසන් කරන ලදි. හරිත බැදුම්කර වල උප කොටසක් ලෙස සලකන නිල් බැඳුම්කර සඳහා අදාළ වන ප්‍රතිපත්ති රාමුවද අවසන් කොට ඇත. මෙමගින් සංස්ථාපිත සමාගම් වලට සිය හරිත මූලාරම්භයන් සඳහා අරමුදල් රැස් කිරීමට මාර්ග විවෘත වනු ඇත.

## වඩාත් හොඳ ඉදිරියක් සඳහා සහයොගීතාව

ලැයිස්තුගත සමාගම් අතර පාරිසරික, සමාජයීය සහ පාලනය ආශ්‍රිත වූ භාවිතයන් ප්‍රවර්ධනය කිරීම ඉතා වැදගත් වේ. ඒ අනුව එවැනි භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ව්‍යාපාර වස්තු හුවමාරුව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (Institute of Chartered Accountants of Sri Lanka) එකතුව 2022 අගෝස්තු 24 වන දින අවබෝධතා ගිවිසුමකට ඇතුලත් වෙන ලදි. මෙම අවබෝධතා ගිවිසුම සැලසුම් කර ඇත්තේ ආයතන වලට සහ මූල්‍ය වාර්තා හා ආයතනික වාර්තා භාවිත කරන්නන්ට උපකාර වන ඒකාබද්ධ වාර්තාකරණය, යහපාලනය සහ තිරසාරත්වය සහ වෙනත් අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳ එකාබද්ධ දැනුවත් කිරීමක් ලබා දීමයි.

තව දුරටත්, 2022 ජුනි 17 වන දින සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ව්‍යාපාර වස්තු හුවමාරුව සහ වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ සංගමය (Chartered Financial Analyst) එක්ව අවබෝධතා ගිවිසුමකට ඇතුලත් වූ අතර මෙම අවබෝධතා ගිවිසුමට විශේෂිත ලක්ෂණ ගණනාවක් ඇතුලත් වන අතර ආයෝජකයින් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආයෝජකයින් අතර පාරිසරික, සමාජයීය සහ පාලනය මත පදනම් වූ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා සහයෝගීතාවයෙන් කටයුතු කිරීම, ප්‍රාග්ධන වෙළෙඳපොල වෘතිකයින් ඔවුන්ගේ ආයෝජන පර්යේෂණ සහ තක්සේරු ක්‍රියාවලින් සඳහා පාරිසරික, සමාජයීය සහ පාලනය මත පදනම් වූ ආයෝජන හඳුන්වාදීමට දිරිමත් කිරීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොලේ වෘත්තීය ප්‍රමිතීන් සහ අඛණ්ඩතාව පවත්වාගෙන යාම සහතික කිරීම ඒ අතරින් කිහිපයක් වේ.

## බහුපාර්ශවීය සංවර්ධන බැංකු සමඟ සහයෝගීතාවය

ආසියානු සංවර්ධන බැංකුවෙන් රජයට ලැබුනු ප්‍රතිපත්ති මත පදනම්වූ ණයක් මෙන්ම තාක්ෂණික සහය ලබාදෙන වැඩසටහනක් වන ප්‍රාග්ධන වෙළෙඳපොල සංවර්ධන වැඩසටහන (Capital Market Development Program - CMDP) යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට හරිත බැඳුම්කර හඳුන්වාදීම සඳහා නියාමන සහ ප්‍රතිපත්ති රාමුව සැකසීම, කොටස් සමූහ අරමුදල් සැපයීම (Equity

Crowdfunding) සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සංග්‍රහය හඳුන්වාදීම වැනි කර්තව්‍යන් සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලැබිණි. ප්‍රාග්ධන වෙළෙඳපොල සංවර්ධන වැඩසටහන 2022 වර්ෂය තුල අවසන් වූ අතර එය ප්‍රාග්ධන වෙළෙඳපොළ සහභාගීවන්නන්ට විශාල ප්‍රතිලාභ රැසක් අත්කර දුන් බව මම ඉතාමත් තෘප්තියකින් යුක්තව සඳහන් කිරීමට කැමැත්තෙමි.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රධාන නියාමන සහ සංවර්ධන මුලපිරීම් සඳහා මූල්‍ය අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ලෝක බැංකුවෙන් අරමුදල් ලබා ගැනීමට සමත්වුනු අතර මෙම ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුළ අවසන් කරන ලදි. මෙම ව්‍යාපෘතිය වෙළෙඳපොලේ බොහෝ නියාමන සහ සංවර්ධන ප්‍රතිසංස්කරණ රාශියකට මග පෑදූ අතර ආයතනික විශිෂ්ටත්වය වැඩිදියුණු කිරීමට උපකාර විය.

මෙම ව්‍යාපෘති සාර්ථකව අවසන් කිරීමට අපට උපරිම සහයෝගය ලබාදුන් ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව සහ මුදල් අමාත්‍යාංශයයේ අපගේ කේන්ද්‍රීය ස්ථානය වන මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේඛම් ප්‍රියන්ත රත්නායක මහතාට මම ස්තූතිවන්ත වෙමි. කොටස් වෙළඳපොළ ප්‍රමිතීන් ඉහළ නංවාලීම සඳහා ඉදිරියටත් මෙම බහුපාර්ශවීය සංවර්ධන ආයතන සමඟ සමීපව කටයුතු කිරීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අපේක්ෂාවයි.

## දැනුවත්භාවය වැඩිදියුණු කිරීම

ජනතාව අතර ආයෝජන මනෝභාවයක් වර්ධනය කිරීමට අත්‍යවශ්‍ය කාරණාවක් වන්නේ මූල්‍ය සාක්ෂරතාවයයි. ආයෝජන ප්‍රජාව අතර මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීමට සහ වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අඛණ්ඩව කටයුතු කරනු ලබයි. ප්‍රාග්ධන වෙළෙඳපොළ අන්ත්ගතයන් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ජාතික අධ්‍යාපන ආයතනය සමඟ සමීපව කටයුතු කරමින් පවතින අතර එම උත්සාහය මල්ඵල ගන්වමින් 2023 වර්ෂය වන විට 06 ශ්‍රේණියේ සිට 09 ශ්‍රේණිය දක්වා පාසල් විෂය නිර්දේශයට ප්‍රාග්ධන වෙළඳපොළ අන්තර්ගතයන් ඇතුලත් වනු ඇති බවට අපේක්ෂා කරමු. කොටස් වෙළෙඳපොළ අධ්‍යාපනය දියුණු කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගත් වැදගත් පියවරක් ලෙස මෙය සලකනු ලබයි.

## ඉදිරි දැක්ම

ඉදිරි කාලය තුළ යථාර්තවාදී කාල රාමුවක් ඇතිව වැදගත් අංශ කිහිපයක් ඔස්සේ ස්ථිරසාර ප්‍රතිඵල ලබාගැනීම කෙරෙහි අපි දැඩිව අවධානය යොමුකල යුතු බව මම සිතමි.

ඇත්ත වශයෙන්ම, රජයෙන් ලැබෙන සහයෝගය සහ දිරිගැන්වීම් භුක්ති විඳීමට ලැබීම භාග්‍යක් කොට සලකමි. රජය අනුගමනය කරන ප්‍රතිපත්ති වල ස්ථාවරත්වය සහ ඉදිරි දැක්ම හේතුවෙන් අපගේ මෙම ජයග්‍රහණ ලබාගැනීමේ හැකියාව ලැබුණි. එබැවින්, අපට දැක්වූ සහයෝගයට සහ අප කෙරෙහි තැබූ විශ්වාසය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාට සහ මහා භාණ්ඩාගාර ලේඛම් මහින්ද සිරිවර්ධන මහතාට මම මාගේ අවංක කෘතඥතාව පළකර සිටිමි.

හිටපු සභාපති ජනාධිපති නීතීඥ විරාජ් දයාරත්න මහතාගෙන් සහ කොමිෂන් සභාවෙන් නොමඳ සහයෝගය සහ මගපෙන්වීම කෙරෙහි මම කෘතඥ වන අතරම අප කෙරෙහි තැබූ විශ්වාසය පිළිබඳව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සියලුම දෙනා වෙනුවෙන් මම පෞද්ගලිකවම ස්තූතිවන්ත වෙමි.

කීර්තිමත් වෘත්තිකයෙකු වන වත්මන් සභාපති ෆයිසාල් සාලි මහතාගේ දූරදර්ශී උපදේශනය සහ නොමඳ සහයෝගය අප ගන්නා සෑම ඉදිරි පියවරකදීම ඉතා වැදගත් වන අතරම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සියලුම දෙනා වෙනුවෙන් ඔහුට අවංකවම ස්තූතිවන්ත වෙමි. තවද, වර්තමාන කොමිෂන් සභාවේ කීර්තිමත් කොමිෂන් සභා සාමාජිකයන් සියලුම දෙනාට ඔවුන්ගේ නොමඳ සහයෝගයට, වටිනා උපදෙස්වලට, සාමූහික විශේෂඥතාවයට සහ සමහර අවස්ථාවන්හිදී ඔවුන්ගේ පෞද්ගලික සහ වෘත්තීය කාලය අප වෙනුවෙන් කැප කිරීම සම්බන්ධයෙන් මම ස්තූතිවන්ත වෙමි.

කාර්යමණ්ඩලයේ ඉහළ සහභාගීත්වය, කාර්යය සාධනය සහ විශ්වාසය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ ප්‍රධාන සාධකයන් බවට මම තරයේ විශ්වාස කරමි. එමනිසා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මානව ප්‍රාග්ධනය වර්ධනය කිරීමට මම නිරතුරුවම කටයුතු කරමි. අවසාන වශයෙන් මම මාගේ අධ්‍යක්ෂවරුන්ට, ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වයට සහ කාර්යය මණ්ඩලයට විශාල ස්තුතියක් පුදකරන අතරම අපගේ කාර්යයන් සාර්ථක කරගැනීමට ඔවුන්ගෙන් ලැබෙන්නා වූ පූර්ණ සහයෝගය දැකීමට මම වාසනාවන්ත වෙමි.

පෙර අත් නොවිඳි ආර්ථික කඩාවැටීමෙන් පසු, වර්තමානයේ නව උද්යෝග යකින් යුතුව නිවැරදි දිශාවට ඉතා වේගවත්ව ගමන් කිරීමක් මට දක්නට ලැබේ. ප්‍රංශ විප්ලවය ආරම්භයේදී සිටි උද්යෝගිමත් පුද්ගලයින්ට එය පෙනීගිය ආකාරය පිලිබඳ මහා කවි විලියම් වර්ඩ්ස්වර්ත් (William Wordsworth) ඔහුගේ කවියක සඳහන් කරන්නේ "සතුට නම් අළුයමේදී ජීවත් වීමය" ලෙසටය. අපගේ වෙළෙඳපොළ නියාමනය කිරීමේදී අප ගන්නා වූ ප්‍රවේශය නිරන්තර සමාලෝචනයට ලක් කිරීම තුළින් අනුකූල වෙනස්කම් කරමින් අපගේ සාර්ථකත්වය ගොඩනැගීමට මම බලාපොරොත්තු වෙමි.

**"සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමස්තයක් ලෙස රටේ සුරැකුම්පත් වෙළෙඳපොළ වැඩිදියුණු කිරීමට කැපවී සිටියි. "**



**චින්තක මෙන්ඩිස්**
අධ්‍යක්ෂ ජනරාල්
2023 මාර්තු 15

# කොමිෂන් සභා සාමාජිකයින්



ෆයිසාල් සාලි මහතා
සභාපති



මනිල් ජයසිංහ මහතා



සුජීව මුදලිගේ මහතා



ඇන්තනි ෂනිල් ප්‍රනාන්දු මහතා



ඇන්ටන් ගොඩ්ෆ්‍රි මහතා



ආර්. එම්. ජී. රත්නායක මහතා



ඉවෙට් ප්‍රනාන්දු මහත්මිය



සංජීව දිසානායක මහතා



සංජය බංඩාර මහතා

## ෆයිසාල් සාලි මහතා

**සභාපති**

ෆයිසාල් සාලි මහතා 2023 පෙබරවාරි 15 වැනි දින ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නව සභාපතිවරයා ලෙස වැඩ භාර ගන්නා ලදී. ඔහු ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි වාණිජ හා සංවර්ධන බැංකුකරණය පිළිබඳ දීර්ඝකාලීන හා පුළුල් අත්දැකීම් ඇති ප්‍රවීණ විශ්‍රාමික බැංකුකරුවෙකි. ඔහු Grindlays බැංකුව, ANZ බැංකුව, NDB සහ අමානා බැංකුව වැනි ගෝලීය සහ දේශීය බැංකුවල ඉහළ කළමනාකරණ තනතුරු හොබවා ඇත. බැංකු, මූල්‍ය, රක්ෂණ, අරමුදල් කළමනාකරණය, කොටස් තැරැව් කිරීම, නිෂ්පාදනය, වෙළෙඳාම සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍ර වලට අයත් සමාගම් කිහිපයකම අධ්‍යක්ෂ මණ්ඩලවල අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර ඔහු සතු අත්දැකීම් විවිධාකාර වේ.

ඔහු රාජ්‍ය විශ්වවිද්‍යාල අධ්‍යක්ෂ මණ්ඩලවල සහ මූල්‍ය, ආර්ථික කටයුතු, නිවාස සංවර්ධන, ඉදිකිරීම් සහ තෘතීයික අධ්‍යාපනය යන ක්ෂේත්‍රවල රාජ්‍ය සහ රාජ්‍ය නොවන කමිටු කිහිපයකම ද සේවය කර ඇත. එමෙන්ම ඔහු ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ලංකා ක්ලියර් ප්‍රයිවට් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලයේද කටයුතු කර ඇත.

සාලි මහතා බැංකු හා මූල්‍ය පිළිබඳ ආර්ථික විද්‍යා (විශේෂ) පළමු පන්තියේ ගෞරව උපාධියක්, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ මූල්‍ය සාංගමික කාර්යසාධන කළමනාකරණය පිළිබඳ උපාධියක්ද හිමිකරගෙන ඇත. ආයතනික අංශයේ ඔහු සතු පළපුරුද්ද වසර 40 ඉක්මවන අතර, ඉන් වසර 20කට වැඩි කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ ද වසර 14ක් වැඩි කාලයක්, කළමනාකරණ අධ්‍යක්ෂකවරයෙකු /ප්‍රධාන විධායක නිළධාරීයෙකු ලෙසද වසර 30කට වැඩි කාලයක් අධ්‍යක්ෂක මණ්ඩල මට්ටමේ ඇත්දැකීම් ලබා ඇත. ඔහු විවිධ සමාගම්වල විධායක, විධායක නොවන සහ ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩල තනතුරු හොබවා ඇත.

ලාභ අලාභ බෙදාගැනීමේ බැංකු ආකෘතිය මත පදනම්ව ශ්‍රී ලංකාව තුළ පොලී රහිත බැංකුකරණ ක්‍රමය ආරම්භ කිරීම, සංවර්ධනය කිරීම සහ ඉදිරියට ගෙන යාම සහ ශ්‍රී ලංකාවේ ප්‍රථම පොලී රහිත බලපත්‍රලාභී වාණිජ බැංකුව ලෙස අමානා බැංකුව පිහිටුවීම සඳහා ඔහු කැපී පෙනෙන උපායමාර්ගික සහ මෙහෙයුම් නායකත්ව කාර්යභාරයක් ඉටු කළ අතර එහි ආරම්භක කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරියා ද ඔහු විය.

ඔහු දැනට ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ සභාපතිවරයා ලෙස කටයුතු කරන අතර අධ්‍යක්ෂ මණ්ඩල නායකත්වය සහ පාලනය පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවයේ සහතික ලත් පුහුණුකරුවෙකු වන අතර පශ්චාත් උපාධි මට්ටමින් රාජ්‍ය විශ්ව විද්‍යාලවල ව්‍යාපාර උපාය මාර්ග ඉගැන්වීම පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇත.

---

## මනිල් ජයසිංහ මහතා

මනිල් ජයසිංහ මහතා, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයෙකු හා රාජ්‍ය මූල්‍ය හා ගණකාධිකරණය පිළිබඳ වරලත් ආයතනයේ සාමාජිකයෙකි.

ඔහු ශ්‍රී ලංකාව සහ මාලදිවයිනේ Ernst & Young ආයතනයෙහි රාෂ්ට්‍ර කළමනාකාරණ හවුල්කරුවෙකු සහ ඇෂුවරන්ස් සහ බැංකු සහ මූල්‍ය සේවා කටයුතු භාර ප්‍රධානී ලෙස කටයුතු කරන අතර වසර 40කට වැඩි පෘතුල පළපුරුද්දක් ඇති අයෙකු වේ.

වර්තමානයේදී ඔහු ;

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හිටපු සභාපති හා කවුන්සිල සාමාජිකයකු වශයෙන්,
- ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපති ලෙස, ව්‍යවස්ථාපිත විගණන කමිටුවේ සාමාජිකයකු සහ තවත් බොහෝ කමිටුවල සාමාජිකයකු ලෙස,
- දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපති ලෙස,
- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස,
- ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ කවුන්සිල සාමාජිකයෙකු ලෙස,
- ලැයිස්තුගත සමාගම්වල විගණන කමිටුවල උපදේශකවරයෙකු ලෙස සේවය කරයි.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ විභාග කමිටුවේ සභාපති, පසුගිය වසරවලදී ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ විකල්ප සභාපති, ජාත්‍යන්තර ගණකාධිකාරී සම්මේලනයේ, ජාත්‍යන්තර ගිණුම්කරණ අධ්‍යාපන ප්‍රමිති මණ්ඩලයේ සාමාජිකයකු සහ මොරටුව විශ්වවිද්‍යාලයේ කවුන්සිල සාමාජිකයෙකු ලෙස සේවය කර ඇත.

---

## සුජීව මුදලිගේ මහතා

මුදලිගේ මහතා වරලත් ගණකාධිකාරීවරයෙකු ලෙස වසර 30කට වැඩි පළපුරුද්දක් ඇති අයෙකි. ඔහුගේ සුදුසුකම් වන්නේ FCA (ICA - SL), FCMA (CIMA - UK), FCCA (ACCA - UK) සහ FCPA (CPA - Australia) ය.

වත්මන් පත්වීම්:

ඔහු PwC, Sri Lanka හි කළමනාකාර හවුල්කරු සහ වෙළෙඳ සේවා අර්ථසාධක සංගමයේ (MSPS) විධායක නොවන සභාපති වශයෙන් කටයුතු කරයි. ඔහු එන් ඩී බී බැන්ක් පී එල් සී, සී අයි සී හෝල්ඩිංග්ස් පී එල් සී, සී අයි සී ෆීඩ්ස් සමූහය, එන් එස් බී එම් හරිත විශ්වවිද්‍යාලය, ලින්ක් නැචුරල් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ්, ෂර්වුඩ් කැපිටල් සහ අයිඩියල් ෆයිනෑන්ස් ලිමිටඩ්හි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ද වේ. ඔහු ලංකා වාණිජ මණ්ඩල කමිටු සාමාජිකයෙකි. .

පසුගිය පත්වීම්:

මුදලිගේ මහතාට රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම ආයතනවල විගණන කමිටු සභාපතිවරයකු ලෙස අත්දැකීම් බහුලය. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (ICASL) සහ ආසියා පැසිෆික් ගණකාධිකාරීවරුන්ගේ (CAPA) ආයතනයේ හිටපු සභාපතිවරයෙකු වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ කවුන්සිල සාමාජිකයකු සහ එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයේ - ශ්‍රී ලංකා අංශයේ පාලක මණ්ඩල සාමාජිකයෙකු ලෙසද, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙසද (2010-2011), සහ ඔහුගේ වෘත්තීය කාලය තුළ දේශීය හා ගෝලීය වශයෙන් එවැනි තවත් තනතුරු කිහිපයක් දරා තිබේ.

ඔහු 2012 සිට 2019 දක්වා හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී (HNB) හි විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ද විය. ඔහු මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශක කමිටුවේ නියෝජ්‍ය සභාපතිවරයෙකු

# කොමිෂන් සභා සාමාජිකයින්

ලෙසත්, ජාතික ආර්ථික සභාවට උපදෙස් දීම සඳහා වන උපදේශක කමිටු සාමාජිකයෙකු ලෙසත් සහ අසාර්ථක බලපත්‍රලාභී මූල්‍ය සමාගම් පුනර්ජීවනය සඳහා වූ උපදේශක කමිටුවෙහි සමාජිකයකු ලෙසත් කටයුතු කර ඇත.

## ඇන්තනි ශනිල් ප්‍රනාන්දු මහතා

ශනිල් මහතා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ (ICC Sri Lanka) සභාපතිවරයා වේ. ඔහු තිරසාර සංවර්ධන මූල්‍යකරණ ව්‍යාපෘතියේ ICC-UNESCAP හි සභාපතිධුරය සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) අනුමත තෙවන පාර්ශවීය (3PL) ගබඩා සැපයුම් දාම කළමනාකරණ සමාගමක් වන Asian Logistics Park Pvt Ltd හි සභාපති ධුරය හොබවන අතර බහුජාතික සමාගම් සඳහා ස්ථාන 3 ක BOI අනුමත ගබඩා පහක් හිමිකාරීත්වය දරමින් කළමනාකරණය කරයි. ජාත්‍යන්තර භාණ්ඩ ප්‍රවාහන NVOCC සහ ට්‍රක් රථ සමාගම් සහ දේශීය හා බහුජාතික සමාගම් සඳහා සැපයුම් දාම කළමනාකරණය හැසිරවීමේ Gold Card Customs House හී නියෝජිත ලෙස කටයුතු කරන වර්ල්ඩ් එක්ස්ප්‍රස් (CMB) ප්‍රයිවට් ලිමිටඩ්හී සභාපතිවරයාද වේ. එමෙන්ම ඔහු, දේශීය හා විදේශීය සමාගම්වලට සේවා සපයන සමාගම් ලේකම්වරුන්ගේ සමාගමක් වන AFA කෝපරේට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්හි සභාපති සහ Air & Sea Logistics (Pvt) Ltd හි සභාපතිවරයාද වේ.

ශනිල් මහතා නීතිඥයෙක්, බේරුම්කරුවෙක්, නොතාරිස්වරයෙක්, දිවුරුම් කොමසාරිස්වරයෙක් සහ ලියාපදිංචි සන්නාම නියෝජිතයෙක් සහ සමාගම් ලේකම්/ ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් ද වේ. ඔහු Anton Fernando Associates නීති ආයතනයේ හවුල්කරුවකුද වේ. ශනිල් මහතා ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් ප්‍රථම පන්තියේ ගෞරව උපාධියක් සහ වාණිජ නීතිය පිළිබඳ ත්‍යාගයක් ලබා ඇති අතර ඔහු මහපොළ කුසලතා විශාරදයෙකි. ඔහු ඔහුගේ සොලිසිටර් (එංගලන්තය සහ වේල්ස්) විභාග ද සම්පූර්ණ කර ඇත. ශනිල් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් (PIM) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර "වෙළෙඳාම සහ ප්‍රවාහනය පහසු කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික දත්ත හුවමාරුව භාවිතය" පිළිබඳ ඔහු පර්යේෂණ අධ්‍යයනයන් සිදුකර ඇත. ශනිල් ලන්ඩන් විශ්ව විද්‍යාලයේ ක්වීන් මේරි විද්‍යාලයේ ආයතනික නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය, පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්වයක් (මේ වන විට චෙව්නිත් ලෙස හැඳින්වේ) ලබා ඇති අතර ඇමරිකා එක්සත් ජනපදයේ ටෙක්සාස් විශ්ව විද්‍යාලය සහ කැනඩාවේ ප්‍රින්ස් එඩ්වඩ් අයිලන්ඩ් විශ්ව විද්‍යාලය සහ ජපානය තුළද පශ්චාත් උපාධි හදාරා ඇත.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ වෘත්තීය සංගමයේ පශ්චාත් උපාධි ආයතනයේ ජයග්‍රහණ සම්මානයෙන් පිදුම් ලැබූ අයෙක් වන අතර PIM වෘත්තීය සංගම් පදනමේ භාරකරුවෙකි. ශනිල් මහතා සිංගප්පූරු බේරුම්කරුවන්ගේ ආයතනයේ (MSiArb) සාමාජිකයෙකු වන අතර බේරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකි.

ශනිල් මහතා පැරිස් හි ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ ශ්‍රී ලංකාවේ බේරුම්කරණයට ද පෙනී සිට ඇත. ශානිල් මහතා පැරීසියේ ICC ඇකඩමියේ ජාත්‍යන්තර කොන්ත්‍රාත් සහ බේරුම්කරණය පිළිබඳ පුහුණු පාඨමාලා හදාරා ඇත. ශනිල් මහතා ආයතනික පාලනය පිළිබඳ සහතිකලත් පුහුණුකරුවෙකු වන අතර ලන්ඩනයේ ආයතනික පාලනය සඳහා වන පොදුරාජ්‍ය මණ්ඩලීය සංගමය වෙතින් පුහුණුව ලබා ඇත. ඔහු ජාත්‍යන්තර වෙළෙඳාම සහ බහුවිධ ප්‍රවාහන පහසුකම් පිළිබඳ UNESCAP හි පුහුණුකරුවෙකු හා සම්පත් දායකයකු ලෙස කටයුතු කර ඇත.

ඔහු අර්ධ වශයෙන් සුදුසුකම් ලත් ගණකාධිකාරීවරයෙකි, කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයේ CIMA ලන්ඩන් විභාගවල සමහර කොටස් සම්පූර්ණ කර ඇත. ශනිල් මහතා බේරුම්කරණය සහ ADR පිළිබඳ ICC කොමිසමේ කාර්ය සාධක බලකායේ සාමාජිකයෙකි. ඔහු බොහෝ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලවල සම්මන්ත්‍රණ සහ විදේශයන්හි වැඩමුළුවල විද්වත් මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇත. ජපානයේ ටෝකියෝ හි දකුණු ආසියානු ආයතනික කළමනාකරණය පිළිබඳ පුහුණුව ලැබීම සම්බන්ධව ඔහුට AOTS සාමාජිකත්වය ද පිරිනමන ලදී.

කොළඹ කොටස් හුවමාරුවේ හිටපු ස්වාධීන නම් කරන ලද අධ්‍යක්ෂ සහ බේරුම්කරණ හා විනය කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කර ඇති අතර ආරවුල් විසඳීමේ කමිටුව, අවදානම් සහ විගණන කමිටුව, අලෙවිකරණ සහ රීති කමිටුව යන කමිටුවල සාමාජිකයෙකු විය. සීමාසහිත කොළඹ කොටස් හුවමාරුවේ මධ්‍යම තැන්පතු පද්ධති (CDS) හි හිටපු ස්වාධීන නම් කරන ලද අධ්‍යක්ෂ, සහ සීමාසහිත නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ්හි ස්වාධීන අධ්‍යක්ෂවරයාද වේ. ශනිල් මහතා නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) සහ පැලියගොඩ තොග ගබඩා සමාගමේ හිටපු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. ශ්‍රී ලංකා රජය සතු සේවක භාරකාර අරමුදලේ (ETF) ආයෝජන කමිටුවේ නම් කරන ලද සාමාජිකයෙකි.

ශනිල් මහතා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ (BASL), ආයතනික නීතිඥ සංගමයේ සහ වෘත්තීය සංගම් ආයතනයේ (OPA) යාවජීව සාමාජිකයෙකු වන අතර, ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ (SLID) සාමාජිකයෙකි. ඔහු සාංගමික නීතිය, බේරුම්කරණය, සංගමික අනුකූලතාවය, ගිවිසුම් සහ ගැටුම් නිරාකරණය සහ සැපයුම් දාම කළමනාකරණය යන ක්ෂේත්‍රවල බාහිර සම්පත් දායකයෙකු ලෙසද සේවය කරයි. ඇන්තනි එම් ශනිල් ප්‍රනාන්දු මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) කළමනාකරණ පශ්චාත් උපාධි වෘත්තීය සංගමයේ ආදි ශිෂ්‍ය සංගමයේ හිටපු සභාපතිවරයා විය.

## ඇන්ටන් ගොඩ්ෆ්‍රී මහතා

ඇන්ටන් ගොඩ්ෆ්‍රි මහතා ඇග්සා ග්ලෝබල් සහ AG ඉන්ටර්නැෂනල්හි නිර්මාතෘ/විධායක සභාපතිවරයා වේ. එමෙන්ම ඔහු සමාගමේ ගෝලීය ව්‍යාපාරික කාර්යයන්හි සීමා පුළුල් කිරීම් සම්බන්ධයෙන් ඉදිරියෙන් සිටින ව්‍යාපාරික දක්ෂතාවයෙන් යුත් කීර්තිමත් ව්‍යවසායකයෙකි. ඔහු වෘත්තීයභාවයේ ඉහළම ප්‍රමිතීන් රකිමින් සියලුම පාර්ශවකරුවන් සම්බන්ධයෙන් වගකීම් පවත්වාගෙන යනු ලබයි.

ජයග්‍රහණ ඉලක්ක කරගත්, නවෝත්පාදනය කෙරෙහි අවධානය යොමු කර, පවතින ව්‍යාපාර ජාලයන් තවදුරටත් ව්‍යාප්ත කිරීමට දිරිගැන්වීම සඳහා ඔහු කැපවී සිටී. ඔහුගේ දැක්ම සහ නව්‍යතාවයන් හේතුවෙන්, වෙළෙඳාම, බලශක්තිය, රසායනික ද්‍රව්‍ය, පල්ප් සහ කඩදාසි, තාක්ෂණය, ආයතනික පාරිභෝගික සේවා සහ බාහිරින් ලබා ගැනීමේ අංශවල ලෝකයේ ප්‍රමුඛතම සන්නාම කිහිපයක් ඇග්සා ග්ලෝබල් සහ AG ඉන්ටර්නැෂනල් නියෝජනය කරයි.

ඇග්සා ග්ලෝබල් ආයතනයට අනුබද්ධ ආයතන ශ්‍රී ලංකාව, ඉන්දියාව, සිංගප්පූරුව සහ ඕස්ට්‍රේලියාව යන රටවල පිහිටා ඇති අතර ප්‍රධාන ජාල ආසියාව, යුරෝපය, උතුරු ඇමරිකාව සහ අප්‍රිකාව පුරා විහිදේ. බාහිර විදේශීය පොදු ලැයිස්තුගත කිරීම් ඇතුළු හවුල් ව්‍යාපාර ලෙස Fonte Resources, Fusionex, පෙන්වාදිය හැකිය. ඔහුගේ ජයග්‍රහණ අගයමින් ගොඩ්ෆ්‍රි මහතාට APEA 2013 හි විශිෂ්ට ආසියා පැසිෆික් ව්‍යවසායකත්ව සම්මානය හිමි විය.

ඔහු එංගලන්තයේ වරලත් කළමනාකරණ ආයතනයට අනුබද්ධ වරලත් අලෙවිකරුවෙකු වන අතර එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ සහ ඕස්ට්‍රේලියානු කළමනාකරණ ආයතනයෙහි සාමාජිකයෙකි. ඔහු එංගලන්තයේ Leicester විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් ද ලබා ඇත. ඇන්ටන් ගොඩ්ෆ්රි මහතා ශ්‍රී ලංකාවේ සහ ඕස්ට්‍රේලියාවේ වාණිජ මණ්ඩලය ඇතුළු ජාත්‍යන්තර වෙළෙඳ කවුන්සිලයන්හී ක්‍රියාකාරීව සම්බන්ධ වී ඇත.

ඔහු වියට්නාමයේ ශ්‍රී ලංකා ව්‍යාපාරික කවුන්සිලයේ, ලංකා වාණිජ මණ්ඩලයේ ඉන්දුනීසියාවේ ශ්‍රී ලංකා ව්‍යාපාරික කවුන්සිලයේ සහ කලම්බු අප්ටවුන් හි රොටරි සමාජයේ හිටපු සභාපතිවරයා වන අතර 2015-2019 අතර කොළඹ කොටස් හුවමාරුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ද සේවය කර ඇත.

## ආර්.එම්.පී. රත්නායක මහතා

ආර්.එම්.පී. රත්නායක මහතා ශ්‍රී ලංකා සැලසුම් සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන අතර දැනට මුදල් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ලෙස කටයුතු කරයි. ඔහු වසර 29 කට ආසන්න කාලයක් විවිධ වැදගත් තනතුරු දරමින් රාජ්‍ය සේවයේ යෙදී සිටී. රත්නායක මහතා නෝර්වේ කෘෂිකාර්මික විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ඇත.

1994 දී රාජ්‍ය සේවයට බැඳුණු ඔහු මහා භාණ්ඩාගාරයට අනුයුක්තව කටයුතු කරමින් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ හා බාහිර සම්පත් දෙපාර්තමේන්තුවේ (ERD) තනතුරු ගණනාවක් දරා ඇත. සංවර්ධන සැලසුම්කරණය සහ අයවැය සැකසීම සම්බන්ධයෙන් ඔහුට පුළුල් අත්දැකීම් තිබේ. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ඔහු සංවර්ධන හවුල්කරුවන්, ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ සමඟ එක්ව රටකට සුවිශේෂී වූ සංවර්ධන වැඩසටහන් දියත් කිරීම සහ විදේශ මූල්‍යකරණය, ද්විපාර්ශ්වික සාකච්ඡා මෙහෙයවීම සහ බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා විදේශ මූල්‍ය කාලීනව යෙදවීමට පහසුකම් සැලසීම සඳහා ඔහු වගකීම් දරා ඇත.

රත්නායක මහතා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා ලෙස කටයුතු කිරීමට අමතරව, ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB), ලංකා බැංකුවේ සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි. ඔහු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපති, මහජන බැංකුවේ අධ්‍යක්ෂ, වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) කළමනාකරණ මණ්ඩලයේ සාමාජික, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ (SPC) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ, ජාතික වෛද්‍ය නියාමන අධිකාරියේ සාමාජිකයකු ලෙස තවත් වැදගත් නායකත්ව තනතුරු රැසක් දරා ඇත.

## ඉවෙට් ප්‍රනාන්දු මහත්මිය

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ශ්‍රී ලංකා මහ බැංකුව
ඉවෙට් ප්‍රනාන්දු මහත්මිය දැනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරිය ලෙස කටයුතු කරන අතර මූල්‍ය පද්ධති ස්ථායිතා අංශය භාරව කටයුතු කරයි. බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල අධීක්ෂණය සහ නියාමනය, මූල්‍ය පද්ධති ස්ථායිතාව, විදේශ විනිමය කළමනාකරණය, මුදල් කළමනාකරණය, ගෙවීම් සහ පියවීම් යනාදී ක්ෂේත්‍රවල මහ බැංකුවේ වසර 30 කට වැඩි සේවා කාලයක් ඇය සතුය. මෙම කාලසීමාව තුළ ප්‍රනාන්දු මහත්මිය බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ සහ විනිමය පාලකවරිය ලෙස කටයුතු කර ඇති අතර ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ ආචාරධර්ම භාවිතයන්ට අනුකූලව බැංකු සඳහා ශක්තිමත් නියාමන රාමුවක් ක්‍රියාත්මක කිරීමට නායකත්වය ලබා දෙමින් මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට දායක වීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. වර්තමානයේ ඇය බැංකු අධීක්ෂණය, බැංකු නොවන අධීක්ෂණ, ගෙවීම් සහ පියවීම්, මුදල්, විදේශ විනිමය, මුදල්, ප්‍රාදේශීය සංවර්ධන සහ සේවක අර්ථසාධක අරමුදල යන දෙපාර්තමේන්තු භාරව කටයුතු කරයි.

ප්‍රනාන්දු මහත්මිය දැනට මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුවේ, ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය සඳහා සැළසුම් ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කමිටුවේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාතික ගෙවීම් කවුන්සිලයේ, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යංශයේ සභාපතිනිය ලෙස සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

ප්‍රනාන්දු මහත්මිය කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් ලබා ඇත.

## සංජීව දිසානායක මහතා

සංජීව දිසානායක මහතා 1997 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු ලෙස ඇතුළත් කර බඳවා ගන්නා ලදී. ඔහු හොංකොං විශ්ව විද්‍යාලයෙන් මානව හිමිකම් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (LL.M) ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුවට අනුයුක්ත නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයෙකු වන අතර දැනට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස රාජකාරී කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව (PSC) විසින් නිදහස් කර ඇත.

සංජීව දිසානායක මහතා නීතිපති දෙපාර්තමේන්තුවේ අපරාධ සහ සිවිල් යන දෙඅංශයේම අත්දැකීම් ඇති අතර 2010 පෙබරවාරි සිට 2011 ජූලි දක්වා දූෂණයට එරෙහි ෆීජි ස්වාධීන කොමිෂන් සභාවේ අභිචෝදකයෙකු ලෙස සේවය කර ඇත. ඔහු ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ නිල බලයෙන් පත් වූ සාමාජිකයෙකි.

## සංජය බණ්ඩාර මහතා

FCA, MBA (Col.) B.Sc ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය (USJP)

බණ්ඩාර මහතා, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති සහ ආසියානු පැසිෆික් ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ (CAPA), දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි.

ඔහු වරලත් ගණකාධිකාරී ආයතනයක් වන බී ආර් ද සිල්වා ඇන්ඩ් කම්පනිහි, (නෙක්සියා ඉන්ටර්නැෂනල්හි සාමාජික ආයතනයක්) හවුල්කරුවෙකු වන අතර ඇෂුරන්ස් සේවා සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳව වසර 24 කට වැඩි ප්‍රායෝගික පළපුරුද්දක් ලබා ඇත්තෙකි.

# අධ්‍යක්ෂකවරුන්, අධ්‍යක්ෂකවරියන්, සහකාර අධ්‍යක්ෂකවරුන් සහ සහකාර අධ්‍යක්ෂකවරියන්



**වමේ සිට දකුණට:** ජී. එච්. නිරෝෂා කොඩිකාර - අධ්‍යක්ෂ, මුදල් හා පරිපාලන, තුෂාර ජයරත්න - අධ්‍යක්ෂ, බාහිර සම්බන්ධතා සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන සහ වැඩ බලන අධ්‍යක්ෂ, මානව සම්පත්, ජූඩ් නානායක්කාර - අධ්‍යක්ෂ, නීති සහ බලාත්මක කිරීම්, ප්‍රභාෂ් වනිගතුංග - අධ්‍යක්ෂ, ආවේක්ෂණ සහ වැඩ බලන අධ්‍යක්ෂ, ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන, සුනෙත් පෙරේරා - සහකාර අධ්‍යක්ෂ, අධීක්ෂණ, දිලුම් මහවත්ත - අධ්‍යක්ෂ, අධීක්ෂණ, මධුගයානි බලපිටිය - සහකාර අධ්‍යක්ෂ, විමර්ශන සහ තොරතුරු තාක්ෂණ

**වමේ සිට දකුණට අසුන්ගෙන:** චින්තක මෙන්ඩිස් - අධ්‍යක්ෂ ජනරාල්, මනුරි වීරසිංහ - වැඩබලන අධ්‍යක්ෂ, සාංගමික කටයුතු, ඩී.එම්.ජී. ප්‍රියන්ත - සහකාර අධ්‍යක්ෂ, විමර්ශන

**නොපැමිණි:** ධම්මික පෙරේරා - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනියන්



**වමේ සිට දකුණට:** රන්මිණි ජයතිලක - ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, තොරතුරු තාක්ෂණ, ෂර්මිලා පණ්ඩිතරත්න - ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, නීති සහ බලාත්මක, සෞමි කොඩිප්පිලි- ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, අධීක්ෂණ, සජීවනී බක්මීදෙණිය - ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන

# කළමනාකරුවන්/කළමනාකාරිනියන්



**වමේ සිට දකුණට සිටගෙන:** ෂීනා ගුණරත්න- කළමනාකාරිනී, බාහිර සම්බන්ධතා, තක්ෂිලා ෆ්‍රැන්සිස් - කළමනාකාරිනී, ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන, මේකලා ජයපාල- කළමනාකාරිනී, සාංගමික කටයුතු ,පී.එම්. නිරෝෂිකා උදයංගනී - කළමනාකාරිනී, නීති හා බලාත්මක කිරීම්, නිමල් කුමාරසිංහ- කළමනාකාරු, බාහිර සම්බන්ධතා, අනුලා විජේසිංහ-කළමනාකාරිනී, විමර්ෂන,

**වමේ සිට දකුණට අසුන්ගෙන:** වමේ සිට දකුණට අසුන්ගෙනඃ ලක්ෂ්මි වික්‍රමනායක - කළමනාකාරිනී, මූල්‍ය හා පරිපාලන, ආර්. කේ. වසන්ත සුනිමල්- කළමනාකාරු විමර්ශන, අශෝකා කේ. දයාරත්න- කළමනාකාරිනී, මානව සම්පත්

**නොපැමිණි:** මංජුලා චන්ද්‍රරත්න - කළමනාකරිනී, අධීක්ෂණ

# කාර්ය මණ්ඩලය

## සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ කාර්යාලය



**වමේ සිට දකුණට:** ක්‍රිෂාන්ති මුතුතන්ත්‍රිගේ, ෂමිල්කා කරුණානායක, චින්තක මෙන්ඩිස්, රසික වල්පිටගම, එස්.ඒ.කේ. රාධා ජී. ප්‍රතිභා, කවීෂා කුඹුකගේ

**නොපැමිණි:** නිශෝකා ජයතුංග

## ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අංශය



**වමේ සිට දකුණට සිටගෙන:** නිම්තරා ඩී අමරසේකර, ඩී කේ අයි මල්ෂානි දහනායක, ඔලිවි සෝලංගආරච්චි

**වමේ සිට දකුණට අසුන්ගෙන:** ප්‍රභාෂ් වනිගතුංග, තක්ෂිලා ෆ්‍රැන්සිස්

## සාංගමික කටයුතු අංශය



**වමේ සිට දකුණට සිටගෙන:** සමන්ති ගුණවර්ධන, මේරියන් ග්ලෙන්ඩා සන්දනම්, කේ.ඒ.ඩී. සේමිණි දයනිකා, ලක්ෂ්මි අතපත්තු

**වමේ සිට දකුණට අසුන්ගෙන:** ශානිකා ගුණසිංහ, මනුරි වීරසිංහ, මේබලා ජයපාල

**නොපැමිණි:** තනිෂ්ක තිලකරත්න

## බාහිර සම්බන්ධතා සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන



**වමේ සිට දකුණට සිටගෙන:** රවීෂා දේවින්දි ද සිල්වා, නිමල් කුමාරසිංහ, ෂීනා ගුණරත්න, ජුලී අලගකෝන්, එම්.ජී. හංසනී මධුෂා

**වමේ සිට දකුණට අසුන්ගෙන:** තුෂාර ජයරත්න, කේ.වී.උෂානි එන්. සමරවික්‍රම, එම්.ඉම්රාන් අහමඩ්, සජීවනී බක්මීදෙණිය

# කාර්ය මණ්ඩලය

## මුදල් සහ පරිපාලන අංශය



**වමේ සිට දකුණට:** එස්.ඩී. ධර්මසිරි, සකුන්තලා දේවි, එම්.ඒ. සඳරුවන් විජේරත්න, චන්ද්‍රන් නාගේන්ද්‍රන්, ඩබ්ලිව්. ආරියරත්න, දුලාරි මුහන්දිරම්, වාසනා සංජීවනී කුරේ, ඒ.සී. ඩයස්, ඩී. පැතුම් නිරෝෂණ, පී.ඩබ්ලිව්.එල්. පියතිස්ස

**වමේ සිට දකුණට අසුන්ගෙන:** ඈන් ක්‍රිෂාන්ති ප්‍රනාන්දු, ජී.එච්. නිරෝෂා කොඩිකාර, ප්‍රීතිකා තිලක්ෂි පෙරේරා, ලක්ෂ්මි වික්‍රමනායක

**නොපැමිණි:** වයි.ඩී. සඳමාලි, බුද්ධික බලපිටිය, සමිත් ප්‍රේමරත්න

## මානව සම්පත් අංශය



**වමේ සිට දකුණට සිටගෙන:** ජේ. කේ. ප්‍රියදර්ශනී, තුෂාර ජයරත්න

**වමේ සිට දකුණට අසුන්ගෙන:** අශෝක කේ. දයාරත්න, ධනේෂා රාජපුර

## නීති සහ බලාත්මක අංශය



**වමේ සිට දකුණට සිටගෙන:** උදානි කේ. වික්‍රමරත්න, මිනෝලි පියුමිකා රත්නායක, බුද්ධිනී හේරත්, ටී. රවින්දි ද සිල්වා, සී. එරන්දතී වෛද්‍යසේකර

**වමේ සිට දකුණට අසුන්ගෙන:** පී.එම්. නිරෝෂිකා උදයංගනී, ජූඩ් නානායක්කාර, ෂර්මිලා පණ්ඩිතරත්න

**නොපැමිණි:** කුමාරි සිරිවර්ධන

## ආවේක්ෂණ අංශය



**වමේ සිට දකුණට සිටගෙන:** එච්.එම්. පී. නවෝද්‍යා දිසානායක, ප්‍රභාෂ් වනිගතුංග, දශංක වර්ණකුලසූරිය, රන්දික සිල්වා

**වමේ සිට දකුණට අසුන්ගෙන:** නිලංජනා සිවාජි, ගංගා ද කොස්තා

# කාර්ය මණ්ඩලය

## විමර්ශන අංශය



**වමේ සිට දකුණට සිටගෙන:** ප්‍රියන්ත හේරත්, ආර්. කේ. වසන්ත සුනිමල්, ඩබ්ලිව්. අනුෂ්ක සී පෙරේරා, ඩබ්ලිව්. ඩබ්ලිව්. එම්. රාධිකා එච්. වීරකෝන්, ජී. ඩී. කපිල කුමාර

**වමේ සිට දකුණට අසුන්ගෙන:** අනුලා විජේසිංහ, මධුගයනි බලපිටිය, ඩී. එම්. ජී. ප්‍රියන්ත

**නොපැමිණි:** පී.ජී.එන්. අශානි ෆොන්සේකා, මනීෂා සෙනරතාරච්චි

## තොරතුරු තාක්ෂණ අංශය



**වමේ සිට දකුණට:** රන්මිණි ජයතිලක, චමිත් විජේතුංග, මධුගයනි බලපිටිය

## අධීක්ෂණ අංශය



**වමේ සිට දකුණට සිටගෙන:** දිලුම් මහවත්ත, දිනුෂි උඩකුඹුර, නොමානි සෙනෙවිරත්න, පූර්ණි වීරසේකර, රසාංගි දිසානායක, කෞශල්‍යා ගුණවර්ධන

**වමේ සිට දකුණට අසුන්ගෙන:** සචිත්‍ර වරුසවිතාන, සෞමි කොඩිප්පිලි, සුනෙත් පෙරේරා

**නොපැමිණි:** මංජුලා චන්ද්‍රරත්න, සුදාරා වීරක්කොඩි, චමිලා එස්. කරුණාරත්න

# වසරේ විශේෂ අවස්ථාවන් සහ ඡායාරූප එකතුවක්




ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ ඩිජිටල්කරණය කිරීමේ තුන්වන අදියර දියත් කරමින් විශේෂ වෙළෙඳ පොළ විවෘත කිරීමේ උත්සවයක්



මූල්‍ය සාක්ෂරතා දිනය සමරමින් කොටස් වෙළෙඳපොළ සීනුව නාද කිරීම



එක්සත් රාජධානියේ මූල්‍ය මෙහෙයුම් අධිකාරියේ නිලධාරීන් සමඟ පැවති සාකච්ඡාව



ඕමාන වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ ව්‍යාපාරික නියෝජිත කණ්ඩායම සමඟ පැවති සාකච්ඡාව



ගාල්ල ආයෝජක දින වැඩසටහන



යාපනය ආයෝජක දින වැඩසටහන




විදේශ අරමුදල් කළමනාකරුවන් සඳහා ලන්ඩන් කොටස් හුවමාරු සමූහයේ පැවති ආයෝජක සමුළුව



ශ්‍රී ලාංකික විදේශික ප්‍රජාව සඳහා එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ පැවති ආයෝජක සම්මන්ත්‍රණය



පාසල් සිසුන් සඳහා පැවති සම්මන්ත්‍රණයක්

# වසරේ විශේෂ අවස්ථාවන් සහ ඡායාරූප එකතුවක්



මොණරාගල අධ්‍යාපන කලාපයේ ගුරුභවතුන් සඳහා පැවති එක් දින ගුරු පුහුණු වැඩසටහනක්



කැළණිය විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් සඳහා පැවති සම්මන්ත්‍රණයක්



දෙමළ මාධ්‍ය පාසල් සිසුසිසුවියන් සඳහා පැවිති සම්මන්ත්‍රණයක්



කුරුණෑගල ආයෝජන සම්මන්ත්‍රණය



ශ්‍රී ජයවර්ධන විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් සඳහා පැවති සම්මන්ත්‍රණයක්

# සංවර්ධනය



# දිරිමත් කිරීම

# මෙහෙයුම් සමාලෝචනය

**"2021 අංක 19 දරන නව සුරැකුම්පත සහ විනිමය කොමිෂන් සභා පනත මගින් හඳුන්වා දී ඇති නියාමන අවශ්‍යතා අනුව, බලපත්‍ර ලබා දීම යනු අදියර දෙකක ක්‍රියාවලියක් වන අතර එහිදී අයදුම්කරුවන්ට නියාමනය කරන ලද ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්‍රියාකාරකම්වල නිරත වීමට බලපත්‍රය ලබා දීම සඳහා මූලික අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රථමයෙන් ඉල්ලුම් කළ හැකි අතර, වැඩිදුර අවශ්‍යතා සපුරාලීමෙන් පසු අවසාන අනුමැතිය ලබා ගැනීමට හැකියාව ඇත."**

## නියාමනය

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමන ප්‍රවේශය, ප්‍රමාණවත් රෙගුලාසි සමඟ වෙළෙඳපොළ හැසිරීම හැඩගැස්වීමෙන් ආයෝජකයින් ආරක්ෂා කිරීම අරමුණු කරන අතර අනෙක් අතට එය සංවර්ධනය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමට ප්‍රමාණවත් පෙළඹවීමක් ලබා දෙයි.

## බලපත්‍ර ලබා දීම

2021 අංක 19 දරන නව සුරැකුම්පත සහ විනිමය කොමිෂන් සභා පනත මගින් හඳුන්වා දී ඇති නියාමන අවශ්‍යතා අනුව, බලපත්‍ර ලබා දීම යනු අදියර දෙකක ක්‍රියාවලියක් වන අතර එහිදී අයදුම්කරුවන්ට නියාමනය කරන ලද ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්‍රියාකාරකම්වල නිරත වීමට බලපත්‍රය ලබා දීම සඳහා මූලික අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රථමයෙන් ඉල්ලුම් කළ හැකි අතර, වැඩිදුර අවශ්‍යතා සපුරාලීමෙන් පසු අවසාන අනුමැතිය ලබා ගැනීමට හැකියාව ඇත. නියාමනයට ලක්වන ආයතන සඳහා ලබා දී ඇති බලපත්‍ර තුළ ක්‍රියාත්මක වීමට තවත් වසරක කාලයක් සඳහා බලපත්‍රය අලුත් කිරීම සිදුකළ යුතු අතර ඒ සඳහා යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා නියාමනයට ලක්වන ආයතන වාර්ෂිකව වැඩිදුර සමාලෝචනයට ලක් කෙරේ.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍රයක් ප්‍රදානය කරන අවස්ථාවේදී, ඕනෑම නව බලපත්‍ර ලබාදීමකට පෙර සහ අලුත් කිරීමේදී, ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ සහ සේවාලාභීන් සමඟ ගනුදෙනු කරන පුද්ගලයන්ගේ යෝග්‍යතා සහ හිමිකම් දිවුරුම් ප්‍රකාශ සමාලෝචනය කරයි. මෙමගින් ආයතන තුළ වැදගත් කාර්යයන් ඉටු කරන වගකිව යුතු ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සම්බන්ධයෙන් ආයෝජක විශ්වාසය ඇති කරන අතර ඔවුන්ගේ වෘත්තීය හැසිරීම තුළින් කළමනාකරණ සමාගම්වලට ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට සහ වෙළෙඳපොළේ අඛණ්ඩතාව ආරක්ෂා කිරීමටත් හැකියාව ලැබේ.

සමාලෝචිත වර්ෂය තුළ ආයතන සඳහා ලබා දී ඇති නව බලපත්‍ර සහ 2022 දෙසැම්බර් 31 දිනට මුළු බලපත්‍රලාභීන් සංඛ්‍යාව පහත පරිදි වේ: (සංඛ්‍යා සටහන 01)

සංඛ්‍යා සටහන 01 : බලපත්‍ර ලබාදීම

| නියාමනයට ලක් වූ ආයතන වර්ගය | 2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ලබා දී ඇති මුළු නව බලපත්‍ර සංඛ්‍යාව | 2022 දෙසැම්බර් 31 දිනට බලපත්‍රලාභී ආයතනවල මුළු සංඛ්‍යාව |
|---|---|---|
| කොටස් හුවමාරු | - | 01 |
| කොටස් තැරැව්කරුවන් | - | 28 |
| කොටස් වෙළෙන්දන් | 02 | 12 |
| ඒකක භාර කළමනාකරණ සමාගම් | 08 | *17 |
| ආයෝජන කළමනාකරුවන් | - | 24 |
| ආන්තික ණය සැපයුම්කරුවන් | - | 20 |
| කොටස් ප්‍රාරක්ෂකයන් | - | 08 |
| ණය ප්‍රමාණීකරණ සමාගම් | - | 03 |
| නිශ්කාෂණ | 01 | 01 |
| මධ්‍යම තැන්පතුගාර | 01 | 01 |

* දැනට පවතින සියලුම කළමනාකරණ සමාගම් ඇතුළත් වේ

මීට අමතරව, සමාලෝචිත වර්ෂය තුළ, සාමූහික ආයෝජන යෝජනා ක්‍රම හයක් (6) සඳහා අනුමැතිය ලබා දී ඇත. (සංඛ්‍යා සටහන 02)

සංඛ්‍යා සටහන 02 : බලපත්‍රලාභී මුළු ආයතන සංඛ්‍යාව

| නියාමනයට ලක් වූ ආයතන වර්ගය | 2021 දෙසැම්බර් 31 වන විට බලපත්‍රලාභී මුළු ආයතන සංඛ්‍යාව | 2022 දෙසැම්බර් 31 වන විට බලපත්‍රලාභී මුළු ආයතන සංඛ්‍යාව |
|---|---|---|
| කොටස් හුවමාරුව | 01 | 01 |
| කොටස් තැරැව්කාර ආයතන | 29 | 28 |
| කොටස් වෙළෙන්දන් | 12 | 12 |
| ඒකක භාර කළමනාකරණ සමාගම් | 16 | 17 |
| ඒකක භාර අරමුදල් | 76 | 81 |
| ආයෝජන කළමනාකරුවන් | 24 | 24 |
| ආන්තික ණය සැපයුම්කරුවන් | 20 | 20 |
| කොටස් ප්‍රාරක්ෂකයන් | 08 | 08 |
| ණය ප්‍රමාණීකරණ නියෝජිතායතන | 03 | 03 |
| නිශ්කාෂණ ආයතන | 01 | 01 |

## ප්‍රතිපත්ති මුල පිරීම්

### සම්මත කිරීමට නියමිත වෙළෙඳපොළ ආයතන හා වෙළෙඳපොළ අතරමැදියන් සඳහා වන නියාමන ගාස්තු පැනවීම සම්බන්ධ රෙගුලාසි සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නිර්දේශ

නව පනතක් බලාත්මක කර තිබීම, නිෂ්කාශනාගාරය හා මධ්‍යම තැන්පතුව, වෙළෙඳපොළ ආයතන ලෙසත් අනෙකුත් අවස්ථා වෙළෙඳපොළ අතරමැදියන් ලෙසත් නැවත වර්ගීකරණය කර තිබීම යන කාරණා සළකා බැලීමේදී, ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සඳහා මූල්‍ය සේවාවන් සපයමින් එම වෙළෙඳපොළ ආයතන හා වෙළෙඳපොළ අතරමැදියන් විසින් ගෙවිය යුතු බලපත්‍ර ගාස්තු නිර්දේශ කරමින් රෙගුලාසි සම්පාදනය කිරීම අනිවාර්ය වේ.

එමනිසා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අදාළ රෙගුලාසි කෙටුම්පත් කර ගැසට් නිවේදනය නිකුත් කිරීම සඳහා මුදල් අමාත්‍යංශය වෙත භාරදී ඇත.

### කොළඹ කොටස් වෙළෙඳපොළ මගින් ආයෝජක පැමිණිලි හැසිරවීමට අදාල යෝජිත යාන්ත්‍රණය පිළිබඳ සංකල්ප පත්‍රය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් වෙළෙඳපොළ හා එක්ව සේවාදායකයන් හා කොටස් තැරැව්කරුවන් අතර ආරවුල් මෙන්ම සේවාදායකයන් අතර ආරවුල් හා කොටස් තැරැව්කරුවන් හා ආන්තික සැපයුම් කරුවන් අතර ආරවුල් විසඳීම සඳහා ස්වාධීන විනිශ්චය සභාවක් ස්ථාපනය කිරීමට අපේක්ෂා කරයි. සංකල්ප පත්‍රය සම්පූර්ණ කර ඇති අතර නීතිරීති සැකසීම අවසන් කෙරෙමින් පවතී.

## ආයෝජකයන්ගේ සුභසිද්ධිය ආරක්ෂා කිරීම සඳහා වන නියාමන මැදිහත්වීම්

### අනුමැතිය ලබාදීම්

#### ගෝලීය , කලාපීය හා දේශීය අරමුදල් සඳහා අනුමැතිය ලබාදීම

මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගමෙහි නිර්දේශ මත, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගෝලීය, කලාපීය හා දේශීය අරමුදල් සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලයිස්තුගත සමාගම් කොටස්වල ආයෝජනය කිරීමට අනුමැතිය ප්‍රදානය කරනු ලබයි. මෙම අනුමැතිය ප්‍රදානය කරනු ලබන්නේ විනිමය පාලන රෙගුලාසි, 2006 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ පනත, 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ සුරැකුම්පත්වලට අදාළ ශ්‍රී ලංකාවේ නීති වලට අනුකූල වීමට යටත්වයි.

2022 වර්ෂය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගෝලීය, කලාපීය, සහ දේශීය අරමුදල් 47කට ශ්‍රී ලංකාවේ ලයිස්තුගත සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට අනුමැතිය ලබාදී ඇති අතර නම් වෙනස් කිරීම් 67ක් වාර්තාගත කරනු ලැබ ඇත.

### කොළඹ කොටස් වෙළෙඳපොළ රීති හා මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගමට අදාල රීති සමාලෝචනය කිරීම

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට (2021 අංක 19 දරන පනත) අනුකූල වන ලෙස කොළඹ කොටස් වෙළෙඳපොළෙහි මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගමේ රීති, කොළඹ කොටස් වෙළෙඳපොළ හා එක්ව ප්‍රතිසංස්කරණය කළ අතර මෙය කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් අනුමත කරන ලදි.

### මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි කොටස් හිමිකාරිත්වය

පහත කරුණුවලට යටත්ව යෝජිත ව්‍යාපාර සැළැස්ම ස්ථාපනය කිරීමෙන් පසුව, කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගමේ හිමිකාරිත්වය දරන කොටස් ඉවත් කිරීමට කොළඹ කොටස් වෙළෙඳපොළට හැකියාව ලැබෙනතුරු, 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 66 වන වගන්තිය ප්‍රකාරව කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාගමේ දරන කොටස් හිමිකාරිත්වය 100% ක පවත්වාගෙනයාමට කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් අනුමැතිය ලබාදී ඇත.

- කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් එය මාස 6ක කාලයක් තුළ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 66 වන වගන්තිය ප්‍රකාරව පනවා ඇති අවශ්‍යතාවයන් හා අනුකූල වන්නේ කෙසේද යන්න දක්වමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට තම ව්‍යාපාර සැළසුම ඉදිරිපත් කිරීම සහ
- ඉහත දැක්වූ කොටස් අවුරුද්දක කාලයක් තුළ ඉවත් කිරීමට හැකිවීම.

### කොළඹ කොටස් වෙළෙඳපොළෙහි වෙළෙඳ සහභාගීවන්නන් සඳහා වන රීති (පෙර හැඳින්වීම කොළඹ කොටස් වෙළෙඳපොළෙහි කොටස් තැරැව්කරුවන් සම්බන්ධ රීති) සමාලෝචනය කිරීම

සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කළ වෙළෙඳපොළ සහභාගීවන්නන්ගේ රීති (පෙර හැඳින්වීම කොළඹ කොටස් වෙළෙඳපොළෙහි තැරැව්කරුවන් සම්බන්ධ රීති) කොළඹ කොටස් වෙළෙඳපොළ සමග ප්‍රතිසංස්කරණය කළ අතර කොළඹ කොටස් වෙළෙඳපොළෙහි වෙළෙඳ සහභාගීවන්නන්ගේ රීති 2021 අංක 19 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත් ප්‍රතිපත්තීන් සමග සමමුහුර්ත කිරීමට මෙන්ම ජාත්‍යන්තර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සංවිධානයේ සම්මතයන්ට හා ජාත්‍යන්තර ආචාරධර්ම වලට සමගාමීව කටයුතු කිරීමට කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් අනුමැතිය ලබාදී ඇත.

### කොටස් පැවරීම තහනම් කිරීමේ දැනුම්දීම්

යම් යම් පුද්ගලයන් හා සංස්ථාපිත ආස්තිත්වයන් කොටස් හිමිකාරිත්වයන් පැවරීම වලක්වමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාගත්, කොළඹ මහාධිකරණය මගින් නිකුත් කරනු ලැබූ යම් තහනම් නියෝග පිළිබඳව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම මත ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ මහාධිකරණයේ එම තීන්දු කොළඹ කොටස් වෙළෙඳපොළ හා මධ්‍යම තැන්පතු ක්‍රමය පුද්ගලික සමාගම වෙත දැනුම් දීමට පියවර ගන්නා ලදී.

# මෙහෙයුම් සමාලෝචනය

## කොළඹ කොටස් වෙළෙඳපොළේ මූලික කාර්යයන් ඩිජිටල්කරණය කිරීමට පහසුකම් සැලසීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ එක්ව කොළඹ කොටස් වෙළෙඳපොළේ අන්තර් ආන්තික මෙහෙයුම් ඩිජිටල්කරණය කිරීම උදෙසා සහ ජාතික හදිසි තත්වයකදී කිසිදු බාධාවකින් තොරව මෙහෙයුම් පවත්වාගෙන යාමට ඉඩ සැලැස්වීම සඳහා ප්‍රගතිශීලී ජාතික මුලපිරීමක් ආරම්භ කරන ලදී. මෙම මුලපිරීම, පොදු සේවා සපයන ආයතන වල සියළු මූලික ක්‍රියාකාරකම් ඩිජිටල්කරණය කිරීමේ රජයේ මුලපිරීම හා අනුකූල වේ.

කොළඹ කොටස් වෙළෙඳපොළ සහ එහි පූර්ණ අනුබද්ධිත සමාගමක් වන මධ්‍යම තැන්පතු ක්‍රමය පුද්ගලික සමාගම (CDS) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ එකඟතාවය, මඟපෙන්වීම හා නියාමනය ඇතිව, අනාගතයේ CDS ගිණුම් හිමියන් වීමට බලාපොරොත්තු වන අයට, කොටස් තැරැව්කරුවකුගේ ශාඛා කාර්යාලයකට යාමට හෝ භෞතිකව අයදුම්පත්‍රයක් පිරවීමට නොමැතිව ඩිජිටල් ලෙස CDS ගිණුම් විවෘත කිරීම සඳහා වේදිකාවක් හඳුන්වාදෙන ලදී. කොළඹ කොටස් වෙළෙඳපොළේ එයට අදාල රීති සඳහා සංශෝධන වලට අනුමැතිය ලබාදීමට පහසුකම් සැලසීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

කොළඹ කොටස් වෙළෙඳපොළේ මූලික කාර්යයන් පූර්ණ ලෙස ඩිජිටල්කරණය කිරීම අනෙකුත් දෑ අතර පහත දැක්වෙන ජයග්‍රහණ සඳහා මඟපෙන්වා ඇත.

- මොබයිල් ඇප් පහසුකම ඔස්සේ විදේශීය පුද්ගලයන් ඇතුළත් කර ගැනීම. (කොටස් තැරැව්කාර සමාගම් හරහා) සහ බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා ආමුඛ ආයෝජන ගිනුම් (IIA) විවෘත කිරීමට ඇති හැකියාව;
- කොළඹ කොටස් වෙළෙඳපොළ වෙබ් පිටුව භාෂා ත්‍රිත්වයෙන්ම ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැළසීම;
- කොළඹ කොටස් වෙළෙඳපොළ මොබයිල් ඇප් පහසුකම සඳහා පුද්ගල කොටස් කරුවන්ට සම්බන්ධවීමට අයදුම්කරණ ක්‍රමලේඛන අතුරු මුහුණතක් (API) හඳුන්වාදීම;
- E-IPO (විද්‍යුත් මූලික කොටස් නිකුතු) වෙබ් ද්වාරයක් විවෘත කිරීම;
- ආයතනික ක්‍රියකාරකම් වැඩසටහන් දින දර්ශනයක් හඳුන්වාදීම;
- කොළඹ කොටස් වෙළෙඳපොළ මොබයිල් ඇප් පහසුකම හරහා ඒකකභාර වල ආයෝජනය කිරීමට පාරිභෝගිකයන් ඇතුළත් කර ගැනීම.;
- වයස අවුරුදු දහ අටට (18) වඩා වැඩි පුද්ගලයෙකුට සමාගමක කිසියම් කොටස් ලැබීමට හිමිකම් කීමට වෙනත් පුද්ගලයෙකු නම් කළ හැකි අවස්ථාවකදී "Deceased and Nominations Repository" "මියගිය නාමික ගිණුම්" සඳහා පහසුකම් සැළසීම
- පර්යේෂණ වෙබ් පිටුව සඳහා හඬ පහසුකමක් / හඬ බොත්තමක් එක් කිරීම;
- "ප්‍රතිචාර කාර්යක්ෂමතාව" මත කොටස් තැරැව්කරුවන් ශ්‍රේණිගත කිරීම හඳුන්වාදීම;
- ග්‍රාහකයා සඳහා යෙදුම් පණිවිඩයක් යැවීමට හැකිවන පරිදි කොළඹ කොටස් වෙළෙඳපොළ මොබයිල් ඇප් එක තුළ මිල නිවේදන, ගනුදෙනු පරිමාව සැකසීම;

## කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත කිරීමේ රීති

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට අනුකූල වන ලෙස කොළඹ කොටස් වෙළෙඳපොළ මගින් ලයිස්තුගත කිරීමේ රීති සම්පූර්ණ වශයෙන් සංශෝධනය කළ අතර යෝජිත රීති සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සමාලෝචනය යටතේ පවතී.

## ලයිස්තුගත ලේඛනයෙන් ඉවත් කිරීම්

සලකා බලන කාලය තුළදී, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 4(2) සහ 4(3) රීතීන් අනුව ද පහත සමාගම් කොළඹ කොටස් වෙළෙඳපොළේ නිල ලයිස්තුවෙන් අනිවාර්ය ඉවත් කිරීමට ලක් කෙරිණි.

- ඇඩම් ඉන්වෙස්ට්මන්ට්ස් පී එල් සී
- ඇඩම් කැපිටල් පී එල් සී
- සිලෝන් ඇන්ඩ් ෆොරින් ට්‍රේඩ්ස් පී එල් සී
- කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
- ස්වර්ණමහල් ෆයිනෑන්නෂල් සර්විසස් පී එල් සී
- ප්‍රයිම් ෆයිනෑන්ස් පී එල් සී
- එම් ටී ඩී වෝල්කර්ස් පි එල් සී
- ලකී ලංකා මිල්ක් ප්‍රෝසෙසිං කම්පනි පී එල් සී

මීට අමතරව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති අංක 05 ප්‍රකාරව කොළඹ කොටස් වෙළෙඳපොළේ නිල ලයිස්තුවෙන් ස්වෙච්ඡාවෙන් ලයිස්තුගත ලේඛනයෙන් ඉවත්වීමට ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් පී එල් සී සඳහා අනුමැතිය ලබාදෙන ලදි.

## කොළඹ කොටස් වෙළෙඳපොළේ වෙළෙඳ රීතිවලට අදාළ සංශෝධන

සලකා බලන වර්ෂය තුළ, කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් යෝජනා කරන ලද සංයුක්ත ණය සුරැකුම්පත් වල වාණිජ නැවත මිලදී ගැනීම් ගනුදෙනු පාලනය කිරීම සඳහා වන වෙළෙඳපොළ රීති (REPO) සහ සදාකාලික ණය සුරැකුම්පත් සඳහා වන රීති සඳහා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබාදෙන ලදි.

## කොළඹ කොටස් වෙළෙඳපොළෙහි සමාගම් ලයිස්තුගත කිරීමේ රීතිවල 5.4 (අ) රීතිය යටතේ ලබාදෙන නිදහස් කිරීම්

කොටස් නිකුතුවක් සිදුකළ වහාම එම නිකුත් කළ කොටස් වලින් 20%ක් ඉක්මවන සේ පුද්ගලික ස්ථානගත කිරීමක් (පෞද්ගලික කොටස් නිකුතුවක්) මගින් කොටස් නිකුත් කිරීමට බලාපොරෙත්තු වන ලයිස්තුගත පොදු සමාගම් වලට නිදහස් කිරීම් ප්‍රදානය කිරීමට අදාළ අයදුම්පත් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සලකා බලනු ලබයි. සලකා බලන වර්ෂය තුළ සමාගම් දෙකක් සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළෙහි සමාගම් ලයිස්තුගත කිරීමේ රීති වල 5.4 (අ) රීතිය යටතේ නිදහස් කිරීම් ලබාදෙන ලදි.

## 2021 අංක 19 දරණ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ නිකුත් කළ නව නීති රීති

සලකා බලන වර්ය තුළ, කොමිෂන් සභාව විසින් 2021 අංක 19 දරණ සුරැක්ම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ක්‍රියාකරමින් වෙළෙඳපොළ ආයතන , වෙළෙඳපොළ අතරමැදියන්ගේ ඇතැම් කාණ්ඩ හා සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සංග්‍රහය (CIS Code) සඳහා නීති රීති නිකුත් කරන ලදි.

වෙළෙඳපොළ ආයතන කාණ්ඩය යටතේ නික්තු කරන ලදි නීති රීති සඳහා පහත රීති ඇතුළත් වේ.

- කොටස් වෙළෙඳපොළ සඳහා අදාළ වන නීති රීති
- නිෂ්කාශනාගාර සඳහා අදාළ වන නීති රීති
- මධ්‍යම තැන්පතු සඳහා අදාළ වන නීති රීති

වෙළෙඳපොළ අතරමැදි ආයතන කාණ්ඩය සඳහා නිකුත් කරන ලද නීති රීති පහත පරිදි වේ

- ආයෝජන කළමනාකාරුවන් සඳහා අදාළ වන නීති රීති
- ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන සඳහා අදාළ වන නීති රීති
- ආන්තික ණය සපයන්නන් සඳහා අදාළ වන නීති රීති
- කළමනාකරණ සමාගම් සඳහා අදාළ වන නීති රීති
- ආයතනික මූල උපදේශක සඳහා අදාළ වන නීති රීති
- කොටස් ප්‍රාරක්ෂකයින් සඳහා අදාළ වන නීති රීති
- කොටස් තැරැව්කරුවන් සඳහා අදාළ වන නීති රීති
- කොටස් වෙළෙඳුන් සඳහා අදාළ වන නීති රීති

### කොළඹ කොටස් වෙළෙඳපොළේ මහජන හිමිකාරීත්වය සමඟ අනුකූල නොවන ලයිස්තුගත සමාගම්වලට එරෙහිව යෝජිත බලාත්මක කිරීමේ ක්‍රියා

අවම මහජන කොටස් හිමිකාරීත්වය සමඟ අනුකූල නොවන ලයිස්තුගත සමාගම් සඳහා වන යෝජිත බලාත්මක කිරීමේ ක්‍රියා සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළට, කොමිෂන් සභාවේ එකඟතාවය ලබාදෙන ලදී.

### කොළඹ කොටස් හුවමාරුවෙහි බලාත්මක කිරීමේ නීති කල් දැමීම

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කොළඹ කොටස් හුවමාරුවෙහි සුරැකුම්පත් ගනුදෙනු අත්හිටුවීම් කල් දැමීම සම්බන්ධ කරුණු 5 ක් වසර තුළ සමාලෝචනය කරන ලදී. කල්දැමීම පහත සඳහන් සමාගම්වලට අදාළ විය.

- බ්ලූ ඩයමන්ඩ් ජුවෙලරි වර්ල්ඩ් වයිඩ් පී එල් සී (කල්දැමීම් 2ක්)
- මල්ටි ෆයිනෑන්ස් පී එල් සී
- සෙරන්ඩිබ් ඉංජිනියරිං ග්‍රෘප් පී එල් සී
- නේෂන් ලංකා෴ ෆිනෑන්ස් පී එල් සී

### සමාගම් පවරා ගැනීම හා ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය ක්‍රියාත්මක කිරීම

තක්සේරු කිරීමේ ක්‍රමවේදයන්හි සාධාරණ සහ අදාළ පොදුවේ පිළිගත් පරිචයන් සඳහා අනුගත වී ඇත්දැයි හඳුනාගැනීම සඳහා, මෙම ඒකාබද්ධ කිරීම් පරිපාලනය කිරීමට පෙර, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ස්වාධීන උපදේශකයන් විසින් පිළියෙළ කරන ලද වාර්තාවෙහි අන්තර්ගතය සහ ඒ සඳහා පදනම් කරගත් උපකල්පනයන් ඇතුළුව තක්සේරු කිරීමේ ක්‍රමවේදයන් සමාලෝචනය කරන ලදී. එය තුළින් ලැයිස්තුගත සමාගම් වලින් කරන ලද හෙළිදරව් කිරීම් වල පැහැදිළි බව වැඩි කිරීම බලාපොරොත්තු වේ. 2022 වර්ෂය තුළ සමාගම් 1995 පවරා ගැනීමේ හා ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය (සංශෝධන) යටතේ පහත පවරා ගැනීමේ අර්පණ ක්‍රියාත්මක වීම ආරම්භ වී තිබේ.

අර්පණය සම්පූර්ණයෙන් ස්ථාපනය කිරීමට අවශ්‍ය මූල්‍ය වපසරිය කොමිෂන් සභාව සෑහීමකට පත්වන ලෙස ඉදිරිපත් කිරීමට වූ නොහැකියාව මත එක් පොදු ලයිස්තුගත සමාගමකට ලබාදී තිබූ අනිවාර්ය අර්පණයක් නවතා දමන ලද අතර කොමිෂන් සභාව සමාගම් අත්පත් කර ගැනීමේ හා ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ රීති 31 (1A) (2) යටතේ ක්‍රියාත්මක වෙමින්, පොදු ලයිස්තුගත සමාගමේ ඡන්දය භාවිතා කිරීමේ පාලනයෙන් 30% ක් වන අතිරික්තව අත්පත් කර ගත් සාමාන්‍ය ඉවත් කිරීම සඳහා අත්පත්කර ගන්නා පුද්ගලයාට යොමුකරන ලදී. (සංඛ්‍යා සටහන 03)

සංඛ්‍යා සටහන 03 : පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය යටතේ සිදුකරන ලද අර්පණයන්

| අර්පණකරු | අර්පණ ලාභියා | අර්පණයේ ස්වභාවය | පවතින තත්වය |
|---|---|---|---|
| බ්‍රවුන්ස් පවර් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට් පී එල් සී පූර්ණයෙන් අනුබද්ධිත සමාගමකි) | උඩුපුස්සැල්ලාව ප්ලාන්ටේෂන් පී එල් සී | අනිවාර්ය අර්පණය | අවසන් වී ඇත. |
| යෝ කිම් ලෙන්ග් මහතා | රම්බොඩ ෆොල්ස් පී එල් සී | අනිවාර්ය අර්පණය | අවසන් වී ඇත. |
| එල් බි ෆයිනෑන්ස් පී එල් සී | මල්ටි ෆයිනෑන්ස් පී එල් සී | අනිවාර්ය අර්පණය | අවසන් වී ඇත. |
| බ්‍රවුන්ස් පවර් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට් පී එල් සී පූර්ණයෙන් අනුබද්ධිත සමාගමකි) | හපුගස්තැන්න ප්ලාන්ටේෂන්ස් පී එල් සී | අනිවාර්ය අර්පණය | අවසන් වී ඇත. |
| අයිකොනික් ට්‍රස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට් පී එල් සී පූර්ණයෙන් අනුබද්ධිත සමාගමකි) | ඇග්ස්ටාර් පී එල් සී | අනිවාර්ය අර්පණය | අවසන් වී ඇත. |
| බ්ලූ ඕෂන් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | කෙල්සි ඩිවෙලොප්මන්ට්ස් පී එල් සී | අනිවාර්ය අර්පණය | සිදුකෙරෙමින් පවතී |
| එච්එන්බී ෆයිනෑන්ස් පී එල් සී | ප්‍රයිම් ෆයිනෑන්ස් පී එල් සී | අනිවාර්ය අර්පණය | අවසන් වී ඇත. |

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 80 වැනි වගන්තිය යටතේ පිරිනමනු ලබන අනුමැතීන්

කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලද තැනැත්තකු විසින් එය අනුමත කර ඇත්නම් මිස, විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමක් ලබා ගැනීමට ඉල්ලීමක්කර ඇති පොදු සමාගමක් විසින් හෝ වෙනත් ලයිස්තුගත පොදු සමාගමක් විසින් මහජනයාගෙන් අරමුදල් ඉල්ලීමේ කාර්යය සඳහා සංස්ථා ප්‍රකාශයක් හෝ ඒ හා සමාන ලේඛනයක් මගින් හෝ අන්‍යාකාරයකින් කෙලින්ම හෝ තුන්වන පාර්ශවයක් මගින් සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදු කරනු නොලැබිය යුතුය. ඇල්ෆා ෆයර් සර්විසස් පී එල් සී හා යූ බී ෆයිනෑන්ස් ලිමිටඩ් සඳහා මෙම වසර තුළ අනුමැතිය ලබා දෙන ලදී.

# මෙහෙයුම් සමාලෝචනය

## ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 81 වැනි වගන්තිය යටතේ පිරිනමනු ලබන අනුමැතීන්

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 81 වැනි වගන්තියට අනුව ලයිස්තුගත සමාගම් විසින් සිදුකරනු ලබන ලයිස්තුගත නොවන සුරැකුම්පත් නිකුතුන්වලට අදාළ අයදුම්පත්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. පහත ආයතන විසින් සිදුකළ නිකුතුන් සඳහා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදි. (සංඛ්‍යා සටහන 04)

සංඛ්‍යා සටහන 04 : සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 81 වැනි වගන්තිය යටතේ සිදුකළ අනුමැතීන්

| නිකුතු සිදුකළ ආයතනයේ නම | නිකුත් කළ සුරැකුම්පත්වල ස්වභාවය | අනුමත කරන ලද මුදල | කාල සීමාව |
|---|---|---|---|
| සොෆ්ට් ලොජික් හෝල්ඩිංග්ස් පී එල් සී | ජ්‍යෙෂ්ඨ වගකීම් රහිත, ලයිස්තුගත නොකළ, නිදහස් කළ හැකි සහ ශ්‍රේණිගත කළ අවුරුදු 3 ණයකර | අනුමත නොකරන ලදි | අදාළ නොවේ |
| ජෝන්කිල්ස් හෝල්ඩිංග්ස් පී එල් සී | ශ්‍රී ලංකා රුපියල් වලින් මිල ප්‍රකාශිත, ශ්‍රේණිගත නොකළ, ලයිස්තුගත නොකළ, වගකීම් රහිත, පරිවර්තනය කළ හැකි ණයකර | රුපියල් බිලියන 27.06 | අවුරුදු 3 |
| ලංකා බැංකුව | බාසල් III අනුකූල, ස්ථර 2, ලයිස්තුගත නොකළ, ශ්‍රේණිගත කළ, වගකීම් රහිත, අප්‍රධාන, නිදහස් කළ හැකි, ශක්‍ය නොවන විට කපාහළ හැකි ලක්ෂණ සහිත ණයකර | රුපියල් බිලියන 20 | A වර්ගය - අවුරුදු 5<br>B වර්ගය - අවුරුදු 5<br>C වර්ගය - අවුරුදු 8 |

## භූමියෙන් බැහැර ගනුදෙනු සඳහා අනුමැතිය ලබාදීම්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ අංක 84(1) වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළක ලයිස්තුගතව ඇති පොදු සමාගමක සුරැකුම්පත් දරන පුද්ගලයෙකු වෙළෙඳපොළ විසින් අනුගමනය කරනු ලබන ගනුදෙනු පටිපාටියට අනුව එබඳු සුරැකුම්පත් මිලදී ගැනීම, විකිණීම, තෑගි කිරීම හෝ වෙනත් ආකාරයකින් ගනුදෙනු කිරීම සිදුකළ යුතුය. එසේම වෙළෙඳපොළ ගනුදෙනු පටිපාටියක් නොමැති අවස්ථාවලදී එවැනි ගනුදෙනු සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

මෙහෙයුම් වර්ෂය තුළදී විශේෂිත පැවරීම් 958ක් සහ කොටස් ත්‍යාග කිරීම් 132ක් කොමිෂන් සභාවේ අවධානය පිණිස යොමු කරන ලදි. අප ආයතනය විසින් සිදුකරන ලද විශේෂිත පැවරීම් ලෙස සැළකෙන්නේ : ආන්තික ගනුදෙනු, තනි පුද්ගල ගිණුම් හවුල් ගිණුම් බවට, හවුල් ගිණුම් වෙනත් හවුල් ගිණුම් බවට හැරවීම්, හවුල් ගිණුම් තනි පුද්ගල ගිණුම් බවට හැරවීම්, මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා වන පැවරීම්, විශේෂිත ත්‍යාග පැවරීම්, අනිවාර්ය අර්පණ සඳහා අදාළ පැවරීම්ය.

## අධීක්ෂණය සහ අනුකූලතාවය

සියලුම ආයෝජකයින්ට කාලෝචිත, නිවැරදි සහ සම්පූර්ණ තොරතුරු වෙත ප්‍රවේශය ඇති විට වෙළෙඳපොළ වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක වේ. ලයිස්තුගත සමාගම් ආයෝජකයින්ට දැනුවත් ආයෝජන තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු වෙත ප්‍රවේශය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඒ අනුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින්, සාංග මික හෙළිදරව් කිරීම් සහ ලයිස්තුගත සමාගම් විසින් ආයෝජනය කරන ජනතාව වෙත බෙදා හැරීමට අපේක්ෂා කරන අනෙකුත් වැදගත් තොරතුරු අධීක්ෂණය කරයි. වෙළෙඳපොළ සහභාගිවන්නන් සුරැකුම්පත් නීති, රෙගුලාසි සහ නීතිරීතිවලට අනුකූලද යන්න සහ ආයෝජකයින්ගේ අවශ්‍යතා ආරක්ෂා වන ආකාරයෙන් හැසිරෙන්නේද යන්න සොයා බැලීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වගකීම දරයි.

## ලයිස්තුගත සමාගම්

සියළුම ලයිස්තුගත සමාගම් මූල්‍ය වර්ෂය අවසාන වී මාස 5ක් ඇතුළත වාර්ෂික වාර්තා ඔවුන්ගේ කොටස් හිමියන්ට සහ කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ඉදිරිපත් කළ යුතුය.

සාංගමික කටයුතු අංශය විසින් මෙම ලැයිස්තුගත සමාගම්වල වාර්ෂික වාර්තා සමාලෝචනය කර, අනුකූල නොවීම් සම්බන්ධ කරුණු එම සමාගම් වෙත දැනුම් දෙනු ලැබේ. මෙම ප්‍රයත්නයේදී ලයිස්තුගත සමාගම්වල ප්‍රතිචාර අතිශයින්ම ධනාත්මක විය.

මෙම කර්තව්‍යයේ පරමාර්ථය වනුයේ ලයිස්තුගත සමාගම් විසින් කරනු ලබන මූල්‍ය වාර්තාකරණයේ සහ තොරතුරු බෙදාහැරීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමයි. සුරැකුම්පත් වෙළෙඳපොළේ විනිවිදභාවය සහ වගවීම තහවුරු කිරීමට සහ වෘත්තීයමය ප්‍රමිති පවත්වාගෙනයාම සහතික කිරීම සඳහා ලයිස්තුගත සමාගම් විසින් ප්‍රමාණාත්මක තොරතුරු නිසියාකාරව බෙදාහැරීම අත්‍යවශ්‍ය වේ.

වාර්ෂික වාර්තා සමාලෝචනය කිරීමේදී සාංගමික කටයුතු අංශය පහත සඳහන් අංශයන් කෙරෙහි අවධානය යොමුකරන ලදි.

කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත කිරීමේ නීති රීති, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ සමාගම් පනතේ අදාළ විධි විධාන සමඟ අනුකූලතාවය

- සාංගමික යහපාලන සම්බන්ධ භාවිතයන්
- මූල්‍යමය අවධාරණයන්
- සභාපතිගේ වාර්තාව
- ස්වාධීන විගණකගේ වාර්තාව
- කොටස් හිමියන් සහ ආයෝජකයන් පිළිබඳ තොරතුරු
- මූල්‍ය දත්ත
- අධ්‍යක්ෂක මණ්ඩල අනුකමිටු වාර්තා

කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත කිරීමේ නීති රීති සහ අදාළ රෙගුලාසිවලට අනුකූලව වාර්ෂික වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සමාගම් වෙත පැවරී ඇති වගකීම පිළිබඳ දැනුවත්භාවයේ මට්ටම වැඩි දියුණු කිරීමට මෙම ක්‍රියාවලිය අඛණ්ඩව දායක වනු ඇත.

වර්ෂය තුළදී, සාංගමික කටයුතු අංශය විසින් ලයිස්තුගත සමාගම්වල වාර්ෂික වාර්තා 118ක් සමාලෝචනය කරන ලදි. එම සමාලෝචනයන්වලදී අදාළ අනුකූලතාවයන් සහ හෙළිදරව් කිරීම් වැඩි දියුණු කිරීම සඳහා

නිරීක්ෂණය කරන ලද කරුණු ඇතුළත් කර ලිපි 94ක් යවන ලදි. එමෙන්ම වාර්ෂික වාර්තා සමාලෝචනයන් 30ක් එසේ අනුකූල නොවීම් නොමැති සමාලෝචනයන් ලෙස නිගමනය කරන ලදි.

තවද ණය නිකුතු සංස්ථා ප්‍රකාශන 8ක් සහ හිමිකම් නිකුතු සංස්ථා ප්‍රකාශන 6ක් මූලිකව සමාලෝචනය කරන ලදි.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින්, දැනට සිටින කොටස් හිමියන්ගෙන් තවදුරටත් අරමුදල් රැස්කිරීම සඳහා අයදුම් කර ඇති ලයිස්තුගත සමාගම් 11ක කොටස් හිමි චක්‍රලේඛ 11ක් මූලිකව සමාලෝචනය කර ඒවායෙහි හෙළිදරව් කිරීම් වැඩි දියුණු කිරීම සඳහා අදාළ නිරීක්ෂණයන් ලබාදෙන ලදි.

## ලයිස්තුගත පොදු සමාගම්වල හෙළිදරව් කිරීම් සහ සාංගමික කටයුතු සම්බන්ධයෙන් ගනු ලැබූ නියාමන ක්‍රියාමාර්ග

මෙහෙයුම් වර්ෂය තුළදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ලයිස්තුගත සමාගම් විසින් වෙළෙඳපොළ දැනුම් දීම හරහා සිදුකළ හෙළිදරව් කිරීම් සමාලෝචනය කළ අතර අවස්ථා 102කට අදාළව කොළඹ කොටස් වෙළෙඳපොළ වෙතින් පැහැදිළි කිරීම් ඉල්ලා සිටින ලදි. එවැනි පැහැදිළි කිරීම් ඉල්ලා සිටින ලද්දේ පහත සඳහන් හෙළිදරව් කිරීම් සම්බන්ධයෙනි. (සංඛ්‍යා සටහන 05)

**සංඛ්‍යා සටහන 5: ලයිස්තුගත පොදු සමාගම්වල හෙළිදරව් කිරීම් සහ සාංගමික කටයුතු සම්බන්ධයෙන් ගනු ලැබූ නියාමන ක්‍රියාමාර්ග**

| පැහැදිළි කිරීම් ස්වභාවය | අවස්ථා ගණන |
|---|---|
| අවදානම් පුවරුව සහ දෙවන පුවරුවෙහි සිටින ලයිස්තුගත සමාගම්හී අධ්‍යක්ෂකවරුන් විසින් කරනු ලැබූ ගනුදෙනු | 8 |
| අධ්‍යක්ෂකවරුන් විසින් කරනු ලැබූ ගනුදෙනු - ප්‍රමාද වූ අනාවරණයන් | 31 |
| අධ්‍යක්ෂකවරුන් විසින් කරනු ලැබූ ගනුදෙනු - තහනම් කරනු ලැබූ කාල පාරාසය තුළ කරනු ලැබූ ගනුදෙනු (කොටස් වෙළෙඳපොළ රීති අංක 8.6) | 10 |
| ප්‍රමාද වූ හෙළිදරව් කිරීම් | |
| අධ්‍යක්ෂක මණ්ඩලයේ වෙනස්කම් | 44 |
| වෙනත් ආයතනික ක්ෂණික අනාවරණය කිරීමේ අවශ්‍යතා | 9 |

## අනෙකුත් නියාමන ආයතන වෙත යොමුකරනු ලද කරුණු

හඳුනාගැනීම, මැනීම සහ හෙළිදරව් කිරීම් අදාළ ප්‍රමිතීන්ට අනුකූල ද යන්න පිළිබඳව පැහැදිළිකිරීම් ලබාගැනීම සඳහා පහත කරුණු වෙනත් නියාමන ආයතන වෙත යොමු කරන ලදි. (සංඛ්‍යා සටහන 06)

**සංඛ්‍යා සහටන 06: අනෙකුත් නියාමන ආයතන වෙත යොමු කරන ලද කරුණු**

| නියාමන ආයතනය | සමාගම් ගණන | සම්බන්ධ කරුණු සහ ප්‍රතිඵලය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිනුම්කරණ සහ විගණන ප්‍රමිති මණ්ඩලය | 2 | **කෝපරේටිව් ඉන්ෂුරන්ස් කම්පනි පී එල් සී**<br>සමූපකාර රක්ෂණ සමාගමෙහි මූල්‍ය ප්‍රකාශනවල අක්‍රමිකතා සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලැබී ඇත.<br><br>**ඒෂියා කැපිටල් පී එල් සී**<br>2022 මාර්තු 31න් අවසන් වසර සඳහා අදාළ ස්වාධීන විගණන වාර්තාව සම්බන්ධයෙන් පැහැදිළි කිරීම් ඉල්ලා ඇත. |
| කොළඹ කොටස් වෙළෙඳපොළ | 1 | **ඇක්සස් ඉන්ජිනියරින් පී එල් සී**<br>සාංගමික අංශයේ සොයාගැනීම් මත පදනම්ව තම ලයිස්තුගත ණයකර සඳහා ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම සම්බන්ධයෙන් ක්ෂණිකව සිදුකරන වෙළෙඳපොළ හෙළිදරව් කිරීමක් සිදුකිරීමට සමාගම යොමු කරන ලදි. |
| ශ්‍රී ලංකා මහ බැංකුව | 1 | **සෙලාන් බැන්ක් පී එල් සී**<br>බදු ගිවිසුම්වලට අදාළ අක්‍රමිකතා සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලැබී ඇත. |
| ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව | 2 | **කෝපරේටිව් ඉන්ෂුරන්ස් කම්පනි පී එල් සී** (COOP)<br>කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් නිසි ලෙස සැළකිල්ලට නොගෙන අධ්‍යක්ෂකවරුන් පත් කිරීම<br><br>**කෝපරේටිව් ඉන්ෂුරන්ස් කම්පනි පී එල් සී**<br>අධ්‍යක්ෂක මන්ඩලයේ නීත්‍යානුකූලභාවය |

## වෙළෙඳපොළ අතරමැදියන්

2022 වර්ෂය තුළදී, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2021 දී හඳුන්වාදෙන ලද නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන තවදුරටත් බලාත්මක කිරීම සඳහා නීති රීති හඳුන්වා දෙන ලදී. වෙළෙඳපොළ ආයතන, වෙළෙඳපොළ අතරමැදියන් සහ පෙර ඒකක භාර ලෙස හැඳින්වූ සාමූහික ආයෝජන යෝජනා ක්‍රම (CIS) සඳහා නීති සංග්‍රහය ඇතුළු ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්‍රියාකරුවන්ගේ ක්‍රියාකාරිත්වය සහ පාලනය සඳහා පැහැදිලි රාමුවක් තවදුරටත් ශක්තිමත් කිරීමට අදාළ වන්නා වූ නීති කෙටුම්පත් කිරීම සඳහා අවශ්‍යතා සම්පාදනය කිරීමේදී අධීක්ෂණ කණ්ඩායම මූලික විය.

# මෙහෙයුම් සමාලෝචනය

**"අනුගත නොවීම් වල ස්වභාවය සහ එහි බරපතලකම මත පදනම්ව පරිපාලන දඬුවම් පැනවීමට කොමිෂන් සභාවට හැකියාව ලබා දෙන නව පනතත් සමඟ, වැඩිදියුණු කළ නීති රීති සහ රෙගුලාසි තුළින් බලාත්මක කිරීමේ හැකියාවෙන් අධීක්ෂණ අංශය ශක්තිමත් කර ඇත."**

වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන් සඳහා අදාළ වන රීති පිළිවෙලින් 2022 මාර්තු 15 දිනැති අංක 2271/10 සහ 2271/09 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද අතර සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සම්බන්ධ රීති 2278/2 7 දිනැති අංක 2278/2 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී.

කොටස් හුවමාරුව, මධ්‍යම තැන්පතුගාරය සහ නිෂ්කාශනාගාරයෙන් සමන්විත වෙළෙඳපොළ ආයතන 3 සඳහා නීති රීති හඳුන්වාදීම තුළින් ප්‍රාග්ධන වෙළෙඳපොළ මෙහෙයුම්වල ඵලදායීතාවය හා කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය ඉහළ නැංවෙන අතර රටේ ජාතික ආර්ථිකය තුළ සැළකිය යුතු කාර්යභාරයක් ඉටු කරන සුරැකුම්පත් වෙළෙඳපොළ හා සම්බන්ධව පවතින පද්ධතිමය අවදානම අවම කිරීමට ද උපකාරී වේ. බලපත්‍ර ලබාදීමේ ක්‍රියා පටිපාටිය, අවම මූල්‍ය හා යටිතල පහසුකම් අවශ්‍යතා, පාලන ව්‍යුහයන්, අනුකූලතා සහ අභ්‍යන්තර පාලන අවශ්‍යතා සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා සවිස්තරාත්මක නිර්ණායක වලින් රීතිවල ප්‍රධාන කොටස් සමන්විත වේ. 2022 දී කොළඹ කොටස් හුවමාරුව විසින් හඳුන්වා දුන් ගෙවීම් වලට එදිරිව බේරුම් කිරීමේ (DVP) ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ඵලදායිතාවය තක්සේරු කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධීක්ෂණ අංශය විසින් ස්වාධීනව එතැන් පරීක්ෂණයකට භාජනය කරන ලදී. DVP යනු පියවීම් අවදානම අවම කිරීමේ අරමුණින් වෙළෙඳපොළ යටිතල පහසුකම් සඳහා අදාළ වන්නා වූ වැදගත් වැඩිදියුණු කිරීමකි.

ආයෝජකයින් සමඟ ගනුදෙනු කරමින්, වෙළෙඳපොළෙහි සුමට ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන වෙළෙඳපොළ අතරමැදියන් ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ඉදිරියෙන්ම කටයුතු කරයි. නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මගින් "වෙළෙඳපොළ අතරමැදියන්" නැවත අර්ථකථනය කරන අතර එමගින් ආයතනික මූල්‍ය උපදේශකයින්, ව්‍යුත්පන්න තැරැව්කරුවන්, ව්‍යුත්පන්න අලෙවිකරුවන් සහ වෙළෙඳපොළ සාදන්නන් ආදී නව වෙළෙඳපොළ අතරමැදියන්ගේ කාණ්ඩ කිහිපයක් ඇතුළත් කර ඇත.

වෙළෙඳපොළ අතරමැදියන් සඳහා වන රීති මගින් වෙළෙඳපොළ අතරමැදියන් අටක විෂය පථය ආවරණය කරයි. ආයෝජන කළමනාකරුවන්, ආන්තික සපයන්නන්, ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන, කොටස් ප්‍රාරක්ෂකයින්, කොටස් තැරැව්කරුවන්, කොටස් වෙළෙන්දන්, කළමනාකරණ සමාගම් සහ සාංගමික මූල්‍ය උපදේශකයින් ඊට අයත් වේ. බලපත්‍ර ලබාදීමේ ක්‍රියාපටිපාටිය, අවම මූල්‍ය සහ යටිතල පහසුකම් අවශ්‍යතා, අනුකූලතා සහ අභ්‍යන්තර පාලන අවශ්‍යතා සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා සවිස්තරාත්මක නිර්ණායක සහ මෙහෙයුම් නැවැත්වීමට අදාළ ක්‍රියාවලිය එම නීති මගින් ආවරණය කෙරේ.

2022 සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සංග්‍රහය ("CIS Code") මගින් 2011 දී හඳුන්වා දුන් ඒකක භාර සංග්‍රහය අවලංගු කර ප්‍රතිස්ථාපනය කරයි. මෙම සංග්‍රහය මගින් විනිමය අන්තර් හුවමාරු අරමුදල්, විනිමය හුවමාරු අරමුදල්, කුඩා පරිමාණ අරමුදල් යෝජනා ක්‍රම සහ දේපල ආයෝජන භාර ආදී සාමූහික ආයෝජන යෝජනා ක්‍රම හඳුන්වාදීමට මග පාදයි.

අධීක්ෂණ අංශයේ නියාමන විෂය පථයට එතැන් සහ විතැන් අධීක්ෂණ යන දෙඅංශයෙන්ම නියාමනය කරන ලද ආයතනවල බලපත්‍ර ලබාදීම්, අලුත් කිරීම් සහ අධීක්ෂණ කටයුතු සම්බන්ධ ක්‍රියාවලි ඇතුළත් වේ. බලපත්‍රලාභී ආයතන විසින් නිසි ලෙස කටයුතු කිරීම සහතික කිරීම සඳහා මෙම නිත්‍ය අධීක්ෂණ සහ අධීක්ෂණ ක්‍රියාකාරකම් සිදු කරනු ලබන අතර එමගින් ඔවුන්ගේ මූල්‍ය ස්ථාවරත්වය සහ මෙහෙයුම් ශක්‍යතාව ආරක්ෂා කරමින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ, අදාළ නීති රීති සහ රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල වන බව සහතික කිරීමක්ද සිදු කෙරේ. තවද, අනුගත නොවීම් වල ස්වභාවය සහ එහි බරපතලකම මත පදනම්ව පරිපාලන දඬුවම් පැනවීමට කොමිෂන් සභාවට හැකියාව ලබා දෙන නව පනතත් සමඟ, වැඩිදියුණු කළ නීති රීති සහ රෙගුලාසි තුළින් බලාත්මක කිරීමේ හැකියාවෙන් අධීක්ෂණ අංශය ශක්තිමත් කර ඇත.

### කොටස් තැරැව්කරුවන්

වෙළෙඳපොළ අතරමැදියන් අතර කොටස් තැරැව්කරුවන් ප්‍රධාන පාර්ශවයක් වන අතර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ, අදාළ නීතිරීති සහ රෙගුලාසිවලට අනුව ඔවුන්ගේ හැසිරීම සහ අනුකූල වීම නිරීක්ෂණය කිරීම සඳහා අධීක්ෂණ අංශය විසින් නිසි අධීක්ෂණයක් සිදු කරනු ලැබේ. කොටස් තැරැව්කරුවන් සම්බන්ධ අධීක්ෂණය සිදු කරනු ලබන්නේ අවදානම් මත පදනම් වූ ප්‍රවේශයක් මත වන අතර, එය එක් එක් ආයතනයේ නිශ්චිත අවදානම් ශ්‍රේණිගත කිරීම සහ සාපේක්ෂ වෙළෙඳපොළ කොටස සැලකිල්ලට ගනිමින් ආයතනවල සාපේක්ෂ අවදානම් තත්ත්වයන් තක්සේරු කරයි. කොටස් තැරැව්කරුවන්ට මුහුණදීමට සිදුවන අවදානම, විචක්ෂණ, ද්‍රවශීලතාව, ප්‍රතිපාර්ශව, මූල්‍ය, ණය, මෙහෙයුම් සහ නීතිමය අවදානම් ලෙස හඳුනාගත හැකිය. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මගින් නියාමන රාමුව හඳුන්වාදී ඇති අතර, කොටස් හුවමාරුවද කොටස් තැරැව්කරුවන් ස්වාධීනව අධීක්ෂණය කරනු ලබයි. නීතිරීතිවලට අනුකූල වීම සම්බන්ධයෙන් කිසියම් කඩකිරීමක් හෝ නොගැලපීම් අනාවරණය වුවහොත් සුදුසු විනය ක්‍රියාමාර්ග ගනු ලබයි.

2022 වසර තුළ රට තුළ පැවති අභියෝගාත්මක සමාජ ආර්ථික පරිසරය නොතකා, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එම ආයතනවල ඵලදායී අධීක්ෂණය සඳහා තැරැව්කරුවන්ගේ එතැන් සහ විතැන් ස්වාධීන අධීක්ෂණය දිගටම කරගෙන ගියේය. කොටස් තැරැව්කරුවන් විසින් සපයනු ලබන මූල්‍ය ප්‍රකාශන, අනුකූලතා නිලධාරීන්ගේ වාර්තා සහ ඇතැම් වැදගත් විචල්‍යයන් පිළිබඳ කාලානුරූප හෙළිදරව් කිරීමේ වාර්තා ඇතුළත් වරින් වර සිදුකරන ඉදිරිපත් කිරීම් සමාලෝචනය සහ විශ්ලේෂණය විතැන් අධීක්ෂණයට ඇතුළත් වේ. විතැන් සමාලෝචන වලදී අනාවරණය වූ ඕනෑම අනුගත නොවීමක් ආයතන වෙත දැනුම් දෙනු ලබන අතර ඒවා නිවැරදි කරන තෙක් පසු විපරම් කරනු ලැබේ. එතැන් අධීක්ෂණය අතරතුර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නිලධාරීන් කොටස් තැරැව්කරුගේ ලියාපදිංචි ව්‍යාපාරික කාර්යාලවලට ගොස් පද්ධති සහ ආයතනයට අදාළ නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සම්බන්ධ සාක්ෂි පිළිබඳ පුළුල් පරීක්ෂණයක් පවත්වයි. තවද, 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතට සහ ඒ යටතේ සාදන ලද රීති සහ රෙගුලාසිවලට අනුකූල වීමේ මට්ටම තීරණය කිරීම සඳහා වසර තුළදී කොටස් තැරැව්කරුවන් තිදෙනෙකු (3) සම්බන්ධයෙන් මූල්‍ය බුද්ධි අංශයේ නියෝජිතයන් සමඟ ඒකාබද්ධව පරීක්ෂණ සිදු කරන ලදී.

වසර තුළ, කර්මාන්තයේ කාර්ය සාධනය දෙස අවධානය යොමු කිරීමේදී පෙන්නුම් කළ සුවිශේෂී ලක්ෂණයක් වූයේ, ශක්තිමත් වසරක් වූ 2021 වසරට සාපේක්ෂව කොටස් තැරැව්කරුවන්ගේ මුළු පිරිවැටුම 41% කින් පහත වැටී ඇති බවයි. 2021 දී වාර්තා වූ රු.මිලියන 6,308 ක බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභයට සාපෙක්ෂව 2022 දී වාර්තා වූයේ රුපියල් මිලියන 2,094 කි. ඒ අනුව 2022 දී කර්මාන්තයේ ලාභදායීත්වය 67% පහළ යාමක් පෙන්නුම් කරන ලදි. කොටස් තැරැව්කාර කර්මාන්තයේ කාර්ය සාධනය පිළිබඳ සංසන්දනාත්මක සංඛ්‍යාලේඛන පහත දැක්වේ. (සංඛ්‍යා සටහන 07)

සංඛ්‍යා සටහන 07: කොටස් තැරැව්කාර කර්මාන්තයේ කාර්ය සාධනය

| | 2022 (රු'000) | 2021 (රු'000) | වෙනස % |
|---|---|---|---|
| පිරිවැටුම | 7,989,609 | 13,555,296 | (41) |
| ශුද්ධ තැරැව්කාර ගාස්තුව | 7,383,356 | 12,764,289 | (42) |
| අනෙකුත් ආදායම් | 3,567,382 | 2,015,305 | 77 |
| මෙහෙයුම් ලාභය/අලාභය | 3,812,946 | 8,162,762 | (53) |
| බදුවලට පෙර ශුද්ධ ලාභය/අලාභය | 3,001,569 | 7,723,787 | (61) |
| බදුවලට පෙර ශුද්ධ ලාභය/අලාභය | 2,094,232 | 6,307,940 | (67) |
| ශුද්ධ වත්කම්* | 24,805,524 | 36,490,460 | (32) |
| ශුද්ධ වගකීම්* | 11,631,100 | 23,956,798 | (51) |
| කොටස් හිමියන්ගේ අරමුදල්* | 13,174,424 | 12,533,662 | 5 |

*දෙසැම්බර් 31 දිනට

මූලාශ්‍රය: කොටස් තැරැව්කාර ආයතන විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත භාර දෙන ලද විගණනය නොකළ මූල්‍ය වාර්තා

## කළමනාකරණ සමාගම් සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රම

කළමනාකරණ සමාගම් සම්බන්ධ රීති බලාත්මකවීම 2022 දී සිදු වූ අතර කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීමට, කළමනාකරණය කිරීමට, ක්‍රියාත්මක කිරීමට හෝ අලෙවි කිරීමට කළමනාකරණ සමාගමක් විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය විය. සළකා බලන වසර තුළ, අවදානම් පදනම් කරගත් ප්‍රවේශය ශක්තිමත් කරමින් කළමනාකරණ සමාගම් අධීක්ෂණය සඳහා සහ නැගී එන අවදානම් කාර්යක්ෂමව අධීක්ෂණය කිරීම සහතික කිරීම සඳහා උපාය මාර්ගික ප්‍රමුඛතා පෙළගස්වන ලදී.

කළමනාකරණ සමාගම් සම්බන්ධයෙන් සිදු කරන එතැන් සහ විතැන් අධීක්ෂණ අවදානම් පදනම් ප්‍රවේශය තුළින් මූලිකව අවධානය යොමු කරනුයේ, විචක්ෂණ, මෙහෙයුම්, ද්‍රවශීලතා, කළමනාකරණ ප්‍රතිපත්තිවල ප්‍රමාණවත් බව වැනි ක්ෂේත්‍ර ආවරණය පිළිබඳවයි. සමාලෝචනයේ පරමාර්ථය වන්නේ මූල්‍ය ශක්තිය තක්සේරු කිරීම සහ අදාළ නියාමන අවශ්‍යතා සමඟ එහි අනුකූලතා මට්ටම තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටි, අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම ය.

තවද, විතැන් සමාලෝචනවල හරහා කළමනාකරණ සමාගම් අධීක්ෂණය කරන ලද අතර එමගින් කළමනාකරණ සමාගම්වල මූල්‍ය ශක්තිය, අභ්‍යන්තර පාලනයන් සහ ක්‍රියාශීලී අවදානම් කළමනාකරණ පිළිවෙත් ක්‍රියාත්මක වන්නේ ද යන්න තක්සේරු කරමින් ප්‍රාග්ධන වෙළෙඳපොළේ ස්ථායීතාවය සහතික කිරීම ද අරමුණක් විය. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නියම කර ඇති අවම කොටස් හිමියන්ගේ අරමුදල් අවශ්‍යතාවයට අනුකූලව කළමනාකරණ සමාගම්වල මූල්‍ය තත්ත්වය ස්ථාවර සහ ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා කළමනාකරණ සමාගම්වල මාසික විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය සහ යෝජනා ක්‍රම පිළිබඳ මාසික ප්‍රතිලාභ ඉදිරිපත් කිරීම තුළින් විතැන් අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

සමාගම් කළමනාකරණය සඳහා වන රීති තුළින් අනුකූලතා නිලධාරියෙකු පත් කිරීමේ අවශ්‍යතාවයක් ගෙන එන ලද අතර, එම නිලධාරියාගේ වගකීම වන්නේ කළමනාකරණ සමාගම සෑම විටම අදාළ නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල වන බව සහතික කිරීම සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සමාලෝචනය සඳහා කාර්තුමය අනුකූලතා වාර්තාවක් ඉදිරිපත් කිරීමයි.

මීට අමතරව, ආයෝජකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අදාළ වන්නා වූ නීති පිළිබඳව සහතික වීම සඳහා අවම ඒකක හිමියන් සංඛ්‍යාවට අදාළ අවශ්‍යතාවයන්ට අනුකූල වීම, ආයෝජන සීමා කිරීම් සහ ආයෝජන යෝජනා ක්‍රමවල ද්‍රවශීලතා අවශ්‍යතා අදාළ යෝජනා ක්‍රම මගින් නියම කර ඇති පරිදි පිළිගත හැකි සීමාවන් තුළ ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා අධීක්ෂණය අංශය මගින් අඛණ්ඩ පදනමක් මත විමර්ශනය කර අධීක්ෂණය කරන ලදී.

එවැනි යෝජනා ක්‍රමවල මූල්‍ය ස්ථායීතාවයේ මට්ටම තහවුරු කර ගැනීම සඳහා සහ නියමිත නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම අධීක්ෂණය කිරීම සඳහා අප කළමනාකරණ සමාගම් සහ සාමූහික ආයෝජනා යෝජනා ක්‍රම භාරකරුවන් සමඟ නිරන්තරයෙන් අදහස් හුවමාරු කර ගත්තෙමු. වර්ෂය තුළ යෝජනා ක්‍රමවල ආයෝජන සීමාවන් සහ ද්‍රවශීලතා අවශ්‍යතා පිළිබඳ යම් යම් උල්ලංඝනයන් හඳුනාගැනීමෙන් පසු, ඇතිවිය හැකි අවදානම් අවම කිරීම සඳහා විධිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අධීක්ෂණ අංශය අදාළ කළමනාකාර සමාගම්වලට උපදෙස් දුන්නේය. ඒ අනුව, අදාළ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා කළමනාකරණ සමාගම්වලට සහාය වීම සඳහා අප ඔවුන්ට කාලෝචිත මග පෙන්වීමක් අඛණ්ඩව ලබා දී ඇත. (සංඛ්‍යා සටහන 08, රූප සටහන 01)

සංඛ්‍යා සටහන 08: සාමූහික ආයෝජන යෝජනා ක්‍රමවල සමස්ත තත්ත්වය

| | 2022 දෙසැම්බර් 31 දිනට | 2021 දෙසැම්බර් 31 දිනට | වෙනස % |
|---|---|---|---|
| අනුමත ඒකක භාර අරමුදල් ගණන | 81 | 75 | |
| ඒකක භාරවල ශුද්ධ වත්කම් වටිනාකම (රු. බිලියන දළ වශයෙන්.) | 143.00 | 194.00 | (26.28) |
| ඒකක දරන්නන් සංඛ්‍යාව | 67,912 | 59,426 | 14.27 |
| නිකුත් කරන ලද ඒකක ගණන (අංක මිලියන. දළ වශයෙන්) | 6,283 | 7,835 | (19.80) |
| කොටස්වල ආයෝජනය (රු. මිලියන දළ වශයෙන්) | 11,856 | 17,586 | (32.58) |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය (රු. මිලියන දළ වශයෙන්) | 88,879 | 28,755 | 209.09 |
| වෙනත් උපකරණ සඳහා ආයෝජනය* (රු. මිලියන. දළ වශයෙන්) | 48,187 | 148,907 | (67.63) |

* වාණිජ පත්‍රිකා, භාර සහතික, ණයකර, බැංකු තැන්පතු ආදිය

මූලාශ්‍රය: ඒකක භාර කළමනාකරණ සමාගම් විසින් සිදුකළ නියාමන ඉදිරිපත් කිරීම්

# මෙහෙයුම් සමාලෝචනය

රූප සටහන 01: ඒකකභාර කළමනාකරණ සමාගම්වල වෙළෙඳපොළ කොටස




- සීමාසහිත සිලොන් ඇසෙට් මැනේජ්මන්ට් කම්පනි
- CT CLSA ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
- NDB වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්
- සීමාසහිත සීබැන්ක් ඇසෙට් මැනේජ්මන්ට්
- නැෂනල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
- ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
- J B ෆයිනෑන්ෂල් (ප්‍රයිවට්) ලිමිටඩ්
- ගාර්ඩියන් ඇක්විටි ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
- සෙන්ෆින් ඇසෙට් මැනේජ්මන්ට් (පයිවට්) ලිමිටඩ්
- ඇසෙට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
- කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
- ආර්පිකෝ අටරාසියා ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
- ප්‍රිමියර් වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්
- ඇසෙට්ලයින් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
- සීමාසහිත ඒෂියා සෙකියුරිටීස් වෙල්ත් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
- සොෆ්ට්ලොජික් ඉක්විටි ෆන්ඩ්
- ලීනියර් වෙල්ත් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්

## අනෙකුත් වෙළෙඳපොළ අතරමැදියන්

ආන්තික ණය සපයන්නන්, ආයෝජන කළමණාකරුවන්, ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන, කොටස් ප්‍රාරක්ෂකයන් සහ සාංගමික මූල්‍ය උපදේශකයින් ඇතුළු අනෙකුත් වෙළෙඳපොළ අතරමැදි සියලු ආයතන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධානවලට සහ අදාළ නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූල බව සහතික කිරීම සඳහා සමාන අධීක්ෂණ ක්‍රියාවලියකට යටත් වේ. වෙළෙඳපොළ අතරමැදියන්ගෙන් ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත පැන නගින ඕනෑම පද්ධතිමය අවදානමක් අවම කිරීම සඳහා, එතැන් සහ විතැන් අධීක්ෂණයන් සඳහා ඵලදායී අවදානම් මත පදනම් වූ අධීක්ෂණ රාමුවක් අනුගමනය කරන ලදී.

2022 වර්ෂය තුළ එක් ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් සිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රට තුළ සිය ව්‍යාපාරික කටයුතු නතර කිරීමට ගත් තීරණය දැනුම් දීම විශේෂත්වයකි. එම සමාගමේ ගණුදෙනු ක්‍රියාකාරකම් නතරකිරීම සම්බන්ධ ක්‍රියාවලිය පිළිබඳව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවශ්‍ය උපදෙස් සපයන ලදී.

තවද ආයතනික මූල්‍ය උපදේශකවරයෙකු ලෙස බලපත්‍රයක් ලබා ගැනීම සඳහා නව වෙළෙඳපොළ අතරමැදි කාණ්ඩය යටතේ අයදුම්පත් ලැබී තිබුණි.

## නිරීක්ෂණ, විමර්ශන සහ බලාත්මක කිරීම

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රධාන නියාමන ඉලක්කයක් වන්නේ සාධාරණ හා ක්‍රමවත් ගණුදෙනු පිළිබඳව සහතික වීමයි. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, වෙළෙඳපොළ වැරදි ලෙස හැසිරවීම සහ අනෙකුත් අසාධාරණ වෙළෙඳාම් හඳුනා ගැනීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙළෙඳපොළ ආවේක්ෂණය භාවිතා කරයි. ඕනෑම සැක සහිත වෙළෙඳපොළ විෂමාචාරයක් ආවේක්ෂණ ජාලය හරහා හඳුනාගැනීම හොඳින් සමාලෝචනය කෙරේ. වෙළෙඳපොළ වරදවල් පිළිබඳව සාධාරණ සැකයක් පවතින අවස්ථාවලදී විමර්ශනයන් දියත් කෙරෙන අතර සුදුසු අවස්ථාවලදී බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබයි.

## ආවේක්ෂණ කටයුතු

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රධාන නියාමන අරමුණ වනුයේ සාධාරණ, ක්‍රමවත්, කාර්යක්ෂම හා විනිවිදභාවයෙන් යුත් සුරැකුම්පත් වෙළෙඳපොළක් නිර්මාණය කිරීම, පවත්වාගෙනයාම හා නියාමනය කිරීම වන අතර මනා ක්‍රියාකාරීත්වයකින් යුත් ප්‍රාග්ධන වෙළෙඳපොළක් සඳහා එය ඉතා වැදගත් වේ. සිදුවිය හැකි අහිතකර බලපෑම් වලින් වෙළෙඳපොළේ නිරවද්‍යතාවය ආරක්ෂා කර ගැනීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් වෙළෙඳපොළ ආවේක්ෂණය සිදු කරනු ලබයි. මේ සඳහා වෙළෙඳපොළ නියාමනය හා වෙළෙඳපොළ විචලතාවයන් අතර සමබරතාවයක් රැකගනිමින් විශ්ලේෂණයන් තුළින් වෙළෙඳපොළ වරදවල් මැඩපැවැත්වීම සඳහා සුදුසු උපාය මාර්ග ක්‍රියාත්මක කෙරේ. තවද ව්‍යාජ වෙළෙඳාම් කිරීම, වෙළෙඳපොළ මිලගණන් කෘතිමව උස්පහත් කිරීම, සුරැකුම්පත් වංචා, අභ්‍යන්තරික තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීම, පෙර විකුණුම් ඇතුළු අවිධිමත් වෙළෙඳළෙ ක්‍රියාකාරකම් තුළින් වෙළෙඳපොළට සිදුවිය හැකි කඩාකප්පල්කාරී තත්ත්වයන් මගහැර ගැනීම සඳහා පූර්ව ක්‍රියාකාරී මිනුම් භාවිතා කරයි.

## නව අභියෝග

සමාලෝචනයට ලක්වන කාල පරිච්ඡේදය තුළ අන්තර්ජාල ප්‍රවේශ හරහා වෙළෙඳාම් කරනු ලබන නව තාක්ෂණික දැනුම ඇති ආයෝජකයින් ප්‍රවේශවීමත් සමඟ ප්‍රධාන වශයෙන් වෙළෙඳපොළ ක්‍රියාකාරකම් වල කැපී පෙනෙන වර්ධනයක් ඇති වී තිබේ. තරුණ ජන ආයෝජකයන්ගේ ප්‍රවේශවීම මත සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට වෙළෙඳපොළ ආවේක්ෂණය සඳහා සාම්ප්‍රදායික ප්‍රවේශයෙන් ඔබ්බට යාමට සිදුව ඇත. පහතින් දක්වා ඇති ප්‍රස්ථාර නිදර්ශනයන්ට අනුව වෙළෙඳාම්වලින් 80% ට ආසන්න ප්‍රමාණයක් දේශීය පුද්ගලයන් හරහා ආරම්භ වූ අතර දේශීය අභ්‍යන්තර තැනැත්තන්ගේ නව CDS, ලියාපදිංචි කිරීම් වලින් ආසන්න වශයෙන් 70%ක් පමණ වයස අවුරුදු 35ට අඩු අයගෙන් සමන්විත වූ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. නව ඩිජිටල් දැනුමක් සහිත ආයෝජකයන් ඔවුන්ගේ ආයෝජන තීරණ සමාජ මාධ්‍යයන්හී ප්‍රකාශයට පත් කරන ලද ආයෝජන ආශ්‍රිත අදහස්, විශ්ලේෂණ හා තක්සේරු මත පදනම්ව ගනු ලබයි. එනිසා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් සමාජ මාධ්‍යයන් හරහා පලකරනු ලබන ව්‍යාජ හෝ නොමඟ යවන තොරතුරු අඩංගු අන්තර්ගතයන් කෙරෙහි දැඩි අවධානයක් යොමු කොට ඇත.

අතිරේක වශයෙන් නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත බලාත්මකවීමත් සමඟ කොටස් මිල/ප්‍රමාණ විචලනයන් ඇති කිරීමේ අරමුණින් සමාජ මාධ්‍යය අනිසි ලෙස භාවිතා කිරීම හඳුනාගැනීම සඳහා ඉතා පැහැදිළි හා විශේෂිත විධිවිධාන දක්නට ලැබේ. (රූප සටහන 02, 03)

රූප සටහන 02: ගිණුම් වර්ග අනුව ගනුදෙනු සංසන්දනය




රූප සටහන 03: වයස් අනුව සී ඩී එස් හි නව ලියාපදිංචිවීම් (දේශීය තනි පුද්ගල)




පහත ප්‍රස්ථාරයේ දක්වෙන පරිදි පසුගිය වසර තුළදී වෙළෙඳපොළ පිරිවැටුම ආසන්න වශයෙන් රුපියල් බිලියන 686ක් වූ අතර රුපියල් මිලියන 6කට අධික වූ ගනුදෙනු ප්‍රමාණයක් දක්ණට ලැබුණි. වෙළෙඳ කටයුතුවල සිදු වූ කැපී පෙනෙන වෙනස වෙළෙඳපොළ ආවේක්ෂණයේ අවශ්‍යතාව තවදුරටත් තහවුරු කරනු ලබයි.

## ආවේක්ෂණ සොයාගැනීම්, වාර්තා සටහන්

වෙළෙඳපොළ විෂමාචාර තුළින් සිදුවිය හැකි හානි අවම කර ගැනීම හා බලාත්මක කිරීමේ ක්‍රියාපටිපාටිය වේගවත් කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් එහි සොයා ගැනීම් හා බලාත්මක කිරීමේ ක්‍රියා වාර්තාකරණය සම්බන්ධයෙන් වූ උපාය මාර්ගයන් වෙනස් කරන ලදි. මේ සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් 2020/2021 සිට සොයාගැනීම් කළමනාකරණ පද්ධතියක් යොදා ගෙන ඇති අතර ඒ තුළින් ප්‍රගතිශීලී ප්‍රවේශයක් සඳහා වැඩි දායකත්වයක් ලැබී ඇත. වසර තුළදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් හඳුනා ගනු ලැබූ අසාමාන්‍ය වෙළෙඳපොළ හැසිරීම් 61 ක් හා වෙළෙඳ විෂමාචාර සම්බන්ධයෙන් වූ සොයාගැනීම් පහතින් දක්වා ඇත. (රූප සටහන 04)

රූප සටහන 04: සැක සහිත වරදවල් වර්ග




2022 වර්ෂයේදී සභාපතිතුමාගේ මග පෙන්වීම යටතේ නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ පස්වන කොටසට අනුව පවත්නා බලාත්මක කිරීමේ ක්‍රියාවලීන් සියල්ල එක්ව ගන්නා ලදි. මෙම මුල පිරීම තුළින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට කාර්යක්ෂම හා ඵලදායී බලාත්මක කිරීමේ ක්‍රියාවලීන් සමානුපාතික හා කාලෝචිත ආකාරයට සිදුකළ හැක. (රූප සටහන 05)

රූප සටහන 05: කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු සාරාංශය



# මෙහෙයුම් සමාලෝචනය

මීට අමතරව නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මගින් තහනම් කරන ලද ක්‍රියාවන් හා ඊට මුල් වූ බීජයන් එක් එක් විෂමාචාර යටතේ පැහැදිළිව දක්වා ඇත. තවදුරටත් නව පනත දඬුවම් හා බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන් සඳහා වූ අංග වලින්ද සමන්විතය. මේ අනුව එය සුරැකුම්පත් වෙළෙඳපොළ නියාමනය කිරීමේ විභව හැකියාව හා අනුකූලතාවය ශක්තිමත් කරයි. මීට සමගාමීව පෙර පැවති ආවේක්ෂණ හා විමර්ෂණ ක්‍රියාවලිදාමය වෙනස් වූ අතර වර්තමානය වන විට ආවේක්ෂණ වාර්තා හා සටහන් සහ කොළඹ කොටස් වෙළෙඳපොළ මගින් සපයන ආවේක්ෂණ වාර්තා ආවේක්ෂණ අංශයේ සමාලෝචනයකින් හා ඇගයීමකින් පසුව කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබේ. පැන නගින්නා වූ අවශ්‍යතාවයන් මත උක්ත කාර්යය සඳහා විමර්ෂණ අංශය ඇතුළු අනෙකුත් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අංශයන්ගෙන් සහාය ලබාගනු ලැබේ.

තවද කාලෝචිත ක්‍රියාමාර්ගවල අරමුණු ලුහුබැඳීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වාර්තා නිම කිරීමට වැයවන කාලරාමුවක් සකසන ලදි. එක් එක් ආකාරයේ වරදවල් යටතේ එනම්, මිල හැසිරවීම් හා අභ්‍යන්තර ගනුදෙනු සඳහා ගතවන ඇස්තමේන්තුගත කාලය දැක්වීමට ආකෘතියක් දක්වා ඇත. එම ආකෘතිය දර්ශක දෙකක් යටතේ ඉදිරිපත් කරයි. එනම්, ඉටුකළ යුතු ක්‍රියාකාරකම් හා එක් එක් ක්‍රියාකාරකම සඳහා ගතවන කාලය මෙහෙයවන පරාමිතීන් යනුවෙනි. එවැනි පරාමිතීන් "කාල ශ්‍රම මෙහෙයුම් කාරක'' ලෙස හැඳින් වේ. එබැවින් එක් එක් ක්‍රියාකාරකම් සඳහා ගත වන කාලය අදාළ පරාමිතීන්හී ප්‍රමාණය/විශාලත්වය මත රඳා පවතී. පරාමිතීන්හී ප්‍රමාණය/විශාලත්වය පහත එක් එක් අවස්ථාවෙන් සළකා බලා ව්‍යුත්පන්න කළ යුතුය. ප්‍රමාණය/විශාලත්වය මත එක් එක් පරාමිතීන් උපවර්ග තුනකට වර්ග කර ඇත. එක් එක ක්‍රියාකාරකම් සඳහා පරාමිතියේ එක් එක් උපවර්ගය යටතේ කාල ශ්‍රමය ලබාදී ඇත. මෙම රාමුව අවසානයේ එක් එක් සිද්ධිය සඳහා සම්පත් යොමු කිරීම තීරණය කරනු ඇති අතර ප්‍රශස්ත ලෙස විශ්ලේෂක උත්සාහයන් භාවිතය ඇති කරයි.

ඒ අනුව වසර තුළදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ආවේක්ෂණ අංශයේ සොයාගැනීම් මත පදනම්ව ආවේක්ෂණ වාර්තා 13ක් සහ ආවේක්ෂණ සටහන් 2ක් ද කොමිසම වෙත ඉදිරිපත් කරන ලදි. ගතවූ වසර තුළ කොළඹ කොටස් හුවමාරුවේ ආවේක්ෂණ වාර්තා 3ක් ආවේක්ෂණ අංශය වෙත ලැබුණි. (රූප සටහන 06)

රූප සටහන 06: ආවේක්ෂණ වාර්තා සහ සටහන්




ඉදිරිපත් කරන ලද සියළු වාර්තා අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා විමර්ශන අංශය වෙත යොමු කරන ලදි. වෙළෙඳ විෂමාචාර වැළැක්වීමේ අරමුණින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනතුරු ඇඟවීම් අවවාද කිරීම් ප්‍රකාශයන් ලබා ගැනීම සඳහා කැඳවීම් විෂමාචාරයන්හි බරපතලත්වය මත ලිඛිත හා දුරකථන මාර්ගයෙන් ප්‍රකාශ ලබා ගැනීම් ඇතුළත් විවිධ වැළැක්වීමේ පියවරයන් ලෙස භාවිතා කරයි.

වෙළෙඳපොළට සිදුවිය හැකි හානිය ප්‍රමාදයකින් තොරව අවම කිරීම සඳහා මෙම පියවර ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එහි සාම්ප්‍රදායික ප්‍රවේශයෙන් මිදී ප්‍රගතිශීලී ප්‍රවේශයක් වෙත යොමු වී ඇති අතර ඒ තුළින් ආයෝජක ප්‍රජාව තුළ ඉහළ විශ්වාසනීයත්වයක් ඇති කරයි. 2022 වසරේදී අනුමාන වෙළෙඳපොළ විෂමාචාරයන් පිළිබඳ පැහැදිළි කිරීම් ලබා ගැනීමට අකුලතා නිළධාරීන් 5 දෙනෙකු හෝ ඉහළ අධිකාරියක් හා ආයෝජන උපදේශකවරුන් 04ක් හා ආයෝජකයන් 03ක් සම්බන්ධකර ගන්නා ලදි. එසේම සිද්ධීන් 36ක් සඳහා ප්‍රකාශ ලබා ගැනීමට ආයෝජකයන්ට සහ වෙළෙඳපොළ අතරමැදියන් වෙත ලිපි යොමු කරන ලදි. මීට අමතරව වෙළෙඳපොළ විෂමාචාර සිදු කිරීමට දායක වූවා යැයි සැක සහිත පුද්ගලයන් යොදාගනිමින් ප්‍රකාශ ලබා ගැනීම් 23ක් සිදුකරන ලදි.

## සමාජ මාධ්‍යය නියාමනය

නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා නීතිය පැමිණීමත් සමඟ ආවේක්ෂණ කාර්යයේ විෂය පථය පුළුල් විය. විවිධ සමාජ මාධ්‍ය ජාලයන්හි පලවන වෙළෙඳපොළ නොමඟයවන සුළු තොරතුරු හඳුනාගැනීමත් ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීමත් අප විසින් ආරම්භ කළෙමු. එදිනෙදා නිරීක්ෂණයන් තුළදී විවිධ ආයෝජකයින් ගේ සමාජ මාධ්‍යවල පලකිරීම්, මිල ඉලක්කගත කිරීම්, ගැනුම් විකුණුම් ඇඟවීම්, නිර්දේශ ලබාදීම්, "කොටස් හුවමාරුව'' යන මාතෘකාව හෝ විස්තරයන් භාවිතා කිරීම් ආදිය දක්නට ලැබිණි.

සිදුවිය හැකි වෙළෙඳපොළ විෂමාචාරවලට සම්බන්ධ සමාජ මාධ්‍යය අවභාවිතා කිරීම් මැඩපැවැත්වීම සඳහා කොමිෂන් සභාව විසින් කාලෝචිත හා සමානුපාතික බලාත්මක කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කරන ලදි. ඒ අනුව සොයාගැනීම් 7 කට අදාළව ආයෝජකයන්ගෙන් දුරකථන මාර්ගයෙන් ඉක්මනින් ප්‍රකාශ ලබාගැනීමක් හා ආයෝජකයන් දෙදෙනෙකුගෙන් ලිපි මගින් ප්‍රකාශ ලබා ගැනීමක් සිදු කරන ලදි. සිද්ධීන් 11 කට අදාළව ඒ ඒ සොයාගැනීම්හී බරපතලත්වය මත පදනම්ව ප්‍රකාශයන් ලබා ගන්නා ලදි. ආවේක්ෂණ සොයාගැනීම් මත පදනම්ව කොමිසම විසින් පුද්ගලයන් 7 දෙනෙකුට අනතුරු හැඟවීමේ ලිපි හා දෙදෙනෙකුට තදබල ලෙස අවවාද ලිපි නිකුත් කරන ලෙස නියම කර න ලදි. මීට අමතරව පදනම් විරහිත නොමඟ යවන සුළු නිර්දේශයක් කෙටි පනිවිඩයක් මාර්ගයෙන් ආයෝජකයන් වෙත ලබාදීම හේතුකොට ගෙන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් පළමු වරට කොටස් තැරැව්කාර ආයතනයකට රුපියල් 500,000 ක පරිපාලන දඩයක් නියම කොට ඇත.

## විවිධ ප්‍රතිපත්තිමය කරුණු කෙරෙහි මැදිහත්වීම

මූලික ආවේක්ෂණ කාර්යයන් සඳහා ඇතැම් නීති රීති හා අධීක්ෂණ ක්‍රියාවලීන් අතර වූ හිඩැස් ඉස්මතු කරමින් කොමිසමට කරුණු කිහිපයක් ඉදිරිපත් කෙරිනි. මෙයට කොළඹ කොටස් හුවමාරුවේ නීති හා ලයිස්තුගත සමාගම්හී වාර්ෂික වාර්තා පිළියෙළ කිරීම්වලදී දක්නට ලැබූ අඩුපාඩු ඇතුළත් වේ.

## මානව සම්පත ඉහළ නැංවීම

ආවේක්ෂණ කාර්යය බොහෝදුරට විවිධ තාක්ෂණික මෙවලම් මත කේන්ද්‍රගත වුවද පද්ධතීන් ඇතැම් ව්‍යාජ ධනාත්මක කරුණු නිපදවීමට නැඹුරු වේ. එබැවින් මානව සංවේදනය වෙළෙඳපොළ විෂමාචාරයන්ගෙන් නිරවද්‍යතාවය වෙන්කර ගැනීමේදී වෙන් කළ නොහැකි අංගයක් වේ. තවද නිරීක්ෂණය කරන ලද අසාමාන්‍යතා තවදුරටත් නිරීක්ෂණය කිරීමට හා විමර්ෂණය කිරීමට මානව ප්‍රාග්ධනය අත්‍යවශ්‍ය වේ. වෙළෙඳපොළ ක්‍රියාකාරකම් වල ඉහළයාමත් සමඟ මේ වසරේදීත් මානව ප්‍රාග්ධනය ඉහළ නැංවීමට කටයුතු කරන ලදි. මීට අමතරව වසර තුළදී අවශ්‍ය ක්ෂේත්‍රයන් පිළිබඳ පුහුණුවක් ලබාදීම තුලින්ද ආවේක්ෂණ සේවක ධාරිතාවය ඉහළයාමක් පෙන්නුම් කරන ලදි.

### තාක්ෂණික සංවර්ධනය

වෙළෙඳපොළ ක්‍රියාකාරකම් ඉහළයාම හා වෙළෙඳපොළ ක්‍රියාකාරුවන් විසින් වඩාත් නවීන වෙළෙඳ හැසිරීම් නිර්මාණය කිරීමත් සමඟ ආවේක්ෂණ අංශයේ විශ්ලේෂනාත්මක ධාරිතාවය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගිණි. මේ අනුව කොමිෂන් සභාව විසින් ගෙවී ගිය වසර තුළ සුදුසු විශ්ලේෂක මෙවලම් භාවිතය හා තාක්ෂණික සේවාවන් යොදා ගැනීම සිදු කරන ලදී. 2022 වසර තුළ ද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විශ්ලේෂකයන් හට අඩු කාලයක් තුළදී යම් යම් කාර්යයන් ඉටු කිරීමට හා විශ්ලේෂණයන් නව පරාසයක් තුළ පුළුල් කිරීම සිදු කරන්නා වූ තාක්ෂණික මෙවලම් භාවිතය ඇරඹීම සිදු කරන ලදී. මෙයට සමගාමීව කොමිෂන් සභාව විසින් S & P කැපිටල් IQ මෘදුකාංග සේවාව අත්පත් කරගෙන ඇති අතර එය විවිධ වර්ගයේ වෙළෙඳපොළ තොරතුරු ලබා ගැනීමට වෙබ් පාදක සේවාවක් සපයයි. මේ තුළින් විවිධ මූලාශ්‍රයන් ඔස්සේ තොරතුරු එක් රැස් කිරීමේ වෙහෙසකර තත්ත්වය මග හරවයි.

මීට අමතරව කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළේ සමකාලීන හා විභව වර්ධනයන්ට සරිලන උසස් ආවේක්ෂණ පද්ධතීන් ඇගයීමට ලක් කරන ලදී. මෙම ඇගයීම් ක්‍රියාවලියේදී කොටස් වෙළෙඳපොළ මගින් ඉදිරියේදී හඳුන්වාදීමට අපේක්ෂිත නව ආයෝජන සුරැකුම්පත් වර්ග (New Products) ආවේක්ෂණය කළ හැකි වීමද සැළකිල්ලට ගැනෙන ලදී.

### විමර්ශන කටයුතු

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ සඳහන් නියෝග, නීති සහ රීති කඩකිරීම් හෝ උල්ලංඝණය කිරීම් සම්බන්ධයෙන් වන චෝදනා කෙරෙහි විමර්ශන පවත්වනු ලබයි. එම විමර්ශන මගින් ලබාගන්නා සාක්ෂි පදනම් කරගෙන සුදුසු නීතිමය ක්‍රියාමාර්ග තීරණය කිරීමේදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයින්ගේ උපදෙස් ලබාගනු ලැබේ. ඒ අනුව කොමිෂන් සභාව විසින් වැරදි කරුවන්ට එරෙහිව සුදුසු නීති බලාත්මක කිරීම් සිදු කරනු ලබයි.

2022 වසර ආරම්භයේදී කොමිෂන් සභාව විසින් පූර්ණ විමර්ශන, මූලික විමර්ශන, පැමිණිලි සහ වෙනත් පැවරීම් 70 කරමින් පැවතුනි. 2022 වසර තුලදී තවත් පූර්ණ විමර්ශන 25ක්ද විශේෂ පැවරුම් 2 ක්ද ආරම්භ කරන ලදී. කොමිෂන් සභාව විසින් වසර තුලදී පූර්ණ විමර්ශන 17 ක්, පැමිණිලි 1 ක්, විශේෂ පැවරුම් 5ක් සහ මූලික විමර්ශන 14 ලෙස සියලුම විමර්ශන 37 ක් අවසන් කරන ලදී. එසේම කොළඹ කොටස් හුවමාරුව විසින් එවන ලද ආවේක්ෂණ වාර්තා 3කට අදාළ කටයුතු ආවේක්ෂණ අංශයෙන් සහ නීති සහ බලාත්මක කිරීමේ අංශයෙන් කරගෙන යන ලදී.

ඒ අනුව 2022 වසර අවසන් වන විට විමර්ශන 57 ක් කරමින් පැවතුනි. 2022 දෙසැම්බර් 31 වන දින වන විට ඉන් විමර්ශන 16 ක වාර්තා පිළියෙළ කර තිබුණි.

අදාළ වර්ෂය තුලදී විමර්ශන 13 කට අදාළව පහත නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- අභ්‍යන්තර වෙළෙඳාම (Insider Dealing) සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයන්ට අදාලව පුද්ගලයින් 6 දෙනෙකුට සහ එක් ආයතනයකට හේතු දැක්වීමේ නිවේදන (Show Cause Notice) නිකුත් කිරීමට තීරණය කිරීම.
- ව්‍යාජ සහ නොමඟ යවනසුළු වෙළෙඳපොළක් (Market Manipulation) ඇති කිරීම සම්බන්ධයෙන් වූ විමර්ශනයන්ට අදාළව පුද්ගලයින් 19 දෙනෙකුට හේතු දැක්වීමේ නිවේදන (Show Cause Notice) නිකුත් කිරීමට තීරණය කිරීම.
- ව්‍යාපාර අත්පත් කර ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයට (Takeovers and Mergers Code) අනුව සිදුකරන ලද විමර්ශනයන්ට අදාළව පුද්ගලයින් 9 දෙනෙකුට හේතු දැක්වීමේ නිවේදන (Show Cause Notice) නිකුත් කිරීමට තීරණය කිරීම.
- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට කරගෙන යන විමර්ශනයකදී වැරදි තොරතුරු ලබාදීම සම්බන්ධයෙන් එක් පුද්ගලයෙකුට හේතු දැක්වීමේ නිවේදන (Show Cause Notice) නිකුත් කිරීමට තීරණය කිරීම.
- කොළඹ කොටස් හුවමාරුවේ ලයිස්තුගත රීති 7.8 සහ 8.6 ට අනුකූල නොවීම හේතුවෙන් එක් ලයිස්තුගත සමාගමකට 2001 ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති 17 සහ 18 ට පටහැනිවීම සම්බන්ධයෙන් හේතු දැක්වීමේ නිවේදන (Show Cause Notice) නිකුත් කිරීමට තීරණය කිරීම.
- කොළඹ කොටස් හුවමාරුවේ තැරව්කාර රීතී අංක 2.5.1. ට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධයෙන් එක් තැරව්කාර සමාගමකට හේතු දැක්වීමේ නිවේදන (Show Cause Notice) නිකුත් කිරීමට තීරණය කිරීම.

විමර්ශන 2 කදී තැරව්කාර සමාගම් 2 ක් විසින් සිදු කර ඇති කොළඹ කොටස් හුවමාරුවේ තැරව්කාර රීතී උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුවට යොමු කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

එසේම අදාළ වර්ෂය තුළදී පුද්ගලයින් දෙදෙනෙකුට අභ්‍යන්තර වෙළෙඳාමට අදාළ නීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් අනතුරු හැඟවීමේ ලිපි (Letters of warning) නිකුත් කරන ලදී.

එක් පූර්ණ විමර්ශනයකට සහ මූලික විමර්ශන 8 කට අදාළ නිරීක්ෂණ ශ්‍රී ලංකා මහ බැංකුවට යොමු කරන ලදී.

වර්ෂය තුළදී විමර්ශන 4 කට අදාළ පුද්ගලයින් විසින් වරදක් කර ඇති බවට තහවුරු නොවීම නිසා එම විමර්ශන නීති බලාත්මක කිරීමකින් තොරව අවසන් කරන ලද අතර විමර්ශන 2 ක් යම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා ආවේක්ෂණ අංශයට යොමුකරන ලදී. එක් පැමිණිල්ලක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ විෂය පථයට නොවැටීම හේතුවෙන් අවසන් කෙරිණි.

එක් විමර්ශනයකට අදාළ නිරීක්ෂණ පදනම් කරගෙන කොමිෂන් සභාව විසින් තැරව්කාර සමාගම් වල සමීක්ෂණ කටයුතුවල නිරත වන පුද්ගලයින් ලියාපදිංචි කිරීම සඳහා නව නියාමනයන් හෝ නියාමන රාමුවක් හඳුන්වාදෙන ලෙස කොළඹ කොටස් හුවමාරුවට යොමු කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

### බලාත්මක කිරීමේ කාර්යයන්

කොමිෂන් සභාව විසින් එහි සාමාජිකයින්ගේ නියමය හා මග පෙන්වීම යටතේ බලාත්මක කිරීමේ කාර්යයන් ඉටු කරනු ලබයි;

### අනතුරු ඇඟවීම් නිකුත් කිරීම

- කොටස් දහය (10) බැගින් මිලදී ගැනීම මගින් ලයිස්තුගත පොදු සමාගමක කොටස්වල මිල කෙරෙහි බලපෑම් ඇතිකළ පුද්ගලයන් නව (9) දෙනෙකුට, හේතු දැක්වීමේ ලිපි නිකුත් කිරීමෙන් අනතුරුව, අනතුරු ඇඟවීම් සිදු කරන ලදී.

# මෙහෙයුම් සමාලෝචනය

- ආයෝජකයන් කිහිප දෙනෙකුගේ කොටස් වෙළෙඳාමෙහි මිල කෙරෙහි නොමඟ යවන සුළු පෙනුමක් ඇති කිරීම සම්බන්ධයෙන් සිදුකළ විමර්ශනයකින් අනතුරුව, ආයෝජන උපදේශකයෙකුට අනතුරු අඟවන ලදි.
- ලයිස්තුගත පොදු සමාගමක අධ්‍යක්ෂකවරයෙකුගේ කොටස් ගනුදෙනු අභ්‍යන්තර වෙළෙඳාම් ගණයට වැටේදැයි සිදුකළ විමර්ශනයකට අනතුරුව, එකී අධ්‍යක්ෂකවරයා අනතුරු ඇඟවීමක් නිකුත් කරන ලදි.
- ලයිස්තුගත පොදු සමාගමකට අදාළ තමා සතු අප්‍රකාශිත මිල සංවේදී තොරතුරු සන්නිවේදනය කිරීම මගින් පනතේ 32වන වගන්තිය එකී සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු විසින් උල්ලංඝනය කර ඇත්දැයි සිදුකළ විමර්ශනයකට අනතුරුව එකී අධ්‍යක්ෂකවරයා සහ තවත් පුද්ගලයෙකුට අනතුරු අඟවන ලදි.
- ලයිස්තුගත පොදු සමාගමක අධ්‍යක්ෂකවරයෙකු විසින් සිදුකළ කොටස් ගනුදෙනු අභ්‍යන්තර වෙළෙඳාම් ගණයට වැටේදැයි සිදුකළ විමර්ශනයකට අනතුරුව එකී අධ්‍යක්ෂකවරයාට අනතුරු අඟවන ලදි.
- අදාළ නියමිත කාර්ය පටිපාටිය සහ කොටස් තැරැව්කාර ආයතන සඳහා අදාළ රීතීන් අනුගමනය නොකිරීම සම්බන්ධයෙන් ආයෝජන උපදේශකවරයෙකුට සහ ඔහුගේ කොටස් තැරව්කාර සමාගමට අනතුරු අඟවන ලද අතර එකී උල්ලංඝනය පිළිබඳව පරීක්ෂාකාරී නොවීම සම්බන්ධයෙන් කොළඹ කොටස් වෙළෙඳපොළෙන් කරුණු විමසා සිටින ලදි.
- කාර්ය මණ්ඩලයේ ගනුදෙනුවලට අදාළ සිය කොටස් තැරැව්කාර සමාගමේ ලේඛණගත කාර්ය පටිපාටිය අනුගමනය කිරීමට නියම කර ඇති කොටස් තැරුව්කාර සමාගම්වලට අදාළ රීතීන් අනුගමනය නොකිරීම සම්බන්ධයෙන් ආයෝජන උපදේශකවරයෙකුට අනතුරු අඟවන ලදි.
- සිය සමාගම් සමූහයේ සම්බන්ධිත පුද්ගලයින් විසින් එකී සමාගමේ කොටස්වල ගනුදෙනු කරන කාලයට අදාළ නියාමන කරුණුවලට අදාළව අනුකූලතා වැඩසටහන සඳහන් ලේඛනයක් ඉදිරිපත් කිරීම ඇතුළුව, කොන්දේසි කිහිපයකට යටත්ව පොදු සමාගමක සභාපතිවරයෙකු විසින් සිය සමාගමේ කොටස්වල දෙවතාවකදී සිදුකළ ගනුදෙනු සම්බන්ධයෙන් ඔහු විසින් හේතු දැක්වීමේ නිවේදනයකට එවන ලද පිළිතුරු, ඔහු වෙනුවෙන් ලිඛිත හා වාචිකව සිදුකරන ලද සැළකිරීම් සහ එකී ගනුදෙනු සිදුකළ ආකාරය සැළකිල්ලට ගනිමින් එම පොදු සමාගම් සභාපතිවරයාට අනතුරු ඇඟවීමක් නික්තු කර ලදි.
- සමාජ මාධ්‍ය ජාල ඔස්සේ සිදුකළ නොයෙකුත් පලකිරීම් හරහා පදනම් විරහිත ලෙස කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරැකුම්පත් සම්බන්ධයෙන් නිර්දේශ සහ අදහස් දක්වන ලද ආයෝජකයෙකුට ඊට එරෙහිව අනතුරු අඟවන ලදි.

### හේතු දැක්වීමට දැන්වීම

- ලයිස්තුගත පොදු සමාගමකට එහි ලියාපදිංචි ණය ප්‍රමාණීකරණ නියෝජිතායතනය විසින් ලබාදෙන ලද ණය ප්‍රමාණය සහ 2022 සැප්තැම්බර් මස එකී සමාගම විසින් නිකුත් කරන ලද වගකීම් රහිත නිදහස් කරගත හැකි ලයිස්තුගත ණයකර වලට අදාළ ණය ප්‍රමාණීකරණයේ සංශෝධනය පිළිබඳව කාලානුරූපව අනාවරණය නොකිරීම සම්බන්ධයෙන් එම සමාගමට සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයට හේතු දැක්වීමේ දැන්වීම් නිකුත් කරන ලදි.
- විමර්ශනයක ප්‍රතිඵලයක් ලෙස පවරා ගැනීමේ හා ඒකාබද්ධවීමේ සංග්‍රහයේ 31(3) රීතිය උල්ලංඝනය සහ එකී රීතිය උල්ලංඝණයට අනුබල දීම සහ කුමන්ත්‍රණය කිරීමට අදාළව තනි පුද්ගලයන් දෙදෙනෙකු සහ ලයිස්තුගත පොදු සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයට හේතු දැක්වීමේ දැන්වීම් නිකුත් කරන ලදි.
- වාර කිහිපයක් තිස්සේ ලයිස්තුගත පොදු සමාගමකට අදාළව පලනොකරන ලද මිල සංවේදී තොරතුරු තමන් සන්තකයේ තබා ගනිමින් එකී සමාගමේ කොටස්වල ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් එකී සමාගමේ අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුට පුද්ගලික සමාගමකට සහ ලයිස්තුගත සමාගමකට අදාළව ලයිස්තුගත කිරීමේ රීති උල්ලංඝනය සම්බන්ධව හේතු දැක්වීමේ දැන්වීම් නිකුත් කරන ලදි.
- පවරා ගැනීමේ හා ඒකාබද්ධවීමේ සංග්‍රහයේ 31(1) (ආ) රීතිය උල්ලංඝනයට අදාළව සමාගමක අධ්‍යක්ෂවරුන් 8 දෙනෙකුට ද අසත්‍ය හා නොමඟ යවනසුළු තොරතුරු කොමිෂන් සභාවට ලබාදීම සම්බන්ධයෙන් එක් පුද්ගලයෙකුටද හේතු දැක්වීමේ දැන්වීම් නිකුත් කරන ලදි.
- විමර්ශනයකින් පසුව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතින්හි 12 වන රීතිය උල්ලංඝනය සම්බන්ධයෙන් පුද්ගලයන් 13කටද ඒ සඳහා අනුබල දීම සම්බන්ධයෙන් එක් පුද්ගලයෙකුටද නියමිත ක්‍රියාපටිපාටිය අනුගමනය නොකිරීම සම්බන්ධයෙන් කොටස් තැරැව්කාර සමාගමකටද හේතු දැක්වීමේ දැන්වීම් නිකුත් කරන ලදි.
- විමර්ශනයකින් අනතුරුව ලයිස්තුගත සමාගමක සම්බන්ධිත පුද්ගලයෙකුට එකී සමාගම සම්බන්ධව පල නොකළ මිල සංවේදී තොරතුරු තමන් සතුව තිබියදී එකී සමාගමේ කොටස් ගනුදෙනු කිරීම හේතුවෙන්, හේතු දැක්වීමේ දැන්වීමක් නිකුත් කරන ලදි.
- ලයිස්තුගත කොටස් සම්බන්ධයෙන් සිය ට්විටර් ගිණුමේ පලකරන ලද පනිවිඩ මගින් අනෙකුත් එකී කොටස් වල ගනුදෙනුවට පෙළඹවීමට තැත් කිරීමේ පෙනුමක් ඇති කිරීම සම්බන්ධයෙන් ආවේක්ෂණ අංශයේ සොයාගැනීම්වලින් අනතුරුව එකී පුද්ගලයාට හේතු දැක්වීමේ දැන්වීමක් නිකුත් කරන ලදි.

### වරදවල් සමථයකට පත් කිරීම

- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතීන් හී 12 වන රීතිය ප්‍රකාරව වෙළෙඳපොළ නොමඟ යවනසුළු පෙනුමක් ඇති කිරීම යන චෝදනාවට ලක් වූ පුද්ගලයන් දෙදෙනෙකුගේ එකී වරදවල් ඔවුන් කොමිෂන් සභාවට රුපියල් මිලියන 3.3ක මුදලක් බැගින් පියවීම මගින් සමථයකට පත් කිරීමට කොමිෂන් සභාව විසින් එකඟ වන ලදි. එක් පුද්ගලයෙකුට එරෙහි චෝදනා එම පුද්ගලයා එම මුදල් පනතේ 51 (අ) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ වන්දි අරමුදලට බැර කිරීමෙන් අනතුරුව සමථයකට පත් වූ අතර අනෙක් පුද්ගලයාට සිය වරද සමථයකට පත් කිරීමට නොහැකිවූයෙන් ඔහුට එරෙහිව නඩු මාර්ගයෙන් කටයුතු කිරීමට පියවර ගෙන ඇත.

- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ 12 වන රීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධව අනාවරණය වූ පුද්ගලයන් දෙදෙනෙකුගේ සමථ ඉල්ලීම් හේතුවෙන් ඔවුන්ගේ වරදවල් රුපියල් මිලියන 3.3 බැගින් ගෙවීමෙන් අනතුරුව සමථයකට පත් කිරීමට කොමිෂන් සභාව විසින් එකඟවන ලදි. එක් පුද්ගලයෙකු රුපියල් මිලියන 3.8 ගෙවීමෙන් අනතුරුව සිය වරද සමථයකට පත් කරන ලදි. අනෙකුත් පුද්ගලයා විසින් සිය සමථ මුදල අඩුකර ගැනීමට කළ ඉල්ලීම කොමිෂන් සභාවෙන් ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව ඔහුට ඒ සම්බන්ධව දැනුම් දෙන ලදි.

## අවවාද ලිපි නිකුත් කිරීම

- කොළඹ කොටස් වෙළෙඳපොළෙහි හුවමාරු වන කොටස්වල මිල හෝ වෙළෙඳපොළ සම්බන්ධයෙන් ව්‍යාජ පෙනුමක් ඇති කිරීමට හැකි ක්‍රියාකාරකම් හා ගනුදෙනු ක්‍රියාකලාපයන්හි යෙදීමෙන් වළකින ලෙස එක් ආයෝජකයෙකුට අවවාද කරන ලදි.
- ලයිස්තුගත කොටස්වල ව්‍යාජ වෙළෙඳපොළක් ඇති කිරීමට හේතුවන ආකාරයෙන් අනෙකුත් ආයෝජකයන් පොළඹ වන ආකාරයෙන් සමාජ මාධ්‍යය හරහා ලයිස්තුගත කොටස් සම්බන්ධයෙන් පල කිරීමට එරෙහිව ආයෝජකයන් දෙදෙනෙකුට අවවාද කරන ලදි.

## පරිපාලනමය දණ්ඩනයන් නියම කිරීම

කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද හේතු දැක්වීමේ ලිපිවලට දක්වන ලද පිළිතුරු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව පදනම් විරහිත ලෙස ආයෝජකයන්ට ලයිස්තුගත කොටසක් සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කිරීම මගින් එකී කොටස් මිල කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කිරීම සම්බන්ධයෙන් කොටස් තැරැව්කාර සමාගමක් හා එහි අභ්‍යාසලාභි ආයෝජන උපදේශකයෙකුට කොමිෂන් සභාව විසින් පරිපාලන දන්ඩනයක් නියම කරන ලදි.

ඒ අනුව කොටස් තැරැව්කාර සමාගමට පනතේ 178 (I) (II) වගන්තිය ප්‍රකාරව පනතේ 112 (1) වගන්තිය උල්ලංඝනය සම්බන්ධයෙන් රුපියල් 500,000 ක දඩයක් නියම කරන ලද අතර සිය කටයුතු පවත්වාගෙනයාමේදී නියමිත ක්‍රියාපටිපාටි අනුගමනය කරන ලෙස නියම කරන ලදි. ඊට අමතරව පනතේ 178 (I) (II) වගන්තිය ප්‍රකාරව, පනතේ 112 (I) වගන්තිය උල්ලංඝනය සම්බන්ධයෙන් එකී තැරැව්කාර සමාගමේ අභ්‍යාසලාභී ආයෝජන උපදේශකට තරයේ අවවාද කරන ලදි.

## නීති කෘත්‍යය

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව එම්. අයි. සම්සුදීන් සහ එම්. බී. නිසාර් - MC S/5322/17

1987 අංක 36 දරණ (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 51(1)(අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්ති සමග කියවිය යුතු 2001 දෙසැම්බර් 18 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලවූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 රීතිය යටතේ දඩුවම් ලැබිය හැකි වෙළෙඳපොළ/මිල හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම සහ වෙළෙඳපොළ/මිළ හැසිරවීමට ක්‍රියාකිරීම සම්බන්ධව එම්. ඉම්තියාස් සම්සුදීන් සහ බාෆික් නිසාර් යන අයට එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ මෙම නඩුව පවරන ලදි.

### මැග්පෙක් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව - HCMCA 217/2007

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ කොමිෂන් සභා රීති උල්ලංඝනය කරමින් යම් වැදගත් කරුණු වහාම හෙළි නොකිරීම සම්බන්ධව වරදකරුවන් කෙරුන මෙම නඩුවේ චූදිතයන්ගෙන් හතර දෙනෙක් ගරු මහේස්ත්‍රාත් වරයා විසින් ලබාදුන් තීන්දුව සහ සිරදඬුවමට එරෙහිව පළාත්බද මහාධිකරණයට අභියාචනා කර ඇත. අභියාචනයේදී, චූදිතයන් තුන්දෙනෙකුට අදාලව අධිකරණය විසින් ලබාදී තිබූ තීන්දු නැවත තහවුරු කෙරු නමුත් දණ්ඩනය ලිහිල් කරන ලදි. හයවන චූදිතට අභයාචනාකරු වරදට හා දඬුවමට එරෙහිව සිදුකළ අභියාචනය අධිකරණය පිළිගෙන ඔහුට එරෙහි තීන්දුව හා දඬුවම ඉවත් කරන ලදි.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව ලංකා කන්නංගර, කපිල සෙනරත්, ෆාරික් ෆුර්කාන් සහ රවීන්ද්‍ර මල්ලවආරච්චි MC/කොටුව/13736/19

1987 අංක 36 දරණ (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 51(1)(අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්ති සමග කියවිය යුතු 2001 දෙසැම්බර් 18 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලවූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 රීතිය යටතේ දඩුවම් කරනු ලැබිය හැකි වරදවල් වන වෙළෙඳපොළ අයථා හැසිරවීම, වෙළෙඳපොළ අයථා හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම හා ආධාර හා අනුබල දීම සම්බන්ධයෙන් ආයෝජන උපදේශකවරුන් හතර දෙනෙකුට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදි.

මෙම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී.

### ඩබ් කේ එච් වැගපිටිය, තිලක් ද සිල්වා එරෙහිව චින්තක මෙන්ඩිස් HCRA 28/22

කොමිෂන් සභාව විසින් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනුකරන ලද MC/කොටුව/16987/20 නඩු කටයුත්තේ උගත් මහේස්ත්‍රාත්තුමාගේ නියෝගයකට එරෙහිව එම නඩුවේ චූදිතයන් දෙදෙනෙකු විසින් මහාධිකරණයට යොමුකරන ලද සංශෝධන ඉල්ලීම එකී අධිකරණයේ විභාග වෙමින් පවතී.

### චින්තක මෙන්ඩිස් එරෙහිව ඩබ් කේ එච් වැගපිටිය, තිලක් ද සිල්වා සහ තක්ෂිල හුලංගමුව MC/කොටුව/16967/20

1987 අංක 36 දරණ (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 51 (1) (අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113 (අ) සහ 102 වගන්තිය සමඟ කියවිය යුතු 2001 දෙසැම්බර් මස 18 වන දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 12 වන රීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වෙළෙඳපොළ අයථා හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම සහ ආධාර හා අනුබලදීම සම්බන්ධව ඉහත සඳහන් පුද්ගලයන්ට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදි.

මෙම නඩුව දැනට අධිකරණයේ විභාග වෙමින් පවතී.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව සේන යද්දෙහිගේ සහ එස්. තිනාමනි MC/කොටුව/12639/19

අභ්‍යන්තර වෙළෙඳාමට සහ එයට අනුබලදීමට එරෙහිව මෙම පුද්ගලයන්ට 2019 වර්ෂයේදී, 1987 අංක 36 දරණ (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 32 (6) වගන්තිය සහ දණ්ඩනීති සංග්‍රහයේ 102 වගන්තිය යටතේ කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදි. මෙම නඩුව දැනට එකී අධිකරණය ඉදිරියේ පවතී.

# මෙහෙයුම් සමාලෝචනය

### සේන යද්දෙහිගේ එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව CA/ රිට්/417/2017

### සේන යද්දෙහිගේ එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව SC/SPL/LA 100/19 (ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව සේන යද්දෙහිගේ සහ එස්. තිනාමනි MC/කොටුව/12639/19)

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් තමන්ට විරුද්ධ ව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩු කටයුත්තට එරෙහිව එහි පළවන වගඋත්තර කරු අභියාචනාධිකරණයේ රිට් ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදි. අභියාචනාධිකරණය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු අත්හිටුවමින් අතුරු තහනම් නියෝගයන් කිරීම ප්‍රතික්ෂේප කළ අතර නොතීසි නිකුත් කිරීම මත ලිඛිතව කරුණු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදි. එකී නියෝගයට එරෙහිව ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරමින් එකී නියෝගය අභියෝගයට ලක් කිරීමට විශේෂ අවසර ඉල්ලා සිටින ලදි. කොමිෂන් සභාව විසින් මූලික විරෝධතාවක් දක්වමින් කියා සිටින ලද්දේ මෙහිදී පෙත්සම්කරු විසින් දිවිරුම් හා තහවුරු කිරීමේ ආඥා පනත හා 1981 කොන්සල් කාර්යයන් පිළිබඳ පනතට අනුව අදාළ දිවුරුම් ප්‍රකාශය නිසි පරිදි ගොනුකර නොමැති බවයි.

ඉදිරිපත් වූ මූලික විරෝධතාවයට අදාළ නියෝගය කල් තබමින් එහි නියෝගය ලබාදෙන තෙක් මහේස්ත්‍රාත් අධිකරණයේ සහ අභියාචනාධිකරණයේ ඇති සම්බන්ධිත නඩු කටයුතු අත්හිටුවන ලදි. මේ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ලැබීමට නියමිතව ඇත.

### තාලිබ් තවුෆික් අල් නකීබ් එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ (WP/HCCA/LA/COL/158/17 (LA), DC Case No: DSP/20/2016)

පැමිණිලිකරු 14% ක කොටස් හිමියෙකු වන හන්ටර් සහ සමාගමට 1982 අංක 17 දරණ සමාගම් පනත උල්ලංඝනය කරමින් හීත් සහ සමාගම විසින් සිදුකළ කොටස් නිකුතුවකින් සිදුවන බලපෑම පිළිබඳව විමර්ශනය කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් කොළඹ කොටස් වෙළෙඳපොළ සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව මෙම නඩුව පවරා ඇත.

2017 ඔක්තෝබර් මස 26 වන දිනැති නියෝගය මගින් මෙම නඩුව දිසා අධිකරණයෙන් නිෂ්ප්‍රභා කරන ලද අතර ඊට එරෙහිව පැමිණිලිකරු විසින් අභියාචනයට අවසර ඉල්ලා බස්නාහිර පලාත්බද මහාධිකරණයට මෙම ඉල්ලීම සිදුකර ඇත.

මෙම නඩුව දැනට එම අධිකරණය ඉදිරියේ පවතී.

### S.C.F.R. අයදුම්පත් අංක 182/2021 - ඉංජිනේරු ජී. කපිල රේණුක පෙරේරා එදිරිව නීතිපති සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

අනිකුත් කරුණුද ඇතුළුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති පෙත්සම්කරුගේ (සියළු ශ්‍රී ලාංකික පුරවැසියන්ගේද ඇතුලුව) මූලික අයිතිවාසිකම් එකක් හෝ කීපයක් උල්ලංඝණය වීමට ආසන්න බවට ප්‍රකාශයක් නිකුත් කරවා ගැනීම සඳහා සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් හා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවද (7වන වගඋත්තරකරු ලෙස) ඇතුළුව පාර්ශව 32ක ට එරෙහිව පෙත්සම්කරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනුකර ඇත.

තවද, සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් (මෙය, සුදුසු ප්‍රතිව්‍යුහගතකිරීම් තුළින් රජයට අයත් සත්කාරක කළඹ ප්‍රශස්ත කාර්යසාධන මට්ටමට පත්කිරීමේ මූලික අරමුණ ඇතිව පිහිටවනු ලැබූ නව රාජ්‍ය දේපළ සංවර්ධන සමාගමකි) පිහිටුවනු ලැබූ 2020 මාර්තු 06 දිනැති කැබිනට් තීන්දුව ශූන්‍ය හා බලරහිත බවට ප්‍රකාශනයක් ලබාගැනීමට පෙත්සම්කරු ඉල්ලුම් කර ඇත.

සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්, කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත කිරීමට ඉඩදීමෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වලක්වමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට අතුරු නියෝගයක් නිකුත්කරන මෙන්ද මෙහිදී ඉල්ලා ඇත.

මෙම නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතී.

### C.A. (රිට්) අයදුම්පත් අංක 148/2021: එම්. ඒ. සී. ඊ. මන්ත්‍රීරත්න එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හා තවත් 14ක්

මෙහිදී, පෙත්සම්කාරියට උසස්වීමක් ලබාදීමට, නැතිනම් විකල්ප ලෙස දැනට කළමණාකාර තනතුරට උසස් කර ඇති සේවකයාට ඉහළින් පෙත්සන්කාරිය තබමින් කළමණාකාර තනතුරට උසස්කරන ලෙසට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට නියම කිරීම ඉල්ලමින් සහ එක් සේවකයෙක්ට උසස්වීමක් ලබාදීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව ගත් තීරණයක් අවලංගු කරන ලෙස ඉල්ලමින් සර්ෂි යොරාරි හා මැන්ඩාමුස් රිට් ආඥා ලබාදෙන ලෙස අභියාචනාධිකරණයෙන් ඉල්ලමින් පෙත්සම්කාරිය විසින් අභියාචනයක් ගොනුකර ඇත.

මෙම නඩුව අභියාචණාධිකරණයේ විභාග වෙමින් පවතී.

### CASE NO: SC (SPL) LA අයදුම්පත් අංක 177/2020

පෙත්සම්කාර පන්වලිංගම් ඇසෝසියේෂන් (පුද්ගලික) සමාගම විසින්, හැටන් නැෂනල් බැංකුව ලයිස්තුගත පොදු සමාගමෙහි තම සමාගම සතුව තිබූ කොටස් සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනලද යම් නියෝගයන්ට එරෙහිව සර්ෂි යොරාරි රිට් ආඥා ලබාදෙන ලෙස අභියාචනාධිකරණයෙන් ඉල්ලා සිටින ලදි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් හා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඇතුළුව පාර්ශව 4ක් මෙහි වගඋත්තරකරුවන් ලෙස නම්කර ඇත. අභියාචනාධිකරණය විසින් අදාල රිට් ආඥා ප්‍රත්ක්ෂේප කිරීමෙන් අනතුරුව පෙත්සම්කාර සමාගම විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කිරීමට විශේෂ අවසරයක් ලබාගැනීමට ඉල්ලුම් කර ඇත. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිය කොමිෂන් සභාවෙන් මෙහිදී කිසිදු සහනයක් ඉල්ලා නැත.

මෙම නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතී.

### නාගරික සංවර්ධන අධිකාරිය එදිරිව ඔනාලි හෝල්ඩින්ස් පීඑල්සී (සිවිල්)/11/2021/CO

මෑතකදී ඔනාලි හෝල්ඩින්ස් පී එල් සී ලයිස්තුගත පොදු සමාගමේ අයිතිය අනිවාර්ය අර්පණයක් මගින් අත්පත් කර ගනු ලැබූ වෙනත් ලයිස්තුගත සමාගමක් කොටස් අයිතිය හේතුවෙන් සිදු වී ඇති ඔනාලි සමාගමේ පාලනයේ සැළකිය යුතු වෙනස්කම් නිසා ඔනාලි සමාගමේ කටයුතු වල සමාගම අගතිදායී අන්දමින් සිදුකෙරෙමින් සිටින බවට චෝදනා කරමින් ඔනාලි සමාගමේ 5%ක කොටස් හිමියෙකු වන නාගරික සංවර්ධන අධිකාරිය විසින් සමාගම් පනතේ 226, 520, 521 වගන්ති සමගද එක්ව සළකමින් එම පනතේ 225 වන වගන්තිය යටතේ ඔනාලි සමාගමට එරෙහිව මෙම නඩුව ගොනු කර ඇත. මෙම නඩුවේ නාගරික සංවර්ධන අදිකාරිය විසින් ඔනාලි හෝල්ඩිංග්ස් පී එල් සී ලයිස්තුගත පොදු සමාගම, ලංකා රියැලිටි

ඉන්වෙස්ට්මන්ට්ස් ලයිස්තුගත පොදු සමාගම, රේණුකා කැපිටල් ලයිස්තුගත පොදු සමාගම, පී ඩබ් කෝපරේට් සෙක්‍රටේරියල් (පුද්ගලික) සමාගම පිළිවෙලින් මෙම නඩුවේ 1 සිට 5 වන වගඋත්තරකරුවන් ලෙස නම්කර ඇති අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එහි 6 වන වග උත්තරකරු ලෙස නම්කර ඇත.

මෙම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී.

### කැපිටල් ට්‍රස්ට් හොල්ඩිංග්ස් සහ උෂාන් හර්ෂ මෙනිඩිස් වික්‍රමසිංහ එදිරිව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ නීතිපතිතුමා (CA (W) 465/2022)

මෙම නඩුවේ දෙවන පෙත්සම්කරු සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතීන් හී 12 වන රීතිය උල්ලංඝනය කිරීමට එරෙහිව කොමිෂන් සභාව විසින් අපරාධමය නඩුවක් ගොනුකිරීමට තීරණය කිරීමට එරෙහිව සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලමින් මෙම නඩුව ගොනුකර ඇති අතර එම නඩුව අභියාචනාධිකරණයේ විභාග වෙමින් පවතී.

### චින්තක මෙන්ඩිස් එදිරිව නිහාල් රදැල්ල MC/කොටුව/23337/22

1987 අංක 36 දරණ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 469 (1) වගන්තිය උල්ලංඝනය කරමින් විමර්ෂනයකදී සිදුකරන ලද

> "ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ සඳහන් නියෝග, නීති සහ රීති කඩකිරීම් හෝ උල්ලංඝණය කිරීම් සම්බන්ධයෙන් වන චෝදනා කෙරෙහි විමර්ශන පවත්වනු ලබයි."

වාචික ප්‍රකාශයක් අතරතුරු අසත්‍ය හා නොමඟ යවනසුළු තොරතුරු ලබාදීමට එරෙහිව නිහාල් රදැල්ලට එරෙහිව 2022 දී කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු ගොනු කරන ලදි.

මෙම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී.

### පැමිණිලි විසඳීමේ ක්‍රමය

ලයිස්තුගත සමාගම් සම්බන්ධයෙන් ලද පැමිණිලි සහ එයට ලබාදුන් විසඳුම් පහත දක්වා ඇත. (සංඛ්‍යා සටහන 09)

සංඛ්‍යා සටහන 09: ලයිස්තුගත සමාගම් වලට අදාළ පැමිණිලි සහ කාරණා පිළිබඳ කටයුතු

| පැමිණිල්ලේ ස්වභාවය | පැමිණිලි ගණන | ගණුලැබූ පියවර/ වත්මන් තත්ත්වය |
|---|---|---|
| ලයිස්තුගත පොදු සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකලාපය සම්බන්ධව | 5 | සියළුම කරුණු යෝග්‍ය පරිදි විසඳන ලදි |
| ලයිස්තුගත සමාගම්වල ක්‍රියාකලාපය සම්බන්ධව | 6 | කාරණා 04ක් යෝග්‍ය පරිදි විසඳන ලදි |
| ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි නීතිරීතීන්ට අනුකූල නොවීම | 1 | කාරණාව දැනට විභාග වෙමින් පවතී |
| වෙනත් පරිපාලන කාරණා සම්බන්ධව | 8 | සියළුම කරුණු යෝග්‍ය පරිදි විසඳන ලදි. |
| අදාළ මූල්‍ය වාර්තාකරණ රාමු වලට අනුකූල නොවීම සම්බන්ධව | 1 | කාරණාව යෝග්‍ය පරිදි විසඳන ලදි |
| | 21 | |

# මෙහෙයුම් සමාලෝචනය

## ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය

ව්‍යාපාර සඳහා අරමුදල් සම්පාදනය, රැකියා උත්පාදනය, වත්කම්වල හිමිකාරිත්වය පුළුල් කිරීම සහ දිගුකාලීන ඉතුරුම් මත ප්‍රතිලාභ උත්පාදනය කිරීම සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රහල කාර්යභාරයක් ඉටු කළ අතර ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ නව මාවතකට පරිවර්තනය කිරීමේ අරමුණින් සංවර්ධන ක්‍රියාකාරකම් ගණනාවක් සිදු කරන ලදී. වර්ෂය තුළ පහසුකම් සපයන ලද එවැනි ප්‍රධාන සංවර්ධන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

## කොටස් වෙළෙඳපොළ මෙහෙයුම් ඩිජිටල් පරිවර්තනය

ප්‍රාග්ධන වෙළෙඳපොළ ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් කොටස් වෙළෙඳපොළ මෙහෙයුම් ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීම දක්වා අදියර තුනකින් සාර්ථකව නිම කරන ලදී. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ කොළඹ කොටස් හුවමාරුවෙහි නියෝජිතයන්ගෙන් සමන්විත ඒකාබද්ධ කමිටුවක් පත් කිරීමත් සමඟ මෙම කාර්යය ආරම්භ විය. එමගින් වෙළෙඳපොළ තුළ කටයුතු කිරීමේ පහසුව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ තාක්ෂණික දැනුමක් ඇති තරුණ ආයෝජක ප්‍රජාවක් වෙළෙඳපොළ වෙත ප්‍රවේශ විය.

කොටස් වෙළෙඳපොළේ මෙම ඩිජිටල් පරිවර්තනය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් මට්ටම් වැඩිදියුණු කිරීමට ද ධනාත්මක ලෙස දායක වී ඇත. කොටස් වෙළෙඳපොළ ජංගම යෙදුම දියත් කිරීමෙන් පසු සුළු පරිමාණ ආයෝජකයින්ගේ සහභාගීත්වය සැළකිය යුතු ලෙස වැඩි වීම තුළින් මෙය පැහැදිලි විය. මෙම ඩිජිටල් පරිවර්තනය මගින් කොටස් වෙළෙඳපොළ මෙහෙයුම් ගණනාවක් ඔන්ලයින් හරහා ක්‍රියාත්මක කිරීමට හැකි වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ නව පුනර්ජීවනයක් දැකගත හැකි විය. ''ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ - ගමන්මග" ඩිජිටල්කරණ ක්‍රියාවලියේ තුන්වන අදියර යටතේ සම්පූර්ණ කරනු ලැබූ පියවරයන්:

- ජංගම යෙදුම හරහා විදේශීය පුද්ගලයින් (කොටස් තැරැව්කාර සමාගම් හරහා) ඇතුළත් කිරීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා අභ්‍යන්තර ආයෝජන ගිණුම් (IIAs) විවෘත කිරීමට ඉල්ලීමේ හැකියාව
- කොටස් තැරැව්කරුවන් විසින් CDS ගිණුම් විවෘත කිරීම
- CSE ජංගම යෙදුමට සම්බන්ධ වීමට තනි කොටස් තැරැව්කාර සමාගම් සඳහා යෙදුම් ක්‍රමලේඛන සකස්කිරීම
- CSE ජංගම යෙදුම - ත්‍රිභාෂා විශේෂාංගය
- ලාභ අලාභ පහසුකම
- විද්‍යුත් මූලික කොටස් නිකුතු (e-IPO) වෙබ් ද්වාරය
- e-Connect හරහා වාර්තා මිලදී ගැනීම්
- ආන්තික ගිණුම් විවෘත කිරීම්
- පුද්ගලික කොටස් පැවරීම් (ආන්තික ගිණුම්වල අර්ථලාභී අයිතිය වෙනස් වනවිට)
- සාංගමික ක්‍රියාකාරකම් දින දර්ශනය
- නම්කිරීම්
- විද්‍යුත් පිරිනැමීම්/ ප්‍රති මිලදී ගැනීම
- විද්‍යුත් හිමිකම් කොටස් සම්බන්ධ (පළමු අදියර - කොටස් වෙන් කිරීමේ ලිපි ඩිජිටල්කරණය)
- ඒකක භාරවලට ඇතුල් වීම

## කොළඹ කොටස් හුවමාරුවෙහි මධ්‍යම ප්‍රතිපාර්ශව (CCP) යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැළසීම

කොළඹ කොටස් හුවමාරුව විසින් ගෙවීම් වලට එදිරිව බේරුම් කිරීමේ (DVP) යාන්ත්‍රණයක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් පසු, ඊළඟ අදියර වූයේ වෙළෙඳපොළෙහි පශ්චාත් ගනුදෙනු අවදානම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා මධ්‍යම ප්‍රති පාර්ශව (CCP) යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමයි. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් 2022 ජනවාරි මාසයේදී මෙම කාර්යය සඳහා මූලිකත්වය ගෙන කටයුතු කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජික සුනිල් ලංකාතිලක මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ කොටස් හුවමාරුව සමඟ ඒකාබද්ධව කමිටුවක් පත් කරන ලදී. ඒකාබද්ධ කමිටුවේ උපදෙස් මත හා ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP) යටතේ පත්කළ උපදේශකවරයාගේ තාක්ෂණික සහයෝගය මත එම කාර්යය සඳහා සහය දැක්වීමට, මධ්‍යම ප්‍රතිපාර්ශව පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ප්‍රතිපත්ති රාමුව කොමිෂන් සභාව විසින් අවසන් කර අනුමත කරන ලදී. ඒ අනුව, කොළඹ කොටස් හුවමාරුව විසින් පද්ධතිමය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ආරම්භ කරන ලද අතර, වර්තමානය වන විට, කොළඹ කොටස් හුවමාරුව විසින් සැපයුම්කරු සමඟ පද්ධතිමය පිරිවිතරයන් අවසන් කිරීමේ ක්‍රියාවලියෙහි යෙදී සිටී. යෝජිත ආකෘතිය පිළිබඳව කොළඹ කොටස් හුවමාරුව විසින් කර්මාන්ත උපදේශන ද පවත්වා ඇත. කොළඹ කොටස් හුවමාරුව සහ කොටස් තැරැව්කාර සමාගම් විසින් පද්ධතිවල වෙනස් කිරීම් අවසන් කර 2023 දෙවන කාර්තුව වන විට එය සජීවීව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

## නව නිෂ්පාදන වෙළෙඳපොළට හඳුන්වා දීම

නව නිෂ්පාදන රැසක් වෙළෙඳපොළට හඳුන්වාදීම කඩිනම් කිරීමේ අරමුණින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජික මනිල් ජයසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුවේ සාමාජිකයින්ගෙන් සමන්විත ඒකාබද්ධ කමිටුවක් පත් කරන ලදී. එහි 1 අදියර යටතේ පහත සඳහන් මුලපිරීම් පිළිබඳව අවධානය යොමුකරනු ලබයි:

- සුරැකුම්පත් ණයට ගැනීම සහ ණය දීම හරහා නියාමන කෙටි විකුණුම් ක්‍රියාත්මක කිරීම
- හරිත/නිල් බැඳුම්කර හඳුන්වාදීම
- ESG දර්ශකය හඳුන්වාදීම
- ලයිස්තුගත ආයතනික ණයකර මත REPO ගනුදෙනු සිදු කිරීමට OTC වේදිකාව
- පර්පෙචුවල් බැඳුම්කර ලැයිස්තුගත කිරීම
- රජයේ ව්‍යාපාර විසින් නිකුත් කරන ලද ණය / කොටස් සුරැකුම්පත් ලයිස්තුගත කිරීම පහසු කිරීම සඳහා ලයිස්තුගත කිරීමේ රාමුව පුළුල් කිරීම.
- ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත ආයතන විසින් නිකුත් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් නම් කරන ලද ණය සුරැකුම්පත් ලයිස්තුගත කිරීම සහ වෙළෙඳාම් කිරීම
- OTC වේදිකාව මත ඉහළ අස්වැන්නක් සහිත ආයතනික ණය සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම.
- XBRL මත පදනම් වූ වාර්තාකරණ වේදිකාව ක්‍රියාත්මක කිරීම

II අදියර යටතේ සලකා බලනු ලබන ක්‍රියාකාරකම් වනුයේ ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ නිෂ්පාදන, හිමිකම් සමූහ අරමුදල්, රන් පදනම් කරගත් විනිමය හුවමාරු අරමුදල්, ව්‍යුහගත බලපත්‍ර සහ උකස් පිටුබලය සහිත සුරැකුම්පත් හඳුන්වාදීමයි.

## සුරැකුම්පත් ණය ගැනීම සහ ණයට දීම (SBL) හරහා ආවරණය කරන ලද හිඟ විකුණුම් (SS) හඳුන්වාදීමට පහසුකම් සැලසීම

සුරැකුම්පත් ණය ගැනීම සහ ණයට දීම හරහා ආවරණය කරන ලද හිඟ විකුණුම් සඳහා උත්තේජනයක් සැපයීම තුළින් වෙළෙඳපොළේ ද්‍රවශීලතා සහ ක්‍රියාකාරකම් මට්ටම් වැඩිවීමට ඉඩ ඇත. සුරැකුම්පත් ණය ගැනීම සහ ණයට දීම හරහා ආවරණය කරන ලද හිඟ විකුණුම් සක්‍රීය කිරීමේ ප්‍රතිපත්ති රාමුව ලෝක බැංකුව විසින් නම්කර ඇති උපදේශකයාගේ තාක්ෂණික සහාය යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව සමඟ එක්ව අවසන් කරන ලද අතර එය කොමිෂන් සභාව විසින් ද අනුමත කරන ලදී. ඒ අනුව, කොළඹ කොටස් හුවමාරුව දැනට අවශ්‍ය පද්ධතිමය වෙනස් කිරීම් සිදු කරමින් සහ එය සක්‍රීය කිරීම සඳහා නීති රීති සකස් කරමින් සිටී. නව පියවර පිළිබඳව හුරුපුරුදු වීම සඳහා පාර්ශ්වකරුවන් සඳහා දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම කොළඹ කොටස් හුවමාරුව විසින් ආරම්භ කර ඇත.

## පාරිසරික, සමාජීය සහ පාලන (ESG) ආශ්‍රිත ක්‍රියාකාරකම් හඳුන්වාදීමට පහසුකම් සැලසීම

ලොව පුරා ජනප්‍රියත්වයේ වර්ධනය සහ ESG කේන්ද්‍ර කරගත් ආයෝජන පිළිවෙත් අනුගමනය කිරීමත් සමඟ, බොහෝ ප්‍රාග්ධන වෙළෙඳපොළ හරිත මුලපිරීම් හඳුන්වා දීමට අවශ්‍ය ප්‍රතිපත්ති සහ නියාමන රාමු සකස් කර ඇත. එබැවින්, හරිත, සමාජ සහ තිරසාර (GSS) ප්‍රාග්ධන වෙළෙඳපොළ මූල්‍ය සම්පාදනය සඳහා වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට පහසුකම් සළසමින්, දේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළ පාර්ශවකරුවන් අතර ESG ආයෝජනය සහ වාර්තා කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම සහ වැඩි දියුණු කිරීමේ අරමුණින් අපි සැපයුම් අංශය සහ ඉල්ලුම යන දෙකම සංවර්ධනය කිරීමට පියවර ගත්තෙමු.

## සැපයුම් පැත්ත ප්‍රවර්ධනය කිරීමට ගන්නා ලද පියවර

### හරිත/නිල් බැඳුම්කර නිකුත් කිරීම ප්‍රවර්ධනය කිරීම

සැපයුම් අංශය ප්‍රවර්ධනය කිරීමේ කොටසක් ලෙස, හරිත බැඳුම්කර හඳුන්වාදීම සඳහා ප්‍රතිපත්ති රාමුව අවසන් කරන ලද අතර, ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) විශේෂඥයින් විසින් ලබා දෙන ලද නිර්දේශ අනුව කොළඹ කොටස් හුවමාරුව විසින් නීති රීති කෙටුම්පත් කිරීම සකස් කරන ලදී. සාගර ආශ්‍රිත ව්‍යාපෘති සඳහා පමණක් ආයෝජනය කරන හරිත බැඳුම්කරවල උප කොටසක් වන නිල් බැඳුම්කර සම්බන්ධ ප්‍රතිපත්ති රාමුව ද අවසන් කරන ලදි. හරිත සහ නිල් බැඳුම්කර දෙකටම අදාළ වන මූලධර්ම සහ ප්‍රමිතීන් සමාන බැවින්, දෙකම එකම රාමුවක් යටතේ නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ. නීති රීති ප්‍රකාශයට පත් කළ පසු, ආයතනවලට හරිත ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් ලබා ගත හැකි අතර, රටට අවශ්‍ය විදේශ විනිමය ගෙන ඒම සඳහා අනාගත දේශීය හා විදේශීය ආයෝජකයින්ට වෙළෙඳපොළට පිවිසීමේ මංපෙත් ද මෙමගින් විවර වනු ඇත.

**“සැපයුම් අංශය ප්‍රවර්ධනය කිරීමේ කොටසක් ලෙස, හරිත බැඳුම්කර හඳුන්වාදීම සඳහා ප්‍රතිපත්ති රාමුව අවසන් කරන ලද අතර, ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) විශේෂඥයින් විසින් ලබා දෙන ලද නිර්දේශ අනුව කොළඹ කොටස් හුවමාරුව විසින් නීති රීති කෙටුම්පත් කිරීම සකස් කරන ලදී.”**

### පාරිසරික, සමාජීය සහ පාලන (ESG) ආශ්‍රිත ක්‍රියාකාරකම් වාර්තා කිරීම ප්‍රවර්ධනය කිරීම සහ කොළඹ කොටස් හුවමාරුව මගින් ESG ආශ්‍රිත වෙනත් මුලපිරීම් සඳහා සහාය වීම

ලයිස්තුගත සමාගම් විසින් ESG වාර්තා කිරීම ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සමඟ ඒකාබද්ධව (ICASL) 2022 අගෝස්තු 24 වැනි දින අවබෝධතා ගිවිසුමකට (MoU) එළැඹි අතර එමගින් ඒකාබද්ධ වාර්තාකරණය, ආයතනික පාලනය, තිරසාරභාවය සහ ආයතනික සහ මූල්‍ය ප්‍රකාශන/ආයතනික වාර්තා භාවිතා කරන්නන්ගේ ප්‍රයෝජනය සඳහා වෙනත් අදාළ ක්ෂේත්‍ර පිළිබඳ දැනුවත්භාවය ගොඩනැගීම් පුළුල් ලෙස ආවරණය කරන ලදී. මීට අමතරව, නව ESG පදනම් කරගත් නිෂ්පාදන නිර්මාණය කිරීමට හෝ එවැනි ආයෝජන සඳහා මිණුම් ලකුණක් ලෙස භාවිතා කිරීමට සහ හරිත, සමාජීය හා තිරසර (GSS) ප්‍රාග්ධන වෙළෙඳපොළ මූල්‍යකරණයට පහසුකම් සැලසීමට අවශ්‍ය නියාමන රාමු හඳුන්වා දීමට ESG දර්ශකයක් අභ්‍යන්තරව සකස් කරන ලෙස සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ කොටස් හුවමාරුව වෙතින් ඉල්ලා සිටියේය.

## ඉල්ලුම අංශය ප්‍රවර්ධනය කිරීමට ගන්නා ලද පියවර

### ESG පිළිබඳ දැනුවත් කිරීම

ESG සම්බන්ධව දැනුවත් කිරීම් ගොඩනැගීමේ කාර්යයන් වැඩිදියුණු කිරීම සඳහා, 2022 ජුනි 17 වන දින සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සහ වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ (CFA) සංගමය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම අවබෝධතා ගිවිසුම මගින් ශ්‍රී ලාංකීක ආයෝජකයින් අතර ESG පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම සඳහා සහයෝගී සබඳතාවක් ඇති කිරීමට පුළුල් ලෙස අදහස් කර ඇත. තවද එමගින්, ආයෝජක ආරක්ෂාව වැඩි දියුණු කිරීම, අභියෝගාත්මක ගෝලීය ප්‍රවණතා සමඟ සමීපව සිටීමට සහ ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළේ වෘත්තීය ප්‍රමිතීන් සහ අඛණ්ඩතාව පවත්වා ගැනීම සහතික කිරීම සඳහා ඔවුන්ගේ ආයෝජන සමීක්ෂණ සහ තක්සේරු කිරීමේ ක්‍රියාවලියට ESG හඳුන්වා දීමට ප්‍රාග්ධන වෙළෙළෙපොළ වෘත්තිකයන් දිරිමත් කිරීමට හැකියාව ලැබෙනු ඇත.

## කොළඹ කොටස් හුවමාරුවෙහි සුකුක් (SUKUK) ආයෝජන හඳුන්වාදීම සඳහා රාමුව සකස් කරන ලදී

සුකුක් ඇතුළු ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ නිෂ්පාදන ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළට හඳුන්වා දීම සඳහා නියාමන රාමුවක් සකස් කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහන යටතේ තාක්ෂණික සහාය ලබා දෙන ලදී. ඉන් අනතුරුව, ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව සමඟ සාකච්ඡා කර එකඟ වූ කාර්යයන් විෂය පථයට අනුකූලව ඉටුකිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. ඉදිරිපත් කරන ලද වෙළෙඳපොළ තක්සේරු වාර්තාවට අනුව, සුකුක් නිෂ්පාදන හඳුන්වාදීම සඳහා දේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ දැඩි උනන්දුවක් සහ හැකියාවක් පවතින බව අවධාරණය විය.

සුකුක් යනු සාම්ප්‍රදායික ණය සුරැකුම්පත්වලට සමාන මූල්‍ය උපකරණයක් වන අතර එය සැබෑ මූල්‍ය වටිනාකමක් සහිත සුරක්ෂිත වත්කමකට සම්බන්ධ වේ (සාමාන්‍යයෙන් ස්පර්ශ කළ හැකි). ආයෝජකයින්ගේ දෘෂ්ටිකෝණයෙන්, සුකුක් තබා ගැනීම අදාළ වත්කමේ අර්ධ හිමිකාරීත්වයක් නියෝජනය කරයි. සුකුක් ව්‍යූහයන් පිළිබඳ විස්තර වෙනස් වේ. කෙසේ වෙතත්, සාමාන්‍යයෙන් ප්‍රාග්ධනය අවශ්‍ය වන සමාගමක් (“ආරම්භකයා” ලෙස හැඳින්වේ) විශේෂ කාර්යයන් සඳහා උපසමාගම් (SPV) ස්ථාපිත කර SPV වෙත වත්කම් විකුණයි. මෙම SPV විසින් සුකුක් සහතික නිකුත් කරන අතර ඒවා ආයෝජකයින්ට විකුණනු ලබයි. ආරම්භකයා පසුව වත්කම් තම ව්‍යාපාරයේ භාවිතා කිරීමට ගිවිසුම් ගත වෙයි. උදාහරණයක් ලෙස ඒවා ආපසු බදු දීමෙන් ලැබෙන ගෙවීම් වලින් ආයෝජකයින්ට ප්‍රතිලාභ ලබා දෙයි. කාලය අවසානයේ වත්කම් ආපසු මිලදී ගැනීමට ද ගිවිසුම්ගත වේ.

# මෙහෙයුම් සමාලෝචනය

වෙළෙඳපොළ තක්සේරු වාර්තාවේ ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයින් විසින් ඉදිරිපත් කරන ලද සොයාගැනීම් මත පදනම්ව, උපදේශකයින්, සුරැකුම්පවත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) සහ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) වැනි අනෙකුත් නියාමන ආයතන අතර සාකච්ඡා කිහිපයක් පැවැත්විණි. ඒ අනුව, ණය සුරැකුම්පත් සඳහා අදාළ වන කොළඹ කොටස් වෙළෙඳපොළේ පවතින ලයිස්තුගත කිරීමේ නීතිවලට සංශෝධන සිදුකරමින් සුකුක් නිෂ්පාදන ප්‍රාග්ධන වෙළෙඳපොළට හඳුන්වා දීමට උපදේශකයින් යෝජනා කළේය.

ඉන් අනතුරුව, සුකුක් නිෂ්පාදන පහසුවෙන් හඳුන්වාදීම සඳහා පවතින ලයිස්තුගත කිරීමේ රාමුවට යෝජිත සංශෝධන අනුව කෙටුම්පත්කළ රෙගුලාසි/මාර්ගෝපදේශයක් ඉදිරිපත් කරන ලද අතර, මෙය සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව මගින් සමාලෝචනය කර එකඟ විය. යෝජිත සංශෝධන සහිත කෙටුම්පත් රෙගුලාසි/මාර්ගෝපදේශය සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් වෙත ඉදිරිපත් කර අනුමත කරන ලදී. ඒ අනුව, සුකුක් නිෂ්පාදන නිකුත් කිරීම සඳහා යෝජිත නියාමන රාමුව අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා කොළඹ කොටස් හුවමාරුව වෙත දැනුම් දෙන ලදී.

### ව්‍යුහගත බලපත්‍ර හඳුන්වාදීම

ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) විශේෂඥයින් විසින් ව්‍යුහගත බලපත්‍ර හඳුන්වාදීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කරන ලද අතර එම මාර්ගෝපදේශ පිළිබඳව අවධානය යොමු කොට ව්‍යුහගත බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන නීති සම්පාදනය සඳහා කොළඹ කොටස් හුවමාරුව වෙත යොමුකර ඇත. මීට අමතරව, ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂඥයින් විසින් ව්‍යුහගත බලපත්‍ර සම්බන්ධ වෙළෙපොළ සාදන්නන් සඳහා කෙටුම්පත් නීති සකස් කර ඒවා මහජන උපදේශනය සඳහා ප්‍රකාශයට පත් කරන ලද අතර අභ්‍යන්තරව අවසන් වෙමින් පවතී. නව සුරැකුම්පත් හඳුන්වාදීම සඳහා, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව ඒකාබද්ධව පිහිටුවනු ලැබූ කමිටුව විසින් ව්‍යුහගත බලපත්‍ර හඳුන්වාදීම නව සුරැකුම්පත් හඳුන්වාදීමේ දෙවන අදියර ලෙස හඳුනාගෙන ඇත. මෙම උපකරණය හඳුන්වා දුන් පසු, එය ආයෝජකයින්ට පවත්වාගත හැකි වත්කම් පන්ති පුළුල් කරන අතර ව්‍යුහගත බලපත්‍ර සම්බන්ධ වෙළෙඳපොළ සාදන්නන් සහ නිකුත් කරන්නන් බවට පත්වෙමින් වෙළෙඳපොළ සහභාගීකරුවන්ට වැඩි ව්‍යාපාරික අවස්ථා ලබා දෙනු ඇත.

### ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත/සංස්ථාපිත ආයතන විසින් විදේශ මුදල් ඒකකවලින් නිකුත් කරන ලද සුරැකුම්පත් කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීම, වෙළෙඳාම් කිරීම සහ පියවීම සඳහා පහසුකම් සැලසීම.

රටට අත්‍යවශ්‍ය විදේශ මුදල් ගලා ඒම ඉහළ නැංවීමේ අරමුණින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙම කාර්යය සඳහා පහසුකම් සළසා ඇත. කොළඹ කොටස් හුවමාරුව තුළ විදේශ මුදල් වටිනාකම් සහිත සුරැකුම්පත් ලයිස්තුගත කිරීම, වෙළෙඳාම් කිරීම සහ පියවීම සඳහා පහසුකම් සැළසීමේ යෝජනාවක් කොළඹ කොටස් හුවමාරුව වෙතින් ලැබීමෙන් පසු මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමඟ එක්ව සාකච්ඡා කළ අතර ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටියේය. ඒ අනුව, මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කොළඹ කොටස් හුවමාරුව විසින් ඉදිරිපත් කළ යෝජනාවේ දක්වා ඇති කරුණු විසඳීමට සහ එය ක්‍රියාත්මක කිරීම පහසු කිරීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සකස් කරන ලදී. පසුව, කොළඹ කොටස් හුවමාරුව විසින් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විදේශ මුදල් වටිනාකම් සහිත සුරැකුම්පත් සම්බන්ධයෙන් අදාළ නීති, ටික් ප්‍රමාණය සහ ගනුදෙනු පිරිවැයට අදාළ ව්‍යුහයට සංශෝධන යෝජනා කරන ලදී. මෙම නව ආයෝජන උපකරණය හඳුන්වාදීමට පහසුකම් සැළසීමෙන් පසු, යෝජිත ගනුදෙනු පිරිවැය ව්‍යුහය සහ අදාළ නියාමනයන් නිකුත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙතින් අනුමැතිය ඉල්ලා ඇත.

> **"කොටස් වෙළෙඳපොළේ ආයෝජක පදනම පුළුල් කිරීම සඳහා ඩිජිටල් වේදිකා ක්‍රියාකරුවන්ට ඔවුන්ගේ ග්‍රාහක/සාමාජික පදනම වෙත ව්‍යාප්ත කිරීමට පහසුකම් සැළසීම සඳහා ප්‍රතිපත්ති සහ නියාමන රාමුවක් සකස් කිරීම හඳුන්වා දෙන ලදී."**

### හිමිකම් සමූහ අරමුදල් පුවරුවක් හරහා අරමුදල් රැස් කිරීමට පහසුකම් සැළසීම

හිමිකම් සමූහ අරමුදල් හඳුන්වාදීම සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගැනීමෙන් පසු, පත්කරන ලද ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයින් විසින් කෙටුම්පත් කළ ප්‍රතිපත්ති සහ නියාමන සළකා බැලීම් හඳුනාගෙන සහ ඒවා පදනම් කරගෙන කෙටුම්පත් නීති සකස් කරන ලදී. නීති කෙටුම්පත් මහජන අදහස් සඳහා ප්‍රකාශයට පත් කරන ලද අතර දැනට ඒවා අභ්‍යන්තර මට්ටමින් අවසන් වෙමින් පවතී. නීති රීති නිකුත් කළ පසු, අනාගත වෙළෙඳපොළ ක්‍රියාකරුවන්ට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ලියාපදිංචි වීමට හැකියාව ලැබෙන අතර ආයෝජකයින්ට (SMEs) නව ව්‍යාපාරික අවස්ථාවන් සහ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයින්ට හිමිකම් සමූහ අරමුදල් සැපයීමේ වේදිකාවන් තුලින් අරමුදල් රැස් කිරීම සඳහා විකල්ප ක්‍රමයක් නිර්මාණය කරයි. මෙමගින් රටේ කොඳු නාරටිය ලෙස සැළකෙන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයට ඉමහත් සහයෝගයක් ලබා දෙනවා පමණක් නොව ආයෝජකයින් සඳහා පවතින ආයෝජන විකල්පයන් ද පුළුල් කරනු ඇත.

### ආයෝජක පදනම පුළුල් කිරීම ඩිජිටල් වේදිකාවලට පහසුකම් සැලසීම

කොටස් වෙළෙඳපොළේ ආයෝජක පදනම පුළුල් කිරීම සඳහා ඩිජිටල් වේදිකා ක්‍රියාකරුවන්ට ඔවුන්ගේ ග්‍රාහක/සාමාජික පදනම වෙත ව්‍යාප්ත කිරීමට පහසුකම් සැළසීම සඳහා ප්‍රතිපත්ති සහ නියාමන රාමුවක් සකස් කිරීම හඳුන්වා දෙන ලදී. මෙමගින් කොටස් වෙළෙඳපොළ මෙහෙයුම් පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමට සහ කොටස් වෙළෙඳපොළ මෙහෙයුම්වල තාක්ෂණික පරිවර්තනයට සහායවීමට හැකියාව ලැබෙනු ඇත. දැනට, කොළඹ කොටස් හුවමාරුව විසින් එවැනි තෙවන පාර්ශවීය සේවා සපයන්නන් ගණනාවකට ඔවුන්ගේ ඩිජිටල් වේදිකා භාවිතා කිරීමට හැකියාව ලබා දී ඇත.

### විදේශ ප්‍රදාන ලබාදීමේ නියෝජිතායතන මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම

ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහන සහ ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP) යන දෙකම සමාලෝචිත කාලසීමාව තුළ අවසන් කර ඇති අතර එම වැඩසටහන් විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට සහ සමස්ත ප්‍රාග්ධන වෙළෙඳපොළට විවිධ ආකාරවලින් ප්‍රතිලාභ ලබා දී ඇත.

### ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහන (CMDP)

CMDP යනු ආසියානු සංවර්ධන බැංකුව විසින් ශ්‍රී ලංකා රජයට ලබාදුන් ප්‍රතිපත්ති මත පදනම් ණය සහ තාක්ෂණික ආධාර වැඩසටහනක් වූ අතර, මෙම වැඩසටහන මගින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) වැනි නියාමන ආයතන සඳහා තාක්ෂණික සහාය ලබා දෙන ලදී. CMDP යටතේ, සාමූහික ආයෝජන යෝජනා ක්‍රම (CIS) සංග්‍රහය

කෙටුම්පත් කිරීම, කොළඹ කොටස් හුවමාරුව අසාමූහිකරණය, ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය ප්‍රතිසංස්කරණය කිරීම, මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සහ ඒකක භාර ව්‍යාප්ත කිරීම, ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ නිෂ්පාදන සඳහා අදාළ වන්නා වූ ප්‍රතිපත්ති සහ නියාමන රාමු සංවර්ධනය කිරීම, ව්‍යුහගත බලපත්‍ර, හරිත බැඳුම්කර, හිමිකම් සමූහ අරමුදල් වැනි ක්‍රියාකාරකම් ගණනාවක් සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට තාක්ෂණික සහාය ලැබුණි.

## ලෝක බැංකුවේ මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය (FSMP)

ලෝක බැංකුවේ මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වූයේ මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම්, නෛතික සහ නියාමන රාමුව සහ මූල්‍ය අංශයේ නියාමකයාගේ අධීක්ෂණ ධාරිතාව ශක්තිමත් කිරීම තුළින් මූල්‍ය කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා පහසුකම් සැලසීමයි. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මහ බැංකුව, සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන අධිකාරිය ව්‍යාපෘති ප්‍රතිලාභීන් ලෙස හඳුනාගෙන ඇත.

මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය සංරචක දෙකකින් සමන්විත වේ:

- සංරචක 1 - තෝරාගත් ප්‍රධාන බෙදාහැරීම් සම්බන්ධිත දර්ශක සාක්ෂාත් කර ගැනීමට එරෙහිව ව්‍යාපෘති අරමුදල් බෙදා හරිනු ලබන ප්‍රතිඵල පදනම් කරගත් මූල්‍යකරණය
- සංරචක 2 - හඳුනාගත් භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා අරමුදල් සපයන ආයෝජන මත පදනම් වූ මූල්‍යකරණය

ඒ අනුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රධාන නියාමන සහ සංවර්ධන ක්‍රියාකාරකම් ගණනාවක් සඳහා ව්‍යාපෘතිය යටතේ අරමුදල් ලබා ගන්නා ලදී. (සංඛ්‍යා සටහන 10)

සංඛ්‍යා සටහන 10: ප්‍රතිඵල පදනම් කරගත් මූල්‍ය සංරචකය

| වියදම් හා සම්බන්ධිත දර්ශකය (DLI) | ආශ්‍රිත විසර්ජන සම්බන්ධිත ප්‍රතිඵල (DLR) | සාක්ෂාත් කර ගැනීමේ තත්ත්වය (DLR) |
|---|---|---|
| DLI 1. මූල්‍ය ආයතන අධීක්ෂණය සඳහා අවදානම් මත පදනම් වූ ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කිරීම | ▪ DLR 1.1: මූල්‍ය අංශයේ අධීක්ෂණ කමිටුව අවබෝධතා ගිවිසුමක් හරහා ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රමුඛ ඒකාබද්ධ අධීක්ෂකවරයා බවට එකඟ වේ. | සම්පූර්ණයෙන්ම සාක්ෂාත් කර ඇත |
| | ▪ DLR 1.2: FSOC හි සභාපති විසින් තහවුරු කරන ලද FSOC රැස්වීම් 4 කින් සාක්ෂි සහිතව නියාමකයින් තිදෙනා විසින් අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම | සම්පූර්ණයෙන්ම සාක්ෂාත් කර ඇත |
| DLI 4. මූල්‍ය ස්ථාවරත්වයට ඇති විය හැකි අවදානම් අවම කිරීම සඳහා සාංගමික සුරැකුම්පත් සඳහා ගෙවීම්වලට එදිරිව පියවීම් ක්‍රමය ස්ථාපිත කිරීම | ▪ DLR 4.1: ගෙවීම්වලට එදිරිව බෙරුම් කිරීමේ පදනම මත සාංගමික හිමිකම් කොටසට අදාළ පියවීම සඳහා අවශ්‍ය නීති සහ රෙගුලාසි සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව විසින් යොදාගන්නා ලදී. | සම්පූර්ණයෙන්ම සාක්ෂාත් කර ඇත |
| | ▪ DLR 4.2: ගෙවීම්වලට එදිරිව බේරුම් කිරීමේ සැකැස්ම ඇතුළත් සාර්ථක කොළඹ කොටස් හුවමාරුවේ අඛණ්ඩ ව්‍යාපාර සැළසුම් පරීක්ෂණය අවසන් කර ඇත. | සම්පූර්ණයෙන්ම සාක්ෂාත් කර ඇත |
| | ▪ DLR 4.3: ගෙවීම්වලට එදිරිව බේරුම් කිරීමේ පද්ධතියක් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර ඇති බව සහතික කිරීම සඳහා DVP සක්‍රිය කිරීමෙන් වසරකට පසු සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එතැන් හෝ විතැන් පරීක්ෂා/විගණන සිදු කරනු ලදී. | සම්පූර්ණයෙන්ම සාක්ෂාත් කර ඇත |

ව්‍යාපෘතිය අවසන් වන විට, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සියලුම වියදම් කිරීම් සම්බන්ධිත දර්ශක සම්පූර්ණයෙන් සාක්ෂාත් කර ගෙන ඇත. ඒ අනුව ලෝක බැංකුව විසින් DLR 1.1, 1.2, 4.1 සහ 4.2 සඳහා වෙන් කරන ලද අරමුදල් ලබා දී ඇත. DLR 4.3 සඳහා වෙන් කර ඇති අරමුදල් 2023 ජනවාරි මාසයේදී නිකුත් කිරීමට නියමිතය.

## ආයෝජන පදනම් වූ මූල්‍ය සංරචකය

### උපදේශන ප්‍රසම්පාදනය

2022 දෙසැම්බර් වන විට, පහත විශේෂඥයින් ලබා ගන්නා ලද අතර, අත්සන් කරන ලද අදාළ ගිවිසුම් සාර්ථකව නිම කරන ලදී.

- ගෙවීම් වලට එදිරිව බේරුම් කිරීමේ ක්‍රමය (DVP) ක්‍රියාත්මක කිරීම සහ මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනය (CCP) ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුව සහ කොටස් ණයට ගැනීම හා ණයට දීම (SBL) හරහා හිඟ විකුණුම් (SS) ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශනය.
- අධ්‍යාපනය සහ දැනුවත් කිරීමේ සිදුකිරීමේ මාර්ග වැඩිදියුණු කිරීම සඳහා උපදේශනය - සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ (SEC)/ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපනය හා පුහුණු (CMET) / ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු මධ්‍යස්ථානය (CMIC) යන වෙබ් අඩවි සංවර්ධනය කිරීම
- ආයතනික තොරතුරු තාක්ෂණ උපාය මාර්ගයක්/ක්‍රියාත්මක කිරීමේ නිරීක්ෂණ සංවර්ධනය සඳහා උපදේශනය
- වෙළෙඳපොළ ආවේක්ෂණ සඳහා උපදේශනය

# මෙහෙයුම් සමාලෝචනය

### යටිතල පහසුකම් ප්‍රසම්පාදනය

2022 දෙසැම්බර් මාසය වන විට පහත හඳුනාගත් භාණ්ඩ අංශය වෙත ලබාගෙන ඇත.

- ආවේක්ෂණ අංශය සඳහා දත්ත විශ්ලේෂණ මෙවලම - වගුව
- ලේඛන සංරක්ෂණය සහ කළමනාකරණ පද්ධතිය
- ගබඩා පුළුල් කිරීම
- Oracle DB සම්මත සංස්කරණය බලපත්‍ර 10ක් මිලදී ගැනීම
- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම

### සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සුරක්ෂිත කර ඇත

මීට අමතරව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සකස් කරන ලද පුහුණු සැළැස්මක් මත පදනම්ව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ ධාරිතා ඉහළනැංවීම සඳහා අරමුදල් වෙන් කරන ලදී. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සකස් කරන ලද පුහුණු සැළැස්ම ලෝක බැංකුව විසින් අනුමත කරන ලද අතර ඒ අනුව හඳුනාගත් ධාරිතා ඉහළ නැංවීමේ වැඩසටහන් ගණනාවක් සඳහා අරමුදල් භාවිතා කරන ලදී.

### මානව ප්‍රාග්ධන සංවර්ධනය

නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා නීතිය බලාත්මක කිරීමත් සමඟ, ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අංශයේ කාර්යය විෂය පථය ද පුළුල් වූ අතර එහිදී හිමිකම් සමූහ අරමුදල් සහ ව්‍යුහගත බලපත්‍ර සඳහා වෙළෙඳපොළ සාදන්නන් හඳුන්වාදීම වැනි නව මූල පිරිම් හඳුන්වා දීමට හැකි විය. මෙම නව කාර්යය විෂය පථයට සමගාමීව, නව ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන ක්‍රියාකාරකම්වලට අදාළව ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අංශයේ සාමාජිකයින්ට බොහෝ ඉගෙනුම් අවස්ථා ලබා දීම සහ නව සාමාජිකයින් එක්වීම තුළින් සමාලෝචිත කාල සීමාව තුළ අංශයේ ධාරිතාව ශක්තිමත් විය. වැඩිදියුණු කළ දක්ෂතා සහ නිපුණතා සමඟින්, අංශයට වඩාත් ඵලදායී ලෙස වෙළෙඳපොළ සංවර්ධන කාර්යයට සහාය වීමට හැකි වනු ඇත.

### ප්‍රාග්ධන වෙළඳපොළ දැනුවත් කිරීම සහ බාහිර සබඳතා

ආයෝජන උපකරණවල දක්ණට ලැබෙන අවදානම් සහ ප්‍රතිලාභ තක්සේරු කර දැනුවත් ආයෝජන තීරණ ගැනීම සඳහා, දැනුවත් ආයෝජකයින්ට මූල්‍ය උපකරණ සහ සේවා පිළිබඳ වඩා හොඳ අවබෝධයක් තිබිය යුතුය. එපමණක් නොව, දැනුවත් ආයෝජකයින්ට වෙළෙඳපොළ තුළ සිදුවිය හැකි අක්‍රමිකතාවලින් ආරක්ෂා වීමට ද හැකියාව ලැබේ. වසර තුළදී, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සමාජයේ වෙසෙන විවිධ පාර්ශවයන් ඉලක්ක කරගනිමින් ආයෝජකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් සැලසුම් කර, පවත්වනු ලැබීය.

### බාහිර වැඩසටහන් - සම්මන්ත්‍රණ සහ වැඩමුළු

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ දැනුවත් කිරීමේ වැඩසටහන්වල අරමුණ වූයේ දැනුවත් ආයෝජකයින් බිහිකිරීම කිරීමට, ඔවුන්ගේ වත්කම් වර්ධනය කර ගැනීමට සහ මූල්‍යමය වශයෙන් ස්වාධීනවීමට හැකියාව ලැබෙන පරිදි මනා දැනුමකින් ඔවුන් සන්නද්ධ කිරීමයි. ආර්ථික අර්බුදයේ අභියෝග සහ සීමාවන් තිබියදීත්, ඩිජිටල් නාලිකා හරහා ආයෝජක

> **“ආයෝජන උපකරණවල දක්ණට ලැබෙන අවදානම් සහ ප්‍රතිලාභ තක්සේරු කර දැනුවත් ආයෝජන තීරණ ගැනීම සඳහා, දැනුවත් ආයෝජකයින්ට මූල්‍ය උපකරණ සහ සේවා පිළිබඳ වඩා හොඳ අවබෝධයක් තිබිය යුතුය.”**

වැඩසටහන් පැවැත්වීම හරහා බාධාවකින් තොරව ඉගෙනීම අප සහතික කළෙමු. වසර අවසානය වන විට, අප විසින් ගුරුවරුන්, ආයෝජකයින්, පාසල් සිසුන්, මාධ්‍යවේදීන් සහ උපාධි අපේක්ෂකයින් සඳහා විවිධ ප්‍රදේශවල වැඩසටහන් නැවත ආරම්භ කළෙමු.

### ගුරු පුහුණු වැඩසටහන්

ගුරුවරුන් යනු අධ්‍යාපන ක්‍රමයක වැදගත් කොටසකි. ගුරුවරුන් සඳහා ආයෝජනය කිරීම යනු ඉගෙනීමට ආයෝජනය කිරීම ලෙස අපි සලකන්නෙමු. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සිසුන්ගේ ඉගෙනුම් ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා ගුරුවරුන්ට ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුම ලබා දීම අඛණ්ඩව සිදු කළේය. ජාතික අධ්‍යාපන ආයතනය සහ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව සමාලෝචිත වර්ෂය තුළ ගම්පහ, දෙහිඅත්තකණ්ඩිය, මාවනැල්ල, මාතර, ගාල්ල, මොණරාගල සහ වැල්ලවාය යන ප්‍රදේශවල භාෂාත්‍රයෙන්ම ගුරුවරුන් සඳහා වැඩසටහන් පවත්වන ලදී.

### පාසල් සම්මන්ත්‍රණ

පාසල්වල ප්‍රාග්ධන වෙළෙඳපොළ සාක්ෂරතාවය ඉහළ නැංවීම හරහා සිසුන්ගේ ආයෝජන උනන්දුව සහ ආයෝජන තීරණ ගැනීම ඉහළ නැගීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ක්‍රමක්‍රමයෙන් පාසල් නැවත ආරම්භ වීමත් සමඟ අප විසින් පාසල් සිසුන් සඳහා පහත සඳහන් පාසල් සම්බන්ධ කරගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

- අලිගාර් ජාතික පාසල, එරාවූර්, මඩකලපුව
- බණ්ඩාරනායක විද්‍යාලය, ගම්පහ
- අල් අක්ෂා ජාතික පාසල, කල්පිටිය
- දෙහිඅත්තකණ්ඩිය මධ්‍ය මහා විද්‍යාලය, දෙහිඅත්තකණ්ඩිය
- රිවිසඳ මධ්‍ය මහා විද්‍යාලය, අරණායක, මාවනැල්ල
- අල් අසාර් මධ්‍ය මහා විද්‍යාලය, හෙම්මාතගම, මාවනැල්ල
- හසලක ආර්. ප්‍රේමදාස ජාතික පාසල

### උපාධි අපේක්ෂකයින් සඳහා වැඩසටහන්

මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීමට සහ සුරැකුම්පත් වෙළෙඳපොළේ ආයෝජනය කිරීමට ඔවුන් දිරිමත් කිරීම සඳහා උපාධි අපේක්ෂකයින් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අප තුළ ඇති කැමැත්ත පිළිබඳව ශ්‍රී ලංකාවේ සියලුම ජාතික විශ්ව විද්‍යාල වෙත දන්වා සිටියෙමු. එපමණක් නොව, ප්‍රාග්ධන වෙළෙඳපොළ කර්මාන්තය තුළ රැකියා කළ හැකි තරුණ ප්‍රජාවක් බිහිකිරීමට මෙම උත්සාහය තුළින් අපේක්ෂා කෙරේ. ඒ අනුව, පහත ජාතික විශ්වවිද්‍යාලවල දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, ගිණුම්කරණ දෙපාර්තමේන්තුව
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ව්‍යාපාර ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව
- කැලණිය විශ්වවිද්‍යාලය, වාණිජ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, කළමනාකරණ දෙපාර්තමේන්තුව
- රුහුණු විශ්වවිද්‍යාලය, ගිණුම්කරණ දෙපාර්තමේන්තුව
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, මූල්‍ය දෙපාර්තමේන්තුව

### SEC ආයෝජක වැඩමුළු

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව එක්ව "කොටස් වෙළෙඳපොළ නගරයෙන් නගරයට" තේමාව යටතේ සුළුපරිමාණ ආයෝජක ප්‍රජාව තුළ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීමේ අරමුණින්, දිවයිනේ තෝරාගත් නගර ආශ්‍රිතව නැවතත් දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කරනු ලැබීය. එම වැඩසටහන් තුළින් ග්‍රාමීය ආයෝජක ප්‍රජාව තුළ ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ වඩා හොඳ

අවබෝධයක් ඇති කිරීම, ආයෝජකයින්ගේ උනන්දුව ඉහළ නැංවීම, සහ සහභාගීත්වය දිරිගැන්වීම අපේක්ෂා කෙරේ.

ඒ අනුව මහනුවර, ගාල්ල, යාපනය සහ කුරුණෑගල යන නගරවලවල ප්‍රාදේශීය ආයෝජක සම්මන්ත්‍රණ පවත්වන ලදී.

### මාධ්‍යවේදීන්ට ප්‍රාග්ධන වෙළෙඳපොළ දැනුම ලබාදීම

ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් අතර මූලික මූල්‍ය සාක්ෂරතාව සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සඳහා, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ජනමාධ්‍ය ආයතනයේ සිසුන් සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළේ ආයෝජනය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

### සමාජ මාධ්‍ය පදනම් කරගත් අධ්‍යාපනික වැඩසටහන්

ප්‍රධාන වශයෙන් ගත්විට, තරුණ ආයෝජකයින් අතර ජංගම සහ අන්තර්ජාල තාක්ෂණය පුළුල් ලෙස භාවිතා වේ. එබැවින්, විශේෂයෙන් තරුණ පරම්පරාව ඉලක්ක කරගත් පුළුල් ක්‍රියාවලියක් වෙත ළඟා වීමේ අරමුණ ඇතිව සමාජ මාධ්‍ය නාලිකාවල පළ කිරීම් සහ දැනුවත් කිරීම් හරහා ආයෝජකයින් සවිබල ගැන්වීමේ පියවර රැසකට වසර තුළ අප ප්‍රමුඛත්වය ලබා දුන්නෙමු.

තවදුරටත් ආයෝජක අධ්‍යාපනය ඉහළ නැංවීම සහ ආයෝජන වංචාවලින් ආයෝජකයින් ආරක්ෂා කිරීම සඳහා සමාජ මාධ්‍යවල අප අවම වශයෙන් දිනකට එක් වරක්වත් twitter සහ facebook යන සමාජ මාධ්‍ය නාලිකා හරහා භාෂා තුනෙන්ම සමබර අන්තර්ගතයන් පළ කළෙමු.

### ලෝක ආයෝජක සතිය මුල් කරගත් වැඩසටහන්

ආයෝජකයින්ට ඉගෙනීමේ අවස්ථා වර්ධනය කිරීම සහ වර්තමාන වෙළෙඳපොළ ප්‍රවණතා සහ ආයෝජක සුභසිද්ධිය, තිරසර ආයෝජනය, ආයෝජකයින් ආරක්ෂා කිරීම සඳහා වූ නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ ප්‍රතිපාදන, සමාජ ජාල පිළිබඳ මූල්‍ය උපදෙස් සහ ඉහළ උද්ධමනකාරී වාතාවරණයක ආයෝජන කළමනාකරණය කරන්නේ කෙසේද යනාදී තේමාවන් යටතේ අපි ලෝක ආයෝජක සතියට සමගාමීව විවිධ ක්‍රියාකාරකම් පෙළගස්වා සමාජ මාධ්‍ය නාලිකා හරහා ප්‍රධාන පණිවිඩ බෙදා හැරීම සිදුකළ කළෙමු.

මෙම සමාජ මාධ්‍ය ප්‍රචාරණ ව්‍යාපාරයට, "දැනුවත්ව සිටින්න" යන මාතෘකාව යටතේ නව සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සංග්‍රහය - (CIS) සහ නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මගින් සපයනු ලබන ආයෝජක ආරක්ෂාව පිළිබඳ කෙටි වීඩියෝ හතක් ඇතුළත් විය.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ 35 වැනි සංවත්සරයට සමගාමීව නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත නිදහස් කළ අතර මුදල් ප්‍රේෂණ ඉහළ නැංවීම අරමුණු කරගත් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාංගමික වීඩියෝව නිකුත් කරන ලදී. වසර තුළ, අප විසින් සන්ඩේ ටයිම්ස් පුවත්පතෙහි, ආයෝජනය කිරීම පිළිබඳ ලිපි ඇතුළත් සම්පූර්ණ පිටු අතිරේකයක් නොමිලේ ප්‍රකාශයට පත් කළෙමු. සිංහල සහ ඉංග්‍රීසි බසින් ආයෝජක අධ්‍යාපන අත් පත්‍රිකා අටක් යාවත්කාලීන කර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා වෙබ් අඩවියේ "ආයෝජක කවුළුව" තුළ ඇතුළත් කරන ලදී. නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ කැපී පෙනෙන ලක්ෂණ ඇතුළත් නව අත් පත්‍රිකාවක් භාෂා තුනෙන්ම පල කිරීමට අප කටයුතු ආරම්භ කළෙමු.

### "ඉන්වෙස්ට් ශ්‍රී ලංකා" ලන්ඩන් ආයෝජක වැඩමුළුව

ශ්‍රී ලංකා සුරැැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව , කොළඹ කොටස් හුවමාරුව සහ එක්සත් රාජධානියෙහි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය ලන්ඩනයේ වෙසෙන ආයෝජකයින් සඳහා වැඩමුළු කිහිපයක් සංවිධානය කරන ලදී. ඒ අනුව සාංගමික ආයෝජකයින්, එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ සාමාජිකයින්, විදේශගත ශ්‍රී ලාංකික ප්‍රජාව සහ මූල්‍ය මෙහෙයුම් අධිකාරියේ අධ්‍යක්ෂවරුන් සඳහා මෙම දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්විණි.

> **"ආයෝජකයින්ට ඉගෙනීමේ අවස්ථා වර්ධනය කිරීම සහ වර්තමාන වෙළෙඳපොළ ප්‍රවණතා සහ ආයෝජක සුභසිද්ධිය, තිරසර ආයෝජනය, ආයෝජකයින් ආරක්ෂා කිරීම සඳහා වූ නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ ප්‍රතිපාදන, සමාජ ජාල පිළිබඳ මූල්‍ය උපදෙස් සහ ඉහළ උද්ධමනකාරී වාතාවරණයක ආයෝජන කළමනාකරණය කරන්නේ කෙසේද යනාදී තේමාවන් යටතේ අපි ලෝක ආයෝජක සතියට සමගාමීව විවිධ ක්‍රියාකාරකම් පෙළගස්වා සමාජ මාධ්‍ය නාලිකා හරහා ප්‍රධාන පණිවිඩ බෙදා හැරීම සිදුකළ කළෙමු."**

### සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය සමඟ (IOSCO) කටයුතු කිරීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව IOSCO හි සාමාන්‍ය සාමාජිකයෙකු වන අතර වර්ධන හා නැගී එන වෙළෙඳපොළ කමිටුවේ (GEMC) සහ ආසියා පැසිෆික් කලාපීය කමිටුවේ (APRC) සාමාජිකයෙකි. IOSCO හි බොහෝ කාර්යයන් එහි ප්‍රතිපත්ති කමිටු තුළ සිදු වන අතර, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එම කමිටුවලින් සමහර කමිටු, එනම් බලාත්මක කිරීම සහ තොරතුරු හුවමාරුව පිළිබඳ කමිටුව (කමිටු අංක 4) සහ සුළු පිරිමාණ ආයෝජකයින් පිළිබඳ කමිටුව (කමිටු අංක 8) සඳහා සහභාගී වේ. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව IOSCO සමඟ අවබෝධතා ගිවිසුමකට (MMOU) අත්සන් තබා ඇති අතර විමර්ශන සහය සඳහා IOSCO අවබෝධතා ගිවිසුම හරහා උපදේශන සහ සහයෝගීතාවය සහ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා විදේශ රාජ්‍යයන්හී සහයෝගීතාව ලබාගනී. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රතිපත්ති කමිටු දෙකේ රැස්වීම්වලට ක්‍රියාකාරීව සහභාගී වූ අතර සමීක්ෂණ සහ ප්‍රශ්නාවලිය සඳහා ප්‍රතිචාර දැක්වීම හරහා විවිධ වැඩ ප්‍රවාහයන් සඳහා ද දායක විය.

### ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපනය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස වෘත්තීය අධ්‍යාපනය සංවර්ධනය කිරීම සහ පරිපාලනය කිරීම සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන් පවත්වනු ලබයි. ඉහත කරුණු වලට අමතරව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සාමාන්‍ය ජනතාවට ආයෝජනය කිරීමේ මූලික න්‍යායික සහ ප්‍රායෝගික දැනුම ලබා දීම සඳහා මනාව සකස් කරන ලද වැඩසටහන් පවත්වනු ලබයි.

කොටස් තැරැව්කාර සමාගම්වල පුහුණුව ලබන ආයෝජන උපදේශකයින් සඳහා අවම මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා දීමේ අරමුණින් 2019 වර්ෂයේදී හඳුන්වා දුන් සංශෝධිත ප්‍රාග්ධන වෙළෙඳපොළ සුදුසුකම් රාමුව සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. එකී රාමුව වත්කම් පන්ති එකක් හෝ කිහිපයක් සඳහා සහතික කළ ආයෝජන උපදේශකයින්ගෙන් සමන්විත වන අතර උදාහරණ ලෙස හිමිකම් සුරැකුම්පත්, ණය සුරැකුම්පත්, ව්‍යුත්පන්න සහ ඒකක භාර හඳුන්වාදිය හැකිය. ලියාපදිංචි ආයෝජන උපදේශකයින් සඳහා වන (RIA) සුදුසුකම් රාමුවට සුරැකුම්පත් කර්මාන්තයේ සියලුම වත්කම් පන්ති ඇතුළත් කිරීමට හැකි වන පරිදි ඉහළ සුදුසුකම් රාමුවක් දක්වා වැඩි දියුණු කරන ලදී. (රූප සටහන 07)

# මෙහෙයුම් සමාලෝචනය

රූප සටහන 07: ප්‍රාග්ධන වෙළෙඳපොළ සුදුසුකම් රාමුව




කොවිඩ් වසංගතය සහ රටේ පවතින ආර්ථික තත්ත්වය විසින් ඇති කරන ලද වෙනස්කම්වලට අනුවර්තනය වීමේ වැදගත්කම හඳුනාගනිමින් සහ අවබෝධ කර ගනිමින්, අප විසින් ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර පාඨමාලාව (CCM) අන්තර්ජාලය හරහා අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර අන්තර්ජාල වේදිකා හරහා බාධාවකින් තොරව දේශන සැපයීමට අපට හැකි විය. අර්බුද මධ්‍යයේ වුවද මෙම පාඨමාලාවලට අදාළ සියලුම විභාග ඒ අනුව පැවැත්විණි.

එහි බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස, බලපත්‍රලාභී කොටස් තැරැව්කාර සමාගම්වල ආයෝජන උපදේශකයෙකු ලෙස සිය රාජකාරි ඉටුකිරීමට අනිවාර්ය වන ලියාපදිංචි ආයෝජන උපදේශක තත්ත්වය පිරිනැමීම (RIA) සහ හිමිකම් සුරැකුම්පත් උපදේශක (CESA) සහතික පත්‍ර පිරිනැමීමේ පාඨමාලාව අප පවත්වාගෙන යන්නෙමු. වත්කම් පන්ති හතරටම ලියාපදිංචි ආයෝජන උපදේශක තත්ත්වය අපේක්ෂා කරන සිසුන් සඳහා උදාහරණ ලෙස, හිමිකම් සුරැකුම්පත්, ණය සුරැකුම්පත්, ඒකක භාර සහ ව්‍යුත්පන්න සුරැකුම්පත් සඳහා අඛණ්ඩව VIVA VOCE විභාග වසර පුරා පැවැත්වුණු අතර තනි වත්කම් පංතියක් වන හිමිකම් සුරැකුම්පත් සඳහා ආයෝජන උපදේශක තනතුර (CESA) බලපත්‍ර ලබා ගැනීමට අපේක්ෂා කරන සිසුන් සඳහා ද VIVA VOCE විභාග පවත්වන ලදී. ආර්ථික අර්බුද සහ ඉන්ධන සීමා කිරීම් හේතුවෙන් ඉහත කී විභාග කිහිපයක් සම්පූර්ණයෙන්ම ඔන්ලයින් හෝ හයිබ්‍රිඩ් ක්‍රමය භාවිතා කර පැවැත්විණි. කෙසේ වෙතත්, VIVA VOCE විභාග බොහෝ දුරට අප ආයතනය තුළ පවත්වන ලදී. මීට අමතරව, වෙළෙඳපොළ වෘත්තිකයන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා වැදගත් වන්නා වූ CPD වැඩසටහන් ද අන්තර්ජාල වැඩසටහන් (webinars) ආකාරයෙන් පවත්වන ලදී.

මීට අමතරව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2022 වර්ෂය තුළ දැනට සිටින සහ ඉදිරියේදී ආයෝජනය කිරීමට අපේක්ෂාවෙන් සිටින ආයෝජකයින් සඳහා ආයෝජනය පිළිබඳ දැනුම ලබාදෙන වැඩසටහනක් වන "ආයෝජන වැඩසටහන්" (PI) පවත්වන ලදී. මෙම වැඩසටහන සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය දෙකෙන්ම ඉදිරිපත් කරන ලදී. සියලුම ආයෝජන වැඩසටහන් මාර්ගගතව පවත්වන ලදී. ඉහත වැඩසටහන් සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ වෘත්තිකයන්ට අමතරව කර්මාන්තයේ නොවන පුද්ගලයන් විශේෂයෙන් උපාධි අපේක්ෂකයින්, පාසල් හැර ගිය අය සහ වෙනත් අංශවල වෘත්තිකයන් ඇතුළු විවිධ සිසුන් ලියාපදිංචිවීමක් දැකගත හැකි විය.

### ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතිකය (CCM), හිමිකම් සුරැකුම්පත් සහතිකය (CES), ණය සුරැකුම්පත් පිළිබඳ සහතිකය (CDS) සහ ඒකක භාරවල සහතිකය (CUT)

ඉහත වැඩසටහන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන ලද අතර 2022 වර්ෂයේදී ආරම්භ කරන ලදී. 2022 ඔක්තෝම්බර් මාසයේදී එහි 26 වැනි කණ්ඩායම ලියාපදිංචි වී සිටි සිසුන් 88 දෙනෙකුගෙන් ආරම්භ කරන ලදී. (සංඛ්‍යා සටහන 11)

සංඛ්‍යා සටහන 11: සංඛ්‍යානමය කාර්ය සාධනය

| මුළු ලියාපදිංචි ගණන | සුරැකුම්පත් වෙළෙඳපොළවල් සහ උපකරණ අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව | හිමිකම් සුරැකුම්පත් අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව | ණය සුරැකුම්පත් අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව | ඒකක භාර අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව | මූල්‍ය සැළසුම්කරණය, උපදේශනය හා අලෙවිකරණය අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව | සුරැකුම්පත් නියාමනය හා ආචාරධර්ම අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 88 | 53 | 39 | 37 | 62 | 68 | 46 |

### ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA), සහතික කළ කොටස් සුරැකුම්පත් උපදේශක (CESA) සහ නැවත ස්ථාපිත කිරීම්

සළකා බලන වසර තුළ, RIA බලපත්‍රය, CESA බලපත්‍රය අපේක්ෂා කරන සිසුන්ට බලපත්‍ර ප්‍රදානය කිරීම සඳහා සහ වාර්ෂික CPD අවශ්‍යතාවයට අනුකූල නොවීම හේතුවෙන් බලපත්‍රය කල් ඉකුත් වූ ආයෝජන උපදේශකයින් නැවත සේවයේ පිහිටුවීම සඳහා VIVA VOCE විභාග 12ක් පැවැත්විණි.

ඒ අනුව මෙම VIVA VOCE විභාග සඳහා සිසුන් 48 දෙනෙකු සහභාගී වූ අතර සාමාන්‍ය සාමාර්ථය 60% කි. සාර්ථක සිසුන් අතරින් සිසුන් 19 දෙනෙකු 70% ක සාමාර්ථයක් පෙන්නුම් කරමින් RIA බලපත්‍රය ලබා ගත් අතර සිසුන් හතර දෙනෙකු 100% සමත් වීමේ අනුපාතයක් පෙන්නුම් කරමින් CESA බලපත්‍රය ලබාගෙන ඇත. 35% ක සමත් අනුපාතයක් පෙන්නුම් කරමින් වසර තුළ ආයෝජන උපදේශකයින් හය දෙනෙකු පමණක් නැවත සේවයේ පිහිටුවන ලදී. (සංඛ්‍යා සටහන 12)

සංඛ්‍යා සටහන 12: VIVA VOCE විභාගවල සංඛ්‍යාන කාර්ය සාධනය

| VIVA VOCE විභාග | සහභාගී වූ සිසුන් සංඛ්‍යාව | සාමාන්‍ය සමත් ප්‍රතිශතය % |
|---|---|---|
| RIA / CESA / Re-instatements | 48 | 60% |

### අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) පාඨමාලා

සමාලෝචිත වර්ෂය තුළ, කොටස් තැරැව්කාර සමාගම්වල දැනට සිටින ආයෝජන උපදේශකයින් සඳහා දේශීය සහ ගෝලීය ප්‍රාග්ධන වෙළෙඳපොළේ නවතම ප්‍රවණතා සමඟ නිරන්තරයෙන් තක්සේරු කිරීමට සහ යාවත්කාලීන කිරීමට ඔවුන්ට හැකි වන පරිදි CPD වැඩසටහන් පහක් පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා කොටස් තැරැව්කාර සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන්, ආයෝජන උපදේශකයින් සහ විශ්ලේෂකයින් ඇතුළු 1400 කට අධික පිරිසක් සහභාගී වූහ. සියලුම CPD වැඩසටහන් webinars ලෙස මාර්ගගතව පවත්වන ලදී.

දැනට සිටින ආයෝජන උපදේශකයින් හට ඊළඟ වසර සඳහා ඔවුන්ගේ RIA තත්ත්වය අලුත් කිරීම සඳහා වසරකට අවම වශයෙන් CPD සම්මන්ත්‍රණ ලකුණු හතරක් ලබා ගත යුතු අතර ඊට පහසුකම් සළසමින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එහි අනිවාර්ය අවශ්‍යතාවය පවත්වා ගෙන ගියේය. (සංඛ්‍යා සටහන 13)

සංඛ්‍යා සටහන 13: CPD වැඩසටහන්වල සාරාංශය: වසර 2022

| CPD වැඩසටහන් ස්වභාවය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|
| මුදල් විශුද්ධිකරණයට එරෙහිවීම සහ පාරිභෝගික නීති හඳුන්වාදීම | 317 |
| ශ්‍රී ලංකා ආර්ථිකය: ඉදිරි ගමන | 356 |
| වෙළෙඳපොළ අතරමැදියන් / ආයතන සඳහා අදාළ වන නීති | 436 |
| සාමූහික ආයෝජන යෝජනා ක්‍රම (CIS) සංග්‍රහය පිළිබඳ හැඳින්වීම | 191 |
| අඛණ්ඩ ලයිස්තුගත කිරීමේ නීති - ඔබගේ ගනුදෙනුකරුවන්ට උපදෙස් දීමේදී ඔබ දතයුතු දේ | 181 |

### ආයෝජන වැඩසටහන් (PI)

ඉදිරියේදී ආයෝජනය කිරීමට අපේක්ෂාවෙන් සිටින ආයෝජකයින් සඳහා කොටස් ගනුදෙනු සම්බන්ධ මූලික න්‍යායික හා ප්‍රායෝගික දැනුම ලබාදීමේ අරමුණින් ආයෝජන වැඩසටහන ආරම්භ කරන ලදී. වසර තුළ සති හයක් පුරා සිංහල මාධ්‍ය වැඩසටහනක් සහ ඉංග්‍රීසි මාධ්‍ය වැඩසටහනක් පවත්වන ලදී. 28 වන කණ්ඩායම සහ 29 වන කණ්ඩායම 2022 ජනවාරි සහ මාර්තු මාසවලදී ආරම්භ කරන ලදී. වර්ෂය තුළ, සිංහල මාධ්‍ය සහ ඉංග්‍රීසි මාධ්‍ය වැඩසටහන් සඳහා පිළිවෙළින් 26 ක් සහ 24 ක් වශයෙන් සහභාගිවන්නන් ලියාපදිංචි විය.

# මෙහෙයුම් සමාලෝචනය

## රන් පදක්කම් සහ මුදල් ත්‍යාග ලබාදීමේ ව්‍යාපෘතිය

විශ්වවිද්‍යාලවල ප්‍රාග්ධන වෙළෙඳපොළ ආශ්‍රිත විෂයයන් හැදෑරීමට උපාධි අපේක්ෂකයින් දිරිගැන්වීමේ අරමුණින් ආරම්භ කරන ලද රන් පදක්කම් සහ මුදල් ත්‍යාග ප්‍රදානය කිරීමේ ව්‍යාපෘතිය අප සමාලෝචිත වර්ෂය තුළදී අඛණ්ඩව පවත්වාගෙන ගියෙමු. මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලවල ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්ෂේත්‍රයේ හොඳම දක්ෂතා දක්වන උපාධි අපේක්ෂකයින් සඳහා රන් පදක්කමක් සහ මුදල් ත්‍යාගයක් පිරිනැමේ. ඉහත ව්‍යාපෘතියට අදාළව ජාතික විශ්වවිද්‍යාල එකොළහක් සමඟ අවබෝධතා ගිවිසුම් (MOU) අත්සන් කර ඇත.

ඒ අනුව පහත සඳහන් ජාතික විශ්වවිද්‍යාලවලට 2022 වර්ෂය තුළ රන් පදක්කම් සහ මුදල් ත්‍යාග පිරිනමන ලදී.

- යාපනය විශ්වවිද්‍යාලය
- කැලණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හොඳම දක්ෂතා දැක්වූ උපාධි අපේක්ෂිකාව වන එම් එච් එම් අයි එම් සෙනෙවිරත්න මෙනවියට රන් සම්මානය හා මුදල් ත්‍යාගය පිරිනැමීමේ අවස්ථාව

## ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු මධ්‍යස්ථානය (CMIC)

ප්‍රාග්ධන වෙළෙඳපොළේ නියාමකයා ලෙස සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සෑම විටම රටේ මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීමට උත්සාහ කරන්නේ දැනුම පදනම් කරගත්, දැනුම මූලික කරගත් කර්මාන්තයක් නිර්මාණය කිරීම ප්‍රාග්ධන වෙළෙඳපොළේ තිරසාර සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය බව අපි තරයේ විශ්වාස කරන බැවිනි. ප්‍රාග්ධන වෙළෙඳපොළ විෂය ප්‍රචලිත කිරීමේ සහ පර්යේෂණ දිරිගැන්වීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලවල ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු මධ්‍යස්ථාන (CMIC) පිහිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද අතර එමඟින් විද්‍යුත් ඉගෙනුම් පරිසරයක් ලබාදීමට අප අපේක්ෂා කරන බැවින් එය අඛණ්ඩව යාවත්කාලීන කරන ලදී. ප්‍රාග්ධන වෙළඳපොළ පිළිබඳ ඔවුන්ගේ අවබෝධය තවදුරටත් වර්ධනය කිරීමට මෙන්ම ආයෝජනය පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීමටත්, පර්යේෂණ සහ ශාස්ත්‍රීය අරමුණු සඳහාත් තොරතුරු දත්ත සහ මෙවලම් අපේක්ෂා කරන විද්වතුන්ට සහ උපාධි අපේක්ෂකයින්ට මෙම තොරතුරු මධ්‍යස්ථාන වලින් සැපයෙනුයේ මනා පිටිවහළකි. වත්මන් සන්දර්භය තුළ එවැනි කාර්යයක වැදගත්කම ඉස්මතු වන අතර දැනට අප වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටින්නෙමු. 2022 වර්ෂයේදී යාපනය විශ්වවිද්‍යාලයට පිවිස CMIC මධ්‍යස්ථානයේ තත්ත්වය සහ භාවිතය නිරීක්ෂණය කළෙමු.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සම්බන්ධයෙන් පළවූ පුවත්පත් ලිපි



# Capital market content in school curriculum from 2023

SEC to allow local companies to raise capital in foreign currencies

Lanka's financial literacy low at 58%

COLOMBO, 23RD MARCH 2022

# Securities and Exchange Commission of Sri Lanka and CFA Society Sri Lanka continue to advance capital market governance standards

Mr Viraj Dayaratne, PC Chairman, Securities Exchange Commission, Sri Lanka

We are happy that they have shown an interest and taken steps towards contributing to the market, along with the regulator, the Securities and Exchange Commission, as well as the Colombo Stock Exchange, with the idea of bringing in new regulations

SEC UNDERSCORES ROLE OF CFA CAPITAL MARKET AWARDS IN UPLIFTING INVESTMENT RESEARCH STANDARDS

CFA INSTITUTE SOCIETY SRI LANKA

Podium Participants (from left): CSE CEO Rajeeva Bandaranaike, CSE Director Jayantha Fernando, CSE Director Dimuthu Abeywardena, CSE Director Ray Abeywardena, CSE Chairman Dilshan Wirasekara, SEC Chairman Viraj Dayaratne PC, SEC/CSE Joint Committee Chairman for Digitalisation Naresh Abeyesekara, SEC DG Chinthaka Mendis, SEC Commission Member Sanjaya Bandara, SEC Commission Member Manil Jayesinghe, CSE Director Arjuna Herath, and SEC Commission Member Sanjeewa Dissanayake

# SEC, CSE complete third phase of CSE digitalisation

Contd. on page 8

# SEC, CSE and CA Sri Lanka to capitalise on synergies to advance non-financial reporting

THE Securities and Exchange Commission of Sri Lanka (SEC), the Colombo Stock Exchange (CSE) and the Institute of Chartered Accountants of Sri Lanka (CA Sri Lanka) recently signed a Memorandum of Understanding (MoU) to encourage and advance non-financial reporting in Sri Lanka.

Through the MoU, the three institutions aim to capitalise on mutual interests and synergies to jointly deliver awareness on Integrated Reporting, Corporate Governance, Sustainability and other ESG focus areas. Furthermore, the MoU also paves the way for broader cooperation on ESG, including dialogue and consultations on driving progressive ESG policies and frameworks and the introduction of ESG focused new products in the capital market and stakeholder engagement on advancing ESG.

SEC Chairman Viraj Dayaratne PC said: "The MoU with CA Sri Lanka brings together three like-minded institutions, with the common goal of establishing more elaborate and transparent reporting of non-financial information in Sri Lanka. The MoU lays a long-term foundation for the SEC and CSE to work with CA Sri Lanka to introduce policies to ensure that Sri Lankan corporates report more

From left: CASL CEO Dulani Fernando, SEC Commission Member Manil Jayesinghe, Viraj Dayaratne PC, CSE Chairman Dilshan Wirasekara, SEC DG Chi...

# SEC Act enables setting up Central Counterparty mechanism

The new Securities and Exchange Commission of Sri Lanka (SEC) Act which came into force from September 19, 2021 contains provisions which enable the setting up of a Central Counterparty (CCP).

The need for setting up a CCP to enhance the efficiency of post trade risk management had been spoken of for a long time and as the first step towards this, the launch of Delivery vs Payment (DvP) mechanism was successfully completed on August 16, 2021.

The SEC and the Colombo Stock Exchange (CSE) engaged in several rounds of discussions to determine how such a project could be taken forward.

# මෙහෙයුම් සමාලෝචනය

සමාජ මාධ්‍ය නාලිකා හරහා සිදුකළ ආයෝජන දැනුවත් කිරීම්




























SEC
ඔබ දන්නවාද?
2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට අනුව සෑම කොටස් තැරැව්කාර ආයතනයක්මසමීක්ෂණ අංශයක් පවත්වා ගත යුතු බව.
සමීක්ෂණයෙන් තොරව කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීමෙන් වළකින්න!


BEWARE OF FALSIFIED RESEARCH REPORTS
Base your investment decisions from research reports obtained directly from your stockbroker firm/CSE Mobile App. Always check the authenticity of broker reports that you receive via Social media/third parties
@SEC_SriLanka


DID YOU KNOW?
Delivery versus payment (DVP) is a mechanism adopted by Stock Exchanges to minimize principal risk,
that is, the risk that the seller of a security would deliver the security but not receive payment or that the buyer of a security would make payment but not receive delivery of the security.


SEC
Equity Crowdfunding is solicitation of funds (small amounts) from multiple investors through a web-based platform or social networking site for a business venture.


35
SEC
DID YOU KNOW ?
Prior written approval of the SEC shall be obtained by Stock Broker Firms, in order to transfer Securities from one Client Account to another Client Account, outside the trading procedure of the CSE.
All such transfer application forms shall be submitted to the CDS along with original letter of approval received from the SEC.


35
SEC
Don't despair amid the inevitable setbacks that all investors face, especially during a crisis in the market. If the reasoning behind the investment was sound, stick with it, and it should eventually turn around


Capitalization of Reserves
SEC
CONSIDERATION (RS.)
The per share value which will be considered for the increase in the stated capital, in respect of the new shares issued by way of the capitalization of reserves


BLUE BONDS
Blue bonds are a subset of Green bonds, where the funds raised are used to finance the resilience of marine and coastal ecosystems, particularly in line with Sustainable Development Goals.
SEC

# මෙහෙයුම් සමාලෝචනය

## මානව සම්පත්

වඩාත්ම වටිනා සහ අත්‍යවශ්‍ය වත්කම වන්නේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සේවකයින් වන අතර ඉහළ කාර්ය සාධනයක් ඇති ආයතනයක් ලෙස තම කටයුතු පවත්වාගෙනයාම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කාර්ය මණ්ඩලය තුළ අඛණ්ඩව කුසලතා වර්ධනය කර ගැනීම සහ රඳවා තබා ගැනීම අත්‍යවශ්‍ය වේ. අපි සෑම කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේම යහපැවැත්ම සහ ප්‍රගතිය සහතික කිරීමට උත්සාහ කරන අතර සේවකයින්ට සහයෝගය සහ අගය දැනෙන ධනාත්මක සේවා පරිසරයක් නිර්මාණය කිරීමෙන් සේවකයින්ගේ චිත්ත ධෛර්යය ඉහළ නැංවීමට උත්සාහ කරන්නෙමු.

## කාර්ය මණ්ඩලය

වඩා තරඟකාරීව, ගැළපෙන්නාවූ, නැවුම් ඉදිරි දර්ශන, නව ජවයක් මෙන්ම තාක්ෂණික හැකියාවන් වැනි වැදගත් කුසලතා පෙන්නුම් කරමින් තරුණ වෘත්තිකයන්ට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට උපකාර කිරීමට හැකියාවක් ඇති බව අපි විශ්වාස කරන්නෙමු. එබැවින්, ලේකම් කාර්යාලයේ ප්‍රධාන අංශ පහක සේවය කිරීම සඳහා, අප 2022 අවසාන භාගයේදී ස්ථිර සේවක සංඛ්‍යාවට විවිධ විෂය ක්ෂේත්‍රවල නියෝජනය කරන තරුණ වෘත්තිකයන් දහහතර දෙනෙකු බඳවා ගත්තෙමු. මීට අමතරව, අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලනය සහ අධ්‍යක්ෂ අධීක්ෂණ යන තනතුරු සඳහා අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ස්ථිර සේවක සංඛ්‍යාවට බඳවා ගැනීමට ලේකම් කාර්යාලය සමත් විය. එපමණක් නොව, සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාවේ ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම සඳහා නීති සහ බලාත්මක කිරීමේ අධ්‍යක්ෂ, ප්‍රධාන තොරතුරු නිලධාරි සහ අධ්‍යක්ෂ මානව සම්පත් වැනි ජ්‍යෙෂ්ඨ තනතුරු පිරවීම සඳහා අප සම්මුඛ පරීක්ෂණ පැවැත්වුවෙමු.

නව සේවකයින්ට ආයතනය, එහි ප්‍රතිපත්ති, සංස්කෘතිය සහ වටිනාකම් පිළිබඳව හුරුපුරුදු වීමට කාර්ය මණ්ඩලය සහ ඔවුන් තම රාජකාරී කටයුතු සිදුකරන ආකාරය පිළිබඳව හඳුන්වාදීම වැදගත් අංගයකි. නව සේවකයින් සඳහා ලේකම් කාර්යාලයේ කටයුතු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට මෙන්ම සුරැකුම්පත් වෙළෙඳපොළේ මෙහෙයුම් පිළිබඳ දැනුම ලබාදීම සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ පළපුරුදු සහ දක්ෂ තරුණ වෘත්තිකයන් රඳවා තබා ගැනීම බරපතල අභියෝගයක් විය. රට තුළ පවතින තත්ත්වය හේතුවෙන් කාර්ය මණ්ඩල සාමාජිකයින් පස් දෙනෙකු විදේශ රටවල රැකියා සඳහා සංක්‍රමණය වූ අතර තවත් කාර්ය මණ්ඩල සාමාජිකයින් අට දෙනෙකු රට තුළ වෙනත් ආයතන වෙත සංක්‍රමණය විය. ඒ අනුව අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු, කළමනාකරුවෙකු, ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරුවන් දෙදෙනෙකු, සහකාර කළමනාකරුවන් හත්දෙනෙකු සහ ජ්‍යෙෂ්ඨ විධායක ලේකම්වරයෙකුගෙන් ඉල්ලා අස්වීම් දහතුනක් ලැබුණු අතර එම වසරේ කාර්ය මණ්ඩලය රඳවා තබා ගැනීමේ අනුපාතය 14%ක් විය. (රූප සටහන් 08, 09, 10, 11, 12)

රූප සටහන 08: සේවා තොරතුරු




**"වඩා තරඟකාරීව, ගැළපෙන්නාවූ, නැවුම් ඉදිරි දර්ශන, නව ජවයක් මෙන්ම තාක්ෂණික හැකියාවන් වැනි වැදගත් කුසලතා පෙන්නුම් කරමින් තරුණ වෘත්තිකයන්ට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට උපකාර කිරීමට හැකියාවක් ඇති බව අපි විශ්වාස කරන්නෙමු."**

රූප සටහන 09: අධ්‍යාපන සුදුසුකම් අනුව සේවක සංඛ්‍යාව




රූප සටහන 10: ස්ත්‍රී-පුරුෂ සංයුතිය




රූප සටහන 11: වයස් විශ්ලේෂණය



**රූප සටහන 12: පවත්නා කාර්ය මණ්ඩල සංයුතිය**




- අධ්‍යක්ෂ ජනරාල්
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
- අධ්‍යක්ෂක
- සහකාර අධ්‍යක්ෂක
- ජ්‍යෙෂ්ඨ කළමනාකරු
- කළමනාකරු
- සහකාර කළමනාකරු
- නිලධාරී, ජ්‍යෙෂ්ඨ විධායක ලේකම් සහ විධායක ලේකම්
- රහස්‍ය ලේකම්
- දුරකථන ක්‍රියාකරු
- ජ්‍යෙෂ්ඨ කාර්යාල සහකාර

## පුහුණු හා සංවර්ධන

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි පුහුණුව සහ සංවර්ධනය වැදගත් අංගයක් වන අතර එමගින් සේවකයින්ගේ වෘත්තීයමයභාවය සහ පෞද්ගලිකත්වය වර්ධනය වීමට ඉඩ සලසයි. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත පැවරී ඇති වගකීම් ඵලදායි ලෙස සහ කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ තාක්ෂණික සහ අනෙකුත් ආශ්‍රිත නිපුණතා වැඩිදියුණු කිරීම පිළිබඳව අඛණ්ඩව අවධානය යොමු කරන ලදී. කාර්ය මණ්ඩලයට විදේශීය පුහුණුව ලබා දීමේ අරමුණින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 25 ක මුදලක් වෙන් කරන ලදී.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයෙහි (IOSCO) වාර්ෂික සමුළුව, එහි සාමාජිකයින්ට ගෝලීය සුරැකුම්පත් සහ අනාගත වෙළෙඳපොළවල් වලින් පැන නගින වඩාත්ම හදිසි නියාමන ගැටළු සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙයි. 2022 ඔක්තෝම්බර් මාසයේදී මොරොක්කෝවේ පැවති 47 වැනි IOSCO වාර්ෂික සමුළුවේදී සභාපතිවරයා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ සහ විනිමය කොමිෂන් සභාව නියෝජනය කළේය.

තවද, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව IOSCO කමිටු 4 සහ හඳුනාගැනීමේ කණ්ඩායමෙහි (Screening Group-SG) සාමාජිකයෙකි. මෙම රැස්වීමේ අරමුණ වූයේ නව සාමාජිකයින් හඳුනා ගැනීම, බහුපාර්ශවීය අවබෝධතා ගිවිසුමක් (MMOU) ක්‍රියාත්මක කිරීමේදී පැන නගින බලාත්මක ගැටළු විසඳීම, IOSCO අවබෝධතා ගිවිසුමට අදාළ ක්‍රියාවලීන් සහ ක්‍රියා පටිපාටි පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීම, තොරතුරු හුවමාරු කර ගැනීම සහ හොඳ භාවිතයන් හඳුනා ගැනීම පිළිබඳව අවධානය යොමු කිරීමයි. IOSCO කමිටු 4 හි අඛණ්ඩ සහභාගීත්වය සම්බන්ධ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා 2022 නොවැම්බර් මාසයේදී ස්පාඤ්ඤයේ පැවති රැස්වීමට සහභාගී විය.

2022 වර්ෂයේදී කාර්ය මණ්ඩලයට විදේශීය පුහුණුව ලබා දුන් නමුත් පෙර වසරවලට සාපේක්ෂව බොහෝ දේශීය පුහුණුවීම් සඳහා පහසුකම් සැලසීය. කාර්ය මණ්ඩලයේ නිපුණතා ඉහළ නැංවීමට සහ වැඩිදියුණු කිරීම සඳහා SUKUK, නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත, ඉස්ලාමීය බැංකුකරණය සහ මූල්‍ය, භාණ්ඩාගාර තොරතුරු ආරක්ෂණ මෙහෙයුම්, ස්ථාවර ආදායම් ආයෝජන විශ්ලේෂණය, අවදානම් මත පදනම් වූ තොරතුරු තාක්ෂණ විගණනය වැනි ක්ෂේත්‍රවල පුහුණුව ලබා දෙන ලදී. ඊට අමතරව, අපගේ කාර්ය මණ්ඩලය, "ඔබගේ තාක්ෂණික කුසලතා යාවත්කාලීන කරන්න" මැයෙන් මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් පවත්වනු ලැබූ 43 වැනි වරලත් ගණකාධිකාරීවරුන්ගේ ජාතික සමුළුවට සහ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් පවත්වනු ලැබූ අධිකරණ වෛද්‍ය ගිණුම්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවට ද සහභාගී විය.

තවද, වරලත් මූල්‍ය විශ්ලේෂක ආයතනය (CFA) විසින් හඳුන්වා දෙන ලද ගෝලීය පාරිසරික සමාජ සහ පාලන ආයෝජන (ESG) පිළිබඳ සහතික කිරීමේ වැඩසටහනක් කාර්ය මණ්ඩලය වෙත පිරිනමන ලදී. මෙම කාර්යය සඳහා අරමුදල් සපයන ලද්දේ ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය මගිනි. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කාර්ය මණ්ඩලයට වට්ටම් සහිත මිල ගණන් යටතේ CFA පාඨමාලා හැදෑරීමට ශිෂ්‍යත්ව සඳහා පහසුකම් සලසනු ලැබීය.

ඊට අමතරව කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් තුනක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන කාර්ය මණ්ඩලය අතර තාක්ෂණික හා සියුම් දක්ෂතා වර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම සහ ඔවුන්ගේ රාජකාරි වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීමට හැකියාව ලබාගැනීම අරමුණු කර ගෙන ඇත.

කාර්ය මණ්ඩල අධ්‍යාපනය සඳහා ඇති කැපවීම පෙන්නුම් කරමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සේවකයින්ට අධ්‍යයන පාඨමාලා හැදෑරීමට අඛණ්ඩව අවස්ථා ලබා දුන්නේය. ඒ අනුව ජ්‍යෙෂ්ඨ කාර්යාල කාර්ය සහායකයකුට සහ එක් රියැදුරකුට කාර්යක්ෂමව හා වඩා ඵලදායී ලෙස තම කාර්යය ඉටු කිරීම අවශ්‍ය දැනුම ලබාගතහැකි වන ආකාරයේ මාස හයක පරිගණක සහතික පත්‍ර පාඨමාලාවක් හැදෑරීමටත් වස්ථාව හිමි විය.

සමාලෝචිත වර්ෂය තුළ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා දේශීය හා විදේශීය පුහුණුව සඳහා දැරූ මුළු පිරිවැය දළ වශයෙන් රුපියල් මිලියන 9.3 කි. තවද, උසස් අධ්‍යයන කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීම සහ සාමාජික ගාස්තු සඳහා දැරූ වියදම දළ වශයෙන් රුපියල් මිලියන 2ක් විය.

## සේවක සුබසාධක

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා ලේකම් කාර්යාලය සිය කාර්ය මණ්ඩලයට බාහිර වෛද්‍ය යෝජනා ක්‍රම, කාර්යාලයට පැමිණීම හා පිටවීමේ නම්‍යශීලී ක්‍රමවේදයක් , ආපදා ණය යෝජනා ක්‍රමයක්, උත්සව අත්තිකාරම්, එක් වෘත්තීය ආයතනයකට සාමාජික ගාස්තු ප්‍රතිපූරණය කිරීම, සෞඛ්‍ය සහ ජීවිත රක්ෂණ ආවරණ, සහායක කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් වැනි ප්‍රතිලාභ රැසක් ලබා දෙයි.

ආයතන දෙක අතර සුහදතාවය සහ වඩා හොඳ සහයෝගීතාවයක් වර්ධනය කර ගැනීමේ අපේක්ෂාවෙන් කොළඹ කොටස් හුවමාරුව විසින් සුහද ක්‍රිකට් තරගාවලියකට සහ රාත්‍රී භෝජන සංග්‍රහයකට සහභාගී වීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ආරාධනා කරන ලදී. එම අමතක නොවන ක්‍රිකට් තරගාවලිය හා සාර්ථක උත්සවය 2022 දෙසැම්බර් 19 වන දින කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලීය ක්‍රීඩාංගණයේදී ආයතන දෙකේම කාර්ය මණ්ඩල සාමාජිකයින් 140 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

කාර්යමණ්ඩලය හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් අතර සුහදතාව වර්ධනය කර ගැනීමේ අරමුණින් වාර්ෂිකව සංවිධානය කරනු ලැබූ නත්තල් හමුව සෑම දෙනෙකුම වඩා උනන්දුවෙන් බලා සිටින ලද වාර්ෂික උත්සවයකි. සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද එම වාර්ෂික නත්තල් හමුව මෙවර කාර්යාල පරිශ්‍රය තුළ දී පැවැත්විණි.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සේවකයින්ගේ දරුවන් අතර කියවීමට සහ ලිවීමට ඇති ආශාව වැඩි දියුණු කිරීම සඳහා තරග කිහිපයක් පවත්වන ලදී. මෙම තරගාවලිය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සංකල්පයකි. "කියවන්නෙකු බිහිකරන්න", "පුංචි පිකාසෝ", "පුංචි සිතුවිලි - මගේ ප්‍රියතම පොත ගැන" සහ 'Battle of the books' යන මැයෙන් එම තරග නම් කරන ලදී. මීට අමතරව, කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ ඔවුන්ගේ දරුවන්

# මෙහෙයුම් සමාලෝචනය

කියවීමට දිරිමත් කිරීම සඳහා වසර තුළ නව ප්‍රබන්ධ සහ ප්‍රබන්ධ නොවන පොත් වලින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පුස්තකාලය හොඳින් ගබඩා කර තිබුණි. ජයග්‍රාහකයින්ට සහ සහභාගිවූවන්ට ත්‍යාග ප්‍රදානය කරන ලදී.

## සීමාවාසික පුහුණුව

ජාතික විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂකයින්ට සීමාවාසික පුහුණුව ලබා දීම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පරිපාලනය කරනු ලබන වැදගත් ක්ෂේත්‍රයකි. උපාධි අපේක්ෂකයින්ට රැකියා පුහුණුව ලබා ගැනීම සඳහා ලේකම් කාර්යාලය අඛණ්ඩව සහාය වූ අතර ඒ අනුව නව සීමාවාසිකයින් 10 දෙනෙකුට ඔවුන්ගේ අධ්‍යයන ක්ෂේත්‍ර අනුව විවිධ අංශවල සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සේවය කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

## තොරතුරු තාක්ෂණය

සමාලෝචිත වර්ෂය තුළ, ලෝක බැංකුවේ (WB) මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP) යටතේ, KPMG Sri Lanka සහ AAM Management Information Consulting (Hungary) විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සඳහා වසර 5 ක් සඳහා අදාළවන පරිදි තොරතුරු තාක්ෂණ උපාය මාර්ග සහ තොරතුරු තාක්ෂණ (IT) මාර්ග සිතියමක් සකස් කරන ලදී.

තොරතුරු තාක්ෂණ උපායමාර්ගය සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ 2021-2023 ආයතනික සැලැස්ම සහ 2021-2025 ප්‍රාග්ධන වෙළෙඳපොළ උපායමාර්ගය සමඟ පෙලගැසී ඇත. තොරතුරු තාක්ෂණ උපායමාර්ගය තුළ, උපදේශන සමාගම විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ප්‍රධාන උපාය මාර්ගික මාර්ගෝපදේශ 5ක් නිර්දේශ කර ඇත, එනම් අභ්‍යන්තර ව්‍යාපාර කාර්යයන් ස්වයංක්‍රීය කිරීම, බාහිර හවුල්කරුවන් සඳහා වඩා හොඳ සේවා, අභ්‍යන්තර පාරිභෝගිකයින් සඳහා වඩා හොඳ සේවා, ප්‍රමාණවත් පරිගණක සම්පත් සැපයීම සහ මානව සම්පත් සංවර්ධනයයි. සෑම උපායමාර්ගික අංශයකින්ම උපායමාර්ගික ක්‍රියා සමඟ සිතියම්ගත කර ඇත. තොරතුරු තාක්ෂණ සේවා, යටිතල පහසුකම්, ක්‍රියා පටිපාටි සහ මානව සම්පත් ශක්තිමත් කිරීම මගින් ආයතනික අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍යතා මත පදනම්ව ක්‍රියා කිරීමට එමගින් ප්‍රමුඛත්වය දෙන ලදී.

තොරතුරු තාක්ෂණ උපාය මාර්ගික ඉලක්ක හඳුනා ගැනීම පදනම් වූයේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ පරිසරයේ පවත්නා ගැටළු විනිශ්චය වාර්තාවේ සොයාගැනීම් මතය. උපදේශකයා විසින් ව්‍යාපාර ක්‍රියාවලි, යටිතල පහසුකම් සහ එහි පුද්ගලයින් ඇතුළුව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ පරිසරය තක්සේරු කිරීමට තොරතුරු සහ ආශ්‍රිත තාක්ෂණයන් සඳහා වන පාලන අරමුණු (COBIT) ක්‍රියාවලි පරිණත මාදිලිය භාවිතා කර ඇත.

ප්‍රධාන උපායමාර්ගික උපදෙස් වලට අනුව, ව්‍යාපාර ක්‍රියාකාරකම් ස්වයංක්‍රීයකරණය වැඩිදියුණු කිරීම යටතේ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ IT කණ්ඩායම 2022 වර්ෂය තුළ Microsoft Sharepoint හි අංගසම්පූර්ණ නවීනතම ලේඛන කළමනාකරණ සහ ලේඛනාගාර පද්ධතියක් (DMAS) ක්‍රියාත්මක කිරීමට සමත් විය.

**"ජාතික විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂකයින්ට සීමාවාසික පුහුණුව ලබා දීම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පරිපාලනය කරනු ලබන වැදගත් ක්ෂේත්‍රයකි."**

## ව්‍යවස්ථාපිත අරමුදල්

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල

1991 අංක 26, 2003, අංක18, 2009 අංක 47 දරන පනත් මගින් සංශෝධිත 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 14බී යන වගන්තිය යටතේ ස්ථාපනය කරන ලද අතර, එය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ අංක 156 (1) වගන්තිය මගින් අවලංගු කර ප්‍රතිස්ථාපනය කරන ලදී.

2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 155 (1) සහ (2) සහ 156 (1), (2) සහ (3) යන වගන්තිවලට අනුව සෙස් අරමුදලේ ක්‍රියාකාරීත්වය සහ අරමුණු පහත ආකාරයෙන් සඳහන් කොට ඇත.

155 (1) බලපත්‍රලාභී කොටස් හුවමාරුවක සටහන් වී ඇති හෝ එහි නීතිරීති යටතේ දැනුම් දෙන ලද ගැනුම්කරු සහ විකුණුම්කරු යන දෙදෙනාම විසින් සිදුකරනු ලබන සෑම සුරැකුම්පත් මිලදීගැනීමක් සහ විකිණීමක් සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන අනුපාතයකට අනුව වූ සෙස් බද්දක් නියම කිරීම්, අයකිරීම් හා ගෙවීම් කිරීම් සිදු කළ යුතුය. විවිධ වත්කම් පන්ති වෙනුවෙන් විවිධ අයකිරීමේ අනුපාතයන් පැනවීමට ඉඩ ඇත.

(2) මෙම වගන්තිය යටතේ පනවන සෙස් බද්ද වෙනත් ඕනෑම ලිඛිත නීතියක් යටතේ අය කරනු ලබන වෙනත් යම් බද්දකට හෝ සෙස් බද්දකට අමතරව විය යුතුය.

156 (1) සෙස් බදු අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු වන අතර 156 වගන්තිය යටතේ අයකරනු ලබන සෙස් බදු අරමුදල් එම සෙස් බදු අරමුදලට බැර කල යුතුය.

(2) කොමිෂන් සභාව අනුමත කරන්නා වූ මුදල් ප්‍රමාණයන් උපයෝගී කරගෙන සෙස් බදු අරමුදලේ බැරට ඇති මුදල් පහත දැක්වෙන කාර්ය සඳහා පමණක් භාවිතා කරනු ලැබිය යුතුය.

(අ) සුරැකුම්පත් වෙළෙඳපොළ දියුණු කිරීම;

(ආ) මේ කොටස යටතේ පිහිටු වනු ලබන වන්දි අරමුදලේ හෝ කොමිෂන් සභාවේ අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම.

(ඇ) එහි කාර්යය සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේදී, සහ ඉටු කිරීමේදී කොමිෂන් සභාව කළමනාකරණය, පරිපාලනය සහ මෙහෙයවීම සඳහා කොමිෂන් සභාව විසින් දරනු ලබන සියළු වියදම් පියවා ගැනීම;

(ඈ) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සළකනු ලබන පරිදි කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට නිවාසථ අධ්‍යාපනික, සෞඛ්‍ය සහ ප්‍රවාහන යන කාර්යය සඳහා ණය ලබාදීම.

(ඉ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහ එහි නිළධරයන්ගේ සහ සේවකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සහ නාමිකයන්ගේ ප්‍රතිලාභය සඳහා පිහිටුවනු ලබන විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් සහ අනෙකුත් යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම; සහ

(ඊ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි යෝග්‍යතාවය පෙන්නුම් කර ඇති කොමිෂන් සභාවේ නිළධරයන් සහ සේවකයන් විසින් ශ්‍රී ලංකාව තුළදී හෝ විදේශීය රටකදී නිරත වනු ලබන අධ්‍යයනයන්ට අදාළ වියදම් පියවීම.

(3) සෙස් බදු අරමුදල දියුණු කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින්, සෙස් බදු අරමුදලේ බැරට ඇති යම් අතිරික්ත මුදලක් කොමිෂන් සභාව විසින් ආයෝජනය කරනු ලැබිය හැකිය.

## හිමිකම් සුරැකුම්පත් සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සෙස් බද්ද

කොළඹ කොටස් වෙළෙඳපොළ මාර්ගෝපදේශයන්ට අනුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් හිමිකම් සුරැකුම්පත් සඳහා අය කරන ලද සෙස් බද්ද දෙවන වරටත් 2010 අගෝස්තු 1 දින සිට බලපැවැත්වෙන පරිදි එක් ගනුදෙනුවකට 0.09% සිට 0.072% දක්වා අඩු කර ඇත. පසුව අඩු කිරීම 2003 දෙසැම්බර් 1 දින සිට ක්‍රියාත්මක වූ අතර ඒ අනුව ගනුදෙනුවකට අදාළ සෙස් බද්ද 0.1% සිට 0.09% දක්වා අඩු ලරන ලදී.

තවද, 2017 ජූනි 27 දින සිට බලපැවැත්වෙන පරිදි එම ගනුදෙනු පරාසය රු. මිලියන 100ක් දක්වා වන ගනුදෙනු වලට අදාළ වන ලෙස වෙනස් විය. මීට පෙර එය පැවතියේ, 2011 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි රුපියල් මිලියන 50 ක් හා රුපියල් මිලියන 50 ට වඩා වැඩි වටිනාකමකින් යුත් ගනුදෙනු ලෙස වන අතර අයකරනු ලැබූ සෙස් බද්ද පිළිවෙලින් 0.072%ක, හා 0.045% ක විය. අනතුරුව, 2017 ජූනි 27න් පසුව රු. මිලියන 100ක් දක්වා සහ රු. මිලියන 100 ට වඩා වැඩි වටිනාකමකින් යුත් ගනුදෙනු පරාසයන් සඳහා අයකරනු ලබන සෙස් බද්ද පිළිවෙලින් 0.072%ක, හා 0.045% ක විය.

මීට අමතරව, ගනුදෙනුකරුවෙකු විසින් එකම තැරැව්කරුවකු හරහා එකම සුරැකුම්පත (හෝ ඊට පටහැනිව) මිලදී ගෙන විකුණන එක්දින දින වෙළෙඳාමේදී සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාවට ගෙවිය යුතු ගනුදෙනු ගාස්තුව 2006 පෙබරවාරි 15 සිට බලපැවැත්වෙන පරිදි ගනුදෙනුවේ එක් පැත්තකින් අය නොකෙරේ.

මිලදී ගත් මුළු කොටස් ප්‍රමාණය විකුණන ලද මුළු කොටස් ප්‍රමාණයට සමාන නොවන්නේ නම්, ඉහත විස්තර කර ඇති පරිදි ගනුදෙනු ගාස්තු මිලදී ගත් හෝ විකුණන ලද අඩු කොටස් ප්‍රමාණයෙන් අය නොකෙරේ. මිලදී ගත් මුළු ප්‍රමාණය විකුණන ලද මුළු ප්‍රමාණයට සමාන වන අවස්ථාවක දී, විකුණුම් ගනුදෙනුවෙන් ගාස්තු අය නොකෙරේ. එසේම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ගනුදෙනු ගාස්තුවෙන් නිදහස් කිරීම තීරණය කිරීම සඳහා එකම සුරැකුම්පත මත ගනුදෙනුකරුවෙකුගේ මුළු මිලදී ගැනීම් සහ විකිණීම් සලකා බලනු ඇත. කෙසේ වෙතත්, ගනුදෙනු වල දෙපැත්තෙන්ම 0.30% ක රජයේ කොටස් ගනුදෙනු බද්ද අය කෙරේ.

## සෙස් අරමුදලේ හැසිරීම

වන්දි අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 වර්ෂයේදී සෙස් අරමුදලින් රුපියල් මිලියන 50ක් එයට බැර කරන ලදී. එමෙන්ම 2009 සහ 2010 වසරවලදී වසරකට රු.මි.50 බැගින් සෙස් අරමුදලින් රුපියල් මිලියන 100ක් පියවීම් සහතික කිරීමේ අරමුදලට පවරන ලදී.

තවද රු.මිලියන 276ක්, රු.මිලියන 380ක්, රු.මිලියන 94ක්, රු.මිලියන 52ක් හා රු. මිලියන 312ක් වශයෙන් අවස්ථා 5 දී පිළිවෙලින් 2010, 2012, 2013, 2019 හා 2020 යන වර්ෂයන්හි දී ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.

2022 දෙසැම්බර් 31 දින වන විට සෙස් අරමුදලට බැර වී ඇති ශේෂය රුපියල් මිලියන 4,674.2/-ක් වන අතර එයින් රු. මිලියන 148.8ක් මාස දොළහක් තුළ කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල ද රු. 3,010.3ක් මාස දොළහකට පසු කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල ද රු. මිලියන 73.7 ක් සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීම් (රිපෝ) ආයෝජනය කර ඇත.

2013 වසරේ සිට 2022 වසර දක්වා සෙස් අරමුදලෙහි වෙනස්වීම පහත රූප සටහන මගින් පෙන්නුම් කෙරේ. (රූප සටහන 13)

රූප සටහන 13: සෙස් අරමුදල




## වන්දි අරමුදල

වර්ෂ 1987 දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීමත් සමගම වන්දි අරමුදල ආරම්භ කරන ලදී. 2021 අංක 19 දරණ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 158 සහ 159 වැනි වගන්තිය යටතේ වන්දි අරමුදලක් පිහිටුවීම හා නඩත්තු කිරීම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි ව්‍යවස්ථාපිත වගකීමකි. ඒ අනුව වන්දි අරමුදල පවත්වාගෙන යාම සඳහා වන අරමුණු සහ මාර්ගෝපදේශ පහත පරිදි වේ.

158. (1) බලපත්‍රලාභී කොටස් තරව්කරුවෙකු හෝ බලපත්‍රලාභී කොටස් වෙළෙන්දෙකු සිය ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට අසමත්වීම හේතුකොටගෙන මුදල් හානියකට භාජනය වන යම් ආයෝජකයකුට වන්දි ප්‍රදානය කිරීම සඳහා මෙම වන්දි අරමුදල පිහිටුවන ලදී.

(2) එම වන්දි අරමුදල සමන්විත වන්නේ;

(අ) වන්දි අරමුදලෙහි කාර්යය සඳහා පර්ලිමේන්තුව විසින් සම්මත කෙරුණු මුදල්.

(ආ) මෙම පනතේ විධිවිධාන යටතේ අරමුදලට බැර කළ හැකි මුදල්; හා

(ඇ) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිදි සෙස් අරමුදලෙන් බැර කළ හැකි මුදල්.

(3) වන්දි අරමුදලෙහි බැරට ඇති මුදල්, කොමිෂන් සභාව තීරණය කරනු ලබන ආකාරයකට කොමිෂන් සභාව විසින් ආයෝජනය කළ හැකිය.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 159 වගන්තියට අනුව, අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරින් තිදෙනෙකු වන්දි කමිටුවේ සාමාජිකයන් ලෙස පත් කළ යුතුය.

පත් කරන ලද කමිටුව යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වන්දි තක්සේරු කිරීම හා ප්‍රදානය කිරීම පිළිබඳ වගකීම දැරිය යුතු අතර එවැනි තක්සේරු කිරීමක් සම්බන්ධයෙන් කමිටුව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය මෙන්ම මෙම පනතේ අරමුණු සඳහා තීරණාත්මක වේ.

වන්දි සඳහා ඉල්ලුම් කිරීමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් පනතේ විධි විධාන සලසා ඇත. පනත අනුව ඉල්ලුම්කරුවෙකු විසින් හිමිකම් පෑමට සභාය වන පරිදි ඉදිරිපත් කරන ලද ලේඛන සහ වෙනත් සාක්ෂි පරීක්ෂා කිරීමෙන් පසු හෝ එවැනි නඩු විභාගයක නිගමනය පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වූ ඕනෑම අවස්ථාවක කමිටුව විසින් වන්දි සඳහා වූ එම ඉල්ලීමට අවසරදීම හෝ නොදීමට ඉඩ ඇත. වන්දි අරමුදල සඳහා හිමිකම් ඉල්ලීමක් මේ දක්වා ලැබී නොමැත.

# මෙහෙයුම් සමාලෝචනය

## වන්දි අරමුදලෙහි හැසිරීම

වන්දි අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 වර්ෂයේදී සෙස් අරමුදලින් රුපියල් මිලියන 50ක් වන්දි අරමුදලට බැර කරන ලදී.

2022 වර්ෂය අවසානය වන විට වන්දි අරමුදලේ ශේෂය රුපියල් මිලියන 625.2 ක් වූ අතර එයින් රු. මිලියන 24.8 ක් මාස දොළහකින් කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල ද මාස 12 කට පසු කල්පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල රුපියල් මිලියන 369.4 ක් ද ආයෝජනය කර ඇති අතර මිලියන 8 ක් සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීම්වල (රිපෝ හි) ආයෝජනය කර ඇත. (රූප සටහන 14)

2013 සිට 2022 දක්වා කාලය තුළ වන්දි අරමුදලේ වෙනස්වීම් පහත දැක්වේ.

රූප සටහන 14: වන්දි අරමුදල




## පියවීම් සහතික කිරීමේ අරමුදල

මෙම පියවීම් සහතික කිරීමේ අරමුදල 1998 මැයි මස 22 ආරම්භ කරන ලදී. මෙම අරමුදල පිහිටුවන ලද්දේ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි සහභාගීකරුවන් අතර ගනුදෙනු පියවීම සහතික කිරීමේ අරමුණ ඇතිවය. මෙම පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි ක්‍රියාකාරීත්වය පහත සඳහන් පරිදි විස්තර කළ හැකිය.

(1) කොටස් ගනුදෙනුවක් වූ සැනින් ප්‍රමාදයකින් තොරව කොටස් අයිතිය මාරු විය යුතුය. 2007 දෙසැම්බර් 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් බේරුම් කිරීම කාල සීමාව ඒකීය තලයකට ගෙන එන ලදී, එනම් ගැනුම්කරු විසින් ඔ+3 පදනම මත එනම් ගනුදෙනුව සිදු කළ දින ද ඇතුළුව එළඹෙන සිව්වන දිනයේදී අදාළ ගෙවීම් සිදු කළ යුතු අතර විකුණුම්කරුට ඔ+3 පදනම මත එනම් ගනුදෙනුව සිදු කළ දින ද ඇතුළුව එළඹෙන සිව්වන දිනයේදී අදාළ ගෙවීම් පියවීම සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් කොටස් අයිතිය පැවරීම සහ සත්‍ය ලෙස මුදල් ලැබීම අතර සාපේක්ෂ වශයෙන් දිගු අතරමැදි කාලයක් පැවතීම හේතුවෙන් සුරක්ෂිත නොවන පියවීම් අවදානමක් ඇතිවන නිසා මෙම අරමුදල පිහිටුවීමේ අවශ්‍යතාව ඇතිවිය.

(2) මෙම අරමුදලේ භාරකරුවන් නිළ බලයෙන් ඊට පත් වන අතර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති, කොළඹ කොටස් හුවමාරුවෙහි සභාපති, මහා භාණ්ඩාගාරයෙහි නියෝජ්‍ය ලේකම්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සහ කොළඹ කොටස් හුවමාරුවෙහි ප්‍රධාන විධායක නිලධාරී යන අය ඊට ඇතුළත් වේ.

(3) ශ්‍රී ලංකා රජය මෙම අරමුදල ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 50ක මුදලක් ප්‍රදානය කර ඇත. මෙම අරමුදල භාර ඔප්පුව ප්‍රකාරව රජයේ සුරැකුම්පත්වල සහ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත. මෙම අරමුදලට ප්‍රතිපූරක වශයෙන් පරිත්‍යාග තෑගී සහ ප්‍රදානයක් ලබාගත හැකි වේ. වර්තමානයේදී කොටස් තැරැව්කරුවන් සහ භාරකාර බැංකු මෙම අරමුදලට දායකවීමෙහි අවශ්‍යතාවක් නොමැත.

(4) කෙසේ වෙතත්, පියවීම් සහතික කිරීමේ අරමුදල, පියවීම් අවදානම ඉවත් කිරීම සඳහා නියමාකාරයෙන් කටයුතු කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් ඊට පිළියමක් ලෙස මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් ස්ථාපනය කිරීම සඳහා පියවර ගෙන තිබේ. පියවීම් සහතික කිරීමේ අරමුදල සඳහා හිමිකම් ඉල්ලීමක් මේ දක්වා ලැබී නොමැත.

## පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි හැසිරීම

අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 සහ 2010 වර්ෂයන්හිදී රුපියල් මිලියන 50 බැගින් වු සමාන ප්‍රමාණ දෙකකින් රු. මිලියන 100 ක් සෙස් අරමුදලෙන් පියවීම් සහතික කිරීමේ අරමුදලට බැර කරන ලදී. පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාර ඔප්පුව වෙනස් කිරීමෙන් අනතුරුව 2012 ජනවාරි මාසයේදී කොළඹ කොටස් හුවමාරුව විසින් ද අරමුදල ශක්තිමත් කිරීම සඳහා රුපියල් මිලියන 100 ක් ලබා දෙන ලදී.

2022 දෙසැම්බර් අවසානය වන විට පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි ශේෂය රුපියල් මිලියන 1162.3 ක් වූ අතර එයින් රු. මිලියන 104.2 ක් මාස දොළහකින් කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය කර ඇති ඇත. මාස දොළහකට පසු කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය කර ඇති මුදල රුපියල් මිලියන 90.6 කි. රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු සඳහා රුපියල් මිලියන 300 ක් ආයෝජනය කර ඇති අතර සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීම්වල ආයෝජනය කර ඇති මුදල රු. මිලියන 9 කි.

2013 සහ 2021 කාලය තුළ පියවීම් සහතික කිරීමේ අරමුදලේ සංචලනය පහත දැක්වෙන ප්‍රස්ථාරයේ දක්වා ඇත. (රූප සටහන 15)

රූප සටහන 15: පියවීම් සහතික කිරීමේ අරමුදල



# අතිරේක තොරතුරු

## වෙළෙඳපොළ අතරමැදි ආයතන

### 2022 දෙසැම්බර් 31 දිනට බලපත්‍රලාභී

ආන්තික ණය සපයන්නන්, ආයෝජන කළමණාකරුවන්, කොටස් ප්‍රාරක්ෂණ ආයතන, ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන, කොටස් තැරැව්කරුවන්, කොටස් වෙළෙන්දන් යන වර්ගීකරණය සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර ලබාදී ඇති සාමූහික ආයෝජන යෝජනා ක්‍රම (CIS) යන වර්ගීකරණය යටතේ බලපත්‍ර ලබා දී ඇති වෙළෙඳපොළ අතරමැදියන් පහත දක්වා ඇත;

### ආන්තික ණය සැපයුම්කරුවන් යන යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

- ඇක්විටි පාර්ට්නර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
- ඇසෙට්ලයින් ෆයිනෑන්ස් ලිමිටඩ්
- බෙන්සෙයි සෙකියුරිටීස් කැපිටල් ප්‍රයිවට් ලිමිටඩ්
- කැපිටල් ට්‍රස්ට් ක්‍රෙඩිට් ප්‍රයිවට් ලැමිටඩ්
- සිටිසන් ඩිවෙලොප්මන්ට් බිස්නස් ෆයිනෑන්ස් පී එල් සී
- කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී එල් සී
- ඩී එෆ් සි සී බැන්ක් පී එල් සී
- ඩයලොග් ෆයිනෑන්ස් පී එල් සී
- හැට්න් නැෂනල් බැන්ක් පී එල් සී
- ජේ බී ක්‍රෙඩිට් පී එල් සී
- එල් ඕ එල් සී ෆිනෑන්ස් පී එල් සී
- මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
- නේෂන් ලංකා කැපිටල් ලිමිටඩ්
- නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී එල් සී
- පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී එල් සී
- පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
- පී එම් එෆ් ෆයිනෑන්ස් පී එල් සී
- ආර් පී සී මාර්ජින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්
- සම්පත් බැන්ක් පී එල් සී
- සෙලාන් බැන්ක් පී එල් සී

### ආයෝජන කළමනාකරුවන් යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

- ඒෂියා සෙකියුරිටීස් වෙල්ත් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
- ඇසෙට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
- ඇසෙට්ලයින් කැපිටල් (පුද්ගලික) සමාගම
- ලංකා බැංකුව
- කැපිටල් එලයින්ස් ඉන්වෙස්මන්ට්ස් ලිමිටඩ්
- කැපිටල් ට්‍රස්ට් වෙල්ත් මැනේජ්මන්ට් සමාගම
- සී බැන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම
- සී ටී සී එල් එස් ඒ ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
- ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම
- ගාර්ඩියන් ඇක්විටි ඇසෙට් මැනේජ්මන්ට් සමාගම
- ගාර්ඩියන් ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම
- ඉනොවෙස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්ගලික) සමාගම
- ජේ බී ෆයිනෑන්ෂල් (පුද්ගලික) සමාගම
- ලීනියර් වෙල්ත් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
- මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
- නැෂනල් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ්
- එන් ඩී බී වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්
- එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්
- ඔරියන් ෆන්ඩ් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
- ප්‍රිමියර් වෙල්ත් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
- සෙන්ෆින් ඇසෙට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
- සොෆ්ට් ලොජික් ඇසෙට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
- වොල්ඩොක් මැකෙන්සි ලිමිටඩ්

### ප්‍රරක්ෂකයන් යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

- ලංකා බැංකුව
- කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී එල් සී
- ඩී එෆ් සී සී බැන්ක් පී එල් සී
- හැටන් නැෂනල් බැන්ක් පී එල් සී
- මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී
- නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් ඔෆ් පී එල් සී
- සම්පත් බැන්ක් පී එල් සී
- සෙලාන් බැන්ක් පී එල් සී

### ණය ප්‍රමාණීකරණ නියෝජිතායතන යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

- ෆිච් රේටිංග්ස්
- ඉක්රා ලංකා ලිමිටඩ්
- ලංකා රේටිං ඒජන්සි ලිමිටඩ්

### කොටස් තැරැව්කරුවන් යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

- ඇක්විටි ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්ගලික) ලිමිටඩ්
- අල්මාස් ඉක්විටීස් (පුද්ගලික) ලිමිටඩ්
- ඇම්බියෝන් සෙකියුරිටීස් (පුද්ගලික) ලිමිටඩ්
- ආශා සෙකියුරිටීස් ලිමිටඩ්
- ඒෂියා කැපිටල් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්ගලික) සමාගමෆ
- ඒෂියා සෙකියුරිටීස් (පුද්ගලික) ලිමිටඩ්
- බාර්ට්ලීට් රෙලිගෙයාර් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
- කැපිටල් එලායන්ස් පී එල් සී (ණය සුරැකුම්පත්)
- කැපිටල් එලායන්ස් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
- කැපිටල් ට්‍රස්ට් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
- සී. ටී. සී. එල්. එස්. ඒ. සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
- එන්ටර්ප්‍රයිස් සිලෝන් කැපිටල් (පුද්ගලික) සමාගම
- ෆස්ට් කැපිටල් ඉක්විටීස් (පුද්ගලික) සමාගම
- ෆස්ට් ගාඩියන් ඉක්විටීස් (පුද්ගලික) සමාගම

# අතිරේක තොරතුරු

- ජේ.බී සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
- ජෝන් කීල්ස් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්ගලික) සමාගම
- ලංකා සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
- බඨබඝ සෙකියුරිටීස් සමාගම
- නේෂන් ලංකා ඉක්විටීස් (පුද්ගලික) සමාගම
- නෑරි සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
- නෙස්ටර් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්ගලික) සමාගම
- NSB අරමුදල් කළමනාකරණ සමාගම (ණය සුරැකුම්පත්)
- රිච්ඩ් පීරිස් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
- SC සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
- සෙන්ෆින් සෙකියුරිටීස් ලිමිටඩ්
- සොෆ්ට්ලොජික් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්) සමාගම
- සමර්විල් කොටස් තැරැව්කාර (පුද්ගලික) සමාගම
- වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් (ණය සුරැකුම්පත්)

### කොටස් වෙළෙඳුන් යන වර්ගීකරණය යටතේ ඇති බලපත්‍රලාභී වෙළෙඳපොළ අතරමැදි ආයතන

- ඒෂියා සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
- බාර්ට්ලීට් රෙලිගෙයාර් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම (ණය සුරැකුම්පත්)
- කැපිටල් එලායන්ස් පී එල් සී (ණය සුරැකුම්පත්)
මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘතියෙහි II වන සංරචකය යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ප්‍රධාන මූල පිරීම් කිහිපයක් සඳහාම අවශ්‍ය තාක්ෂණික සහ ආයෝජන අරමුදල් සහය සහතික කර ඇත.2022 දෙසැම්බර් 31 දිනට ඇමරිකානු ඩොලර් 367,000 ක මුදලක් ලෝක බැංකුව විසින් මුදල් අමාත්‍යාංශය වෙත ආයෝජන පාදක මූල්‍ය සංරචක යටතේ ලබා දී ඇති අතර එයින් 2022 දෙසැම්බර් 31 දින වන විට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඇමරිකානු ඩොලර් 107,650 ක මුදලක් ශ්‍රී ලංකා රුපියල් වලින් දේශීය සැපයුම්කරුවන් වෙත ගෙවීම් කිරීම සඳහා ද, ඇමරිකානු ඩොලර් 197,303 ක මුදලක් විදේශීය සැපයුම්කරුවන් වෙත කරන ඍජු ගෙවීම් සඳහා ද, ඉවත් කරගෙන ඇත. ව්‍යාපෘති සමාප්ත දින වන 2022.12.31 දින තෙක්, II වන සංරචකය යටතේ ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඇමරිකානු ඩොලර් 152,302ක මුදලක් ඉල්ලා ඇත.

## 19 මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘති ආදායම

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘති - විසර්ජන සම්බන්ධිත දර්ශක අරමුදල් | 171,674,294 | 104,804,128 |
| මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘති - විසර්ජන සම්බන්ධිත දර්ශක නොවන අරමුදල් | 578,445 | - |
| එකතුව | 172,252,739 | 104,804,128 |

## 20 කාර්ය මණ්ඩල පිරිවැය

| | Note | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| කාර්ය මණ්ඩල වැටුප් | | 160,983,569 | 148,721,963 |
| සභාපතිවරයාගේ දීමනා | | 1,200,000 | 1,200,000 |
| ප්‍රතිපූර්ණ පිරිවැය - නීතිපති දෙපාර්තමේන්තුව | | 6,319,668 | 6,245,252 |
| කොමිෂන් සභා සාමාජික රැස්වීම් ගාස්තු | | 1,440,000 | 750,000 |
| උපදේශක දීමනා | | 3,000,000 | 250,000 |
| කාර්යමණ්ඩල සුභසාධන වියදම් සහ අනෙකුත් කාර්‍යමණ්ඩල සම්බන්ධ වියදම් | | 37,965,470 | 30,933,949 |
| සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල | | 24,445,433 | 22,657,813 |
| කාර්යමණ්ඩල පාරිතෝෂිත | 15 | 19,639,457 | 9,591,504 |
| කාර්යමණ්ඩල වෛද්‍ය වියදම් හා රක්ෂණ | | 16,113,522 | 15,350,619 |
| කාර්යමණ්ඩල නිවාස ණය පොලී සහනාධාර | | 1,914,419 | 2,266,022 |
| කාර්යමණ්ඩල වාහන දීමනා | | 25,881,000 | 26,662,653 |
| විදෙස් ගමන් වියදම් හා පුහුණුවීම් වියදම් | | 7,081,485 | - |
| කාර්යමණ්ඩල පුහුණු වීම් වියදම් - දේශීය | | 1,371,374 | 705,210 |
| සාමාජිකත්ව දායක වියදම් | | 1,769,646 | 1,413,666 |
| අධ්‍යයන සඳහා අනුග්‍රාහකත්වයන් * | | 222,784 | 503,063 |
| බඳවා ගැනීම් සඳහා දැන්වීම් ගාස්තු | | 667,864 | 838,399 |
| ආයතනික පුහුණුව ලබන්නන් සඳහා දීමනා | | 2,420,417 | 2,079,583 |
| එකතුව | | 312,436,108 | 270,169,695 |

* ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ස්ථිර සේවකයන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා රු. 250,000/- ක උපරිමයකට යටත් වූ මුදලක් වසර තුනකට වරක් ආයතනයේ විධිවිධාන වලට යටත්ව ලබාදෙන අතර, එසේ ලබාගත් සේවකයින් අදාළ පාඨමාලාව සහ විභාග සාර්ථකව සම්පූර්ණ කල පසු අවුරුදු 2ක කාලයක් ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සේවය කිරීමට බැඳී සිටී. වෙනයම් හේතුවක් හෝ ඉල්ලා අස්වීම හේතුවෙන් පාඨමාලාව සම්පූර්ණ කිරීමට නොහැකි වූ සේවකයින් ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් දරන ලද සම්පූර්ණ මුදල ආපසු ගෙවිය යුතු වේ. තවද පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළද, එකඟ වූ සම්පූර්ණ කාලය ආයතනයට සේවය කිරීමට අසමත් වූ සේවකයින් සම්පූර්ණ කල යුතු ඉතිරි සේවා කාලය සඳහා ගෙවිය යුතු මුදල සමානුපාතිකව ගණනය කර ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ආපසු ගෙවිය යුතු වේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 21 පරිපාලන හා ආයතනික වියදම්

| | සටහන | 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| කුලී හා රථවාහන ගාල් කුලී | | 110,895,458 | 101,143,670 |
| විදුලි ගාස්තු | | 4,833,476 | 4,027,541 |
| කාර්යාල නඩත්තු | | 512,160 | 154,900 |
| කාර්යාල උපකරණ නඩත්තු හා රක්ෂණ | | 2,134,086 | 1,900,000 |
| මෘදුකාංග අලුත් කිරීමේ සහ නඩත්තු වියදම් | | 10,741,282 | 5,996,974 |
| දුරකථන, අන්තර්ජාල, ඊ-මේල් සහ වෙබ් | | 8,868,781 | 8,456,359 |
| මෝටර් වාහන ඉන්ධන, නඩත්තු, බලපත්‍ර හා රක්ෂණ | | 4,658,580 | 4,699,751 |
| වෘත්තීමය ගාස්තු | | 942,031 | 3,202,982 |
| රැස්වීම් ගාස්තු | | 1,701,589 | 953,363 |
| පුවත්පත්, වාරප්‍රකාශන හා පුස්තකාල පොත් | | 589,802 | 333,276 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | | 6,866,091 | 4,314,634 |
| දේශීය ගමන් වියදම් | | 1,380,062 | 7,030,161 |
| රක්ෂණ - සියලු අවදානම්, පොදු වගකීම්, මාර්ගස්ථ මුදල් සහ ගිනි | | 260,770 | 254,726 |
| තැපැල්, මුද්දර ගාස්තු හා කුරියර් ගාස්තු | | 1,110,706 | 1,280,225 |
| නීති ගාස්තු | | 2,646,930 | 2,803,360 |
| විගණන ගාස්තු - අභ්‍යන්තර | | 1,424,100 | 1,762,980 |
| විගණන ගාස්තු - බාහිර | | 284,000 | 344,000 |
| පොදු වියදම් | | 4,212 | 999,101 |
| වෛද්‍ය බදු | | 5,000 | 5,000 |
| සංග්‍රහ වියදම් | | 15,580 | - |
| ක්ෂය වීම්/ක්‍රම ක්ෂය - මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘති | | 578,444 | - |
| ක්ෂය වීම් | 7 | 19,350,111 | 21,735,241 |
| එකතුව | | 179,803,251 | 171,398,244 |

## 22 ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන, බාහිර සම්බන්ධතා, ප්‍රාග්ධන වෙළඳපොල අධ්‍යාපන, ආවේක්ෂණ සහ විමර්ශන කටයුතු වියදම්

| | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| ප්‍රාග්ධන වෙළඳපල සහ නිෂ්පාදිත සංවර්ධන - BBO, Road Shows | 19,050,659 | 14,862,714 |
| මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් | 10,278,137 | 24,840,257 |
| අධ්‍යාපන වැඩසටහන් | 1,678,495 | 1,802,431 |
| අන්තර්ජාතික සාමාජික ගාස්තු - IOSCO | 7,334,807 | 4,210,388 |
| ප්‍රචාරණ හා දැන්වීම් ගාස්තු | 147,015 | 146,664 |
| වෙළඳපොල ආවේක්ෂණ පිරිවැය | 11,820,060 | 9,349,152 |
| විමර්ශන හා පරීක්ෂණ වියදම් | 18,890 | 30,329 |
| එකතුව | 50,328,063 | 55,241,934 |

## 23 මූල්‍ය වියදම්

| | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| බැංකු ගාස්තු | 120,430 | 103,030 |
| එකතුව | 120,430 | 103,030 |

## 24 තත්‍ය ආදායම හා වියදම අයවැය ලේඛනය සමග සැසඳීම

| | තත්‍ය 2022 රු. | අයවැය 2022 රු. | විචලනය රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| බලපත්‍ර ගාස්තු | 3,449,164 | 3,395,000 | 54,164 |
| පරිපාලන බදු | 6,152,213 | 7,028,383 | (876,170) |
| අධ්‍යාපන වැඩසටහන් | 8,671,966 | 7,665,000 | 1,006,966 |
| පොලී ආදායම් | 717,743 | - | 717,743 |
| අනෙකුත් ආදායම් | 110,261 | - | 110,261 |
| කාර්යමණ්ඩල ණය පොලී ආදායම් | 719,194 | 820,000 | (100,806) |
| මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘති ආදායම් | 172,252,739 | 203,000,000 | (30,747,261) |
| ප්‍රදානයන් හඳුනාගැනීම් | 19,350,111 | - | 19,350,111 |
| **ශ්‍රී.සු.වි.කො.ස. මගින් උපයාගත් මුළු ආදායම** | 211,423,391 | 221,908,383 | (10,484,993) |
| **අඩු කළා: වියදම්** | | | |
| කාර්යමණ්ඩල පිරිවැය | (312,436,108) | (412,344,695) | 99,908,588 |
| පරිපාලන හා ආයතනික පිරිවැය | (179,803,251) | (180,341,792) | 538,541 |
| ප්‍රාග්ධන වෙළෙඳපොල සංවර්ධන පිරිවැය | (50,328,063) | (116,588,202) | 66,260,139 |
| මූල්‍ය ගාස්තු | (120,430) | (97,933) | (22,497) |
| **මුළු අයබාර වියදම** | (542,687,852) | (709,372,623) | 166,684,771 |
| අඩු කළා: ආදායම් බදු වියදම | - | - | - |
| **ආදායමට වැඩි අයබාර වියදම** | (331,264,461) | (487,464,240) | 156,199,778 |

## 24. ප්‍රාග්ධන බැඳීම්

2022 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නැත.

## 25. අසම්භාව්‍ය වගකීම්

2022 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

## 26. මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම්

එවකට සභාපති වූ ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා 2023 ජනවාරි 05 වන දින ධුර කාලය අවසන් කිරීමෙන් පසු, කොමිෂන් සභාව පහත පරිදි ප්‍රතිසංස්ථාපනය කරන ලදී.

- ෆයිසාල් සාලි මහතා - සභාපති - පත් කල සාමාජික 2023 පෙබරවාරි 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි
- සංජය බණ්ඩාර මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික
- ආර්.එම්.පී. රත්නායක මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික
- සංජීව දිසානායක මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික
- මනිල් ජයසිංහ මහතා - පත් කල සාමාජික
- සුජීව මුදලිගේ මහතා - පත් කල සාමාජික
- රජීව් අමරසූරිය මහතා - පත් කල සාමාජික
- ඇන්ටන් ගොඩ්ෆ්‍රි මහතා - පත් කල සාමාජික
- ඇන්තනී ශනිල් ප්‍රනාන්දු මහතා - පත් කල සාමාජික

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 27. සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

පහත සඳහන් කොමිෂන් සභා සාමාජිකයින් 2022 වර්ෂය තුළදී පහත පරිදි ධුරයන් හොබවන ලදී.

- ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා - සභාපති - පත් කල සාමාජික - 2023 ජනවාරි 05 වන දින ධුර කාලය අවසන් කරන ලදී.
- ආර්.එම්.පී. රත්නායක මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධුරය දැරීම හේතුවෙන් 2020 ජනවාරි 16 වන දින නිල බලයෙන් පත්වූ සාමාජික.
- සංජීව දිසානායක මහතා - සමාගම් රෙජිස්ට්‍රාර් ධුරය හෙබවීම හේතුවෙන් 2021 ජූලි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික
- මනිල් ජයසිංහ මහතා - පත් කල සාමාජික
- සුහද ගම්ලත් මහතා - පත් කල සාමාජික
- සිසිර රත්නායක මහතා - පත් කල සාමාජික
- සුනිල් ලංකාතිලක මහතා - පත් කල සාමාජික
- සංජය බණ්ඩාර මහතා - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපති ධුරය හෙබවීම හේතුවෙන්, 2022 ජනවාරි 10 වන දින නිල බලයෙන් පත් වූ සාමාජික.
- ඉවට් ප්‍රනාන්දු මිය - ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන්, 2022 ඔක්තෝම්බර් 11 වන දින නිල බලයෙන් පත් වූ සාමාජික

වර්ෂය තුළදී පහත සඳහන් නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධුරකාලය අවසන් වන ලදී.

- එන්.ඩබ්.ජී.ආර්.ඩී. නානායක්කාර මහතා - ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන් නිල බලයෙන් පත් වූ අතර 2022 අප්‍රේල් 29 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී.

සමාලෝචිත වර්ෂයේ ධුරයන් දැරූ කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වසර තුළදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු | නැත |
| මනිල් ජයසිංහ මහතා | අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් | කළමනාකරණ හවුල්කරු - ශ්‍රී ලංකාව සහ මාලදිවයින | නැත |
| | අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් කන්සල්ටින්ග් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් ස්ට්‍රටජි ට්‍රාන්ස්ඇක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් ජීඩීඑස් (CS) ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | ලංකා ටුවර්ස් ඇන්ඩ් ට්‍රෙඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | එන් එම් ජේ ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| ආර්.එම්.පී. රත්නායක මහතා | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් | නැත |
| | ලංකා බැංකුව | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් | 2022 පෙබරවාරි 03 වන දින සිට වැඩ බලන සභාපති | නැත |
| | දේශීය ණය සහ සංවර්ධන අරමුදල | 2022 පෙබරවාරි 28 වන දින දක්වා සභාපති සහ කොමිෂන් සභා සාමාජික | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | 2022 මාර්තු 02 වන දින දක්වා නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු | නැත |
| සංජීව දිසානායක මහතා | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය - ගිණුම්කරණ ප්‍රමිත කමිටුව | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| සංජය බණ්ඩාර මහතා | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | සභාපත | නැත |
| | ප්‍රයිම් ලෑන්ඩ් රෙසිඩන්සීස් පී.එල්.සී. | ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක | නැත |
| | අබාන්ස් ෆයිනෑන්ස් පී.එල්.සී. | 2022 සැප්තැම්බර් 09 වන දින සිට බලපැවැත්වෙන පරිදි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක | නැත |
| | සී.එල්. සිනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ් | ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක | නැත |
| | නෙක්සියා මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | 1 |
| | නෙක්සියා බී.පී.ඕ. (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | 1 |
| සුනිල් ලංකාතිලක මහතා | මුදල් අමාත්‍යාංශය | විදේශ විනිමය පනතෙහි පරීක්ෂණ මණ්ඩල සාමාජික | නැත |
| | එල්.ඕ.එල්.සී. ඩිවෙලොප්මන්ට් ෆයිනෑන්ස් පී.එල්.සී. | ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක | නැත |
| ජනාධිපති නීතිඥ සුහද ගම්ලත් මහතා | නැත | නැත | නැත |
| සිසිර රත්නායක මහතා | නැත | නැත | නැත |
| ඉවට් ප්‍රනාන්දු මිය | ශ්‍රී ලංකා මහ බැංකුව | නියෝජ්‍ය අධිපති | නැත |
| | ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) | සභාපතිනි | නැත |
| | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය | සභාපතිනි | නැත |
| | අපි වෙනුවෙන් අපි අරමුදල | 2022 මැයි 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි කළමනාකරණ මණ්ඩල සාමාජික | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | කොමිෂන් සභා සාමාජික | නැත |

වර්ෂය තුළදී පහත සඳහන් නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධුරකාලය අවසන් වන ලදී.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| එන්.ඩබ්.ජී.ආර්.ඩී. නානායක්කාර මහතා | ශ්‍රී ලංකා මහ බැංකුව | 2022 අප්‍රේල් 29 වන දින තෙක් නියෝජ්‍ය අධිපති | නැත |

වෙළඳපොළ මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශ්වයන් අතර වර්ෂය තුළදී වෙනත් කිසිඳු ගනුදෙනුවක් සිදු නොවීය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ලංකා බැංකුවේ හි පහත සඳහන් ජංගම ගිනුම් පවත්වාගෙන යන අතර ඒ එක් එක්හි බැංකු ශේෂයන් පහත දක්වා ඇත.

| ජංගම ගිණුමේ නම | ගිණුම් අංකය | 2022.12.31 දිනට ශේෂය (රු.) | 2021.12.31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව | 0000001694 | 63,384,501 | 23,794,693 |
| | 0009919753 | 1,488,143 | 10,146,896 |
| | 83810081 | 17,255,538 | 56,134 |

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 2022 වර්ෂය තුළදී පහත සඳහන් ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදු කරන ලදී.

| ආයෝජන වර්ගය | වර්ෂය තුළදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.) | 2022 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ශේෂය (රු.) |
|---|---|---|
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 139,000,000 | - |
| එකතුව | 139,000,000 | - |

මීට අමතරව, කොමිෂන් සභා සාමාජිකයින් විසින් පාලක මණ්ඩලයෙහි සාමාජිකත්වය දරණ ආයතන සමග සලකා බලන වර්ෂය තුල සිදු වූ ගනුදෙනු පහත සඳහන් වගුවේ සඳහන් කර ඇත.

| ආදායකයාගේ නම | ගෙවීම පිළිබඳ විස්තරය | ගෙවූ අගය (රු.) |
|---|---|---|
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | සාමාජිකත්වය අලුත් කිරීම්, වාර්ෂික ජාතික සමුළුව, පුහුණු වැඩසටහන් | 271,600/- |
| අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් | උපදේශන සේවා | 2,021,440/- |
| අධ්‍යක්ෂ, බැංකු විද්‍යා පියස | පුහුණු වැඩසටහන් | 376,000/- |

සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } BAN/G/CESS/FA/22/3 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 26

සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (1) වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදලේ (''අරමුදල") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශනය, සෙස් අරමුදලේ වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනත් ප්‍රකාරව මාගේ අධීක්ෂණය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට, එහි මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිලිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්ති ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිලිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි වල තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එවැනි අවප්‍රකාශනයන් ප්‍රමාණාත්මක ලෙස සලකනු ලබනුයේ මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කරන විටදීය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් වෘත්තීමය විනිශ්චය ක්‍රියාත්මක කල අතර වෘත්තීමය සැකමුසුබව විගණනය පුරාවට පවත්වා ගන්නා ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මුල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීමත්, ඒවා තක්සේරු කිරීමත්, එවැනි වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි අවදානම් සඳහා ප්‍රතිචාරාත්මක විගණන පටිපාටි සැලසුම් කිරීම සහ සිදු කිරීමත්, මාගේ මතයට පදනම් වන ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමත් මෙහිදී සිදු කරනු ලැබේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මග හැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම, වංචාවක් ඇතිවීමට සම්බන්ධ වන බැවින්, වංචාවක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් ඇති විය හැකි අවදානම, වැරද්දක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් වන අවදානමට වඩා ප්‍රබල වේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිලිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය අගයනු ලැබේ.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මුල්‍ය ප්‍රකාශන වල ඒ සබන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මුල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මුල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| 2022 දෙසැම්බර් 31 දිනට | සටහන | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 3,010,320,650 | 3,159,199,611 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 148,878,960 | 355,702,976 |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන | | 1,453,364,761 | - |
| ලැබිය යුතු පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර | | 24,559,621 | 76,520,029 |
| ලැබිය යුතු පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | | 115,829,935 | - |
| ලැබිය යුතු පොලී ආදායම - ප්‍රතිමිලදී ගැනුම් | | 67,307 | 146,132 |
| ලැබියයුතු සෙස් මුදල් | | 6,055,532 | 27,289,951 |
| මුදල් හා මුදල් සමාන දෑ | 7 | 75,145,466 | 459,076,390 |
| **මුළු වත්කම්** | | 4,834,222,233 | 4,077,935,087 |
| | | | |
| **අරමුදල් සහ වගකීම්** | | | |
| **යොදවා ඇති අරමුදල් සහ සංචිත** | | | |
| සමුච්චිත අරමුදල | | 4,674,258,276 | 3,884,378,325 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ - සු.වි.කො.ස. | | 159,723,957 | 193,356,762 |
| විගණන ගාස්තු | | 240,000 | 200,000 |
| **මුළු අරමුදල් සහ වගකීම්** | | 4,834,222,233 | 4,077,935,087 |

99 සිට 104 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිලිබඳ වගකීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල වෙනුවෙන්;

නිරෝෂා කොඩිකාර
අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන

චින්තක මෙන්ඩිස්
අධ්‍යක්ෂ ජෙනරාල්

ෆයිසාල් සාලි
සභාපති

කොළඹදී
2023 මැයි 10 දිය

**සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| වර්ෂය තුල ලද සෙස් මුදල් | | 916,667,624 | 1,554,518,067 |
| පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර | | 323,891,505 | 144,908,971 |
| පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | | 148,575,637 | - |
| පොලී ආදායම - භාණ්ඩාගාර ප්‍රතිමිලදී ගැනුම් | | 22,753,914 | 91,940,659 |
| **මුළු ආදායම** | | 1,411,888,680 | 1,791,367,697 |
| **වියදම** | | | |
| මෙහෙයුම් සහ ප්‍රාග්ධන වියදම් සඳහා ශ්‍රී.සු.වි.කො.ස.ට මාරු කල අරමුදල | | (332,084,732) | (363,832,098) |
| විගණන ගාස්තු | | (268,000) | (398,000) |
| බැංකු ගාස්තු | | (138,800) | (18,442) |
| **මුළු වියදම** | | (332,491,532) | (364,248,540) |
| ආදායම් බදු වියදම | 8 | (289,517,197) | (343,056,625) |
| **වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම** | | 789,879,951 | 1,084,062,532 |

99 සිට 104 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# සෙස් අරමුදලේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| **සමුච්චිත අරමුදල** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 3,884,378,325 | 2,800,315,793 |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | 789,879,951 | 1,084,062,532 |
| ඒකාබද්ධ අරමුදලට මාරු කල අරමුදල් | - | - |
| **වර්ෂය අවසානයේ ශේෂය** | 4,674,258,276 | 3,884,378,325 |

99 සිට 104 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

**සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | 789,879,951 | 1,084,062,532 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 789,879,951 | 1,084,062,532 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම** | | |
| ලැබිය යුතු සෙස් අරමුදල් (වැඩි වීම)/අඩු වීම | 21,234,418 | (16,023,104) |
| ශ්‍රී.සු.වි.කො.ස.න් ලැබිය යුතු දෑ (වැඩි වීම)/අඩු වීම | | 130,331,961 |
| භාණ්ඩාගාර බැඳුම්කරවලින් ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම | 51,960,407 | (29,725,892) |
| භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම | (115,829,935) | - |
| ප්‍රතිමිලදීගැනුම් මත ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම | 78,824 | 37,467 |
| ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | (33,592,804) | 193,556,762 |
| | (76,149,090) | 278,177,195 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් | 713,730,861 | 1,362,239,726 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලෙහි ආයෝජන | - | - |
| ඒකාබද්ධ අරමුදලට මාරු කල අරමුදල් | - | - |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | 355,702,976 | (2,340,843,389) |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන | (1,453,364,761) | |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | (1,097,661,785) | (2,340,843,389) |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | (383,930,924) | (978,603,662) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන (අ)) | 459,076,390 | 1,437,680,052 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන (ආ))** | 75,145,466 | 459,076,390 |
| **සටහන (අ)** | | |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 452,265,729 | 1,425,824,301 |
| බැංකුවේ ඇති මුදල් | 6,810,660 | 11,855,751 |
| | 459,076,390 | 1,437,680,052 |
| **සටහන (ආ)** | | |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 73,757,104 | 452,265,729 |
| බැංකුවේ ඇති මුදල් | 1,388,362 | 6,810,660 |
| | 75,145,466 | 459,076,390 |

99 සිට 104 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 1.1 වාර්තා කිරීමේ ඒකකය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල, 1991 අංක 26, 2003 අංක 18 සහ 2009 අංක 47 යන පනත් මගින් සංශෝධිත, 2021 සැප්තැම්බර් 21 වන දින සිට බලාත්මක, 2021 අංක 19 දරණ නව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 156 (1) වගන්තියෙන් අවලංගු හා ආදේශ වූ 1987 අංක 36 දරණ, පැරණි ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 14B (1) වගන්ති ප්‍රකාරව ස්ථාපිත කර ඇත.

2021 අංක 19 දරණ නව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 156 (1) වගන්ති ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් පරිපාලනය කරනු ලබන "සෙස් බදු අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටවනු ලැබිය යුතු අතර, 155 වන වගන්තිය යටතේ පනවන ලද සෙස් බද්දෙන් ලැබෙන මුදල් එම අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

සෙස් අරමුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුල ස්ථාපිත කර ඇති අතර, කොළඹ 01, ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ එච්ලන් චතුරශ්‍රයේ, නැගෙනහිර කුළුණෙහි 28 හා 29 වන මහලයන්හි පිහිටා ඇත.

### 1.2 මෙහෙයුම් වල ස්වභාවය සහ ප්‍රධාන කාර්යන්

2021 අංක 19 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 156 (2) වන වගන්තියට අනුකූලව සෙස් බදු අරමුදලේ බැරට ඇති මුදල් පහත දැක්වෙන කාර්ය සඳහා පමණක් භාවිතා කරනු ලැබිය යුතුය:

(අ) සුරැකුම්පත් වෙළඳපොල දියුණු කිරීම;

(ආ) වන්දි අරමුදලේ හෝ මෙම කොටස යටතේ පිහිටුවනු ලබන කොමිෂන් සභාවේ අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම;

(ඇ) එහි කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී කොමිෂන් සභාව කළමනාකරණය, පරිපාලනය සහ මෙහෙයවීම සඳහා කොමිෂන් සභාව විසින් දරනු ලබන සියලු වියදම් පියවා ගැනීම;

(ඈ) කොමිෂන් සභාව විසින් සුදුසු යයි සලකනු ලබන පරිදි කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට නිවාස, අධ්‍යාපනික, සෞඛ්‍ය සහ ප්‍රවාහන යන කාර්ය සඳහා ණය ලබා දීම;

(ඉ) අධ්‍යක්ෂ ජෙනරාල්වරයාගේ සහ එහි නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සහ නාමිකයන්ගේ ප්‍රතිලාභය සඳහා පිහිටුවනු ලබන විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් සහ අනෙකුත් යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම; සහ

(ඊ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි යෝග්‍යතාවය පෙන්නුම් කර ඇති කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවකයින් විසින් ශ්‍රී ලංකාව තුලදී හෝ විදේශීය රටකදී නිරත වනු ලබන අධ්‍යයනයන්ට අදාළ වියදම් පියවීම.

තවදුරටත්, නව පනතෙහි 156 (3) වගන්ති ප්‍රකාරව, සෙස් බදු අරමුදල දියුණු කිරීමේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින්, සෙස් බදු අරමුදලේ බැරට ඇති යම් අතිරික්ත මුදලක් කොමිෂන් සභාව විසින් ආයෝජනය කරනු ලැබිය හැකිය.

### 1.3 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකසා තිබේ. මෙම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, සෙස් අරමුදල වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත වේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

### 1.5 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සැලකියයුතු අනාගත කාලයක් සඳහා සෙස් අරමුදල පවත්වාගෙන යාමට ඇති හැකියාව කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තක්සේරු කර ඇත. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් සෙස් අරමුදල මෙහෙයුම් කටයුතු ඇවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව සෙස් අරමුදල එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම නොකඩවා උපයෝගී කරගන්නා ලද අතර කාල පරිච්ඡේදය පුරාවටම ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතතාවයකින් යුතුව යොදාගනු ලැබ ඇත.

### 1.6 පිළියෙළ කිරීමේ පදනම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ පෙර පැවති පනත්ප්‍රකාරව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ විගණන කමිටුවේ නිර්දේශයක් පරිදි 2020 ජනවාරි 01 වන දින සිට, සෙස් අරමුදල සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට තීරණය කරන ලදී. එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, සෙස් අරමුදල වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත වේ.

සෙස් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත. උචිත අවස්ථා වලදී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුයාත සටහන් වල හෙළිදරව් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කර ඇති අතර ගිණුම්කරණ ප්‍රතිපත්තීන් කාල පරිච්ඡේදය පුරාවටම සංගතතාවයකින් යුතුව යොද ගන්නා ලදී.

### 1.7 ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන පිළයෙල කිරීමේදී එහි වාර්තාගත ආදායම්, වියදම්, වත්කම්, වගකීම් සහ අනුගාමී හෙළිදරව් කිරීම් වලට සහ අසම්භාව්‍ය වගකීම් වල හෙලිදරව්කිරීම් වලටත් බලපාන ලෙස විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන භාවිතා කිරීමට

**සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

කළමනාකරණයට සිදු වේ. මෙලෙස භාවිතා කරන උපකල්පන සහ ඇස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවයෙහි ප්‍රතිඵලයක් ලෙස අනාගත කාලයට බලපැවැත්වෙන ලෙස අදාළ වත්කම් හා වගකීම් වල ධාරණ අගයන් හි ප්‍රමාණාත්මක ගැලපීම් ඇති විය හැක. ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කිරීම සිදුවේ. ඇස්තමේන්තු වලට අදාළ සංශෝධනයන් ඉදිරිකාලීනව හඳුනා ගනු ලැබේ.

## 1.8 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන වාර්තා කරනු ලබන්නේ සෙස් අරමුදලේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සලකා බලන වර්ෂය තුළදී ආයතනයේ වාර්තා කරන හා ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි කිසිදු වෙනසක් සිදු වී නැත. විදේශ මුදල් හුවමාරු ගනුදෙනු ඇත්නම් ඒවා ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබන්නේ, අදාල ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ පවතින විදේශ විනිමය හුවමාරු අනුපාතයට අනුවය.

## 1.9 ප්‍රමානාත්මකභාවය හා සමාහාරය

එක් එක් කාණ්ඩයන්ට අයත් ප්‍රමාණාත්මක හා සමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ. ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර, ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

## 1.10 හිලව් කිරීම

වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු කරනු ලබන්නේ, ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් අවශ්‍ය කර හෝ අවසර දී ඇති විටදී හෝ හිලව් කිරීම මගින් පරිශීලකයන් හට අවබෝධ කර ගැනීමට අපහසු වූ ගනුදෙනුවක්, යම්කිසි සිද්ධියක්, තත්වයක් පිලිබඳ හරය පිළිබිඹු වේ නම් හෝ ශ්‍රී.ල.සු.වි.කො.ස. හි අනාගත මුදල් ප්‍රවාහයන් තක්සේරු කිරීමට පිරිවහල් වේනම් හෝ පමණි.

## 1.11 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ වාර්තා කිරීමේ යම් වෙනස් කමක් සිදු වී ඇති නම් ඒ හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වෙනස් කොට ඇත.

## 1.12 වාර්තාකරණ දිනට පසු සිදුවීම්.

සියලුම ප්‍රමාණාත්මක වාර්තාකරණ දිනට පසුව සිදුවීම් සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි අදාල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර ඇත.

## 1.13 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සංගත වේ.

## 2 වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

### 2.1 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු වල හා කෙටි කාලීන ආයෝජන වලත්, රජයේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වලත් ආයෝජන සිදු කර ඇත. මෙම ආයෝජන පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොලිය උපචිත පදනමින් සටහන් කර ඇත.

### 2.2 ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ සටහන් කර ඇත.

## 3 වගකීම් හා ප්‍රතිපාදන

### 3.1 වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනුයේ, වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් තුල හෝ ඉල්ලූ විට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට පසු ගෙවිය යුතු වගකීම් වේ. මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සියලුම හඳුනාගත් වගකීම් පිරිවැය යටතේ ගිණුම්ගත කර ඇත.

## 4 මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය

### 4.1 පොලී ආදායම

ආයෝජන වල පොලී අදායම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 4.2 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

## 5 වියදම් හඳුනා ගැනීම

සෙස් අරමුදල පවත්වාගෙන යාමෙහිලා දරනු ලබන සියලුම වියදම් උපචිත පදනම මත හඳුනා ගන්න අතර එම වියදම් මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

## 6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමාන දේ, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ මාස තුනට අඩු කාලයකින් කල් පිරෙන ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජනවලින් සමන්විත වේ.

## 7 මුදල් හා මුදල් සමාන දේ

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජන | 73,757,104 | 452,265,730 |
| බැංකුවේ ඇති මුදල් | 1,388,362 | 6,810,660 |
| එකතුව | 75,145,466 | 459,076,390 |

## 8 ආදායම් බදු වියදම්

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| තක්සේරු වර්ෂ 2020/2021 සඳහා ආදායම් බදු වියදම | - | (2,905,438) |
| තක්සේරු වර්ෂ 2021/2022 සඳහා ආදායම් බදු වියදම | (495,581) | 345,962,063 |
| තක්සේරු වර්ෂ 2022/2023 සඳහා ආදායම් බදු වියදම | 290,012,778 | - |
| එකතුව | 289,517,197 | 343,056,625 |

2017 අංක 24 දරන සංශෝධිත දේශීය ආදායම් බදු පනත් ප්‍රකාරව ආදායම් බදු වගකීම් ගණනය කර ඇත.

## 9 ප්‍රාග්ධන බැඳීම්

2022 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොවීය.

## 10 අසම්භාව්‍ය වගකීම්

2022 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

## 11 මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම්

එවකට සභාපති වූ ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා 2023 ජනවාරි 05 වන දින ධුර කාලය අවසන් කිරීමෙන් පසු, කොමිෂන් සභාව පහත පරිදි ප්‍රතිසංස්ථාපනය කරන ලදී.

- ෆයිසාල් සාලි මහතා - සභාපති - පත් කල සාමාජික 2023 පෙබරවාරි 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි
- සංජය බණ්ඩාර මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික
- ආර්.එම්.පී. රත්නායක මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික
- සංජීව දිසානායක මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික
- මනිල් ජයසිංහ මහතා - පත් කල සාමාජික
- සුජීව මුදලිගේ මහතා - පත් කල සාමාජික
- රජීව් අමරසූරිය මහතා - පත් කල සාමාජික
- ඇන්ටන් ගොඩ්ෆ්‍රි මහතා - පත් කල සාමාජික
- ඇන්තනි ශනිල් ප්‍රනාන්දු මහතා - පත් කල සාමාජික

**සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 12 සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

සෙස් අරමුදල කළමනාකරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජිකයින් විසිනි.

- ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා - සභාපති - පත් කළ සාමාජික - 2023 ජනවාරි 05 වන දින ධුර කාලය අවසන් කරන ලදී.
- ආර්.එම්.පී. රත්නායක මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේඛම් ධුරය දැරීම හේතුවෙන් 2020 ජනවාරි 16 වන දින සිට නිල බලයෙන් පත්වූ සාමාජික.
- සංජීව දිසානායක මහතා - සමාගම් රෙජිස්ට්‍රාර් ධුරය හෙබවීම හේතුවෙන් 2021 ජුලි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික
- මනිල් ජයසිංහ මහතා - පත් කළ සාමාජික
- සුහද ගම්ලත් මහතා - පත් කළ සාමාජික
- සිසිර රත්නායක මහතා - පත් කළ සාමාජික
- සුනිල් ලංකාතිලක මහතා - පත් කළ සාමාජික
- සංජය බණ්ඩාර මහතා - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපති ධුරය හෙබවීම හේතුවෙන්, 2022 ජනවාරි 10 වන දින නිල බලයෙන් පත් වූ සාමාජික.
- ඉවට් ප්‍රනාන්දු මිය - ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන්, 2022 ඔක්තෝම්බර් 11 වන දින නිල බලයෙන් පත් වූ සාමාජික

වර්ෂය තුළදී පහත සඳහන් නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධුරකාලය අවසන් වන ලදී.

- එන්.ඩබ්.ජී.ආර්.ඩී. නානායක්කාර මහතා - ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන් නිල බලයෙන් පත් වූ අතර 2022 අප්‍රේල් 29 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී.

සමාලෝචිත වර්ෂයේ ධුරයන් දැරූ කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වසර තුළදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු | නැත |
| මනිල් ජයසිංහ මහතා | අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් | කළමනාකරණ හවුල්කරු - ශ්‍රී ලංකාව සහ මාලදිවයින | නැත |
| | අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් කන්සල්ටින්ග් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් ස්ට්‍රටජි ට්‍රාන්ස්ඇක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් ජීඩීඑස් (CS) ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | ලංකා ටූවර්ස් ඇන්ඩ් ට්‍රෙඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | එන් එම් ජේ ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| ආර්.එම්.පී. රත්නායක මහතා | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් | නැත |
| | ලංකා බැංකුව | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් | 2022 පෙබරවාරි 03 වන දින සිට වැඩ බලන සභාපති | නැත |
| | දේශීය ණය සහ සංවර්ධන අරමුදල | 2022 පෙබරවාරි 28 වන දින දක්වා සභාපති සහ කොමිෂන් සභා සාමාජික | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | 2022 මාර්තු 02 වන දින දක්වා නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු | නැත |

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| සංජීව දිසානායක මහතා | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය - ගිණුම්කරණ ප්‍රමිත කමිටුව | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| සංජය බණ්ඩාර මහතා | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | සභාපති | නැත |
| | ප්‍රයිම් ලෑන්ඩ් රෙසිඩන්සීස් පී.එල්.සී. | ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක | නැත |
| | අබාන්ස් ෆයිනෑන්ස් පී.එල්.සී. | 2022 සැප්තැම්බර් 09 වන දින සිට බලපැවැත්වෙන පරිදි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක | නැත |
| | සී.එල්. සිනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ් | ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක | නැත |
| | නෙක්සියා මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | 1 |
| | නෙක්සියා බී.පී.ඕ. (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | 1 |
| සුනිල් ලංකාතිලක මහතා | මුදල් අමාත්‍යාංශය | විදේශ විනිමය පනතෙහි පරීක්ෂණ මණ්ඩල සාමාජික | නැත |
| | එල්.ඕ.එල්.සී. ඩිවෙලොප්මන්ට් ෆයිනෑන්ස් පී.එල්.සී. | ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක | නැත |
| ජනාධිපති නීතිඥ සුහද ගම්ලත් මහතා | නැත | නැත | නැත |
| සිසිර රත්නායක මහතා | නැත | නැත | නැත |
| ඉවට් ප්‍රනාන්දු මිය | ශ්‍රී ලංකා මහා බැංකුව | නියෝජ්‍ය අධිපති | නැත |
| | ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) | සභාපතිනි | නැත |
| | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය | සභාපතිනි | නැත |
| | අපි වෙනුවෙන් අපි අරමුදල | 2022 මැයි 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි කළමනාකරණ මණ්ඩල සාමාජික | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | කොමිෂන් සභා සාමාජික | නැත |

වර්ෂය තුළදී පහත සඳහන් නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධූරකාලය අවසන් වන ලදී.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| එන්.ඩබ්.ජී.ආර්.ඩී. නානායක්කාර මහතා | ශ්‍රී ලංකා මහා බැංකුව | 2022 අප්‍රේල් 29 වන දින තෙක් නියෝජ්‍ය අධිපති | නැත |

වෙළඳපොළ මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශ්වයන් අතර වර්ෂය තුළදී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු නොවීය.

## සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල විසින් ලංකා බැංකුවේ හි පහත සඳහන් ජංගම ගිනුම් පවත්වාගෙන යන අතර ඒ එක් එක්හි බැංකු ශේෂයන් පහත දක්වා ඇත.

| ජංගම ගිණුමේ නම | ගිණුම් අංකය | 2022.12.31 දිනට ශේෂය | 2021.12.31 දිනට ශේෂය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල | 0009834430 | 363,351 | 2,784,645 |

2022 වර්ෂය තුලදී පහත සඳහන් ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදු කරන ලදී.

| ආයෝජන වර්ගය | වර්ෂය තුලදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.) | 2022 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ශේෂය (රු.) |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | - | 2,961,938,365 |
| භාණ්ඩාගාර බිල්පත් | 1,007,695,630 | 1,007,695,630 |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 4,285,093,693 | 70,000,000 |
| එකතුව | 5,292,789,323 | 4,039,633,995 |

වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. BAN/G/COM/FA/22/4 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023 මැයි 26 |

සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (1) වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලේ ("අරමුදල") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, වන්දි අරමුදලේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනත්ප්‍රකාරව මාගේ අධීක්ෂණය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට, එහි මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිලිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්ති ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිලිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි වල තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එවැනි අවප්‍රකාශනයන් ප්‍රමාණාත්මක ලෙස සලකනු ලබනුයේ මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කරන විටදීය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් වෘත්තීමය විනිශ්චය ක්‍රියාත්මක කල අතර වෘත්තීමය සැකමුසුබව විගණනය පුරාවට පවත්වා ගන්නා ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීමත්, ඒවා තක්සේරු කිරීමත්, එවැනි වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි අවදානම් සඳහා ප්‍රතිචාරාත්මක විගණන පටිපාටි සැලසුම් කිරීම සහ සිදු කිරීමත්, මාගේ මතයට පදනම් වන ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමත් මෙහිදී සිදු කරනු ලැබේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මග හැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම, වංචාවක් ඇතිවීමට සම්බන්ධ වන බැවින්, වංචාවක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් ඇති විය හැකි අවදානම, වැරද්දක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් වන අවදානමට වඩා ප්‍රබල වේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිලිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය අගයනු ලැබේ.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සබන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| 2022 දෙසැම්බර් 31 දිනට | සටහන | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 369,424,068 | 394,240,378 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 24,816,310 | 113,632,425 |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය | | 201,936,911 | - |
| ලැබිය යුතු පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර | | 4,594,270 | 13,002,217 |
| ලැබිය යුතු පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | | 15,878,275 | 0 |
| ලැබිය යුතු පොලී ආදායම - ප්‍රතිමිලදී ගැනුම් | | 8,460 | 13,406 |
| මුදල් හා මුදල් සමාන දෑ | 7 | 8,615,687 | 40,728,226 |
| **මුළු වත්කම්** | | 625,273,981 | 561,616,651 |
| | | | |
| **අරමුදල් හා වගකීම්** | | | |
| **යොදවා ඇති අරමුදල් සහ සංචිත** | | | |
| සමුච්චිත අරමුදල | | 609,508,687 | 555,571,118 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ - ශ්‍රී.සු.වි.කො.ස. | | 15,563,294 | 5,845,532 |
| විගණන ගාස්තු | | 202,000 | 200,000 |
| | | | |
| **මුළු අරමුදල් හා වගකීම්** | | 625,273,981 | 561,616,651 |

113 සිට 118 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල වෙනුවෙන්;

නිරෝෂා කොඩිකාර
අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන

චින්තක මෙන්ඩිස්
අධ්‍යක්ෂ ජෙනරාල්

ෆයිසාල් සාලි
සභාපති

කොළඹදී
2023 මැයි 10 දිය

වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර | | 46,233,518 | 33,305,523 |
| පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | | 17,168,552 | - |
| පොලී ආදායම - ප්‍රතිමිලදී ගැනුම් | | 1,157,502 | 11,583,114 |
| වර්ෂය තුලදී වැරදි සමතයකට පත් කිරීමෙන් ලද වන්දි | | 10,400,000 | - |
| **මුළු ආදායම** | | 74,959,572 | 44,888,637 |
| **වියදම** | | | |
| විගණන ගාස්තු | | (200,000) | (398,000) |
| බැංකු ගාස්තු | | (72,180) | (2,912) |
| **මුළු වියදම** | | (272,180) | (400,912) |
| ආදායම් බදු වියදම | 8 | (20,749,823) | (10,669,546) |
| **වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම** | | 53,937,569 | 33,818,179 |

113 සිට 118 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# වන්දි අරමුදලේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| **සමුච්චිත අරමුදල** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 555,571,118 | 521,752,939 |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | 53,937,569 | 33,818,179 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | 609,508,687 | 555,571,118 |

113 සිට 118 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | 53,937,569 | 33,818,179 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 53,937,569 | 33,818,179 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම** | | |
| භාණ්ඩාගාර බැඳුම්කරවලින් ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම | 8,407,946 | (3,693,508) |
| භාණ්ඩාගාර බිල්පත්වලින් ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම | (15,878,275) | - |
| ප්‍රතිමිලදීගනුම් මත ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම | 4,945 | 18,621 |
| ශ්‍රී.සු.වි.කො.ස.ට ගෙවිය යුතු දෑ වැඩි වීම/(අඩු වීම) | 9,717,762 | (13,045,081) |
| අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩි වීම/(අඩු වීම) | 2,000 | 200,000 |
| | 2,254,378 | (16,519,968) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් | 56,191,947 | 17,298,211 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | 113,632,425 | (225,390,894) |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන | (201,936,911) | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | (88,304,486) | (225,390,894) |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | (32,112,539) | (208,092,682) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන (අ)) | 40,728,226 | 248,820,908 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන (ආ))** | 8,615,687 | 40,728,226 |
| **සටහන (අ)** | | |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 40,000,000 | 248,721,328 |
| බැංකුවේ ඇති මුදල් | 728,226 | 99,580 |
| | 40,728,226 | 248,820,908 |
| **සටහන (ආ)** | | |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 8,000,000 | 40,000,000 |
| බැංකුවේ ඇති මුදල් | 615,687 | 728,226 |
| | 8,615,687 | 40,728,226 |

113 සිට 118 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 1.1 වාර්තා කිරීමේ ඒකකය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල, 1991 අංක 26, 2003 අංක 18 සහ 2009 අංක 47 යන පනත් මගින් සංශෝධිත, 2021 සැප්තැම්බර් 21 වන දින සිට බලාත්මක, 2021 අංක 19 දරණ නව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 158 (1) වගන්තියෙන් අවලංගු හා ආදේශ වූ 1987 අංක 36 දරණ, පැරණි ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 38 (1) වගන්ති ප්‍රකාරව ස්ථාපිත කර ඇත.

2021 අංක 19 දරණ නව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 158 (1) වගන්ති ප්‍රකාරව යම් බලපත්‍රලත් කොටස් තැරව්කරුවෙකුට හෝ කොටස් වෙළෙන්දෙකුට තම ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට නොහැකි බවට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍යමය පාඩුවක් විඳින යම් ආයෝජකයෙකුට සීමිත වන්දියක් ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින්, "වන්දි අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටවනු ලැබිය යුතුය.

වන්දි අරමුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ ස්ථාපිත කර ඇති අතර, කොළඹ 01, ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ එච්ලන් චතුරශ්‍රයේ, නැගෙනහිර කුළුණෙහි 28 හා 29 වන මහලයන්හි පිහිටා ඇත.

### 1.2 මෙහෙයුම් වල ස්වභාවය සහ ප්‍රධාන කාර්යන්

2021 සැප්තැම්බර් 21 වන දින සිට බලාත්මක 2021 අංක 19 දරණ නව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 158 (1) වගන්ති ප්‍රකාරව වන්දි අරමුදලක් ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ යම් බලපත්‍රලත් කොටස් තැරව්කරුවෙකුට හෝ කොටස් වෙළෙන්දෙකුට තම ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට නොහැකි බවට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍යමය පාඩුවක් විඳින යම් ආයෝජකයෙකුට සීමිත වන්දියක් ප්‍රදානය කිරීමයි.

2021 අංක 19 දරණ නව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 158 (2) වගන්ති ප්‍රකාරව එම වන්දි අරමුදල සමන්විත වන්නේ;

(අ) පාර්ලිමේන්තුව විසින් වෙන් කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ අරමුදලට බැර කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්; සහ

(ඇ) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සෙස් බදු අරමුදලින් බැර කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන්ගෙන්.

ඊට අමතරව නව පනතෙහි 158 (3) වගන්ති ප්‍රකාරව, වන්දි අරමුදලට අයත් මුදල්, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකට ආයෝජනය කරනු ලැබිය හැකිය.

### 1.3 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල එහි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කරනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, වන්දි අරමුදල වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත වේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

### 1.5 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සැලකියයුතු අනාගත කාලයක් සඳහා වන්දි අරමුදල පවත්වාගෙන යාමට ඇති හැකියාව කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තක්සේරු කර ඇත. පුරෝකථනය කල හැකි අනාගත කාලයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩව සිදු කිරීම පිණිස වන්දි අරමුදලට ප්‍රමාණවත් සම්පත් ඇති බවට කොමිෂන් සභාවේ සාමාජිකයින්ට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් වන්දි අරමුදල මෙහෙයුම් කටයුතු ඇවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව වන්දි අරමුදල එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම නොකඩවා උපයෝගී කරගන්නා ලද අතර කාලපරිච්ඡේදය පුරාවටම ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතතාවයකින් යුතුව යොදාගනු ලැබ ඇත.

### 1.6 පිළියෙළ කිරීමේ පදනම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත්ප්‍රකාරව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ විගණන කමිටුවේ නිර්දේශයක් පරිදි 2020 ජනවාරි 01 වන දින සිට වන්දි අරමුදල සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට තීරණය කරන ලදී. එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලෙහි මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, වන්දි අරමුදල වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනෙකුත් විස්තරාත්මක තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත වේ.

වන්දි අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත. උචිත අවස්ථා වලදී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුයාත සටහන් වල හෙළිදරව් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කර ඇති අතර ගිණුම්කරණ ප්‍රතිපත්තීන් කාල පරිච්ඡේදය පුරාවටම සංගතතාවයකින් යුතුව යොදාගන්නා ලදී.

## වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

### 1.7 ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන පිළයෙල කිරීමේදී එහි වාර්තාගත ආදායම්, වියදම්, වත්කම්, වගකීම් සහ අනුගාමී හෙළිදරව් කිරීම් වලට සහ අසම්භාව්‍ය වගකීම් වල හෙලිදරව්කිරීම් වලටත් බලපාන ලෙස විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන භාවිතා කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙලෙස භාවිතා කරන උපකල්පන සහ ඇස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවයෙහි ප්‍රතිඵලයක් ලෙස අනාගත කාලයට බලපැවැත්වෙන ලෙස අදාළ වත්කම් හා වගකීම් වල ධාරණ අගයන් හි ප්‍රමාණාත්මක ගැලපීම් ඇති විය හැක. ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කිරීම සිදුවේ. ඇස්තමේන්තු වලට අදාළ සංශෝධනයන් ඉදිරිකාලීනව හඳුනා ගනු ලැබේ.

### 1.8 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන වාර්තා කරනු ලබන්නේ වන්දි අරමුදලේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සලකා බලන වර්ෂය තුලදී ආයතනයේ වාර්තා කරන හා ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි කිසිදු වෙනසක් සිදු වී නැත. විදේශ මුදල් හුවමාරු ගනුදෙනු ඇත්නම් ඒවා ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබන්නේ, අදාල ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ පවතින විදේශ විනිමය හුවමාරු අනුපාතයට අනුවය.

### 1.9 ප්‍රමානාත්මකභාවය හා සමාහාරය

එක් එක් කාණ්ඩයන්ට අයත් ප්‍රමාණාත්මක හා සමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ. ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර, ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

### 1.10 හිලව් කිරීම

වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු කරනු ලබන්නේ, ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් අවශ්‍ය කර හෝ අවසර දී ඇති විටදී හෝ හිලව් කිරීම මගින් පරිශීලකයන් හට අවබෝධ කර ගැනීමට අපහසු වූ ගනුදෙනුවක්, යම්කිසි සිද්ධියක්, තත්වයක් පිලිබඳ හරය පිළිබිඹු වේ නම් හෝ ශ්‍රී.ල.සු.වි.කො.ස. හි අනාගත මුදල් ප්‍රවාහයන් තක්සේරු කිරීමට පිටිවහල් වේනම් හෝ පමණි.

### 1.11 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ වාර්තා කිරීමේ යම් වෙනස් කමක් සිදු වී ඇති නම් ඒ හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වෙනස් කොට ඇත.

### 1.12 වාර්තාකරණ දිනට පසු සිදුවීම්.

සියලුම ප්‍රමාණාත්මක වාර්තාකරණ දිනට පසුව සිදුවීම් සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි අදාල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර ඇත.

### 1.13 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සංගත වේ.

## 2 වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

### 2.1 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු වල හා කෙටි කාලීන ආයෝජන වලත්, රජයේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වලත් ආයෝජන සිදු කර ඇත. මෙම ආයෝජන පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොලිය උපචිත පදනමින් සටහන් කර ඇත.

### 2.2 ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ සටහන් කර ඇත.

## 3 වගකීම් හා ප්‍රතිපාදන

### 3.1 වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනුයේ, වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් තුල හෝ ඉල්ලු විට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට පසු ගෙවිය යුතු වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සියලුම හඳුනාගත් වගකීම් පිරිවැය යටතේ ගිණුම්ගත කර ඇත.

## 4 මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය

### 4.1 පොලී ආදායම

ආයෝජන වල පොලී අදායම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 4.2 වන්දි මුදල් ලැබීම්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව වන්දි අරමුදලට ලැබෙන වන්දි මුදල්, 'මුදල් පදනම' මත හඳුනා ගනු ලැබේ.

### 4.3 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

## 5 වියදම් හඳුනා ගැනීම

වන්දි අරමුදල පවත්වාගෙන යාමෙහිලා දරනු ලබන සියලුම වියදම් උපචිත පදනම මත හඳුනා ගන්නා අතර එම වියදම් මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

## 6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමාන දේ, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ මාස තුනට අඩු කාලයකින් කල් පිරෙන ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජනවලින් සමන්විත වේ.

## 7 මුදල් හා මුදල් සමාන දේ

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජන | 8,000,000 | 40,000,000 |
| බැංකුවේ ඇති මුදල් | 615,687 | 728,226 |
| එකතුව | 8,615,687 | 40,728,226 |

## 8 ආදායම් බදු වියදම්

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| තක්සේරු වර්ෂ 2020/2021 සඳහා ආදායම් බදු වියදම | - | (7,508) |
| තක්සේරු වර්ෂ 2021/2022 සඳහා ආදායම් බදු වියදම | - | 10,677,054 |
| තක්සේරු වර්ෂ 2022/2023 සඳහා ආදායම් බදු වියදම | 20,749,823 | - |
| එකතුව | 20,749,823 | 10,669,546 |

2017 අංක 24 දරන සංශෝධිත දේශීය ආදායම් බදු පනත ප්‍රකාරව ආදායම් බදු වගකීම් ගණනය කර ඇත.

## 9 ප්‍රාග්ධන බැඳීම්

2022 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොවීය.

## 10 අසම්භාව්‍ය වගකීම්

2022 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

## 11 මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම්

එවකට සභාපති වූ ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා 2023 ජනවාරි 05 වන දින ධුර කාලය අවසන් කිරීමෙන් පසු, කොමිෂන් සභාව පහත පරිදි ප්‍රතිසංස්ථාපනය කරන ලදී.

- ෆයිසාල් සාලි මහතා - සභාපති - පත් කල සාමාජික 2023 පෙබරවාරි 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි
- සංජය බණ්ඩාර මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික
- ආර්.එම්.පී. රත්නායක මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික
- සංජීව දිසානායක මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික
- මනිල් ජයසිංහ මහතා - පත් කල සාමාජික
- සුජීව මුදලිගේ මහතා - පත් කල සාමාජික
- රජීව් අමරසූරිය මහතා - පත් කල සාමාජික
- ඈන්ටන් ගොඩ්ෆ්‍රි මහතා - පත් කල සාමාජික
- ඈන්තනී ශනිල් ප්‍රනාන්දු මහතා - පත් කල සාමාජික

**වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 12 සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

වන්දි අරමුදල කළමනාකරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජිකයින් විසිනි.

- ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා - සභාපති - පත් කල සාමාජික - 2023 ජනවාරි 05 වන දින ධුර කාලය අවසන් කරන ලදී.
- ආර්.එම්.පී. රත්නායක මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධුරය දැරීම හේතුවෙන් 2020 ජනවාරි 16 වන දින සිට නිල බලයෙන් පත්වූ සාමාජික.
- සංජීව දිසානායක මහතා - සමාගම් රෙජිස්ට්‍රාර් ධුරය හෙබවීම හේතුවෙන් 2021 ජූලි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික
- මනිල් ජයසිංහ මහතා - පත් කල සාමාජික
- සුහද ගම්ලත් මහතා - පත් කල සාමාජික
- සිසිර රත්නායක මහතා - පත් කල සාමාජික
- සුනිල් ලංකාතිලක මහතා - පත් කල සාමාජික
- සංජය බණ්ඩාර මහතා - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපති ධුරය හෙබවීම හේතුවෙන්, 2022 ජනවාරි 10 වන දින නිල බලයෙන් පත් වූ සාමාජික.
- ඉවට් ප්‍රනාන්දු මිය - ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන්, 2022 ඔක්තෝම්බර් 11 වන දින නිල බලයෙන් පත් වූ සාමාජික

වර්ෂය තුලදී පහත සඳහන් නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධුරකාලය අවසන් වන ලදී.

- එන්.ඩබ්.ජී.ආර්.ඩී. නානායක්කාර මහතා - ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන් නිල බලයෙන් පත් වූ අතර 2022 අප්‍රේල් 29 වන දින සිට බලපැවැත්වෙන පරිදි ධුර කාලය අවසන් කරන ලදී.

සමාලෝචිත වර්ෂයේ ධුරයන් දැරූ කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වසර තුලදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු | නැත |
| මනිල් ජයසිංහ මහතා | අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් | කළමනාකරණ හවුල්කරු - ශ්‍රී ලංකාව සහ මාලදිවයින | නැත |
| | අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් කන්සල්ටින්ග් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් ස්ට්‍රටජි ට්‍රාන්ස්ඇක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් ජීඩීඑස් (CS) ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | ලංකා ටුවර්ස් ඇන්ඩ් ට්‍රෙඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | එන් එම් ජේ ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| ආර්.එම්.පී. රත්නායක මහතා | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් | නැත |
| | ලංකා බැංකුව | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් | 2022 පෙබරවාරි 03 වන දින සිට වැඩ බලන සභාපති | නැත |
| | දේශීය ණය සහ සංවර්ධන අරමුදල | 022 පෙබරවාරි 28 වන දින දක්වා සභාපති සහ කොමිෂන් සභා සාමාජික | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | 2022 මාර්තු 02 වන දින දක්වා නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | භාරකරු | නැත |

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| සංජීව දිසානායක මහතා | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිස | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය - ගිණුම්කරණ ප්‍රමිත කමිටුව | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| සංජය බණ්ඩාර මහතා | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | සභාපති | නැත |
| | ප්‍රයිම් ලැන්ඩ් රෙසිඩන්සීස් පී.එල්.සී. | ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක | නැත |
| | අබාන්ස් ෆයිනෑන්ස් පී.එල්.සී. | 2022 සැප්තැම්බර් 09 වන දින සිට බලපැවැත්වෙන පරිදි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක | නැත |
| | සී.එල්. සිනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ් | ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක | නැත |
| | නෙක්සියා මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | 1 |
| | නෙක්සියා බී.පී.ඕ. (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | 1 |
| සුනිල් ලංකාතිලක මහතා | මුදල් අමාත්‍යාංශය | විදේශ විනිමය පනතෙහි පරීක්ෂණ මණ්ඩල සාමාජික | නැත |
| | එල්.ඕ.එල්.සී. ඩිවෙලොප්මන්ට් ෆයිනෑන්ස් පී.එල්.සී. | ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂක | නැත |
| ජනාධිපති නීතිඥ සුහද ගම්ලත් මහතා | නැත | නැත | නැත |
| සිසිර රත්නායක මහතා | නැත | නැත | නැත |
| ඉවට් ප්‍රනාන්දු මිය | ශ්‍රී ලංකා මහා බැංකුව | නියෝජ්‍ය අධිපති | නැත |
| | ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) | සභාපතිනි | නැත |
| | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය | සභාපතිනි | නැත |
| | අපි වෙනුවෙන් අපි අරමුදල | 2022 මැයි 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි කළමනාකරණ මණ්ඩල සාමාජික | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | කොමිෂන් සභා සාමාජික | නැත |

වර්ෂය තුළදී පහත සඳහන් නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධූරකාලය අවසන් වන ලදී.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකම |
|---|---|---|---|
| එන්.ඩබ්.ජී.ආර්.ඩී. නානායක්කාර මහතා | ශ්‍රී ලංකා මහා බැංකුව | 2022 අප්‍රේල් 29 වන දින තෙක් නියෝජ්‍ය අධිපති | නැත |

වෙළඳපොල මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශ්වයන් අතර වර්ෂය තුළදී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු නොවීය.

**වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල විසින් ලංකා බැංකුවේ හි පහත සඳහන් ජංගම ගිනුම් පවත්වාගෙන යන අතර ඒ එක් එක්හි බැංකු ශේෂයන් පහත දක්වා ඇත.

| ජංගම ගිණුමේ නම | ගිණුම් අංකය | 2022.12.31 දිනට ශේෂය (රු.) | 2021.12.31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල | 75433985 | 615,687 | 728,226 |

2022 වර්ෂය තුලදී පහත සඳහන් ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදු කරන ලදී.

| ආයෝජන වර්ගය | වර්ෂය තුලදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.) | 2022 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ශේෂය (රු.) |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | - | 359,889,636 |
| භාණ්ඩාගාර බිල්පත් | 156,457,994 | 145,008,441 |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 322,298,717 | 8,000,000 |
| **එකතුව** | 478,756,711 | 512,898,077 |

**පියවීම් සහතික කිරීමේ අරමුදල**

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. } BAN/G/SGF/FA/22/5 ඔබේ අංකය / உமது இல. } දිනය / திகதி } 2023 මැයි 26

සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ ("අරමුදල") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1998 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවක් ලෙස අරමුදල පිහිටුවීමට සම්බන්ධ 1998 මැයි 21/22 දිනැති අංක 1376 දරන භාර ඔප්පුවේ 11 (ඩී) ඡේදයෙහි විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**පියවීම් සහතික කිරීමේ අරමුදල**

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්ති ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි වල තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එවැනි අවප්‍රකාශනයන් ප්‍රමාණාත්මක ලෙස සලකනු ලබනුයේ මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කරන විටදීය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් වෘත්තීමය විනිශ්චය ක්‍රියාත්මක කල අතර වෘත්තීමය සැකමුසුබව විගණනය පුරාවට පවත්වා ගන්නා ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීමත්, ඒවා තක්සේරු කිරීමත්, එවැනි වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි අවදානම් සඳහා ප්‍රතිචාරාත්මක විගණන පටිපාටි සැලසුම් කිරීම සහ සිදු කිරීමත්, මාගේ මතයට පදනම් වන ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමත් මෙහිදී සිදු කරනු ලැබේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මග හැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම, වංචාවක් ඇතිවීමට සම්බන්ධ වන බැවින්, වංචාවක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් ඇති විය හැකි අවදානම, වැරද්දක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් වන අවදානමට වඩා ප්‍රබල වේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිලිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය අගයනු ලැබේ.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සබන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**පියවීම් සහතික කිරීමේ අරමුදල**

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මුල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| 2022 දෙසැම්බර් 31 දිනට | සටහන | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 90,631,135 | 194,860,375 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | | 300,000,000 | 300,000,000 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | 104,229,240 | 278,775,190 |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන | | 555,183,888 | |
| ලැබිය යුතු පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර | | 8,451,206 | 18,034,969 |
| ලැබිය යුතු පොලී ආදායම - ස්ථාවර තැන්පතු | | 50,054,798 | 30,780,824 |
| ලැබිය යුතු පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | | 44,371,549 | |
| ලැබිය යුතු පොලී ආදායම - ප්‍රතිමිලදී ගැනුම් | | 9,519 | 81,429 |
| මුදල් හා මුදල් සමාන දෑ | 5 | 9,412,567 | 243,458,440 |
| **මුළු වත්කම්** | | 1,162,343,902 | 1,065,991,227 |
| | | | |
| **අරමුදල් සහ වගකීම්** | | | |
| **යොදවා ඇති අරමුදල් සහ සංචිත** | | | |
| ප්‍රදාන - මහා භාණ්ඩාගාරය | | 50,000,000 | 50,000,000 |
| ප්‍රදාන - සෙස් අරමුදල | | 100,000,000 | 100,000,000 |
| ප්‍රදාන - කොළඹ කොටස් හුවමාරුව | | 100,000,000 | 100,000,000 |
| සමුච්චිත අරමුදල | | 891,173,149 | 806,487,080 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු ආදායම් බදු | 6 | 20,970,753 | 9,397,147 |
| විගණන ගාස්තු | | 200,000 | 107,000 |
| **මුළු අරමුදල් සහ වගකීම්** | | 1,162,343,902 | 1,065,991,227 |

127 සිට 131 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාරකරුවන් සතු වගකීමකි.

පියවීම් සහතික කිරීමේ අරමුදල වෙනුවෙන්

**චින්තක මෙන්ඩිස්**
භාරකරු - පියවීම් සහතික කිරීමේ අරමුදල

**ෆයිසාල් සාලි**
භාරකරු - පියවීම් සහතික කිරීමේ අරමුදල

කොළඹදීය
2023 මැයි 10 දිය

**පියවීම් සහතික කිරීමේ අරමුදල**

# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| ආයෝජන මත පොලී ආදායම් - ප්‍රතිමිලදී ගැනීම් | | 4,438,743 | 3,363,641 |
| ආයෝජන මත පොලී ආදායම් - භාණ්ඩාගාර බැඳුම්කර | | 41,994,928 | 66,380,973 |
| ආයෝජන මත පොලී ආදායම් - භාණ්ඩාගාර බිල්පත් | | 47,443,738 | - |
| ආයෝජන මත පොලී ආදායම් - ස්ථාවර තැන්පතු | | 19,273,973 | 21,000,001 |
| **මුළු ආදායම** | | 113,151,382 | 90,744,615 |
| **වියදම්** | | | |
| විගණන ගාස්තු | | (291,000) | (165,000) |
| බැංකු ගාස්තු | | (106,480) | (2,164) |
| **මුළු වියදම** | | (397,480) | (167,164) |
| ආදායම් බදු වියදම | 7 | (28,067,832) | (16,303,941) |
| **වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම** | | 84,686,069 | 74,273,510 |

127 සිට 131 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| **සමුච්චිත අරමුදල** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 806,487,080 | 732,213,570 |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | 84,686,069 | 74,273,510 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | 891,173,149 | 806,487,080 |

127 සිට 131 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

පියවීම් සහතික කිරීමේ අරමුදල

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | 84,686,069 | 74,273,510 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 84,686,069 | 74,273,510 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම** | | |
| අනෙකුත් ලැබියයුතු දෑ (වැඩිවීම)/අඩුවීම | (53,989,850) | (20,631,836) |
| ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | 11,666,606 | 3,940,192 |
| | (42,323,244) | (16,691,643) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් | 42,362,826 | 57,581,867 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | 278,775,190 | 155,151,060 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | - | - |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන | (555,183,888) | - |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | (276,408,698) | 155,151,060 |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | (234,045,873) | 212,732,926 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ) | 243,458,440 | 30,725,513 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන ආ)** | 9,412,567 | 243,458,440 |
| **සටහන (අ)** | | |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 242,950,000 | 30,486,575 |
| බැංකුවේ ඇති මුදල් | 508,440 | 238,938 |
| **එකතුව** | 243,458,440 | 30,725,513 |
| **සටහන (ආ)** | | |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 9,000,001 | 242,950,000 |
| බැංකුවේ ඇති මුදල් | 412,566 | 508,440 |
| **එකතුව** | 9,412,567 | 243,458,440 |

127 සිට 131 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 1.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදල යනු 1998 වර්ෂයේ 1376 අංක දරන සංශෝධිත භාර ඔප්පුවේ විධිවිධාන යටතේ පිහිටුවන ලද ලාභ නොලබන භාරයකි. එහි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙළ කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම පියවීම සහතික කිරීමේ අරමුදලේ භාරකාර මණ්ඩලය සතු වේ.

### 1.3 පිළියෙළ කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත. උචිත අවස්ථා වලදී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුප්‍රාප්තික සටහන් වල හෙළිදරව් කර ඇත.

### 1.4 වාර්තාකරණ දිනට පසු සිදුවීම්

සියලුම ප්‍රමාණාත්මක වාර්තාකරණ දිනට පසුව සිදුවීම් සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි අදාල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර ඇත.

### 1.5 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සංගත වේ.

### 1.6 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ වාර්තා කිරීමේ යම් වෙනස් කමක් සිදු වී ඇති නම් ඒ හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වෙනස් කොට ඇත.

## 2. වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

### 2.1 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු වල හා කෙටි කාලීන ආයෝජන වලත්, රජයේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වලත් ආයෝජන සිදු කර ඇත. මෙම ආයෝජන පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොලිය උපචිත පදනමින් සටහන් කර ඇත.

### 2.2 ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ සටහන් කර ඇත.

## 3. වගකීම් හා ප්‍රතිපාදන

### 3.1 විශ්‍රාමික ප්‍රතිලාභ

අරමුදලෙහි සියලුම කටයුතු භාරකරුවෙකු හරහා සිදු කරන බැවින් සහ අරමුදලේ සේවයේ නියුක්ත පූර්ණ කාලීන සේවකයින් නොමැති බැවින්, 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනත් ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී.

### 3.2 ගෙවිය යුතු දෑ

ගෙවිය යුතු දෑ පිරිවැය යටතේ දක්වා ඇත.

## 4. මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

### 4.1 ආදායම් හඳුනා ගැනීම

ආයෝජන මත පොලී ආදායම් උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ.

### 4.2 වියදම් හඳුනාගැනීම

පියවීම් සහතික කිරීමේ අරමුදල පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම ගෙවීම් උපචිත පදනම මත හඳුනා ගනු ලබන අතර මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ඒවා ආදායමට අය කරනු ලැබේ.

### 4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී, මුදල් හා මුදල් සමාන දෑ, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් හා බැංකුවේ ඇති මාස තුනට අඩු කල් පිරීමක් ඇති ප්‍රතිමිලදී ගැනුම් ආයෝජන වලින් සමන්විත වේ.

## 5. මුදල් හා මුදල් සමාන දෑ

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 9,000,001 | 242,950,000 |
| බැංකුවේ ඇති මුදල් | 412,566 | 508,440 |
| එකතුව | 9,412,567 | 243,458,440 |

**පියවීම් සහතික කිරීමේ අරමුදල**

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 6. ගෙවිය යුතු ආදායම් බදු

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| තක්සේරු වර්ෂ 2020/2021 සඳහා ආදායම් බදු වියදම | | (101,382) |
| තක්සේරු වර්ෂ 2021/2022 සඳහා ආදායම් බදු වියදම | | 9,498,528 |
| තක්සේරු වර්ෂ 2022/2023 සඳහා ආදායම් බදු වියදම | 20,970,753 | |
| එකතුව | 20,970,753 | 9,397,147 |

## 7. ආදායම් බදු වියදම්

| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2022 රු. | 2021 රු. |
|---|---|---|
| තක්සේරු වර්ෂ 2021/2022 සඳහා ආදායම් බදු වියදම | | 16,303,941 |
| තක්සේරු වර්ෂ 2022/2023 සඳහා ආදායම් බදු වියදම | 28,067,832 | |
| එකතුව | 28,067,832 | 16,303,941 |

2017 අංක 24 දරන සංශෝධිත දේශීය ආදායම් බදු පනත ප්‍රකාරව ආදායම් බදු වගකීම් ගණනය කර ඇත.

## 8. ප්‍රාග්ධන බැඳීම්

2022 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොවිය.

## 9. අසම්භාව්‍ය වගකීම්

2022 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

## 10. වාර්තාකරණ දිනට පසු සිදුවීම්.

භාරකරුවන් විසින් සියලුම සිදුවීම් සමීපව අධීක්ෂණය කරනු ලබන අතර යෝග්‍ය පරිදි වර්තමාන මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

එවකට සභාපති වූ ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා 2023 ජනවාරි 05 වන දින ධුර කාලය අවසන් කිරීමෙන් පසු, 2023 පෙබරවාරි 15 වන දින ෆයිසාල් සාලි මහතා සභාපති ලෙස පත් විය.

## 11. සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

අරමුදලේ භාරකරුවන් ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති හා අධ්‍යක්ෂ ජනරාල්වරයාත්, කොළඹ කොටස් හුවමාරුවේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී සහ මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාත් ක්‍රියා කරනු ලැබේ.

2022 වර්ෂය තුළදී පහත නම් සඳහන් භාරකරුවන් පියවීම් සහතික කිරීමේ අරමුදලේ භාරකරුවන් ලෙස ධුරයන් දරන ලදී.

- ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා - සභාපති - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
- රජීව් බණ්ඩාරනායක මහතා - ප්‍රධාන විධායක නිලධාරී - කොළඹ කොටස් හුවමාරුව
- ආර්.එම්.පී. රත්නායක මහතා - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජික සහ මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්
- චින්තක මෙන්ඩිස් මහතා - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්

වර්ෂය තුළදී පියවීම් සහතික කිරීමේ අරමුදලට පත්කළ භාරකරුවන්:

- දිල්ෂාන් වීරසේකර මහතා - කොළඹ කොටස් වෙළඳපොලේ සභාපති (2022 ජූනි සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)

වර්ෂය තුළදී පියවීම් සහතික කිරීමේ අරමුදලේ පහත සඳහන් භාරකරුවන්ගේ ධුරකාලය අවසන් වන ලදී.

- දුමිත් ප්‍රනාන්දු මහතා - 2022 ජුනි සිට භාරකරුවකු වශයෙන් ධුර කාලය අවසන් කරන ලදී.

අරමුදලේ භාරකරුවන් විසින් වර්ෂය තුළදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | සම්බන්ධිත ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකාරීත්වය (අදාළ නම්) |
|---|---|---|---|
| ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න | ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව | 2020 ජනවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි, සභාපති ලෙස පත්කරන ලද අතර, 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්නා ලදී. | නැත |
| දිල්ෂාන් වීරසේකර මහතා | කොළඹ කොටස් හුවමාරුව | සභාපති (2022 ජුනි සිට බලපැවැත්වෙන පරිදි) | නැත |
| | හැටර් කෝප් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| | මධ්‍යම තැන්පතු හුවමාරුව | අධ්‍යක්ෂ | නැත |
| | ෆස්ට් කැපිටල් ලිමිටඩ් | කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2022 දෙසැම්බර් 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි) | නැත |
| | ෆස්ට් කැපිටල් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2022 දෙසැම්බර් 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි) | නැත |
| | ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2022 දෙසැම්බර් 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි) | නැත |
| | ෆස්ට් කැපිටල් මාර්කට්ස් ලිමිටඩ් | කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2022 දෙසැම්බර් 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි) | නැත |
| | ෆස්ට් කැපිටල් ඉක්විටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | කළමනාකරණ අධ්‍යක්ෂ (2022 දෙසැම්බර් 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි) | නැත |
| | ෆස්ට් කැපිටල් ට්‍රස්ටී සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2022 දෙසැම්බර් 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි) | නැත |
| | ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පී.එල්.සී. | කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2022 දෙසැම්බර් 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි) | නැත |
| | කොළඹ කොටස් හුවමාරුව | අධ්‍යක්ෂ (2022 ජුනි දක්වා) | නැත |
| | ෆස්ට් කැපිටල් ලිමිටඩ් | අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2022 දෙසැම්බර් දක්වා) | නැත |
| | ෆස්ට් කැපිටල් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2022 දෙසැම්බර් දක්වා) | නැත |
| | ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2022 දෙසැම්බර් දක්වා) | නැත |
| | ෆස්ට් කැපිටල් මාර්කට්ස් ලිමිටඩ් | අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2022 දෙසැම්බර් දක්වා) | නැත |
| | ෆස්ට් කැපිටල් ඉක්විටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ (2022 දෙසැම්බර් දක්වා) | නැත |
| | ෆස්ට් කැපිටල් ට්‍රස්ටී සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2022 දෙසැම්බර් දක්වා) | නැත |
| | ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පී.එල්.සී. | අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2022 දෙසැම්බර් දක්වා) | නැත |
| රජීව් බණ්ඩාරනායක මහතා | කොළඹ කොටස් හුවමාරුව | ප්‍රධාන විධායක නිලධාරී | නැත |
| | ලංකා මූල්‍ය සේවා කාර්යාංශය | අධ්‍යක්ෂ | නැත |
| ආර්.එම්.පී. රත්නායක මහතා | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් (2020 ජනවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි) | නැත |
| | ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ලංකා බැංකුව | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් | 2022 පෙබරවාරි 03 වන දින සිට වැඩ බලන සභාපති | නැත |

**පියවීම් සහතික කිරීමේ අරමුදල**

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

| නම | සම්බන්ධිත ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකාරීත්වය (අදාළ නම්) |
|---|---|---|---|
| ආර්.එම්.පී. රත්නායක මහතාඩ | දේශීය ණය සහ සංවර්ධන අරමුදල | 2022 පෙබරවාරි 28 වන දින දක්වා සභාපති සහ කොමිෂන් සභා සාමාජික | නැත |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | 2022 මාර්තු 02 වන දින දක්වා නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| චින්තක මෙන්ඩිස් මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව | අධ්‍යක්ෂ ජෙනරාල් | නැත |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | නිල බලයෙන් පත් වූ සාමාජික | නැත |
| | ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල | භාරකරු | නැත |

වර්ෂය තුළදී පහත සඳහන් නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධුරකාලය අවසන් වන ලදී.

| නම | සම්බන්ධිත ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකාරීත්වය (අදාළ නම්) |
|---|---|---|---|
| දුමිත් ප්‍රනාන්දු මහතා | කොළඹ කොටස් හුවමාරුව | සභාපති (2022 ජූනි දක්වා) | නැත |
| | පන්තේරා වෙන්චර්ස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 100% |
| | පී.වී.ගෝල් ප්‍රොපර්ටීස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 100% |
| | පී.වී. හිල්ටොප් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 100% |
| | ඔමැක් ටෙක්නොලොජීස් පුද්ගලික සමාගම | සභාපති | 10% |
| | ටෙකිටෙස් පුද්ගලික සමාගම | සභාපති/ අධ්‍යක්ෂ | 10.34% |
| | වන් සීසන් ප්‍රොපර්ටීස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | නැත |
| | ඩිවූ පැරඩයිස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | නැත |
| | අනීවා පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 11.8% |
| | ජෙනරේටර් සොලියුෂන් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | නැත |
| | ජුවෙලෙක්ස් ඇග්‍රි කුමාරගම පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 15% |
| | ඒෂියා සිකියුරිටීස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 76.70% |
| | ඒෂියා සිකියුරිටීස් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 27.64% |
| | ඒෂියා සිකියුරිටීස් වෙල්ත් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ/ සභාපති | නැත |
| | ඒ-සෙක් කැපිටල් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 100% |
| | ඒෂියා සිකියුරිටීස් ඇඩ්වයිසර්ස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | නැත |
| | ඒෂියා සිකියුරිටීස් වෙල්ත් ප්‍රොඩක්ට් (පුද්ගලික) සමාගම | අධ්‍යක්ෂ/ සභාපති (2022 ජූනි සිට බලපැවැත්වෙන පරිදි) | 100% |
| | සිංගර් ශ්‍රී ලංකා පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | යුනියන් ඇෂුවරන්ස් පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |

වෙළඳපොළ මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශවයන්/ආයතන සමඟ වර්ෂය තුළදී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු නොවීය.

පියවීම් සහතික කිරීමේ අරමුදල විසින් ලංකා බැංකුවේ පහත සඳහන් ජංගම ගිණුම් පවත්වාගෙන යනු ලබන අතර ඒ එක් එක් ගිණුමෙහි ශේෂය පහත දක්වා ඇති පරිදි වේ.

| ජංගම ගිණුමේ නම | ගිණුම් අංකය | 2022.12.31 දිනට ශේෂය (රු.) | 2021.12.31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|
| පියවීම් සහතික කිරීමේ අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව | 1833 | 412,566 | 508,440 |

2022 වර්ෂය තුළදී පහත දැක්වෙන ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදු විය.

| ආයෝජන වර්ගය | වර්ෂය තුළදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.) | 2022 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ශේෂය (රු.) |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | | 189,892,585 |
| භාණ්ඩාගාර බිල්පත් | 337,996,688 | 326,000,714 |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 987,147,506 | 9,000,000 |
| එකතුව | 1,325,144,194 | 524,893,299 |

# සාංගමික තොරතුරු

**කාර්යාලීය ලිපිනය**

28 සහ 29 වන මහල
නැගෙනහිර කුළුණ
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය
කොළඹ 01
ශ්‍රී ලංකාව

**දුරකථනය**

+94 11 2143843

**ෆැක්ස්**

+94 11 2439149

**ඊ-මේල්**

mail@sec.gov.lk

**වෙබ් අඩවිය**

www.sec.gov.lk

**ගිණුම්කරණ වර්ෂය**

2022 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

**විගණකවරු**

විගණකාධිපති

**බැංකුකරුවන්**

ලංකා බැංකුව
සම්පත් බැංකුව
කොමර්ෂල් බැංකුව
හැටන් නැෂනල් බැංකුව

Designed & produced by
emagewise
Digital Plates & Printing by Softwave Printing and Packaging (Pvt) Ltd

SEC

SECURITIES AND EXCHANGE
COMMISSION OF SRI LANKA